හරන්ති, තත්ථ සරෙසූති නිමිත්තභූතෙසු සරෙසු, නිමිත්තත්ථෙ චෙතං ‘යස්මා කාරණා නිමිත්තත්ථෙසු සත්තමී’ති මිනා භුම්මං, යථා ‘නාගො දන්තෙසු හඤ්ඤතෙ’ත්‍යාදි—එතස්මිං නිමිත්තභූතෙ සරෙ බහූනම්පි සරානං එකස්මිං වාරෙ ලොපොදාහරණං දස්සෙතො ‘තෙන සබ්බෙ තො’ත්‍යාදිමාහ, රූපසිද්ධියම්පන එකෙකස්මිං සරෙ පරෙ එකෙකස්සෙව සරස්ස ලොපභාවං ඉච්ඡති, න එකස්මිං සරෙ බහූනං සරානං එකස්මිං වාරෙ ලොපභාවං, තෙනාහ තත්ථ ‘බහුවචනං පනෙත්ථ එකස්මිං සරෙ පරෙ බහූනං ලොපඤාපනත්ථ’න්ති—තට්ටීකායච ‘සරාති බහුවචනග්ගහණං එකෙකස්මිං සරෙ පරෙපි අනන්තරසරානං අකාරාදීනං සබ්බෙසම්පි ලොපො හොතීති තෙසං බහුභාවඤාපනත්ථං, යං පන න්‍යාසෙ වුත්තං ‘එකස්මිං සරෙ පරෙ එකම්හි චතුන්නම්පි ලොපො හොතීති ඤාපනත්ථ’න්ති තං න ගහෙතබ්බන්ති තාදිසස්ස පයොගස්ස ජිනවචනෙ අදස්සනතො ‘සබ්බාතො නසෙස වා’ති සුත්තෙනපි එකාරෙ පරෙ අකාරාදීනං චතුන්නම්පි එකෙකස්මිං පදෙ ලොපසම්භාවෙන එකන්තෙන ලොපස්ස නිරත්ථකත්තා තථා සභාවස්සාපි එති නිපාතනතො සිජ්ඣනතො’ති වුත්තං—සද්දනීතියම්පන න්‍යාසමතං අනුජානන්තො ‘නානා දිසං යන්ති *දිසා හනන්ති’ අයං එකස්මිං සරෙ පරෙ එකක්ඛණෙ ද්වින්නං පුබ්බසරානං ලොපො—‘න මං පුන උපෙය්‍යාසි† අපෙක්ඛියාසි’ති අයං එකස්මිං සරෙ පරෙ එකක්ඛණෙ තිණ්ණං පුබ්බසරානං ලොපො—තත්ථ යන්තීති යා අ අන්ති ති වණ්ණට්ඨිතං, එත්ථ පටිපාටියා තයො සරා ලබ්භන්ති—උපෙය්‍යාසීති උප ඉ අ එය්‍යාසීති වණ්ණට්ඨිති, එත්ථ පටිපාටියා චත්තාරො සරා ලබ්භන්ති—තත්‍රායං ගාථා,

‘සරා යන්ති සරෙ ලොපං එකො චෙපි තයොපි වා,
ධාතු සංසග්ග සන්ධිම්හි සඞ්ඛ්‍යාය කථිතං ඉදං.

තස්මා විඤ්ඤූහි විඤ්ඤෙය්‍යං සොතූනං කංඛංසකං,
නාසී රාජ භවොයන්ති එය්‍ය හෙය්‍ය නිදස්සනං.

වදන්ති යන්ති දිසා හනන්ති‡ විඤ්ඤෙය්‍යං සන්ති පන්ති ච,
අපෙක්ඛියාසි උපෙය්‍යාසි ඉච්චාදි ච නිදස්සනං’—ති වුත්තං.

---

* සමහර ශබ්දනීතිවල “දිසා හනන්ති” යන උදාහරණය නැතුවත්ඇර “විසායසං එය්‍ය පණ්ඩිතො—සචෙ උප්පාදෙ හෙය්‍ය” යන උදාහරණ දෙකක්ද තිබේ.

† අපෙක්ඛියාසි” යන උදාහරණයද ශබ්දනීතියකි නොදක්නාලදී.

‡ සමහර පොත්වල “විඤ්ඤායන්ති වදන්ති ච”—කියාද පාඨයි.

තත්‍ථ නසි රජ්ජහවොති අයං එකක්ඛර ලොපූදාහරණං, තතො පරං විනනං තිණ්ණං සරානං ලොපූදාහරණානි, තෙසම්පන රූපසිද්ධි වෙදිතබ්බාති සම්බන්ධො—ඉමස්මිං කප්පෙති ඉමස්මිං දුතිය පරිච්ඡෙදෙ, කාරකා සුත්තානීති විධිසුත්තානි."

තවද මෙහි න්‍යාසයෙහි පාඨ පමණක් වර්ණනා කරණවා නොව මුල් පොතෙත් (ඒනම් කච්චායනයේ) පාඨවල තේරුම් ආදිය ගැණද සමහර තැන වැදගත් ලෙස කියා තිබෙනවාය—පුරාණ ටීකාවේ සමහර දෙසද කියා තිබෙනවාය—"බ්‍යඤ්ජනො ච විසඤ්ඤොගො" යන සූත්‍රයෙහි වෘත්තිය ගැණ මෙසේ කියා තිබේ.

"ඉමස්ස ච වුත්තියං චසද්දග්ගහණෙන තිණ්ණම්පි බ්‍යඤ්ජනානං අනන්තරෙ යෙ සරූපා තෙසම්පි ලොපො හොතීති ච—චසද්දග්ගහණෙන තිණ්ණම්පි බ්‍යඤ්ජනානං සරූපානං ක්වචි ලොපො හොතීති චාති මෙ වෙ පාඨා භින්නා, තෙසු පඨම පාඨොව පුරිම පාඨො, දුතිය පාඨො පන නව පාඨො, තං ඉදානි පඨන්ති--තෙසු අයං පඨම පාඨස්ස වණ්ණනා, තිණ්ණම්පි බ්‍යඤ්ජනානං අනන්තරෙ බ්‍යවධායකෙ එකස්මිං සරෙ සති යෙ සරූපා තෙසම්පි ආද්‍යක්ඛරස්ස ලොපො හොති එත්ථ ච තෙසන්ති නිද්ධාරණෙ භුම්මං—අයං පන දුතිය පාඨස්ස වණ්ණනා, තිණ්ණන්ති තබ්බිසෙනං බ්‍යඤ්ජනානන්ති නිද්ධාරණෙ භුම්මං ඉදං සරූපානන්ති ඉමිනා සම්බන්ධිතබ්බන්ති ක්වචි සද්දො විකප්පනත්ථො තෙන සරූපක්ඛරමය අසරූපෙකක්ඛර සමුදායභූතෙසු තීසු අක්ඛරෙසෙව සරූපෙකක්ඛර ලොපො හොති න විරූපක්ඛර සමුදාය භූතෙසු තීසු අක්ඛරෙසු ලොපොති දස්සෙති"

තවද පරවෙ හාවො ඨානෙ" යන සූත්‍රයට උදාහරණ කොට දක්වා තිබෙන "පඤ්චදසී" යන පදය අළුත වැටී තිබෙන පදයක් බව හා චතුර් යන සංඛ්‍යා ශබ්ද හැර සෙසු සංඛ්‍යා ශබ්දවලින් පරවූ දස ශබ්දයාගේ දකාරයාට විකාර නොවන බවද කියන ලදී.

මූල ගාථා මෙසේය.

"බුද්ධං විසුද්ධ කරුණාකර *පාළිපන්තං
මොහන්ධකාර විහතං අමතං අදා ච,
ධම්මං සුනිම්මලවරං ගණ මුත්තම ච
නත්වා තිලොක සරණං වරදක්ඛිණෙය්‍යං.

---

* සමහර පොතක "චාලිමන්තං" කියාය.

කච්චායනඤ්ච මුනිවණ්ණිත බුද්ධිමන්තං
නත්වා පභින්න පටිසම්භිද ථෙර මග්ගං,
සංසාර සාගර තරං සුවිසුද්ධ සීලං
සල්ලක්ඛණදස්සනසුවණ්ණසමානවණ්ණං.

සංවණ්ණනා ගරුවරෙහි පකාසිතා යා
න්‍යාසස්ස සා න යතිනං මතිවඩ්ඪනා ච,
ආයාචිතො යතිවරෙහි හිතාය තස්මා
සංවණ්ණනං මති පවඩ්ඪන මාරභිස්සං."

අග.

"දාඨානාගරාජගුරූති ලද්ධනාමලඤ්ඡනෙන ථෙරෙන පුරෙ ගරූහි සද්ධම්මසිරීති ගහිතනාමධෙය්‍යෙන සිරිනන්දධම්මරාජ පවරාධිපති නාමිනා යථා ධම්මං ලද්ධ රජ්ජභාවස්ස ධම්මරාජස්ස රජ්ජසම්පත්තානුභවනකාලෙ සාසනෙ වානවුතාධිකඑකවීසසතකාලෙ සක්ක රජ්ජෙ පන දසාධික සහස්සකාලෙ සම්පත්තෙන රචිතං නිරුත්තිසාර මඤ්ජූසනාමිකං පකරණං සමත්තං.

දසාධිකෙ සහස්සම්හි කතං පකරණං ඉදං,
සම්පත්තෙ තාදිසෙ තිඪං සහස්සෙ වාදසාධිකෙ."

---

4. න්‍යාසප්‍රදීපය—මෙය න්‍යාසයෙහි පළමුවෙනි ටීකාවය-අරිමද්දන නුවර නරපති රජ්ජුරුවන්ගේ කාලයෙහිදී (එනම් බුද්ධවර්ෂ 1725 ට ස්වල්පයකට ඉහත හරියේදී එක්තරා අමාත්‍යයෙක්විසින් සාදන ලදී—අන්තඃපුර ස්ත්‍රියක් නිසා උපන් එක් කුමාරිකාවක් කෙරෙහි පිළිබඳ සිත් ඇති බව රජහට පෙනුනු නිසා සම්පූර්ණ විනිශ්චය හා ගාම්භීර්ය්‍ය ඇති ග්‍රන්ථයක් කෙළේ වීනම් කුමාරිකාව ඔහුට දෙනබව රජ කීකල මෙම න්‍යාස ටීකාව සාද රජ්ජුරුවන්ට ඔප්පුකළවිට කුමාරිකාව හා රජ්ජුග්‍යාහ නම් අමාත්‍ය තනතුරත්ද දුන් බවද, ඒ අමාත්‍යයාගේ නම "සංබ්‍යං" කියා බැවින් මෙම න්‍යාස ටීකාවටද එම නාමය බුරුම රටේ ව්‍යවහාර කරණ බවද, ශාසනවංශයෙහි කියන ලදී—මෙම ටීකාවේ පදවර්ණනාදිය ගැණ නිරුක්තිමඤ්ජූසායෙහි

වර්ණනා කිරීමට පමණ සතුති කරන්ට වැඩි කාරණා නොපෙනෙන වත් ඇර සංක්ෂෙප වශයෙන් වර්ණනා කරණ ලද්දක්හෙයින් ටීකා වද මුල් පොතට වැඩි නැත.

මෙහි වර්ණනාදියට නිරුත්තිමඤ්ජුසායෙහි බොහෝ තැන්වලදී දෙස්ද කියා තිබේ—මූල ගාථාව මෙසේය.

සංසාරවනන්ධ ගමනන්තතා ගුණාධිවාසං
නිරුත්ධ්‍යූපගතාජ්ඤෙය්‍යං මනාථ නාථං,
බුද්ධ ච ධම්ම මභිනීහර මනඝ සංඝං
නාථසප්පදීප මභිනමිය කාරෙම් සාධුං.

---

5. සූත්‍රනිර්දේශය—මේද කච්චායනයෙහි ටීකාවක්ය—බුද්ධ වර්ෂ 1725 ට කිට්ටුවදී (එනම් අවුරුදු 700 කට පමණ ප්‍රථම) රාමඤ්ඤ දෙශවාසී ඡපට (හෙවත් ඡපද) නම් ස්ථවිරයන් වහන්සේවිසින් සාදන ලදී—මේ වර්ෂය හැගෙන්නේ කෙසේද යත්? පළමුවෙනි පරාක්‍රමබාහු රජතුමා (දිඹුලාගල මහාකාශ්‍යප ස්ථවිරයන්වහන් සේගේ සහායත්වය ඇතිව) නිකාය සාමග්‍රිය කොට ශාසන ශුද්ධිය කලේ බුද්ධ වර්ෂ 1709 යේදීය—එනම් එම රජතුමා රාජ්‍යයට පැමිණි 18 වෙනි අවුරුද්දේය—ලදරු සාමණේරවූ ඡපටතෙරුන්වහන්සේ ආචාර්‍ය්‍යවූ උත්තරාජීව ස්ථවිරයන්වහන්සේත් සමග ලංකාවට පැමිණුණේ ඊට අවුරුදු 6 කට ප්‍රථම නුමුත් මෙහිදී උපසම්පන්නව දශ අවුරුද්දක් මෙහි නැවතී ශාස්ත්‍රාගම්ධාරිව සියරටට ගිය නිසා පොත සාදන්ට ඇත්තේ ඒ රටේදීය—සද්ධර්මසංග්‍රහයෙහි පෙනෙන හැටියට *පළමුවෙනි පරාක්‍රමබාහු රජතුමා රාජ්‍යයට පැමුණුණේ බුද්ධ වර්ෂ 1587 තේදී නම් සූත්‍රනිර්දේශය සාදූ දිනට අවුරුදු 700 යකටත් වැඩ්වෙන්ට ඕනෑය—"පරාක්‍රමබාහු රජතුමා රාජ්‍යයට පැමුණුණේ බුද්ධ වර්ෂ 1791 දීය" යන කාලසාණී ප්‍රකරණයේ නියමනද එම කාලයෙහිදීම දිඹුලාගල මේධංකර ස්ථවිර ස්වාමිපාදයන්වහන්සේ විසින් ලියනලද විනය සන්නයෙහි පෙනෙන "බුදුන් පිරි "නිවී සාරසිය සූපනස් හවුරුද්දෙහි පටන් බිදි එක්වාදහස් දෙසිය "සූපනස් හවුරුද්දක් තුබූ බුදු සස්න පරාක්‍රමබාහු මහරජානන් "ඇරගෙණ දෙනානකා බෙගිරිනකා යන අසුබ දෙනකායෙහි

---

* "සම්බුද්ධපරිනිබ්බානා වස්සෙ සහස්සාතික්කමෙ,
සතතාසීති පමසතෙ රාජාහු පරක්කමභුජො"—සද්ධර්මසංග්‍රහයෙහිය.

“විපන්න තැන් හැර මහා විහාර වාසිවූ පරිසුද්ධවූ ථෙරවාදයම “ගෙණ පවත්නා පිරිසිදු තැන් හා සුද්ධ සංඝයා සමග කොට”-යන මේ කියමනද සංසන්දනය වන නිසාද, ජේම්ස් අල්විස් අටකාත් මැති තුමා මහවංශයෙන් ගණන් බලා කියා තිබෙන කියමනත් මීට කිට්ටු වන නිසාද, සද්ධම්මසංග්‍රහයේ ගණ්නාව වඩා කල්‍යාණී ප්‍රකරණයේ ගණන නිසැක විය යුතුය—එවිට සූත්‍රනිද්දේශය සාද අවුරුදු 590 ගණණකට අඩුවෙන්ට බැරිබව පෙනේ.

මේ ඡපට ස්ථවිරයන් වහන්සේවිසින් සූත්‍රනිද්දේශය පමණක් නොව අභිධර්මය ගැණ “අභිධම්මත්ථසංගහ” නම් ප්‍රකරණයට “සංඛෙපවණ්ණනා” යන ටීකාව සහ “නාමචාරදීපය” ද විනය ගැණ “විනයගුළ්හත්ථ දීපනිය” සහ “සීමාලංකාරටීකාව” ද කරණ ලද්දේය.

මුන්වහන්සේ විසින් සාදනලද පොත්වල ආරම්භ අවසාන දෙකේද්ම කෘතූපකාර සැලකිමක් වශයෙන් ලංකාව මතක් කොට තිබේ—නමස්කාර ගාථාවේ පවා බුදුරජානන්වහන්සෙගේ ගුණ යක් කොට කියන්නෙත් තුන්වරක් ලංකාවට වැඩමවා ශාසනය පිහිටෙව් බවය—මුන්වහන්සේ ත්‍රිපිටකධාරි කෙනෙක් බව සහ තුඩාකාලයෙහිදී රාමඤ්ඤදෙශයෙන් ලංකාවිපසට පැමිණ ශාස්ත්‍රා ගම ඉගෙණ ථෙරසම්මුති ලබා ත්‍රිපිටකධාරිව මේ රටේ තෙරුන් නාන්සේලා සතර නමක් සමග රාමඤ්ඤදෙශට ගොස් එහි අමුතු සමාගමක් පිහිටුවා දිවුනු කාලඩව කල්‍යාණී ප්‍රකරණාදියෙහිද කියා තිබේ—සමහර පොත් ලංකාවේදී සාදන ලද්දේයයිද සිතිය හැකිය—සංඛෙපවණ්ණනාවේ මුලදී.

> “ආගතාගම සත්ථෙන චන්දෙව සරදම්බරෙ,
> පාකටෙ ජිබ දීපම්හි මහා විජයබාහුනා.
>
> උකාකුටිකාං නිසීදිත්වා සාසනුපත්ථාස් කාංඛිනා,
> යාචිතොහං කරිස්සාමි සංඛෙප පදවණ්ණනාං.”

යන්නෙන්—පැමිණෙන ලද ආගම ශාස්ත්‍ර ඇති, ශරත් අංකාශයෙහි චන්ද්‍රයාමෙන් ප්‍රසිද්ධවූ ශාසනාභිවෘද්ධිකාමී මහාවිජයබාහු (යන නමැත්තෙක්) විසින් යාඥාකරණලද්දාවූ මම සංඛෙපවණ්ණනාව කරන්නෙමි” කියා තිබෙන නිසා මේ “විජයබාහු” යන නාමය මේ රටේ නාමයක් හෙයින් සංඛෙපවණ්ණනාව මේරටේදී සාදනලදැයි සිතිය හැකිය—උන්වහන්සේගේ සමහර පොත්වල “සීහළදෙසීය පරදෙසීයානාං අත්ථාය” කියාද තිබෙන නිසා වෙන

දෙශවාසීන්ට පරදෙශීහු යයි ලංකාවේදී කිය යුතු හෙයින් ඒ කිය මනොන්ද, ඒ පොත් ලංකාවේදී සෑදුවායයිද සිතිය හැකිය.

එහෙයින් සූත්‍රනිර්දේශය රාමඤ්ඤදේශයේදී සාදනලද බවට කරුණු තිබෙනුය—මෙහි බොහෝසෙයින් වර්ණනා කිරීම සූත්‍ර පමණක් නමුදු සමහර තැනදී වැනති උදාහරණ දෙවගීතය ගැණද ඉතා විස්තාර ලෙස කාරණා කියා තිබෙනවාය—සූත්‍ර වර්ණනා කිරීමත්,

"සම්බන්ධො ච පදඤ්චෙව පදත්ථො පදවිග්ගහො,
චොදනා පරිහාරො ච ඡබ්බිධා සුත්තවණ්ණනා."

යන මේ ෂඩ්ප්‍රකාරයට පමණක් නොව මීට ඉහතින් තිබුනු න්‍යාසාදි ටීකාවල සූත්‍රපදයන්ගේ නිර්දේශ දැක්වීමත් සම්පූර්ණයෙන් නැති නිසා එය මෙහි සම්පූර්ණයෙන් දක්වා තිබෙනවා පමණකුත් නොව, බාලාවතාර, රූපසිද්ධි, න්‍යාස, න්‍යාසප්‍රදීප, කාරිකා, අක්ඛර මඤ්ජූසා, චාන්ද්‍ර, යනාදි පොත්වලින්ද කාරණා ගෙණහැර දක්වා තිබෙනවාය.

මූල ගාථා මෙසේය.

"තිකඛත්තුං පන්තාලංකො යො පතිට්ඨපෙසි සාසනං,
වන්දිත්වා ලොක නාථං තං ධම්ම සංඝ ගණුත්තමං.
සද්ධම්ම කිත්ති නාමෙන යාචිතො ධම්මචාරිනා,
සනිද්දෙසං කරිස්සාමි කච්චාන සුත්ත වණ්ණනං."

"සර සරෙ ලොපං" යන සූත්‍රයේ වර්ණනාව මෙසේය.

"සරාති එකං පදං සරෙති එකං පදං ලොපන්ති එකං පදං විභජ්ජන්තපදවිභාගවසෙන තිපදමිදං සුත්තන්ති අත්ථො, සරාති *කාරි නිද්දෙසො සරෙති නිමිත්තනිද්දෙසො ලොපන්ති කාරියනිද්දෙසො, සඤ්ඤා පරිභාසා විධිනියම පටිසෙධ සුත්තෙසු විධිසුත්තන්ති අත්ථො— එත්ථ චොදනං සියා, සරාති බහුවචනං පටිච්ච සරෙසූති වත්තබ්බං? න වත්තබ්බං එකසෙසව සරස්ස නිමිත්තභූතත්තා—යදි එවං එකස්ස ලොපත්තා සරෙති වත්තබ්බන්ති?-න 'සබ්බතො ගසෙසවා' ති එත්ථ එකස්මිං සරෙ වත්තමානාමපි ලොපත්තා—අථවා, එකස්මිං විසරූපම්පි සබ්බෙ අථ සරා ලොපං පප්පොන්ති ති ඤාපනත්ථං 'සරා' ති

---

* "අනිට්ඨිතං පදං කාරී නිට්ඨිතං කාරියං භවෙ,
තස්ස හෙතු නිමිත්තන්තු තබ්භෙදකං විසෙසනං."

වුත්තං, තෙන වුත්තං වුත්තියං, 'සරා ඛො සබ්බෙපි සරෙ පරෙ ලොපං පප්පොන්ති' ති—එත්ථ ච 'සරා සරෙ' ති සාමඤ්ඤවසෙන වුච්චමානෙපි පරෙති කථං ඤායතීති? සරෙති සත්තමියං වුත්තත්තා ඤායති, අථවා උපරිසුත්තෙන පරෙති කාරිනො වුත්තත්තා ඤායති."

අග ගාථා මෙසේය,

"* පුණ්ණෙණ්ණ දසෙ නව නවුති ගුණෙ †ඡ වස්සෙ
වස්ස සහස්ස ගණනෙ ජින ‡නිබ්බුතායං,
ඉද්ධාරිමද්දන පුර වර තම්බ පණ්ණි
පට්ඨාන යො සිරි පරක්කම බාහු භූපං.

නිස්සාය සාසනමලං සුවිසොධයිත්වා
භික්ඛුහි ඤාතවිනයෙහි සුසඤ්ඤතෙහි,
බන්ධාපයී පුරවරෙ ජයවඩ්ඪනව්හෙ
සීමං විපත්ති රහිතං විනයානුරූපං.

සික්ඛාපයී යතිගණෙ විනයාභිධම්මෙ
පඤ්ඤාවදාත හදයො සදයො ජනානං,
අප්පිච්ඡතා විරියසීල ගුණාප්පසත්ථො
සද්ධාධනො §සකලසිස්සගණානුකම්පී.

සබ්බත්ථ යුත්ත පිටකත්තය පාරදස්සී
සො ඡප්පටව්හය සුතො යතිරාජකන්තො,
කච්චායනස්ස යති සුත්තනිද්දෙස මෙතං
සංඛෙපතො විරචයී මුනි සාසනත්ථං."

---

6. කච්චායන වණ්ණනාව—මේ ද කච්චායනයට සාදනලද තුන් වෙනි ටීකාවය-මෙහි කර්තෘ බුරුමරටේ තඹදීප පලාතේ විජයපුරස නගරයෙහි අභයගිරි පර්වතයෙහි වැඩසිටිය "මහාවිජිතාවී" නම් මහ ස්ථවිරයන්වහන්සේය-කාලය සූත්‍රනිද්දේශ, රූපසිද්ධි, රූපසිද්ධිටීකා, සද්දනීති යනාදී පොත්වලට පසුවය-මෙකී පොත්වලින් පමණක් නොව නිරුත්තිප්‍රකරණ, කච්චායනනිස්සයප්‍රකරණ, කාරිකා.

සමහර පොත්වල

* පුණ්ණෙ ගණෙ.
† ච වස්සෙ.
‡ නිබ්බුතාමං.
§ විකලබුද්ධි ජනානුකම්පී කියාය.

න්‍යාස යන මේ පොත්වලින්ද උදාහරණ ගෙණ තිබෙනවා පමණක් නොව න්‍යාස, සූත්‍රනිද්දේශ යන ටීකාවල නොකියනලද වැදගත් ක්‍රමයක් සියළු සූත්‍ර ගැණම කියා තිබේ—ඒනම් "ඉදං සුත්තං කිං පභවං කිං නිදානං කුතො නික්ඛන්තං?" යන ක්‍රමයට ප්‍රශ්ණ කොට සියළුම සූත්‍රවල නිදාන පෙන්වීමෙන් සූත්‍රයන්ගේ පිළිවෙළ දැක්වීමය—"තත්ථොදන්තා සරා අට්ඨ" යන සූත්‍රය "අක්ඛරපාදයො එකචත්තාලීසං" යන සූත්‍රයෙන් උපන්නේය, යන මේ ආදීවශයෙනි—එහි මූල ගාථාං මෙසේය.

"අවිසුද්ධස්ස ජනස්ස සුද්ධි සම්පාපකං ජිනං,
මොහස්ස ධංසකං ධම්මං නත්වා සංඝං නිරඞ්ගණං.

ඨපිතමෙතදග්ගාමහි එසො අග්ගොති ආදිනා,
නත්වා තඤ්ච මහාථෙරං න්‍යාසාදි කාරකම්පි ච.

බුද්ධප්පියං චවිරිය ච රූපසිද්ධි විධායකං,
සද්දනීති කාරකඤ්ච තතිය මග්ගපණ්ඩිතං.

නිස්සය කාරකඤ්චාපි නිද්දෙස කාරකම්පි ච.
වන්දිත්වා තෙසමාලම්බ නිච්ඡයං සුවිනිච්ඡිතං.
යත්පොත්ථානමත්ථාය කස්සං කච්චායනවණ්ණනං."

"සරා සරෙ ලොපං" යන සූත්‍රය වණ්ණනාකර තිබෙන්නේ මෙසේය—"සරා සරෙ ලොපන්ති ඉදං සුත්තං කිංපභවං කිංනිදානං කුතො නික්ඛන්තන්ති? "පුබ්බමධො ඨිත මස්සරං සරෙන වියොජයෙ-නයෙ පරං යුත්තෙ"ති සුත්තවය පභවං, තන්නිදානං, තතො නික්ඛන්තන්ති—යස්සඤ්ඤායානි න්‍යාදීසු යස්ස + ඉඤ්ඤායානීති ඡෙදෙ කතෙ "පුබ්බ—පෙ—යෙ"ත්‍ය මිනා සරතො බ්‍යඤ්ජනං වියොජෙත්වා සරස්මිං පරෙ පුබ්බසරස්ස ලොපං කත්වා පරක්ඛරං නෙතබ්බන්ති දස්සෙත්වා "සරා සරෙ ලොප"න්ති වුත්තන්ති—කිමත්ථමිදමුච්චතෙ සරස්මිං පරෙ පුබ්බසරානං ලොපො හොතීති ඤාපනත්ථං—සරාති එකං පදං සරෙති එකං ලොපන්ති එකං තිපදමිදං, සරාති කාරීනිද්දෙසො සරෙති නිමිත්ත නිද්දෙසො ලොපන්ති කාරිය නිද්දෙසො, සඤ්ඤා පරිභාසා විධිනියම පටිසෙධ සුත්තෙසු විධි සුත්තන්ති වෙදිතබ්බං.

ලොපාදෙස ච දීඝ ච රස්ස පච්චය මෙව ච
විභත්‍යාගමො පටිසෙධො විධිනාම අට්ඨ සියුං ති,
වුත්තෙසු විධිභෙදෙසු ලොපවිධීති වෙදිතබ්බං.

පුබ්බවිධි පරවිධි අන්තරඞ්ග බාහිරම්පි ච
විධිභෙදො චතුබ්බිධො දීපෙය්‍ය මතිමා නරොති.

වුත්තෙනඤ්ඤ විධිඤ්ඤු පුබ්බේ'ධීති වෙදිතබ්බං—සරා බො සරෙ පරෙ ලොපං පප්පොන්තීති අත්ථො—සරන්තීති සරා, කාරිභූතා අඨ සරා—තථා නිමිත්තභූතා සරා, තස්මිං සරෙ, ලුත්තානං ලොපො, පදච්ඡෙදෙ විජ්ජමානස්ස පදස්සත්ථි වසෙන කථනකාලෙ අනුපලද්ධීති වුත්තං හොති—සරෙසූති අවත්වා කස්මා සරෙති වුත්තන්ති?—එකෙකස්මිං සරෙ පරෙ බහූනං සරානං ලොපඤාපනත්ථං—එත්ථ ච නයි රජ භවෙන්ති එත්ථ එකස්මිං සරෙ පරෙ එකස්ස සරස්ස ලොපො—න+අයිති ඡෙදෙ-යන්ති ඉති එත්ථ ද්වින්නං සරානං එකක්ඛණෙ ලොපො—යා+අ+අන්තීති ඡෙදෙ, යා ධාතුයා අවයවො ආකාරෙ ච "භූවාදිතො අ" ඉති ඉමිනා පවත්තො අප්පච්චයො ච අන්තිප්පච්චයස්ස ආදිභූතො අකාරොචාති තයො සරා, තස්මා අන්තිප්පච්චයස්ස ආදිභූතෙ අකාරෙ පරෙ ද්වින්නං පුබ්බභූතානං ඉමිනා එකක්ඛණෙ ලොපො—උපෙය්‍යන්ති එත්ථ තිණ්ණං සරානං එකක්ඛණෙ ලොපො, උප+ඉ+අ එය්‍යන්ති ඡෙදෙ, උපසද්දො උපසග්ගො, ඉ ධාතු, අකාරෙ පච්චයො, එය්‍ය විභත්තිචාති එත්ථ චත්තාරො සරා, තස්මා එකාරස්මිං පරෙ තිණ්ණං පුබ්බභූතානං පකාරාවයවභූතඅකාරං ධාතුභූතඉකාරං පච්චයභූතඅකාරං ඉමිනා එකක්ඛණෙ ලොපො සද්දනීතියං වුත්තො න්‍යායෙ පන සබ්බතො ගසෙස්වාති සුත්තෙන අ ආ ඉ ඊ එති සිතෙ එකාරස්මිං පරෙ එකක්ඛණෙ චතුන්නං ලොපො වුත්තො—සද්දනීතියං වුත්තඋදාහරණානි විචාරෙතබ්බානි, තෙසං උදාහරණානං "ලොපඤ්චෙත්ත මකාරො-සරලොපො" න්‍යාදි *ලක්ඛණවිසයත්තා—රූපසිද්ධියං පන බහුවචනම්පනෙත්ථ එකෙකස්මිං සරෙ පරෙ බහූනං ලොපඤාපනත්ථන්ති වුත්තං—'සබ්බතො ගසෙසවා'ති එත්ථ ච අ ආ ඉ ඊ එති සිතෙ චතුන්නං සරානං කමෙන ලොපොති ච|වුත්තං—ටීකායංච 'සරෙ සරෙති අවත්වා සරාති බහුවචනග්ගහණං එකෙකස්මිං සරෙ පරෙ අනෙක සරානං අකාරාදීනං සබ්බෙසම්පි ලොපො හොති තෙසං බහුභාවඤාපනත්ථ'න්ති වුත්තං—ඉදං වුත්තං හොති නෙමිත්තකානං සරා බහවො හොන්ති චතුසට්ඨිමත්තා නිමිත්තතා අප්පකා අට්ඨෙවෙති, තස්මා සරාති බහුවචනං වුත්තන්ති—වුත්තඤ්ච—'සරෙහෙව සරා පුබ්බා ලුත්තා වාවි පරෙ රමං' ති චතු සට්ඨි වුත්තං හොති, න්‍යායෙ වුත්තනයඤ්ච තාදිසස්ස පයොගස්ස ජිනවචනෙ අදස්සනතොති කාරණං වත්වා පටික්ඛිත්තං..."

* බොහෝ පොත්වල "ලක්ඛණවිසෙසෙන යුත්තත්තා" කියාය.

අග ගාථා මෙසේය.

"විජයාභිධාන පුරම්හි උස්සිතද්ධජ සන්නිභෙ,
ලංකාතො නන්ද මූලාදි ලෙන සීමාදිකෙහි ච.
නාදී පබ්බත වාපීහි ඛෙත්තෙහි පරිවාරිතො,
නාගො අභය ගිරිත්ති සඞ්ඝ දිස්සාසු පාකටො.
හංසාවති පුරින්දස්ස පඨම සෙට්ඨිහ සාමිනො,
නත්තායො සුරුච්චනාති නාමෙනාපි සුපාකටො.
අකාසි යො එත්ථාවාසං රම්මං දෙවසභොපමං,
වසති එත්ථ යො ථෙරො සාසනස්ස හිතාවහො.
මහා සද්දූනා සහිත ජිනාවී ඉති නාමිනා,
රචිතා තෙන ථෙරෙන එසා කච්චාන වණ්ණනා."

---

7. රූපසිද්ධිය—කච්චායනව්‍යාකරණයට අයිති පදසිද්ධික්‍රමයේ පොත් අතුරෙන් ප්‍රයෝජනයෙන් හා ප්‍රමාණයෙන්ද මහත්වූ පොත මේය--ලංකාද්වීප වාසී ආනන්දස්ථවිරයන් වහන්සේගේ ශිෂ්‍යවූ සොළී රටේ බුද්ධප්‍රියාචාරීන්වහන්සේවිසින් සාදන ලදී--සොළී රටේ විහාර කීපයක ප්‍රධානියෙක්ව සිටිය නුමුත් මේ රටේ කොතනකැයිද කියත්-සූත්‍රනිද්දේශ, කච්චායනවණ්ණනා, කච්චායනභෙද, පයොගසිද්ධි යන පොත්වලට ඉහත බවත් චූලනිරුත්තිටීකා, න්‍යාස යන පොත්වලට මෑත බවත් සොළීරටේ බුද්ධාගම නිර්මලව පවත්නා කාලයෙහි බවත් මිස නියමවශයෙන් කාලය කිය නොහැකිය—කච්චායන ව්‍යාකරණයට රූපසිද්ධිය පාණිනී ව්‍යාකරණයට මහාසිද්ධාන්තකෞමුදියත් මොග්ගල්ලායන ව්‍යාකරණයට පයොගසිද්ධියත් වැනිය—මොග්ගල්ලායනවුත්ති සද්දනීති යනදෙකෙහි මෙය සඳහන්කර නැති නිසා ඒදෙකට පසුව සාදන ලදැයිද සිතියහැකිය—කච්චායන බාලාවතාර දෙක්හි නොකියනලද්දාවූ පදසිද්ධික්‍රමාදිය මෙහි ඉතා බොහෝ නුමුත් සූත්‍ර සියල්ලම කච්චායනයෙහි ඒවාය—කච්චායනයෙහි කියනලද සමහර කියමන්වලට අමුතුකාරණා මිශ්‍ර කොට සම්පූර්ණ කර මෙහි කියා තිබෙන නුමුත් එසේ අමුතුවෙන් මිශ්‍ර කළාවූ සමහර කියමන්වලට පයොගසිද්ධි කර්තෘ විරුද්ධවද කථා කර තිබේ—ඉන් එකක් නම්,

පරස්සරයින්ට අසවර්ණාදේශය සාමාන්‍යයෙන් කොයි පූර්වස්වරයක් ලොප්කළ තැනකත් පුළුවන් බව කච්චායන බාලාවතාර දෙකෙහි

කියනලද්දේය—රූපසිද්ධියෙහි "අවණ්ණා එව ලුප්පන්ත ඉධ වුත්ත විධි හොතීති දට්ඨබ්බං" යන්නෙන් ඒ අසවර්ණාදෙශය අවර්ණයා ලොප්කළ කල්හිම වන බව කියන ලද්දේය—පයොගසිද්ධියෙහි "අවණ්ණා ලුප්පන්ති ඒ ඔ හොන්ති ගාහ නිසෙධනත්ථං" යනාදීන් අවර්ණ ලොප්කළ කල්හිය යන ග්‍රාහයට විරුද්ධව කියන ලද්දේය—මහාසිද්ධාන්තකෞමුදියෙහි කියනලද බොහෝ කියමන් මෙහි සංග්‍රහ කොට තිබේ—මෙහි ආඛ්‍යාත කාණ්ඩය ඉතාම අපූරු තරමට ප්‍රයෝජනවත්ය—දැනට භාවිතා කරණලද නාමවර නැගිල්ලද මෙම රූපසිද්ධියෙන් සංග්‍රහකරණ ලද්දකි—චූලනිරුත්තිටීකාවෙන් උදාහරණකරණලද ගාථාද මෙහි තිබේ—කාණ්ඩ බෙදීම කච්චායනයෙහි මෙන් අටකාටය-පොතේ ප්‍රමාණය අඩරෙකයක් සහිත බණවර 17 ක්ය—ප්‍රාතිමෝක්ෂය ත්‍රාන්සලාත් කොට අව්වුගසවා ප්‍රසිද්ධකළාවූ "මිනයැප්" නම් රුසියන් පණ්ඩිතයා මෙයද දැනට ඔහුගේ භාෂාවට සන්න කොට අච්චුගසවන්ට සාදති.

මීට ටීකාවක් සහ සන්න දෙකක්ද තිබෙනවත් ඇර (8) ටීකාව සද්දනීතියට පසුව බවත් නිරුත්තිමඤ්ජූසයට ඉහත බවත් පෙනෙන්ට තිබෙනවා පමණක් නොව, න්‍යාස, සන්ධිනිරුත්තිප්‍රකරණ, මහාසන්ධිප්‍රකරණාදියෙන්ද කාරණා පෙන්වා තිබේ—න්‍යාසයෙහි සමහර කියමන්වලට විරුද්ධවද කාරණා කියා තිබේ—ඒනම් "සරා සරෙ ලොපං" යන සූත්‍රයෙහි බහුවචන ග්‍රහණය එකවිට ස්වර කීපයක් ලොප්කිරීම පිණිසයයි න්‍යාසයෙහි කියනලද කියමන "එලෙසින්.භාරනොගත යුතු" බව මෙසේ කියනලදී—"යං පන න්‍යාසෙ වුත්තං එකස්මිං සරෙ තිණ්ණං චතුන්නම්පි ලොපො හොතීති ඤාපනත්ථන්ති තං න ගහෙතබ්බං තාදිසස්ස පයොගස්ස ජිනවචනෙ අදස්සනතො..." යනාදියයි—ටීකාව* කොයිරටක කෙනෙක්විසින් කරණලද්දේද යනු කියා නැතුවත් ඇර මූලට නමස්කාර ගාථාවක්ද කියා නැත.

සන්න (9) දෙකින් සඤ්ඤහවිඝාතනීනම් සන්නය ඉතාලොකු පොතක්වත් ඇර දැනට රචේ තිබෙන්නේ කාරක කාණ්ඩය දක්වාය—පොත අසම්පූර්ණ තුමුත් ඒ තිබෙන ප්‍රමාණය අනිත්සන්නයට වඩා ප්‍රයෝජනවත්කමින්ද ප්‍රමාණයෙන්ද මහත්ය—පදසිද්ධි දැක්වීම පමණක් නොව බොහෝ තැන්වල විග්‍රහද භාවයද කියා තිබේ—පාණිනි, ශබ්දජීවිනතා යනාදියෙන්ද සමහර තැන්වලදී කාරණා

---

* ටීකාව රූපසිද්ධියට කුඩාය—කර්තෘ බුද්ධප්පියාචාරීන්වහන්සේමයයි ද කියත්.

දක්වා තිබෙනුය—කොයි කලකදී කවරෙක්විසින් සාදනලද දැයි දැනගත නොහැකි නුමුත් අන්න් සම්පූර්ණ සන්නයට පසුව සාදන ලද්දක්බව දැනගත හැකිය—(10) සම්පූර්ණ සන්නය අවුරුදු හාර සියයකට මෑත නොවේ බව පචිකාප්‍රදීපයෙන් පෙනේ—අන්තිම දක්වා තිබෙනහෙයින් සම්පූර්ණ සන්නයයි කී නුමුත් පිළිවෙළින් සිය ළුම පදවලට අර්ථ දක්වනලද්දේ නොව අතරතුර පදදිය අත්අැර ලාය-සම්පූර්ණ පොත බණවර 40 ක් පමණය—ඒ පුරාණ සන්න යෙහි මූල වාසනම මෙසේය.

“ප්‍රකරණාරම්භයෙහි රත්නත්‍රය ප්‍රණාම පූර්වකවූ සංඥාදි පචතාය දක්වනු පිණිස බුද්ධප්‍රියාචාර්යපාදයන්විසින් ‘විසුද්ධසද්ධම්ම’ යනාදී ගාථාවය ප්‍රාරබ්ධවී”—කියාය.

සන්දෙහවිඝාතනී නම් සන්නයෙහි මූල වාසගම මෙසේය.

“අනුපචිත පුන්‍යසම්භාර ඇති මන්දබුද්ධීන්ගේ ශබ්දලක්ෂණාව බොධය පිණිස පදරූපසිද්ධිනම් ප්‍රකරණයක් කටවිව ප්‍රාරම්භයෙහි යථාධිප්‍රෙත ප්‍රකරණයාගේ පරිසමාප්තියට විබන්ධකවූ උපපීඩකොප ඝාතාදී නෛකානන්තරායන්ගේ; නිවාරණයද ප්‍රඥාවගේ පාටවයද යන එවමාදි ප්‍රයෝජන සංසිද්ධිය පිණිස ශාස්තෘ ප්‍රණාමය දක්වනුවෝ සතුති පූර්වාගම ප්‍රණාමයෙන් ශාස්තෘනුගේ විශිෂ්ට ගුණයොගයද විශිෂ්ටගුණයොගයෙන් ප්‍රණාමාර්හ්‍ය භාවයද, ප්‍රණාමාර්හ්‍ය භාවයෙන් ප්‍රණාමයාගේ ක්ෂෙත්‍රගත ප්‍රභාවයද ක්ෂෙත්‍රගත ප්‍රණාම යෙන් යථාබිප්‍රෙත කාර්යයාගේ නිෂ්ඨාවද සිද්ධවනහෙයින් සතුති පූර්වාගම කොට—“විසුද්ධසද්ධම්ම—පෙ—” යන ගාථාව කීහු”—යනුයි.

රූපසිද්ධියෙහි මූල අග ගාථා මෙසේය.

“විසුද්ධසද්ධම්ම සහස්සදීධිතිං
සුබුද්ධ සම්බොධි යුගන්ධරොදිතං,
තිබුද්ධඛෙත්තෙක දිවාකරං ජිනං
සධම්ම සංඝං සිරසාභි වන්දිය.

කච්චායනාචරියං නමිත්වා
නිස්සාය කච්චායන වණ්ණනාදිං,
බාලප්පබොධත්ථ මුජුං කරිස්සං
ව්‍යත්තං සුබන්ධං පදරූපසිද්ධිං.

විඛ්‍යාතානන්ද ථෙරව්හය වරගුරූනං තම්බපණ්ණිද්ධජානං
සිස්සො දීපඞ්කරාඛ්‍යො දමිලවසුමති දීපලද්ධප්පකාසො,
බාලාදිච්චාදිවාසද්වයමධිවසං සාසනං ජොතයී යො
සොයං බුද්ධප්පියව්හො යති ඉම මුජුකං රූපසිද්ධිං අකාසි.”

11. බාලාවතාරය—කච්චායන ව්‍යාකරණයට අයිති පදසිද්ධික්‍රමයේ පොත් අතුරෙන් කුඩා පොත මේකය—පාඩම් කිරීමට පහසු ලෙස කුඩාකරලා සාදනලද්දක් හෙයින් පාලිව්‍යාකරණ ඉගණීම පිණිස මෙය කච්චායන රූපසිද්ධි දෙක පමණ ප්‍රයෝජනවත් නොවේ නමුදු මෙහි කාරක කාණ්ඩය සියළුම පොත්වල කාරක කාණ්ඩවලට වඩා ප්‍රයෝජනවත්ය, විසිතුරුය—මෙය උදාහරණ මූල්කර ගණ සාදනලද පොතක්හෙයින් ඒ උදාහරණවලට උවමනා සූත්‍ර පමණක් සංග්‍රහ කිරීමෙන් කච්චායනයෙහි සූත්‍ර බොහොමයක් මෙහි සංග්‍රහනොවී තිබෙන නුමුත් කච්චායනයෙහි නොදක්වන ලද්දාවූ ඉතාවැදගත් ප්‍රයෝජනවත් උදාහරණ මෙහි සංග්‍රහ කොට ත්බෙනුය—රත්නශ්‍රීඥාණාචාර්යයන්ගේ ශබ්දත්ථචින්තායෙන්ද “අද්ධභූතං කතනාදි...” යනාදී ගාථාදීය ගෙණ තිබේ.

කච්චායනාදියෙහි දක්වනලද්දාවූ “උණාදි” ප්‍රත්‍යය කාණ්ඩයද මෙහි අඩුය—බාලාවතාරය යමෙක් සම්පූර්ණ ලෙසම පුහුණු කළත් කච්චයනාදියත් භාවිතා නොකළොත් ඔහුගේ පාලිව්‍යාකරණයෙහි ව්‍යක්තතාවය ඉතා පාඩුය—පාලිව්‍යාකරණ ගැණ කලක පටන් ලංකාවේ මෙම පොත භාවිතාකරවන නුමුත් බුරුම සියම් රටවල භාවිතා කරවන්නේ කච්චායනාදියය—මෙම පොතට ලියන සන්නය, බලන සන්නය, ගඩලාදෙනි සන්නය යන නම්වලින් සන්න තුනක්ද, ගැටපදයක්ද, ටීකා දෙකක්ද තිබෙන නුමුත් එයින් බුරුමරටේ සාදනලද ටීකාව* සොයාගැණීම දුෂ්කරය—(12) ලියන සන්නය මීන සරණංකර සංඝරාජස්වාමිපාදයන්වහන්සේගේ ශිෂ්‍ය වූ තෙරුන්වහන්සේ නමක්විසින් බාලාවතාරයෙහි උදාහරණ පද සිද්ධකරණ (ලියන) ක්‍රමය සිංහල භාෂාවට නගා සාදනලද්දකි—එහි ස්වල්ප දෙස තිබුනත් ආධුනිකයන්ට ඉතා ප්‍රයෝජනවත් පොතක්ය—එහි පටන්ගැණ්ම මෙලෙසය.

“බුද්ධං තිධාභිවන්දිත්වා බුද්ධබුජ විලොචනං,
බාලාවතාරං භාසිස්සං බාලානං බුද්ධිවුද්ධියා.

යන මේ ග්‍රන්ථ ප්‍රමුඛ බාලාවතාරනම්වූ ප්‍රකරණයාගේ ‘ලොකගෙගා බුද්ධො’ යනාදී පදසිද්ධි ක්‍රමය බුද්ධශාසනාභිවෘද්ධි වර්ධනයෙහි තත්පර සර්වබුද්ධිසම්පන්නාශෙෂශාස්ත්‍රාභිලාෂී කල්‍යාණජනයන්ට නිරායාසයෙන් දැනගන්නා පිණිස ස්වදෙශ දෙශාන්තර ප්‍රසිද්ධ සීලා

---

* “බාලාවතාරටීකා අරිමද්දනනගරෙ උත්තමත්ථෙරෙන කතා” යනු බුරුම රටේ ලියවිල්ලක තිබේ.

චාර ගුණගණාභසංගත ඡන්දස් නිඝණ්ඩු ව්‍යාකරණ ධර්මවිනයා දුෂ්පර්යන්ත මනාකොට දන්නාවූ වැලිවිට පිණ්ඩපාතික සරණංකර රාජපූජිත සංඝරාජ ස්ථානාන්තරයට ප්‍රාප්ත යතීශ්වරයන්වහන් සේගේ ශිෂ්‍යවූ ඔකඳපොල ආරාමවාසී ධම්මජෝතිනම් භික්ෂුතෙ නෙකුන්විසින් සන්ධිකප්ප රූපසිද්ධ්‍යාදියෙහි පදසිද්ධික්‍රමය විමසා බලා ශබ්දශාස්ත්‍රානුකූල කොට මෙම ව්‍යාඛ්‍යාණය කිරීමට ප්‍රාරම්භ කෙළේ"—යනුයි.

බලත සන්නය යනු පදගතාර්ථ සන්නයයි—(13.)

ගඩලාදෙනි සන්නය ගඩලාදෙනි විහාරවාසී ස්ථවිරයන්වහන්සේ නමක්විසින් පදගතාර්ථද සමහර තැන භාවාර්ථද දක්වා සාදනලද මාහැඟි සන්නයකි—එහි පාණිණ්‍යාදි සංස්කෘත පොත්වලින්ද වැදගත් කාරණා ගෙණහැර දක්වා තිබෙනවා පමණක් නොව බාලාවතාරය තේරුම්ගැනීම පිණිස තිබෙන පොත් අතුරෙන් ප්‍රයෝජනවත් වැදගත් පොත ගඩලාදෙනි සන්නයයි—(14.)

බාලාවතාරයෙහි කර්තෘ "ධම්මකිත්ති" නම් ස්ථවිරයන්වහන්සේ නමක්යයි බුරුමරටේ ලියවිලිවල කියාතිබේ—කච්චායනසාර ටීකා *සද්දත්ථභෙදචින්තා (ඡපට තෙරුන්වහන්සේගේ) සූත්‍රනිර්දේශ යනාදි පොත්වල මෙහි නාමය සඳහන්කොට ගාථාදිය උදාහරණ කර තිබෙන නිසා එකී පොත්වලට පුරාණ බව හෙවත් අවුරුදු 600 කට මෑත නොවේ බව පෙනේ—සූත්‍රනිර්දේශාදියටත් අවුරුදු සිය ගණනකට පුරාණද ඊට අඩුද යනු නිශ්චය කර ගත නොහැකිය—රූපසිද්ධියටත් පුරාණ බව නය වශයෙන් සිතියහැකි නුමුත් ඒද නිශ්චයකර කියන්ට කාරුණක් නොපෙනේ—සංඥා කාණ්ඩයත් සන්ධි කාණ්ඩයටම ගණන් ගෙණ සන්ධි, නාම, සමාස, තද්ධිත, ආඛ්‍යාත, කිතක, කාරක, වශයෙන් කාණ්ඩ සත්ත බවද පොතේ ප්‍රමාණය අතිරේකයක් සහිතවූ බණවර සතර බවද අන්තිම ගාථාවල මෙසේ කියනලදී.

"සන්ධි නාමං සමාසො ච තද්ධිතාඛ්‍යාතිකං තථා,
කිතකං කාරකං කණ්ඩා සත්ත බාලාවතාරිමෙ.
සාතිරෙකෙහි චතුහි භාණවාරෙහි නිට්ඨිතො,
බාලාවතාරෙ ජනතා බුද්ධි වුද්ධිං කරෙතු හි."

---

* සද්දත්ථභෙදචින්තාව, කච්චායනභෙද ටීකාවටත් පුරාණයි එහි බාලාවතාරය සඳහන්කර තිබෙන්නේ මෙලෙසය "බාලාවතාර සම්බන්ධ විනතාදිසු නපුංසකං"

15. බාලාවතාර ටීකාව—මෙය ලංකාවේදි කරණලද්දක්බව මුත් කවුරුන්විසින්ද යනු දැනගත නොහැක්වත් ඇර වැඩි පුරණ ලියවිල්ලක් නොවේබවද, න්‍යාසටීකා, සද්දනීති, සූත්‍රනිද්දේශ, කච්චායනභෙදටීකා, විනයවිනිශ්චයටීකා යනාදියෙන් හා "කීජබ්‍යා" නම්වූ ව්‍යාකරණ පොතකින්ද සමහර කාරණා සංග්‍රහ කොට තිබෙන බවත් පෙනේ—මෙහි වාසගම් යෙදීමේ සොභණතාවය සමහර සමහර තැන්වල පාඩුවා වාගේ පේන තුමුත් වණ්ණනා කිරීම පද, අර්ථ, යන විප්‍රකාරයටවය—කතෘට මනාලෙස තේරුම් තිබෙන සමහර ග්‍රන්ථිස්ථාන තේරුම් දීම පිණිස ඉතා විස්තර කිරීමෙන්ද සියළු සූත්‍රපද විග්‍රහ කිරීමෙන්ද බොහෝ දුරට වෙහෙස ගෙණ තිබේ—පොතේ ප්‍රමාණයද බාලාවතාර සන්නයකට හෙවත් බණ්වර 24 කට අඩු නැත.

"ණ්‍යත්තතා භාවෙතු" යන සූත්‍රාදියෙහි ටීකා මෙසේය.

"ණ්‍යත්තතාති එකං, භාවෙත් එකං, තුති එකං, විභත්‍යන්තපදවිභාගවසෙන තිපදමිදං සුත්තං—සඤ්ඤා පරිභාසා—පෙ—සුත්තෙසු විධි සුත්තන්ති දට්ඨබ්බං—භාවෙතූති භාවත්ථෙ, ණ්‍යත්තාති ණ්‍යප්පච්චය ත්තප්පච්චය තාප්පච්චයා හොන්තීති අත්ථො, ඉධ තුසද්දො සමුච්චයත්ථො—භවන්ති බුද්ධිසද්දා එතස්මාති භාවො එතස්මාති සද්දප්පවත්ති නිමිත්තතො—තථාහි වුත්තං.

'යෙන යෙන නිමිත්තෙන බුද්ධිසද්දො ච වත්තතෙ,
තං තං නිමිත්තකං භාවපච්චයෙන උදීරිත'න්ති.

රූපසිද්ධි ආදිසු පන යස්ස ගුණස්ස හි භාවො දබ්බෙ සද්දසන්නිවෙසො තදභිධානෙ න්‍යත්තතාති වුත්තං—තත්ථ යස්ස ගුණස්සාති යස්ස විසෙසනස්ස, දබ්බෙති විසෙස්‍යෙ, 'දබ්බභාවෙ වාදසපච්චයා'ති වුත්තත්තා සුත්තෙහි විහිතපච්චපච්චයෙ ඨපෙත්වා සෙසා—ත්තනං, ත්තං, ත්වං, තාත්වං, ණික, ණිය, ණිල, ඉමෙ සත්ත පච්චයා තුග්ගහණෙන සංගහෙතබ්බා—තෙනාහ කීජබ්‍යං

'දෙසිතා පච සුත්තෙන පච්චයා භාවතද්ධිතෙ,
සත්ත සෙසා තු සද්දෙන දෙසිතා තද්ධිතඤ්ඤුනා' ති

කච්චායනෙ පන උපලක්ඛණවසෙන ත්තාදිපච්චයොව ගහිතො, න්‍යාසටීකායම්පන එකාදස පච්චයාති වුත්තං, අඤ්ඤත්ථ අට්ඨ පච්චයාති රූපසිද්ධියං 'ණ්‍යත්තතාති යොගවිභාගෙන කම්මනි සකත්ථෙ ච ණ්‍යාදයො—කම්මනි-වීරානං කම්මං විරියං; භාරියං, නාට්‍යං, භෙසජ්ජං, ඉච්චාදි-සකත්ථෙ-කාරුණ්ණමෙව කාරුඤ්ඤං; පත්ත

කාලලං, පාගුඤ්ඤං ඉච්චාදි'—'සකත්ථාදීසු ණ්‍ය සකත්ථෙ තා ච'—සකත්ථාදීසුපි ණ්‍යප්පච්චයො සකත්ථෙ තාප්පච්චයො ච හොන්තීති

"හොන්ත්‍යස්මා සද්දඤ්ඤාණානි භාවො සො සද්දවුත්තියා,
නිමිත්තභූතං නාමඤ්ච ජාති දබ්බං ක්‍රියා ගුණො."

අස්මා සද්දඤ්ඤාණානි හොන්තීති භාවො, සො සද්දවුත්තියා නිමිත්තභූතං නාමඤ්ච ජාති දබ්බං ක්‍රියාගුණොති යොජනා, යෙන කාරණෙන සද්දඤ්ඤාණ උභො හොන්ති සො භාවො නාම, සොපි නාම ජාතිදබ්බක්‍රියාගුණවසෙන පඤ්චකොති අධිප්පායත්ථො—නාමාදීනං පඤ්චකානං ලක්ඛණං උපරි කාරකාවත්ථායං පකාසිස්සං—'යථා—චන්දස්ස භාවො චන්දත්තං—ඉහ නාමවසා—චන්දසද්දො චන්දදබ්බෙ වත්තතෙ—නිමිත්තස්ස රූපානුගතඤ්ච ඤාණං'—අයං චන්දසද්දො ජාතිතො වා ගුණතො වා ක්‍රියතො වා චන්දදබ්බෙ න පවත්තති තථාපි සඤ්ඤාමත්තෙන පවත්තති යෙව—චන්දදබ්බෙ පවත්තන්තින ඤාණං ජාත්‍යාදි සරූපානුසාරෙන අප්පවත්තිත්වා සඤ්ඤාසරූපෙනෙව පවත්තතීති අධිප්පායො—සද්දප්පවත්ති නිමිත්තං නාම සද්දප්පයොගස්ස කාරණං, සද්දො අත්ථෙ පවත්ති නාම අත්ථවාචකත්තං, ඤාණං අත්ථෙ පවත්ති නාම අත්ථවිසයෙ උප්පාදෙති—උපරිපි එවං දට්ඨබ්බං—'එවං මනුස්සත්තන්ති මනුස්සජාතිවසා'—ඉධ මනුස්සසද්දො මනුස්සලක්ඛණෙ අත්ථෙ නාමාදිනා අප්පවත්තිත්වා මනුස්සජාතිපවත්තිනිමිත්තභූතජාතිස රූපඅනුගතඤ්ඤාණං ජාතියා පවත්තති—යදාදි සුත්තෙන දණ්ඩීස ද්දස්ස ඊකාරස්ස රස්සො—'දණ්ඩිත්තන්ති දණ්ඩදබ්බ සම්බන්ධො'—ඉහ දණ්ඩීසද්දො දණ්ඩො අස්ස අත්ථීති දණ්ඩීති වුත්තත්තා දණ්ඩෙන යුත්තදෙවදත්තාදි දබ්බනාමාදිනා අප්පවත්තිත්වා දණ්ඩදබ්බස්ස සම්බන්ධො යෙව නිමිත්තං කත්වා පවත්තිත්තඤ්ඤාණං නිමිත්තභූතදණ්ඩිදබ්බසම්බන්ධස රූපං අනුවත්තති—'පාචකත්තන්ති පචනක්‍රියා සම්බන්ධො'—ඉහ පාචකසද්දො පචතීති පාචකොති වුත්තත්තා පාකක්‍රියාය යුත්තදෙවදත්තාදි දබ්බෙ නාමාදිනා අප්පවත්තිත්වා පචනක්‍රියාය සම්බන්ධ නිමිත්තං කත්වා පවත්තිත ඤාණං නිමිත්තභූත පචනක්‍රියා සම්බන්ධ සරූපානුසාරෙන පවත්තති—'නීලත්තන්ති නීලගුණවසා'—ඉහ නීලසද්දො නීලගුණයුත්ත පටාදි දබ්බෙ නාමාදිනා අප්පවත්තිත්වා නීලගුණං නිමිත්තභූත නීලාදිගුණ සරූප මනුවත්තති."

මූල ගාථාව මෙසේය.

"ලොකම්බරෙ උදිත බුද්ධ සහස්සරංසි
මොහන්ධකාරහතපජ්ජට ධම්ම මාහං,
පුඤ්ඤකර දිගුණ සංඝ මහං නමිත්වා
බාලාවතාර පදවණ්ණනිමං කරිස්සං."

16. චූලනිරුත්තිය—මේනාමින් පොත් දෙකක් තිබෙනුය-එයින් එකක් යමකනම් මහා ස්ථවිරයන්වහන්සේවිසින් විරචිතවූ ඉතාම පුරාණ පොතක්ය—දැනට තිබෙන පාලිව්‍යාකරණ පොත්අතුරෙන් ඉතාම පුරාණ පොතක්වූ න්‍යාසයෙහි පවා ඒ නාමය සඳහන්ව තිබෙන බැවින් ඊටද පුරාණබව පේනවත් ඇර ඊට කරණලද "මඤ්ජූසා" නම්වූ ටීකාවද රූපසිද්ධියටත් ඉහත්‍ා බව රූපසිද්ධියෙහි

"සද්දෙ නාභි මුඛිකාරෙ විජ්ජමානස්ස වත්ථුනො,
ආමන්තණං විධාතබ්බෙ නත්ථි රාජා භවෙ ඉති."

යනාදි ගාථා එම පොතෙන් උදාහරණ කරතිබෙන හෙයින් පෙනේ—ඒ පුරාණ චූලනිරුත්තියෙහි මූඛීජ ලක්‍ෂණ හැරදමා "අක්ඛරාති සමචත්තාලීසති විධං" යී අක්‍ෂර සතලිසක් බව කියන ලදී—එහි ගාථා කිපයක් මෙසේය.

"බ්‍යඤ්ජනානං සරානන්තු සාධාරණ මිදං මතං,
නිග්ගහීතං නාම ජානං නිරුත්තඤ්ඤූහි දෙසිතං.

අක්ඛරානි ච සංඛ්‍යා ච අපිකාරෙන ගණ්හිතා,
තස්මා මජ්ඣෙ පකාසෙති අපිකාර මනුත්තරං.

ඵුට්ඨත්තං ඊසඵුට්ඨත්තං සංවුතම්පි තථෙව ච,
විවටඤ්චාපි වණ්ණානං කරණං තං චතුබ්බිධං.

ඵුට්ඨකරණා සියුං වග්ගා යරලවා තු ඊසකා,
දීඝා ච විවටා සබ්බෙ රස්සා සංවුතකා ඉමෙ.

අනාදවන්තො අත්‍යූණ්හා වග්ගානං පඨමො මතො,
උණ්හවන්තො ච නාදෙ ච වග්ගානං දුතියො මතො.

නාදවන්තො අත්‍යූණ්හා ච තතියො පිච පඤ්චමො
උණ්හා ච නාද වන්තා ච තෙස මෙව චතුත්ථකං."

---

17. අභිනව චූළනිරුත්තිය න්‍යාසාදියට පසු කාලයෙහි සිරිසද්ධම්මාලංකාරනම් ස්ථවිරයන්වහන්සේ නමක්විසින් කච්චායන සූත්‍රවල ච ශබ්දග්‍රහණ වා ශබ්දග්‍රහණාදියෙන් (කච්චායනාදියෙහි නොකියනලද) අමුතු පදසිද්ධික්‍රම දක්වනලද කුඩා පොතකි—එහි සූත්‍ර කිපයක් පිළිබඳව මෙසේ දක්වන ලදී.

" සරා සරෙ ලොපං—එකවචනග්ගහණෙන සඞ්ඛාග්ගහණ පයො

ජනං කාතබ්බං, බ්‍යඤ්ජනසම්පිණ්ඩනත්ථං සරා සරෙ ලොපං, බ්‍යඤ්ජනානි බ්‍යඤ්ජනෙ ලොපං—මෙඝනස්ස + ඛස්ස + මාලා, මෙඛලා,—භවෙසු වන්තගමනො, භගවා.

ක්වචාසවණ්ණං ලුත්තෙ—ලුත්තෙතිගහණං කස්මා? තෙන ලුත්තෙතිගහණෙන සරෙ පරෙ ලුත්තෙ පුබ්බො සරො අසවණ්ණං පප්පොති—මුනි + ආලයො, මුනෙලයො—ඉසි + ආලයො, ඉසෙලයො—රපි + ආසභො, රපෙසභො.

සිම්හි ගච්ඡන්තාදීනං අන්තසද්දො අං—යොගවිභාගෙන පඤ්චවිධො පාඨො ඤාතබ්බො, යොම්හි ගච්ඡන්තාදීනං අන්තසද්දො අං, නාම්හි ගච්ඡන්තාදීනං අන්තසද්දො අං, පාම්හි...ස්මාම්හි ගච්ඡන්තාදීනං අන්තසද්දො අං,—ගච්ඡං, ගච්ඡන්තා සමාගතා පණ්ඩිතා, ගච්ඡං ගච්ඡන්තෙන, ගච්ඡං, ගච්ඡන්තානං—ගච්ඡං, ගච්ඡන්තස්මා පුග්ගලස්මා—ආදිග්ගහණෙන අන්තසද්දො අත්තං ආපජ්ජති—ගච්ඡං ගච්ඡන්ති.

සෙසෙසු න්තුව—යොගවිභාගවසෙන පඨමා විභත්ති පරෙපි අගච්ඡන්ත සද්දො න්තුපච්චයොව දට්ඨබ්බො—අරහා.

කත්තරි ච—චසද්දග්ගහණෙන කත්තරි කාරකෙ පඨමා විභත්ති හොති—පුරිසො කම්මං කරොති.

තදස්සත්ථීති වී ච—චසද්දග්ගහණෙන සො විය ඉව පච්චයා හොන්ති තදස්සත්ථීත්‍යත්ථෙ—තුලං අස්ස අත්ථීති තුලසො, පදෙසො අස්ස අත්ථීති පදෙසවියො, චක්කං අස්ස අත්ථීති චක්කිවො.

සබ්බතො උං ඉංසු—සබ්බතොග්ගහණෙන උං විභත්තිස්ස අංසු එසුං ආදෙසා හොන්ති—අගමංසු, අදංසු, පාතුරහෙසුං.

භූජාදීන මන්තො නො ද්වි ච—චසද්දග්ගහණෙන අභුජාදීනං ධාතූනං අන්තො නො හොති—රමති තායාති රත්ති, යුජ්ජති තායාති යුත්ති, විපජ්ජති තායාති විපත්ති”—මුල අග ගාථා මෙසේය.

“වත්ථුත්තයං නමස්සිත්වා කච්චායනඤ්ච පුබ්බකෙ,
නිරුත්තිමහං වක්ඛාමි වචනං මෙ නිබොධථ.
පුඤ්ඤකාමෙන ථෙරෙන සුතෙන පියසීලිනා,
සිරිසද්ධම්මාලංකාර ඉති නාමෙන යෙන හි.
පොරාණෙහි කතං ගන්ථං චූලනිරුත්ති සඤ්ඤිතං.
ලිඛිතං තෙන පුඤ්ඤෙන සොහං බුද්ධො භවෙ ලොකෙ,
ඉමිනා පුඤ්ඤකම්මෙන යාව බුද්ධො භවාමහං.
මහොසධො ච ඤාණෙන ජොතිසෙට්ඨීව භොගිනා,
වෙස්සන්තරොව දානෙන හොතු මය්හං භවාභවෙ.”

18. මොග්ගල්ලායනවෘත්තිය—මීට මොග්ගල්ලායනය කියා සහ
මොග්ගල්ලායනව්‍යාකරණය, කියාද, වෘත්තිය යයි කියාද නොයෙක්
ලෙස ව්‍යවහාර කෙරෙත්—බුද්ධ වර්ෂ 1691 දී රජ පැමිණි පරාක්‍රම
බාහු රජ්ජුරුවන්ගේ කාලයෙහි අනුරාධපුර යෙහි ථූපාරාමයෙහි වැඩ
සිටිය මොග්ගල්ලායන මහාස්ථවිරයන් වහන්සේවිසින් විරචිත හෙ
යින් මේ ග්‍රන්ථයටද (කච්චායන අමරසිංහ යන නාමයන් මෙන්)
කර්තෘගේ නාමය ව්‍යවහාරයි—මුන්වහන්සේවිසින් පළමුවෙනි වරට
සූත්‍ර උදාහරණ යන දෙවර්ගය පමණක් සාදා දෙවෙනිව වෘත්ති
සෑදූ බව “මොග්ගල්ලානෙන ථෙරෙන යං සද්දසත්ථං රචිතං,
තස්ස වුත්ති පුන තෙනෙව රචිතා” යනාදියෙන් පෙනේ—එපමණ
තුත් නොව ඒ මොග්ගල්ලායනවෘත්තියගේ වර්ණනා සංඛ්‍යාත පඤ්චි
කාවද උන්වහන්සේවිසින්ම කළබව

“යං සද්ද සත්ථං රචිතං අනූනං
වුත්ති ච තස්සාථ කතා සමාසා,
තස්සාපි සංඛෙපනයෙන සො ච
සංවණ්ණනං දානි සමාරභෙය්‍ය.”

යනාදියෙන් පෙනේ—සම්බන්ධචින්තායෙහි අගදී ගාථාවකින්
සංඝරක්ඛිත ස්ථවිරයන්වහන්සේ විසින්ද මේ මොග්ගල්ලායන ස්ථ
විරයන්වහන්සේගේ ගුණ වර්ණනා කරණලද්දේ පමණක් නොව
උන්වහන්සේගේ උගත්කම ගැණ පඤ්චිකාප්‍රදීපයෙහිද

“යා ශක්තිඃ පාණිනෞ යා ච චාන්ද්‍රකාත්‍යායනාදිෂු,
යෙ ස්මෘතිමත් මනොඥ මෞද්ගල්‍යායනරූපිණී—” යනුද

“මහාවෛයාකරණකවිවරයන්විසින් ශබ්දශාස්ත්‍ර කරණයෙහි
දත්තාභිෂෙක ඇති භූමණ්ඩලමණ්ඩණසකලගණීගණයන්විසින්
සම්භාවනීයවූ ආචාර්‍ය්‍ය මෞද්ගල්‍යායන මහා ස්වාමිපාදයොයි—”
යනුද කියන ලදී-මුන්වහන්සේ සංස්කෘත ව්‍යාකරණාදියෙහි අපූරු
උගතෙක්සෙයින්ද කච්චායනයට පසුව එහිසියළු ශබ්දලක්ෂණයන්
බලාකරණලද්දක් හෙයින්ද කච්චායනයෙහි නොදක්වනලද සම
හරඅමුතුශබ්දලක්ෂණාදිය මොග්ගල්ලායනවෘත්තියෙහි තිබීමඅපූරු
වක් නොවේ නමුදු ඒවා ඉතාම ප්‍රයෝජනවත් ශබ්දලක්ෂණාදිය
බව පෙනේ—අකුරු 41 ක් බව කච්චායනව්‍යාකරණයෙහිදී කියන
ලද්දේ නමුදු මෙහිදී 43 ක්යයි කියන ලදී-කච්චායනයෙහි “තත්ථො
දන්තා සරා අට්ඨ” යන සූත්‍රය වෙනුවට මෙහි “දසාදො සරා” යන
සූත්‍රයයි—එසේම “අක්ඛරා පාදයො එකචත්තාලීසං” යන සූත්‍රය
වෙනුවට “අ ආදයො තිතාලීස වණ්ණා” යන සූත්‍රයයි—මේ ආදී

මේ ව්‍යාකරණ දෙකේ එකට එකක් වෙනස්නම් බොහෝය — මෙහි පරිච්ඡෙද බෙදීම කච්චායන ව්‍යාකරණයෙහි පිළිවෙළට නොව ආඛ්‍යාතය අගටය — සංඥාදිකාණ්ඩය, ස්‍යාදි කාණ්ඩය, සමාසකාණ්ඩය, ණාදිකාණ්ඩය, ඛාදි කාණ්ඩය, ත්‍යාදි කාණ්ඩය යි පරිච්ඡෙද සයය — සංඥාදිකාණ්ඩයෙහි සංඥා, හා සන්ධියි — කාරක කාණ්ඩයක් වෙන්වශයෙන් නැත්තේ කාරකලක්‍ෂණාදිය ද ස්‍යාදිකාණ්ඩයයි කියනලද නාමයෙහිම දක්වනු ලැබූහෙයිනි — ස්ත්‍රී ප්‍රත්‍යයන් ද සමාස කාණ්ඩයෙහිය — ණාදිකාණ්ඩය නම් තද්ධිතයයි — ඛාදි කාණ්ඩයනම් (කච්චායනාදියෙහි ආඛ්‍යාතයෙහි දක්වනු ලැබූ) “ඛ ඡ ස ඊය ආය ණය” යනාදිවූද අමුතුද ප්‍රත්‍යය කීපයක් හා කිතකයයි — පොතේ ක්‍රමය ද බාලාවතාර රූපසිද්ධි පයෝගසිද්ධි ආදිය මෙන් උදාහරණප්‍රධාන ක්‍රමයට නොව කච්චායන පාණිනී ආදිය මෙන් සූත්‍ර ප්‍රධාන ක්‍රමයටය — ප්‍රමාණය බණවර හයක්ය.

තොප්‍රත්‍යය පඤ්චම්‍යත්ථ සත්තම්‍යත්ථ දෙක්හි පමණක් කච්චායනයෙහි කියනලද්දේ නමුත් මොග්ගල්ලායන වෘත්තියෙහි ප්‍රථමාර්ථයෙහිද කියනලද්දේය — එනම්, “යතො” යනාදියයි — එසේම තො ප්‍රත්‍යය ලිඟයා කෙරෙන් පරව මුත් උපසර්ග නිපාතයන් කෙරෙන් පරව එනබව කච්චායනයෙහි නොකියනලද්දේය — මොග්ගල්ලායනවෘත්තියෙහි කියා තිබෙන්නේ මෙසේය — “අභ්‍යාදීහි — අභි ආදීහි තො හොති — අභිතො, පරිතො, පච්ඡතො, හෙට්ඨතො උපරිතො.”

තවද මේ මතු දක්වනු ලබන සමහර අර්ථවලට ඒ ඒ ප්‍රත්‍ය කච්චායනයෙහි දක්වා නැති නමුදු මොග්ගල්ලායන වෘත්තියෙහි
“මං පඤ්චාදිකතීහි - ඡට්ඨියන්තාය පඤ්චාදිකාය සංඛ්‍යාය කතිස්මා ච මො හොති පූරණත්ථෙ — පඤ්චමො, සත්තමො, අට්ඨමො, කතිමො, කතිමී. සතාදීනමි ච — සතාදිකාය සංඛ්‍යාය ඡට්ඨියන්තාය පූරණත්ථෙ මො හොති සතාදීන මිචාන්තාදෙසො — සතිමො, සහස්සිමො.

ඡට්ඨමා — ඡ සද්දා ඨ ඨමා හොන්ති තස්ස පූරණත්ථෙ — ඡට්ඨො, ඡට්ඨමො, ඉත්ථියං, ඡට්ඨී, ඡට්ඨමී.

එකා කාක්‍ය සහායෙ — එකස්මා අසහායත්ථෙ ක ආකී හොන්ති වා — එකකො, එකාකී.

වච්ඡාදීහි තනුත්තෙ තරො - වච්ඡාදීනං සභාවස්ස තනුත්තෙ ගම්‍යමානෙ තරො හොති — සුසුත්තස්ස තනුත්තෙ වච්ඡතරො, ඉත්ථියං වච්ඡතරී, යොබ්බනස්ස තනුත්තෙ ඔක්ඛතරො, අස්සභාවස්ස තනුත්තෙ අස්සතරො සාමත්ථියස්ස තනුත්තෙ උසභතරො.

කිම්හා නිබ්බාරණේ රතර රතමා—කිංසද්දා නිබ්බාරණේ රතර රතමා හොන්ති—කතරො භවතං දෙවදත්තො, කතමො භවතං කඨො, භාරද්වාජානං කතමොසි බ්‍රහ්මෙ.

තෙන දත්තෙ ලියා—තතියන්තා දත්තසද්දෙ ල ඉයා හොන්ති-දෙවෙන දත්තො දෙවලො, දෙවියො, බ්‍රහ්මලො, බ්‍රහ්මියො-සිවා-සිවලො, සිවියො-සිස්සදීසො.

රාජතො ඤ්ඤො ජාතියං—රාජසද්දතො ඤ්ඤො වා හොතපච්චෙ ජාතිසං ගම්‍යමානායං—රඤ්ඤො අපච්චං, රාජඤ්ඤො-ජාතියන්ති, කිං? රාජාපච්චං.

ඛත්තා ඊයා—ඛත්තසද්දා ය ඉයා හොන්ත පච්චෙ ජාතියං-ඛත්තස්සාපච්චං ඛත්‍යො, ඛත්තියො.

අමා ඨවෙච්චා-අමාසද්දතො අවෙච්චා හොති භවත්ථෙ—අමා භවො අමවෙච්චා.

පුරතො ණො ච—පුර ඉච්චස්මා භවත්ථෙ ණො හොති තනො ච—පුරාණො, පුරාතනො.

පිතිතො භාතරි රෙය්‍යණ්—පිතුසද්දා තස්ස භාතරි රෙය්‍යණ් හොති—පිතු භාතා පෙත්තෙය්‍යො.

මාතිතො භගිනියං ඡො—මාතිතො පිතිතො ච තෙසං භගිනියං ඡො හොති—මාතු භගිනී මාතුච්ඡා, පිතු භගිනී පිතුච්ඡා.

මාතාපිතුස්වාමහො—මාතාපිතුහි තෙසං මාතාපිතුස්වා මහො හොති—මාතු මාතා මාතාමහී, මාතු පිතා මාතාමහො, පිතු මාතා පිතාමහී, පිතු පිතා පිතාමහො."—මූල ගාථාව මෙසේය.

"සිද්ධ මිද්ධ ගුණං සාධු නමස්සිත්වා තථාගතං,
සධම්මසංඝං භාසිස්සං මාගධං සද්දලක්ඛණං."

අග ගාථා—"යස්ස රඤ්ඤො පභාවෙන භාවිතත්ත සමාකුලං,
අනාකුලං දුලද්ධි පාපභික්ඛූහි සබ්බසො.
ලංකාය මුනිරාජස්ස සාසනං සාධු සණ්ඨිතං,
පුණ්ණචන්ද සමායොගා වාරිධීව විවද්ධතෙ.
පරක්කමභුජෙ තස්මිං සද්ධා බුද්ධි ගුණාදිතෙ,
මනුවංසද්ධජාකාරෙ ලංකාදීප මපාසති.
මොග්ගල්ලානෙන ථෙරෙන ධීමතා සුචිවුත්තිනා,
රචිතං යං සුවිඤ්ඤෙය්‍ය මසන්දිද්ධ මනාකුලං.
අසෙස විසයව්‍යාපි ජිනව්‍යප්පථ නිස්සයං,
සද්දසත්ථ මනායාස සාධියං බුද්ධි විද්ධනං.
තස්ස වුත්ති සමාසෙන විපුලත්ථප්පකාසනී,
රචිතා පුන තෙනෙව සාසනුජ්ජොතකාරිනා."

19. මොග්ගල්ලායන පඤ්චිකාව-මෙයද "මොග්ගල්ලායනවෘත්ති" නාරක මුගලන් ආචාරීන්වහන්සේවිසින් මොග්ගල්ලායන වෘත්තිය සංක්ෂෙප ක්‍රමයෙන් වර්ණනාකිරීම්වශයෙන් සාදනලද භාණවර විස්සක පමණපොතකි-මීට "පඤ්චිකා" යන නාමයද "මොග්ගල්ලායනවෘත්ති විවරණ පඤ්චිකා" යන නාමයද පොත්වලදී ව්‍යවහාර කරතිබේ-මීට සංඝරක්ඛිත මහාසාමිපාදයන් වහන්සේ විසින් සාදනලද "සාරත්ථවිලාසිනී නම්වූ" ටීකාවක්ද, තොටගොමුවේ සාමීන්ද්‍රයන් වහන්සේවිසින් සාදනලද පඤ්චිකාප්‍රදීපනම්වූ මාහැඟිසන්නයක්ද තිබෙන නුමුත් මුල් පොත හා ටීකාවද යන දෙකම සොයා ගැණීම ඉතාම දුෂ්කරය-සුබොධාලංකාර, වුත්තොදය, සම්බන්ධචින්තා, ඛුද්දසික්ඛාටීකා යනාදිය කළාවූ සංඝරක්ඛිතනම් සාමිපාදයන් වහන්සේවිසින් මොග්ගල්ලායනව්‍යාකරණයට උපකාරවූ "සුසද්දසිද්ධි"නම් පොතක් කළ බව සම්බන්ධචින්තාදියෙහි කියා තිබෙන නිසා ඒ පඤ්චිකා ටීකාවයයිද සමහරු කියත්.

සම්බන්ධචින්තායෙහි

"සුසද්දසිද්ධි යො යොගනිච්ඡයං සබ්භි වණ්ණිතං,
අකා සුබොධාලංකාරං වුත්තොදය මහාකුලං."

ටීකාවෙහි.

"යොගනිච්ඡයභූතං සුසද්දසිද්ධි නනාමකං මොග්ගල්ලායන ව්‍යාකරණොපකාරභූතං පකරණඤ්ච අකාසි..." යනුයි.

පදසාධනී ටීකාවෙහිද-"සංඝරක්ඛිත මහාසාමිනා ච පඤ්චිකා ටීකායං කච්චායනෙ මිතීහි තියොච්චාදීනං ආසංකාය කාරණ මුපදෙසෙත්වා වුත්තියං දුතියස්සාති ආදිනා සුත්තෙකදෙසා දස්සිතානි තානි සම්පුණ්ණං කත්වා දස්සෙත්වා දුතියස්සාති ආදිනා චතුත්ථන්තියාන මිච්චාදිනා ච වුත්තානීති විවරිතං" කියා තිබේ-"පඤ්චිකා" නාමය සංස්කෘතයෙන් ගෙණ ව්‍යවහාර කරණලද්දකි-චන්ද්‍රගෝමින්විසින් කරණලද පඤ්චිකාවකට (විනයටීකාදිය කළ) සාරිපුත්‍ර මහාසාමිපාදයන් වහන්සේවිසින් පඤ්චිකාලංකාර නම්වූ ටීකාවක් කළබව දාඨාවංසාදියෙහි කියනලදී—ත්‍රිලොචනදාස විරචිත පඤ්චිකාවක්ද-රත්නමතිපාද විරචිත චාන්ද්‍රපඤ්චිකාවක්ද-කාශිකාවෘත්ති පඤ්චිකාවක්ද—කාතන්ත්‍ර ව්‍යාඛ්‍යාණ පඤ්චිකාවක්දැයි සංස්කෘතයෙහි පඤ්චිකා බොහෝයි—මොග්ගල්ලායන පඤ්චිකාවෙන් හා ටීකාවෙන්ද ගෙණ ලියනලද වාසගම් කච්චායනසාර ටීකා පදසාධනී ටීකාදියෙහිද තිබේ—මෙකියනලද පඤ්චිකාව හා ටීකාවද දැනට තිබුවටම නැතිවී ගොස්යයිද සමහරු කල්පනාකර තිබේ.

මූල ගාථා මෙසේය.

1. "මහාදයො සො ජනතාභිතාය
සම්බොධි සම්පාපක ධම්ම ජාතං,
සම්පූරයං දුක්ඛ මනන්තරූපං
අභින්න රූපොනු භවී සුඛංච.

2. තං ධම්ම රාජං ජිත මාර වීරං
සුධන්ත සොවණ්ණනිභං නමිත්වා,
පධංසි මොහන්ධතම ච ධම්මං
සංඝං තථා සංඝපිතං ගුණෙහි.

3. යො ඉද්ධිමන්තෙසු මහන්ත පත්තො
තන්නාමධෙය්‍යෙන තපොධනෙන,
යං සද්දසත්ථං රචිතං අනූනං
වුත්තී ච තස්සාථ කතා සමාසා.

4. තස්සාපි සංඛෙප නයෙන සොව
සංවණ්ණනං දානි සමාරභෙය්‍ය,
තං සාරභූතං විපුලත්ථ ගාහිං
අනාකුලං සාධු සුණන්තු සන්තො."

අගට ගාථාවක් නැත.

"සමත්තාවායං මොග්ගල්ලායන පඤ්චිකාවීසති භාණවාරෙහි" නිඨාය.

---

20. පඤ්චිකාප්‍රදීපය–මෙය මොග්ගල්ලායන පඤ්චිකාවට තොටගොමුවේ ෂඩ්භාෂා පරමේශ්වර ශ්‍රී රාහුලස්වාමිපාදයන් වහන්සේවිසින් ශක වර්ෂ 1379 දී(එනම් මීට අවුරුදු 417 කට ප්‍රථම)සාදනලද ඉතා මාහැඟි සන්නයකි—තොටගොමුවේ සාමින්වහන්සේ මෙම පඤ්චිකා ප්‍රදීපයෙහි පෙනෙන වර්ෂයට වර්ෂ 14 කට පසු සංඝරාජව වැඩසිටිය බව කාලකණී ප්‍රකරණයෙහි පෙනෙන හෙයින් පදසාධනී ටීකාව සාදනලද්දේ ඒ කාලයෙහිය—මෙම පඤ්චිකා ප්‍රදීපයේ මනොහරතාවය ඇඟවීම පිණිස බොහෝ කාරණා කියයුතු නුමුත්, ශ්‍රීපාදසංඝනයෙහි නායක පදවියලත් සිප්කඩුවේ සුමංගලසාමින් වහන්සේ විසින් කාව්‍යශෙඛර සන්නයෙහිදී කියනලද—"පඤ්චිකාප්‍රදීපය මත් ළුන්වහන්සේගේ ව්‍යක්තතාවයේ තත්වය ප්‍රකාශ වීමට සෑහේමය" යන්න එසේම බව මෙහිදී අපිද කියමු—මෙහි බොහෝ

සෙයින් උදාහරණ කර තිබෙන්නේ පාණිනි ව්‍යාකරණයෙන් හා මුදු මෙහි පනත නම් ජෛන පොත් 50 කින් සහ තවත් පොත්ව ලින්ද කාරණා දක්වා තිබෙනුය—ඒ නම්.

1. කච්චායන.
2. න්‍යාස.
3. න්‍යාසප්‍රදීප.
4. නිරුත්තිමඤ්ජුසා.
5. රූපසිද්ධි.
6. රූපසිද්ධි සන්න.
7. රූපසිද්ධි ගැටපද.
8. බාලාවතාර.
9. බාලාවතාර සන්න.
10. සද්දනීති.
11. චූලනිරුත්ති.
12. නිරුත්තිපිටක.
13. සුත්තනිද්දේශ.
14. සම්බන්ධචින්තා.
15. පදසාධන සන්න.
16. පඤ්චිකා ටීකා.
17. පයෝගසිද්ධි.
18. දික්සඟි ටීකා.
19. භෛසජ්‍ය මඤ්ජුසා සන්න.
20. අභිධානප්පදීපිකා.
21. ධාතු.
22. මහාභාෂ්‍ය.
23. භාෂ්‍යප්‍රදීප.
24. ලඝුවෘත්ති.
25. දුර්ගසිංහවෘත්ති පඤ්චිකා.
26. පඤ්චිකාලංකාර.
27. කාතන්ත්‍ර.
28. ශබ්දාර්ථචින්තා.
29. සාරස්වත.
30. කාශිකා.
31. කාශිකාවෘත්ති.
32. වාර්තිකා.
33. භාගවෘත්ති.
34. සාරසංග්‍රහ.
35. පදාවතාර.
36. ශ්‍රීධර.
37. වෛජයන්ති.
38. අභිධර්මකොෂ.
39. අමරකොෂ.
40. මෙදිනීකොෂ.
41. ප්‍රාකෘතප්‍රකාශ.
42. වෛද්‍ය පොත්.
43. රාමායන.
44. බාහට.
45. භරතශාස්ත්‍ර.
46. ජාතකසන්න.
47. උම්මග්ග ගැටපද.
48. රතනසුත්ත ගැටපද.
49. දෙමලජාතක ගැටපද.
50. විරිත සන්න.

යන මේආදි පොත්වලිනි—මෙහි න්‍යාසයට "කච්චායනවුත්තිවණ්ණනා" කියාද, කච්චායනයට "කච්චායනවුත්ති" කියාද ව්‍යවහාරකර තිබේ—මුල් පොතේ වචන විස්තර කිරීම් ඇර උන්වහන්සේගේ විනිශ්චයන්ද බොහෝවත් ඇර මුල් පොතේ සමහර කියමන් ගැණ උන්වහන්සේගේ කල්පනාව වෙනස් බවද ඇඟෙන්ට තිබේ—ඒ බව පඤ්චිකාප්‍රදීපයෙහි මේ කියමනෙන් බලනු.

“භිය්‍යෝ සො මත්තාය, යී විභක්ත්‍යන්ත පදප්‍රතිරූපක නිපාත පද
“සේකැයි යනු ආචාර්‍ය්‍යයන්ගේ අභිප්‍රාය වුවද ‘මත්තාය’ යන
“තැන්හි ‘මත්තා සුඛපරිච්චාගා’ යනාදියෙහි මෙන් ස්ත්‍රී ලිඞ්ගයෙහි
“වැටෙන්නාවූ මත්තා ශබ්දයා කෙරෙන් පඤ්චමී විභක්ති වූ තැනි-
“භිය්‍යොසොති ඉදං භිය්‍යො සද්දෙන අතිරෙකත්ථ වාචකෙන
“නිපාතෙන සමානත්ථං නිපාත පදං’ යී පුරාතනයන් කීහෙයින්
“‘භිය්‍යො සො’ යනුද අතිරේකාර්ත්ථ වාචකවූ භිය්‍යො ශබ්දයා හා
“සමාන නිපාත පදයකැයි යනු යුක්තයි—මාත්‍රයෙන් අධිකයයි
“අර්ත්ථ කිය යුතු—පුරාතනාර්ත්ථ කථාචාර්‍ය්‍යවරයෝද ‘භිය්‍යො සො
“මත්තායාති අතිරෙකප්පමාණෙන’යී කීහු—රූපසිද්ධිසන්න ගැට
“පද කාරයෝ ‘මත්තාය, පමණට, සො, එතෙමැ, භිය්‍යො, බො
“හෝ විය’ යී අර්ත්ථ කීහු—එසේ කී කල්හි මෙහි ‘එත්ථ භිය්‍යො සො
“මත්තාය’ යනාදීන් දක්වනලද පුනරුක්ත දෝෂය පැමිණෙයි දත
“යුතු”—යනුයි.

තවද ක්‍රියාවිශේෂණය ගැණ පඤ්චිකා ප්‍රදීපයෙහි “ආඛ්‍යාතෙ
“නොඩ්ඪමානස්ස කත්තාඩරූපස්ස චලනස්ස ථොක ගුණෙන සමා
“නාධිකරණත්තෙන විසෙසනං’ යී සඞ්ඛ්‍යායි—‘ථොකං චලති’ යන
“මෙහි ‘සර්වෙභ්‍යො ධාත්වර්ත්ථ කරෙත්‍යෙනෙන ව්‍යපතඃ’ යනු හෙයින්
“චලනං කරෙති යනු අර්ත්ථය, එහෙයින් චලනං යනුද කර කර
“ණ යන ධාතූහුගේ ක්‍රියාවට කර්ම්මයැ, ඒ චලනං යන කර්ම්ම පදය
“භාවයෙහි වූ අනප්‍රත්‍යයන්ගේ නපුංසකලිඞ්ග බව හේතුකොට
“ගෙණ නපුංසකලිඞ්ග වෙයි චලන මාත්‍රයාගේ අනෙකත්වයෙහි
“යෙදීමක් නැතිහෙයින් එකවචනාන්තද වෙයි ථොකං යනුද ඒ
“චලනං යන්නට විශේෂණ නම් වී—එහෙයින්ම කීහ.

සම්බන්ධචින්තායෙහි.

“ක්‍රියාවිසෙසනං යන්තු තං සබ්බම්පි නපුංසකෙ,
දුතියායෙකවචනං ගති තස්ස හි තාදිසී.”

තවද කච්චායනයෙහි ජායා ශබ්දයාහට පති ශබ්දයා පර කල්හි තුදං ජනි යන ආදෙශ දෙකක් “ජායාය තුදං ජානි පතිම්හි” යන සූත්‍රයෙන් වන බව කියා තුදම්පති, ජනිපති, යන උදාහරණ දෙකක්ද දක්වා තිබෙන හෙයින් අභිධානප්‍රදීපිකායෙහිද ඊට සමාන වන ලෙස “ජායාපති ජනිපති ජයම්පති තුදම්පති” යනාදී ගාථාවෙහිද “ජනිපති තුදම්පති” යන නාම දෙක කියනලද්දේ නමුදු පඤ්චිකා ප්‍රදීපයෙහි ඒ ගැණ මෙසේ කියනලදී—“සමහර අභි
“ධානප්‍රදීපිකා පොතෙක ජයම්පති තුදම්පති කියා පෙනෙයි, එම

"සන්ධියෙහි ජායම්පතීය දම්පතී යයි විභාග කොට ලිහෙයින් "ජයම්පතී ච දම්පතී යනු සුබ පාඨයයි දත යුතු—මෙහිද ජං යනු "අසංඛ්‍යයයි කීහ. ආචාර්‍ය්‍ය සර්‍වගුණාකර මහාස්ථවිරයන්විසින් "වනානි 'ජායාය දං ජං ජානියො පතිම්හි" යන සූත්‍රයෙන් ජායා "ශබ්දයානට දං ජං ජානි ආදෙශ කරණලදැයි දතයුතුයි"—යනුයි. මේ කියමනද සර්‍වප්‍රකාරයෙන් සැලකිය යුතු ස්ථිර කියමනක්ය—එසේ නමුදු අභිධානප්‍රදීපිකාවෙහි යථෝක්ත පාඨය ප්‍රමාද ලියවිල්ලකැයි සිතීමද ඉතා දුෂ්කරවා මෙන්ම පාලියෙහිද ජම්පතී, දම්පතී, යනු මිස "තුදම්පතී" යන නාමයක් දැකීමද දුෂ්කරයි.

එහි මූල ගාථා මෙසේය.

"සම්බොධි නිම්මල පයොධි සමුබ්භවස්ස
යස්සුජ්ජලන්ත වචනප්පුති ගන්ථාතීහි,
සංකොච මෙනති පරවාදි මුඛාරවින්ද
වන්දෙ සදා තමතුලං මුනිරාජචන්දං.

ආදිච්චවංස කමලාකර භාකරෙන
රාජින්දමොලි මණිරංජිත සාසනෙන,
ලංකිස්සරෙන මය මනුජ පෙමබුද්ධා
සංවඩ්ඪිතා පිතුපදාධිගතෙන යෙන.

සද්දන්තරෙ ච විවිධෙ සමයන්තරෙ ච
භාසන්තරෙ ච සකලෙ පිටකත්තයෙ ච,
ආචෙරභාව මුපගම්ම භජාම පීතිං
දීඝං සජීවතු පරක්කමබාහු රාජා.

මොග්ගල්ලායනාචරිය ථෙරෙන ධීරබුද්ධිනා
කතා යා පඤ්චිකා සුබා ගුළ්හභාවා සවුත්තියා.
වඤ්ඤාතුන ම කොසල්ලා නාසිතා චිරමන්තරෙ,
සා ටීකායපි දුබ්බොධා සද්දන්තර නයාකුලා.
තස්මා සීහළභාසාය තිමුනායාදීහි භාසිතං,
ලක්ඛණං දස්සයිත්වාන දීපො තස්සා විධීයති."

අග—"රම්මෙ විහාරපවරෙ හුවි තිත්ථගාමෙ
ථෙරො මහා විජයබාහු නිවාස වාසී,
වාචිස්සරො විදිත රාහුලසාමි නාමො
දීපං අකාසි පඨන මපත් පඤ්චිකාය.

අග ගාථා.

පරත්ථාය මයා ලද්ධං යං කත්වා පදසාධනං.
පුඤ්ඤඤ්ජන තෙන ලොකොයං සාධෙතු පදමච්චුතං.

සද්ධාසයෙන පරිසුද්ධ ගුණොදිතෙන
සාරෙන සාරයතිසංඝ නිසෙවිතෙන,
රම්මෙ පුරත්ථනගරෙ වසතාම්බුජේන
විචාලිනං නිජ්ජවිසුද්ධ කුලද්ධජෙන.

මානෙනෙත්තන තථාගතං පටිපද යොගෙන සද්ධාලුනා
නිද්ධං බද්ධනපොනලෙහි නිඛිලප්පාපාරිසන්තාපිනා,
සද්ධම්මවහයසීලනෙසු ඕතියා චාමීකරත්ථාලිනා
නානාවාදි කුදිට්ඨිභෙද පටුනා වානීවධූසාමිනා.

සත්තානං කරුණාවතාගත වතා පාරම්පරන්ධම්මතා
ථෙරෙනාතුම පාදපජ්ජරගතො යො සද්දසත්ථාදිසු,
මොග්ගල්ලායන විස්සුතෙනිවස්සුවණ්ණාපො විනීතො යථා
සොකාසිප්පිඤ්ජදස්සිනා යති නිමං බද්ධන්තං සුබප්පත්තියා,

වුත්තො ච වුත්තමුපභොගිනියා සකාය
පිනප්පයොධර වනාපගසෙවිකාය,
රම්භාවිහාර වධූයා තිලකා තුලෙන
සන්තෙන කප්පින සම්වහය මාතුලෙන."

තවද මෙම පොත් දෙක ගැණ කියයුතු කරුණක්නම් බුරුම රටේ පොත්වල පත්ඉරුවක් පාසා මොග්ගල්ලායන වෘත්තියට "මූලමොග්ගල්ලාන" කියාද පදසාධනයට "වුත්තිමොග්ගල්ලාන" කියාද ලියා තිබෙනවා පමණක් නොව මෙහි (පදසාධනයේ) තද්ධිතකාණ්ඩය ලඟට "ණ්වාදි කාණ්ඩය" යන නමින් ඉතා ප්‍රයෝජනවත් (නාම සමාස දෙකටත් ලොකු) කාණ්ඩයක් තිබෙනුය—එය ලංකාවේ පොතක ඇත්බව දැනගණ්ට නැතුවත් ඇර එහි ක්‍රමය කච්චායන ව්‍යාකරණයෙහි උණාදි කාණ්ඩය මෙන්ය එය මේ පදසාධන, මොග්ගල්ලායන, යන පොත්දෙකේ කතෘභූත ආචාර්‍ය්‍ය දෙනමගෙන් නමක් නොකරණ ලද්දේනම් ඒතරමේ වෙන උගතෙක් විසින් සෑදිය යුක්තක්බව පෙනේ—

එහි මූලපටන් ගැණ්ම—"බහුලං ක්‍රියත්ථං ති ච සද්දා වත්තන්තෙ" කියාය—ඒලඟ සූත්‍රය හා වෘත්තියද උදාහරණද මෙසේය.

“ චර දර කර රහ ජන සන තල සාද සාධ කස අස චටාය වා හි ණු—චර ගති භක්ඛණෙසු දර දරණෙ කර කාරණෙ රහ චාගෙ ජන ජනනෙ සන සම්භත්තියං තල පතිට්ඨායං සද අස්සාදනෙ රාධ සාධ සංසිද්ධියං කස විලෙඛණෙ අස ඛෙපනෙ චට භෙදනෙ අය ඉති ගමනත්ථා (දණ්ඩකො ධාතු) වා ගති බන්ධනෙසු එතෙහි ක්‍රියත්ථෙ හි බහුලං ණු හොති—අස්සා ණානුබන්ධෙනෙති උබන්ධස්ස අස්ස ආ. චරන්ති හදයෙ මනුඤ්ඤභාවෙනාති, චාරු—සොභණං—දරීයතී ති දාරු—කට්ඨං—කරොතී ති කාරු-සිප්පි, මඤ්චා විස්සකම්මො ච—ර හති චන්දාදීනං සොභාවිසෙසං නාසෙතීති රාහු—අසුරින්දො—ජායති ගමනා ගමනෙනාති ජානු-ජංඝොරූනං සන්ධි-සනොති අත්ත නි හනතිං උප්පාදෙතීති සානු-ගිරිප්පදෙසො—තලන්ති පතිට්ඨහන්ති එත්ථ දන්තාති තාළු—වදනෙකදෙසො—සාදීයති අස්සාදීයතීති සාදු-මධුරං—සාධෙති අත්තපරහිතන්ති සාධු—සජ්ජනො—කසීය තීති කාසු—ආවාටො—අසති සීඝභාවෙන පවත්තතීති ආසු-සීඝං—චටති හින්දති අමනුඤ්ඤභාවන්ති චාටු—මනුඤ්ඤා-අයන්ති ප වත්තන්ති සත්තා එතෙනාති ආයු-ජීවිතං—වාති ගච්ඡතීති වායු-වාතො ”—අග මෙසේය,

“ පාතො ළි—පාතිස්මා ළි හොති—අත්ථං පාති රක්ඛතීති පාළි—තන්ති.

විතො ළු—වෙතිස්මා ළු හොති-වෙති පවත්තතී ති වෙළු-වෙණු.

ඉති මොග්ගල්ලායනව්‍යාකරණෙ ණ්වාදි වුත්ති සමත්තා.

සුත්ත ධාතු ගණො ණ්වාදි නාමලිඞ්ගානු ගාහණං,
යස්ස තිට්ඨති ජිව්හග්ගෙ ස ව්‍යෙය්‍යාකරණකෙසරී.”

---

22. පදසාධන ටීකාව-මෙහි නාමය “බුද්ධිප්පසාදනී” කියාය, සපත රත්න ප්‍රතිරාජනිවාසවාසී “ දීපංකර ” නම් ස්ථවිරයන්වහන්සේගේ ආරාධනාවට වාචිස්සර මහාසංඝරාජ ස්වාමිපාදයන්වහන්සේ (ඒනම් තොටගමුවේ ෂඩ්භාෂා පරමේශ්වර ශ්‍රීරාහුල ස්වාමින්වහන්සේ) විසින් සාදනලදී— මුන්වහන්සේට සංඝරාජ තනතුර ලැබෙන්ට ප්‍රථම පඤ්චිකාප්‍රදීපය සාද, සංඝරාජ තනතුර ලැබුනායින්පසු මෙය ඇදූබව මෙම පොත්දෙකේ අවසාන ගාථාවලින් හැඟෙන්ට තිබෙනුය— කතෘගේ නාමයෙන්ම මෙම පොත අපූරුඑකක්බව ලෝකයා සිතනවා ඇතුවාක් මෙන්ම පොතද අපූරු තරමටම ප්‍රයෝජන වත්ය—කච්චායන, නිරුත්තිපිටක, චූලනිරුත්ති, න්‍යාස, මොග්ග

ල්ලායනවුත්ති, පඤ්චිකාටීකා, යනාදි පාලිව්‍යාකරණපොත්ද, පාණිනී, චාන්ද්‍ර, වාර්තිකා, මහාභාෂ්‍ය, වෘත්තිපඤ්චිකා, ශබ්දලක්ෂණ, ප්‍රත්‍යක්ෂාණභාෂ්‍ය, පඤ්චිකාලංකාර, දෞගීසිංහ, යනාදි සංස්කෘත පොත්ද සඳහන්කර තිබෙනවා පමණක් නොව ඒ සමහර ආචාර්‍ය්‍ය මතයන්ද ගෙණහැර දක්වීමෙන් පොත අලංකාරකොට තිබෙනුය—කච්චායන ව්‍යාකරණයෙහි කියනලද සමහර කියමන්ගැණ විරුද්ධවද කථාකරතිබේ-වෙන ටීකාවල මෙන්ම මුද්‍රපොතේ සියළුම පද වර්ණනා කොට නැති නුමුත් විස්තාර කටයුතු එකම පදයක්වත් අත්ඇරලා නැත—සන්නයේ තිබෙන සමහර දෙසද පෙන්වා තිබේ—පොතේ ප්‍රමාණය පදසාධන තුනත්තරමය—මේපොත වෙනුවෙන් කියන්ට තිබෙන තවත් වැදගත් කාරණක්නම්, 1874 අවුරුද්දේදී කොළඹ වාසල ලුවිස්ද සොයිසා මුදලිමන්ත්‍රීශ්වරයානෝ උතුමානන් වහන්සේගේ අවසරය පිට පාළිපොත් සෙවීම පිණිස සත්කෝරළයට ගොස් එන්ට ප්‍රථම "පදසාධන ටීකාව" යන නමින් පොතක් ඇති බව පානරවේ උගත් නූගත් කිසිවෙක් ආරංචියකින් වත් පොතකින්වත් දැනගෙණ තිබුනේ නැතිබව ඇත්තකි—මෙම පොතෙන් ලැබිය හැකි උදාරතර ප්‍රයෝජනද, තවත් අමුතුපොත් කීපයක් ආණ්ඩුවට සොයාදුන්නාවූ යථෝක්ත මුදලිතුමා සත් කෝරළේ රිදී විහාරයෙහි තිබී සොයා ගෙණෙනලද අවුරුදු දෙ තුන්සියයකට ඉස්සර ලියනලද දිරාගිය ඒ පොත තීන්දුවට දිරාගියාම පදසාධන ටීකාවක් ලෝකයෙහිම නැතිවෙන්ට තිබුනුබවද කල්පනාකලාම, මේ පොත සොයා ගෙණවුත් අප අතට දුන්නාවූ මුදලිතුමාට සහ ඊට ආධාරකළ උතුමානන්වහන්සේටද ශබ්ද ශාස්ත්‍රාර්ථීන්විසින් පමණක් නොව සියළු දෙනාවිසින්ම සතුති කට යුතුවන් අ.ර අමුතු පොත් සෙවීම පිණිස ආණ්ඩුව විසින් කළාවූ උත්සාහයේද වියදමේද ඵලයට මෙම පොතම මදිනැත.

එහි මූලගාථා මෙසේය,

"*කල්‍යාණ රූපමචලං සුරසත්ථ වුත්ති
මාදිච්චරාජසරණ ම්භුවනප්පතිට්ඨං,
සබ්බුත්තරං වරසුධම්මමනෙකවණ්ණං
වන්දෙ පසිද්ධ රතනං මුනිරාජමෙරුං.

* මේ ගාථාව සුවලාණීයි.

සම්පන්නලක්ඛණපද මුදුවණ්ණරූපා
දීඝප්පමාණනයනා මුනිරාජවාණී,
සම්භාවිතා සවණ්ණදස්සනු පාසනෙහි
සත්තා නතා පම්පනීය තනොතු නන්දිං,

භත්‍යා නතා මිතනර සුරදෙවරාජ
කොටීරකොටි මණිජප්පද චුම්බිතානි,
තම්බඞ්ගුලීතන්දලෙ නඛකෙසරානි
සංඝස්ස චාරු චරණම්බුරුහානි සෙවෙ.

සද්දානු සාසන පවීණ ගුරූපදෙස
වාණීපවෙණි මවලම්බිය සාරභූතං,
සංඛිප්ප සාසය පදත්ථ විභාවනාය
ටීකං කරෙමි සුගමං පදසාධනස්ස."

ය ශබ්දයෙන් පරව ප්‍රථමාවිභක්ත්‍යර්ථයෙහි තො ප්‍රත්‍යයව සිද්ධවූ "යතො" යන පදය ගැණ දක්වනලද පාඨයක් මෙසේය. "ආද්‍ය දීඝිති සුත්තෙන පඨමන්තා තොප්පච්චයො, විගතාභිලොපො, යතො සද්දතො පඨමෙකවචනං සි, 'අසංඛ්‍යෙහි සබ්බාසං'ති තස්ස ලොපො—සිංහලභාසාය කතෙ පදසාධනවිවරණෙ යන්ති රූපං සත්ථාමිච්ඡන්තො වන්තන්තීති මනත්වා යං යස්මින්ති" සත්ථාමිච්ඡන්තො යතොති හොතීති වුත්තං, තම්පන අසල්ලක්ඛෙත්වා ලිඛිතං—තථාහි, ආද්‍ය දීඝිති එත්ථ වුත්තියං යතොදකං තදාදිත්තං යං උදකං තදෙවාදිත්තන්ති උදාහරණෙ සාරත්ථවිලාසිනියං * පච්කාටීකායං යන්තිපඨමන්තා තොම්හි යතොති වුත්තත්තා ච, පඨමන්තා යතොදකං තදාදිත්තන්ති පයොගසිද්ධියං පඨමන්තා තොප්පච්චයස්ස දස්සිතත්තා ච අමෙහි දස්සිතො රූපසාධනක්කමොව සාරතො පච්චෙතබ්බො."
"ධා සංඛ්‍යාහි" යන සූත්‍රය ගැණ දක්වනලද ටීකාපාඨය මෙසේය. 'ධා සංඛ්‍යාහි—සංඛ්‍යාවාචීනං සද්දානං සංඛ්‍යාසද්දෙන ගහිතත්තා අත්ථප්පධානනිද්දෙස මාහ සංඛ්‍යා වාචීහීති—පාණිනියවුත්ති කාරෙන ජයාදිච්චෙන "සංඛ්‍යාය විධාර්ථෙ ධා" ති එත්ථ සුත්තෙ විධා පකාරෙ සච ක්‍රියා විසයො ඉහ ගය්හති ක්‍රියාපකාරෙ වත්තමානාය සංඛ්‍යාය ධාප්පච්චයො, එකධා භුඤ්ජති, ද්විධා භුඤ්ජති, ද්විධා ගච්ඡතීති. ආදිනා ක්‍රියාවිසයො යෙවෙත්ථ පකාරෙ ගහිතො, චාන්ද්‍රා ච මොග්ග

* පච්කාටීකාවෙහි නාමය "සාරත්ථවිලාසිනී" කියාබව මෙහි පෙනෙන "සුසද්ද සිද්ධි" යනු මොග්ගල්ලායන ව්‍යාකරණයෙහි වෙන පොතකි.

ල්ලායනා ච දඩ්ඪගුණක්‍රියාවිසයෙ එව පකාරෙති පටිපනානා නව ධා දඩ්ඪං බහුධා ගුණෙනාති ච උදාහරනති"යනුයි.

අග ගාථා මෙසේය.

"සාරිපුතත මහාදිසාමිප්ජනනෙ ජාතසස සමභාවිතෙ
නතතා උතතර මූලරාහුලමහාථෙරසස සිකඛාංගරු,
විඛ්‍යාතො පදවාක්‍ය තකකකුසලො වාදීභසීහො සුධී
සො වාචිස්සර සංඝරාජ පවරෙ ව්‍යාඛ්‍යාසි ටීකං ඉමං.
ගඟාතටාංකිය කාරමහාවලනවයෙන
යා සතත රතන පතිරාජ නිවාසිතෙන,
දීපංකරෙන යතිනා කථිතා විධාතුං
සංසිද්ධි මාප පදසාධන වණණණනා සා."

---

23. පයොග සිද්ධිය—ලංකාද්වීපයෙහි "ධූමදෙණී" නම් විහාරයෙහි වැඩසිටිය සුමංගල මහාසථවිර සවාමිපාදයන්ගේ ශිෂ්‍යයෙකුවූ හෙවත් උන්වහන්සේගේ ශිෂ්‍යවූ ත්‍රිපිටකධූරන්ධර වනරතනමෙධංකර මහාසථවිරයන් වහන්සේවිසින් විරචිතයි—මූන්වහන්සේ පරාක්‍රම බාහු මහරජුගේ අනුජාත පුත්‍රවූ භුවනෙකබාහුරජවිසින් සිව්පසය යෙන් උපස්ථාන කරණු ලැබූ කෙනෙක්බවද කියා තිබේ—මෙ පොත සාදාතිබෙන ක්‍රමය නම් කච්චායන ව්‍යාකරණයට රූපසිද්ධිය යම්සේද එසේමය—ප්‍රමාණයෙන් රූපසිද්ධියට කුඩා නැත—මොග්ගල්ලායන ව්‍යාකරණයට අයිති පොත්වලින් හැමටම වඩා ලොකු පොත මේකය—මොග්ගල්ලායනවෘත්ති, පදසාධන යන දෙකෙහිම නොකියනලද සමහර පදසිද්ධි ක්‍රමාදියද මෙහි කියනලද්දේ පමණක් නොව කච්චායනයට මොග්ගල්ලායන වෘත්තිය විරුද්ධ වාටත් වඩා මෙහි රූපසිද්ධියට විරුද්ධව කථා කර තිබේ—රූපසිද්ධියෙහි (සංස්කෘතයෙහි මෙන්ම) පරස්වරවූ ඉවර්ණ උවර්ණයන්ට වන් නාවූ අසවර්ණාදෙශය පූර්වස්වර අවර්ණයාට ලොප්කළ කල්හිම මිස වෙන ස්වරයන් ලොප්කළ කල්හි නොවන බව කියනලද්දේ නමුත් වෙන ස්වරයන්ට ලොප්කළ කල්හිද වෙනබව පයොග සිද්ධියෙහි (අති+ඉව, අතෙව—වි+උදකං, වොදකං—යන උදාහරණ සහිතව "ඉදං පච්ඡිමොදාහරණද්වයං අවණ්ණෙ ලුත්තෙත එ ඔ හොනති ගාහ නිසෙධනත්ථං" යන්නෙන්) කියනලදී—බහුලාධි කාරය ගැණ "බහුලාධිකාරං කප්පදුම මිව මඤ්ඤනති සද්දිකා"යි කියනලද්දේ පමණක් නොව ඒගැණම සංස්කෘත පොත්වල කියනලද.

"ක්වචිත්ප්‍රවෘත්තිඃ ක්වචිද ප්‍රවෘත්තිඃ
ක්වචි විභාෂා ක්වචි දන්‍යදෙව,
විධෙර්විධානං බහුධා සමීක්ෂ්‍ය
චතුර්විධං බාහුලකං වදන්ති."

යන ශ්ලොකයද, පඤ්චවිධ නිරුක්තිය ගැණ කියනලද

"වර්ණාගමො වර්ණ විපර්යයශ්ච
වෞචා පරෞ වර්ණ විකාරනාශෞ,
ධාතොස්තදර්ථා තිශයෙන යොගඃ
තදුච්‍යතෙ පච විධං නිරුක්තං"

යන ශ්ලොකයද මෙහි එමක්‍රමයෙන්ම ගාථාවලට නගා තිබේ.

ඒ මෙසේය— "ක්වචි පපවත්ති ක්වචිදප්පවත්ති
ක්වචිබ්භාසා ක්වචි දඤ්ඤදෙව,
විධිබ්බිධානං බහුධා සමික්ඛ
චතුබ්බිධං බාහුලකං වදන්ති.

වණ්ණාගමො වණ්ණවිපරියයො ච
වෙචා පරෙ වණ්ණවිකාරනාසා
* ධාතුස්ස අත්ථාතිසයෙන යොගො
තදුච්චතෙ පචවිධං නිරුත්තං."

---

* මහානිද්දෙසඅට්ඨකථාවෙහි—"වණ්ණාගමො වණ්ණවිපරියායො..."
ධාතූනමත්ථාතිසයෙන යොගො,
තදුච්චතෙ පඤ්චවිධං නිරුත්තිං.

තත්ථ නක්ඛත්තරාජරිව තාරකානන්ති එත්ථ රකාරාදයො විය අවිජ්ජමානස්ස අක්ඛරස්ස ආගමො වණ්ණාගමො නාම, හිංසනා හිංසොති වත්තබ්බෙ සීහොති විය විජ්ජමානක්ඛරානං හෙට්ඨුපරියවසෙන පරිවත්තනං වණ්ණවිපරියායොනාම, නවෙ ච්ඡනකෙ දානෙ නෙබ්යතීති (?) එත්ථ අකාරස්ස එකාරාපජ්ජනතා විය අඤ්ඤක්ඛරස්ස අඤ්ඤක්ඛරාපජ්ජනතා වණ්ණවිකාරො නාම, ජීවනස්ස මූතොති වත්තබ්බෙ ජීමූතොති වකාරනකාරානං විනාසො විය, විජ්ජමානක්ඛරවිනාසො වණ්ණවිනාසො නාම, ඒරුසාහි වාචාහි පනුබ්බමානො ආසජ්ජ මං ත්වං. වදස්ස කුමාරාති එත්ථ පනුබ්බමානොති පරස්ස අභිභවමානොති අත්ථපටිපාදනං විය තත්ථ තත්ථ යථායොගං විසෙසත්ථයොගො ධාතූනං අත්ථාතිසයෙන යොගො නාම, එවං නිරුත්තිලක්ඛණං ගහෙත්වා"—කියාය.

සංස්කෘත ව්‍යාකරණයෙහි ටයන්නත් සහිතව දක්වනු ලබන ආදෙශාදිය මූලට බවද කයන්නත් යහිතව දක්වනු ලබන ආදෙශාදිය අනට බවද කියනලද "ටිත්වා ද දෞ කිත්වා දනෙත" යන ගුරුකමේ ක්‍රමයටම මෙහිද "ක්‍රකානුබන්ධාදන්තා"යි ක්‍රකාරණු බන්ධවූ ආදෙශාදිය මූලව බවත් නකාරණු බන්ධ ආදෙශාදිය අගට බවත් කියනලදී—බුඩශබ්දාදිය මෙන් වරනැගියයුතුවූ නාම සඟ්‍රහිතවූ "එවං සුරා සුර නරො රග" යනාදි රූප සිඩියෙහි ගාථා මෙහිද එලෙසින්ම ගෙණ ලියා තිබෙනුය—පුල්ලිඟයෙහි පළමු වෙනි ශබ්දයාගේ පදසිඩි ක්‍රමය දක්වා නිමවූ තැනට ශබ්දයන්ගේ අර්ථ කල්පනාකරණ ක්‍රමයක් (ඒනම් ශබ්දයන්ගේ අර්ථ වචනවලින්ම පමණක් නොව, එක් කිරීමය, වෙන් කිරීමය, එක්ව හැසිරීමය, විරොධය, ප්‍රයොජනය, ප්‍රකරණය, ලිඟය, අන්‍යවූ ශබ්දයක් ලංකිරීමය, සාමර්ථ්‍යය, ඖචිත්‍යය, දෙශය, කාලය, ව්‍යක්තිය, අනුරූපය, උපචාරය, කාකුභෙදය, [ඒනම් ශබ්ද විකාර] සම්බන්ධය, උපලක්ෂණය, වචනාව්‍යවත්වය, ප්‍රධානත්වය, යන මේ ආදියෙන්ද විභාග කරණු ලබන බව) ගාථා තුනකින් මෙසේ කියනලදී.

"සංයොගා විප්පයොගා ච සාහචරියා විරොධතො,
අත්ථා පකරණා ලිඟා සද්දන්තර සමීප තො.
සාමත්ථ්‍යා චිත්‍යදෙසෙහි කාලව්‍යත්‍යානුරූපතො,
උපචාරා කාකුභෙදා සම්බන්ධුපලක්ඛණා.
වචනා ච තදඟතා පධානතා ති ආදිහි,
සද්දත්ථා පවිභජ්ජන්තෙ න සද්දා දෙව කෙවලා."

ඊට උදාහරණද මෙසේ දක්වනලදී—තත්ථ [1] "සංයොගතො සද්දත්ථප්පවිභාගෙ යථා—සකිසොරා ධෙනු දීයතූති වුත්තෙ අස්ස පොතකා වාචී කිසොර සද්ද සංයොගතො වළවා එව පතීයතෙ—[2] විප්පයොගතො—අකිසොරා ධෙනු දීයතූති වුත්තෙ තප්පටිසෙධා වළවා එව පතීයතෙ න ගාවී—[3] සාහචරියතො—සාරිපුත්ත මොග්ගල්ලානාති වුත්තෙ සාරිපුත්තො ති ධම්මසෙනාපති ත් විඤ්ඤායතෙ න හත්ථකො සාරිපුත්තො, අඤ්ඤා පන රාම ලක්ඛණා රාමකෙසවා යුධිෂ්ඨිලාර්ජුනාති උදාහරන්ති—[4] විරොධතො—කුසලා කුසලන්ති වුත්තෙ කුසලන්ති ඉට්ඨවිපාකධම්මොව විඤ්ඤායති නාවජ්ජකො, අඤ්ඤා රාමජ්ජුනා අහිමඤ්ඤාලක්ඛණාති උදාහරන්ති—[5] අත්ථතො—ගොපාලක භානය මාණව' මජ්ඣාපස්සාති, සිනාවමානාය රණඟාණං පවිසිස්සාමීති වුත්තෙ ගොපාලකොති එවනාමකො

උපජ්ඣායො, සින්ධවාති අස්සොති පයොජනතො පතීයතෙ—6 පකරණතො—භොජනගෙහෙ උපසංහරීයමානෙසු සින්ධව මානෙහීති වුත්තෙ ලවණන්ති පකරණතො විඤ්ඤායති න අස්සො—7 ලිඞ්ගතො—දෙවදත්තං පඨමං නිවෙසය චතුබ්බෙදෙ හි දෙවදත්තොති වුත්තෙ චතුබ්බෙදත්තෙන ලිඞ්ගසඞ්ඛාතෙන වත්ථුසාමත්ථියෙන තස්ස ජාතිමන්තතා පතීයතෙ—8 සද්දන්තර සමීපතො—ගච්ඡතො භයතො පතිතොති වුත්තෙ කිනාරෙතොති විඤ්ඤායති, ගච්ඡතො පණ්ණපුප්ඵානි පතන්තීති වුත්තෙ බුද්ධකරුක්ඛවාචකො රුක්ඛසද්දොති විඤ්ඤායති, අජ්ජුනො කතවිරියොති කෙචි—9 සාමත්ථියතො—සතොපි උදරස්ස අවිවජ්ජාය අනුදරා කඤ්ඤාති වුත්තෙ උදරස්සාභාවෙ කඤ්ඤායපි අභාවා පසත්තො තනුමජ්ඣාති විඤ්ඤායති, තථා අලොමිකා එළිකාති—10 ඔචිත්‍යතො—රාම සදිසොයං අජ්ජුනසදිසොයමිති වුත්තෙ වත්තුනො පරිචයා යුත්තිවසෙන රාමාදිසද්දෙ දසරථාදි අත්ථවිසෙසං ජොතෙති—11 දෙසතොති දෙසො පබ්බතවනාරඤ්ඤාදි, කිඤ්චි පදෙසෙ පසංසාවචනා අඤ්ඤත්‍ර අනෙන සවචනා පොඨාදයො—12 කාලතො—දක්ඛිණාපථෙකාලදෙසෙ පුබ්බණ්හෙ පචතීති වුත්තෙ යාගු පාකොති පතීයතෙ සායණ්හෙ ච ඔදන පාකොති—13 ව්‍යත්තිතො—ගාමස්සඩ්ඪං ලද්ධන්ති වුත්තෙ නපුංසකත්තා සමභාගොති ච, ගාමස්සඩ්ඪො ලද්ධොති වුත්තෙ පුල්ලිඞ්ගත්තා අසමභාගොති පතීයතෙ—14 අනුරූපතො—නරපති සාධු රක්ඛති ගොමණ්ඩලන්ති වුත්තෙ රඤ්ඤො ගොගණපාලනස්ස අනනුරූපත්තා පථවිමණ්ඩලන්ති විඤ්ඤායති—15 උපචාරභෙදෙ තදත්ථධම්ම තංසහචරිත තංසමීපාදිවසෙන අනෙකවිධො, යථා, මඤ්චා උක්කොසන්ති අග්ගිමාණවො යඤ්ඤියො පවෙසය ගඞ්ගායං වජො ඉච්චාදි—16 කාකුභෙදතොති කාකුසද්දෙ සොකභයාදිවසප්පවත්තස්ස සද්දස්ස නිවත්තනාදිරූපෙ විකාරෙ වත්තතෙ, ඊසදත්ථෙ කුසද්දො; තස්ස කාදෙසො කුකුම්භාදයත්ථවත්ථුප්පත්තියා ඊසකං භූමි කාකූති වචනතො, යථා වත්තුකාය විකාරකිං ත්වං තං අකාසීති පුට්ඨො කොපෙන හමුහෙදෙ අහං කතවාති කථෙති සා ච තස්ස අකරණං සූචෙති—17 සම්බන්ධතො—මාතරි සම්මා වත්තිතබ්බං පිතරි සම්මා වත්තිතබ්බන්ති වුත්තෙ සකාය මාතරි සකෙ පිතරීති විඤ්ඤායති—18 උපලක්ඛණතො—කාකෙහි රක්ඛිතබ්බං දධීති වුත්තෙ උපලක්ඛණත්තා කාකග්ගහණස්ස තතො අඤ්ඤෙහි සුනඛාදීහිපි රක්ඛිතබ්බන්ති විඤ්ඤායති—19 වචනතො—දසාති වුත්තෙ දසාසද්දො වත්ථන්තෙ වත්තමානො බහුවචනො

අඤ්ඤත්‍ර අනියත වචනොති විඤ්ඤායති—[20] තදඞ්ගතො—සප්පිතං භොජනන්ති වුත්තෙ සූපබ්‍යඤ්ජනාදයොපි තදවයවත්තා සම්පාදිතානීති විඤ්ඤායන්ති—[21] පධානතො—නිග්ගතො රාජාති වුත්තෙ සෙනාපි නිග්ගතාති විඤ්ඤායතීච්චෙවමාදි සමූහනීයං."

තවද—වැඩ ගණ්ට පූර්වන් තරමටවත් නිවරදි පයොගසිද්ධියක් ලංකාවෙන් සපයා ගැණීම දුෂ්කර තරමට මෙම පොත ලිපි දෝෂ වලින් ආකූලය—අපට දකින්ට ලැබුනු පොත් වල මූලට ගාථාවක් නැත-ඒද වැරදීමක්ද කර්තෘගේ රචනා ක්‍රමයමද යනුත් සැකහැර නොකිය හැකිය—තොටගමුවේ රාහුල ස්වාමින්වහන්සේගේ පඤ්චිකා ප්‍රදීපයේ හැර වෙන පොතක මේ නාමය සඳහන් කර තිබෙනවා දකින්ට නොලැබුනි.

අග ගාථා මෙසේය,

"චාගවික්කමසද්ධානු සම්පන්නා ගුණසාලිනො
පරක්කම නරින්දස්ස සීහළින්දස්ස ධීමතො.
අත්‍රජෙනානුජාතෙන භූපාලකුලකෙතුනා
දිසන්ත පත්ථටොදාරවික්කමෙන යසස්සිනා.

භුවනෙක භුජව්හෙන මහාරාජෙන ධීමතා,
චතු පච්චයදානෙන සන්තතං සමුපට්ඨිතො.
ධම්මදෙණීති විඛ්‍යාතාවාසෙ නිවසතො සතො,
සුමංගල මහාථෙර සාමිනො සුචිවුත්තිනො.
වංසෙ විසුද්ධෙ සඤ්ජාතො පන්තසෙනාසනෙ රතො,
පරියත්ති මා සින්ධු නියාමක ධුරන්ධරො.

අප්පිච්ඡාදි ගුණො පෙතො ජිනසාසනමාමකො,
වනරතන මහාථෙරෙ මෙධංකර සව්හයො.
පාටවත්ථාය භික්ඛූනං විනයෙසු විසාරදෙ,
පයොගසිද්ධිං සුද්ධම්පි සද්දසප්පඤ්ඤ ගොචරං."

---

24. ශබ්දනීතිය—බුරුමරටේ අරිමද්දන නුවර මහා අග්ගපණ්ඩිත අග්ගවංසාචාර්‍ය්‍යයන්වහන්සේ විසින් විරචිතවූ මෙනම් ප්‍රකරණයේ කොඨාස දෙකට මහාශබ්දනීතිය, චූලශබ්දනීති යයි නම් දෙකක් ව්‍යවහාර කරණ නුමුත් ග්‍රන්ථ කර්තෘ පොත් දෙකක් වශයෙන් කියා නැත—රූපසිද්ධි ටීකාවෙහි පවා මෙහි පදසිද්ධි ක්‍රමය

කියන ලද්දවූ භාගයට මූලශබ්දනීතිය යන නාමය ව්‍යවහාර කරතිබෙන නිසා ග්‍රන්ථකර්තෘගේ අදහස කෙසේ නුමුත් යථෝක්ත ව්‍යවහාරයද මෑත කාලයෙහි එකක් නොවේබව පෙනේ—ග්‍රන්ථ කර්තෘ ප්‍රකරණ දෙකක් වශයෙන් රචනා නොකළබව මූලශබ්ද නීතියයයි ව්‍යවහාර කරණුලබන භාගයේ (පොතේ) මුලට නමස්කාර ගාථාවක් පමණවත් නොකියා "ඉතො පරං උද්දෙසානුක්කමෙන සලක්ඛණෙ සන්ධිනාමාදිභෙදෙ භවිස්සති"—කියා පටන් ගත් හෙයින්ද, එහි මුලම පරිච්ඡේදයට "එකූනවීසතිමො පරිච්ඡේදෙ" කියා තිබෙන හෙයින්ද පෙනේ—මෙහි වර්ණිය සූත්‍රනිද්දේශයට ඉහතබව පේන නුමුත් කොපමණ ඉහතද යනු නිශ්චය කිරීම අමාරුය—සූත්‍රනිද්දේශයට ඉහතබව පේන්නේ කෙසේද යත්—සූත්‍රනිද්දේශයේ කර්තෘවූ ඡප්පට තෙරුන්වහන්සේගේ ආචාර්යවූ උත්තරජීවතෙරුන්වහන්සේගෙන් සහ වෙනත් තෙරුන්වහන්සේලාගෙන් අරිමද්දන නුවර ශබ්දශාස්ත්‍රයෙහි ඉතා දක්ෂයෝ බොහෝ බව ලත් දිව් වැසි තෙරුන්වහන්සේලාට අසන්ට ලැබී ඒ සොයනු කැමතිව එහි ගොස් විමසූකල ශබ්දනීතිය පෙනවනුලැබූ බවද, ලක්දිව් වැසි තෙරුන්වහන්සේලා එය බලා විස්මයට පැමිණ "ශබ්දශාස්ත්‍රය ගැණ මේ තරම් ග්‍රන්ථයක් ලංකාවේ නැතිය"යි කී බවද ශාසනවංශයෙහිකියා තිබෙන නිසා සූත්‍රනිද්දේශයට ඉහතබව දැනගත හැකිය.

මෙහි නාමය, රූපසිද්ධිටීකා, කච්චායනවණ්ණනා, නිරුත්තිසාරමඤ්ජූසා, පඤ්චිකාප්‍රදීප,යනාදියෙහිද සඳහන්ව තිබෙන නුමුත් ඒවා සූත්‍රනිද්දේශයට මෑතය-මෙහිද කච්චායන,න්‍යාස, මූලනිරුත්ති, මඤ්ජූසා, නිරුත්තිපිටක, කාතන්ත්‍ර, කාව්‍යාදර්ශ, පුරාණ එකාක්ෂරකොශ සන්ධිවිසොධනටීකා, විදග්ධමුඛමණ්ඩනටීකා බොධිවංසාදි නොයෙක් පොත්වලින් කාරණා දක්වා තිබෙන නිසා ඒ පොත්වලට මෑත බව පේනවත් ඇර මොග්ගල්ලායන ව්‍යාකරණයට අයිති පොතක නාමයක් මෙහි සඳහන්ව නැති නිසා මේ පොත සාදන කාලයෙහිදී එකී පොත් නොසෑදුනායේ කියාත් සිතිය හැකිය—මේ පොතේ තිබෙන අපූරු කියමන්වල හැටියෙන් සහ, කච්චායනවණ්ණනාවේදී "සද්දනීතිකාරකච තතිය මග්ග මණ්ඩිතං" කියා තිබෙනවායයිද මේ ග්‍රන්ථකර්තෘන්වහන්සේ මාර්ගඵලයකට පැමිණි කෙනෙක්යයිද සමහරු කල්පනා කළාය.

නුමුත් ඒ ගාථාවේ සුඛපාඨය "තතිය මගග මණ්ඩිතං" කියං නොව "තතියමගග පණ්ඩිතං" කියාය—ඒ බව හැඟෙන්නේ කෙසේද යත්? ඒ කාලයෙහිදී අරිමද්දන නුවර ශබ්දශාස්ත්‍රාදියෙහි දක්ෂවූ අග්‍ර පණ්ඩිතවරු තුන්නමක් වැඩසිටියබවද, මේ ග්‍රන්ථකතෘනවහන්සේ "සමන්තභද්‍ර" නම් දෙවෙනි අග්‍ර පණ්ඩිතයාගේ බෑනාකෙනෙක් වන ශිෂ්‍යයෙක්වූ තුන්වෙනි අග්‍රපණ්ඩිතයන් වහන්සේ බවද ශාසනවංශයෙහි සඳහන්ව තිබෙන නිසාය—මුන්වහන්සේ මාර්ගාධිගමකළ කෙනෙක් නුනත් අටුවාටීකා සහිත සියළු පිටකත්‍රයෙහි විනිවිදපෑවැත්නා අපූරු තීක්ෂණ බුද්ධියක් ඇත්තෙක් බව පේනවාය—මෙහි ක්‍රමාදිය හඟවනු පිණිස පොතෙන් බොහෝ කාරුණු මෙහිදී ගෙණ හැර නොදැක්වූ නුමුත් මෙම "නාමමාලා" නම් ප්‍රකරණයේ ශබ්දමාලා කාණ්ඩයේ බොහෝ තැන්වලදී මෙම පොතෙන් බොහෝ කාරණා ගෙණහැර දක්වා තිබෙන නිසා එයින් දැනගත හැකිය—ලංකාවේ කොයි ස්ථානවලත් තිබෙන ශබ්දනීති (නිඝණ්ඩුටීකාව මෙන්ම) ඉතාම වරදින් ආකූල නුමුත් නිවරදිවූ පොතක් සපයාගෙණ මුලපටන් බලාගණ යන්නාවූ ශබ්දශාස්ත්‍රාභිලාෂීන්ට අනිත් ශබ්දශාස්ත්‍ර පොත්වලට වඩා මෙම පොතට ආදරයක් උපදිනවාමය—ශබ්දනීතිය සම්පූර්ණලෙස භාවිතාකළ තැනැත්තා ශබ්දශාස්ත්‍රයේ කාරණාගැණ නිසීයකමින් සිංහයෙක් හා සමාන වෙන බව පොතේම කියා තිබෙනවාය—කච්චායන රූපසිද්ධි මොග්ගල්ලායනවුත්ති යනාදියෙහි නොකියන ලද පදසිද්ධ්‍යාදික්‍රම මෙහි බොහෝ බැවින් මෙම පොතෙන් ලැබිය හැකි ප්‍රයෝජන සම්පූර්ණයෙන් ඒ පොත්වලින් ලබන්ට නුපුළුවන.

මෙහි "මහාශබ්දනීති" යයි ව්‍යවහාර කරණලද ප්‍රථමභාගය "සව්කරණාඛ්‍යාතවිභාන" පරිච්ඡේදය,—"භූධාතු ක්‍රියාපදමාලා විභාග" පරිච්ඡේදය,—"සඬගණවිනිච්ඡය" පරිච්ඡේදය—යනාදී වශයෙන් පරිච්ඡේද 18 කටද—"චූලශබ්දනීති" යයි ව්‍යවහාරවූ (සූත්‍රවෘත්ති උදාහරණ සහිතවූ) අපරභාගය සන්ධි, නාම, සමාස,...වාචොගධ පදවිභත්ති, පාළිනයාදි සංගහ, යන පරිච්ඡේද 9 කටද බෙදනලද්දේය—මෙසේ සම්පූර්ණපොත පරිච්ඡේද විසිඅටක් වුවද මූලපරිච්ඡේද දහඅටම නාම, ක්‍රියා දෙක ගැණය—අග පරිච්ඡේද නවයෙන් හතක් සන්ධි, නාම, කාරක, සමාස, තද්ධිත, ආඛ්‍යාත, කිතකයෝය—අග දෙක චතුර්විධ පද විභාගයනා චතුර්විධ නයසංග්‍රහ විභාගාදියයි—මුළුපොතම බණවර 70 කට වැඩිය.

මූලගාථා මෙසේය.

“තං නමිත්වා මහාවීරං සබ්බඤ්ඤුං ලොකනායකං,
මහාකාරුණිකං සෙට්ඨං විසුද්ධං සුද්ධිදායකං.

සද්ධම්මඤ්චස්ස පූජෙත්වා සුද්ධං සන්තමසංඛතං,
අතක්කාවචරං සුඛුමං විගතන්තං මධුරං සිවං.

සඞ්ඝස්ස චඤ්ජලිං කත්වා පුඤ්ඤක්ඛෙත්තස්ස තාදිනො,
සීලසමාධිපඤ්ඤාහි විසුද්ධගුණජොතිනො.”

සවිකරණාඛ්‍යාතවිභාග පරිච්ඡෙදයේ
අග ගාථාව මෙසේය

“යෙ ලොකෙ අප්පයුත්තා විවිධවිකරණාඛ්‍යාතසද්දෙසු ඡෙකා
තෙ පත්වාඛ්‍යාතසද්දෙ අධිගතවිමතී හොන්ති ඤාණීපි තස්මා,
අච්චන්තඤ්ඤෙව ධීරෙ සපරහිතරතො සාසනෙ දළ්හපෙමො
යොගං තෙසං පයොගෙ පටුතරමතිතං පත්ථයානො කරෙය්‍ය.

භූධාතුක්‍රියාපදමාලා විභාග පරිච්ඡෙදයේ අග ගාථාවක්.

“වොහාරභෙද කුසලෙන සුබුද්ධිනා යො
කච්චායනෙන කථිතො ජිනසාසනත්ථං,
ත්‍යාදික්කමො තදනුගං කිරියාපදානං
කත්වා කමො භවති ධාතුවසෙන වුත්තො.”

භූධාතුනාමිකරූප විභාග පරිච්ඡෙදයේ අගගාථාව.

“උල්ලිඞ්ගනෙන විවිධෙන නයෙන වුත්තං
භූධාතුසද්දමයලිඞ්ගතිකං යදෙතං,
ආලිඞ්ගියං පියතරංව සුතං සුලිඞ්ගං
පොසො කරෙ මනසි ලිඞ්ගවිදුත්තමිච්ඡං.”

ඒලග සමහර කාණ්ඩවල අග ගාථාද මෙසේය.

“ඉමමතිමධුරචෙ චිත්තිකත්වා සුණෙය්‍යුං,
විවිධනය විචිත්තං සාධවො සද්දනීතිං,
ජිනවරවචනෙ තෙ සද්දතො ජාතකඞ්ඛං
කුමුදමිව සිනා වෙ සුඛු ජිනෙය්‍යු මන්ථෙ.

ඉමං සද්දනීතිං සුනීතිං විචිත්තං
සපඤ්ඤාහි සම්මා පරීපාලනීයං,
සදා සුඛුවිනෙන්ති වාචෙන්ති යො සො
නරො ඤාණවිත්ථිණ්ණතං යාති සෙට්ඨං.

සද්දනීති සුරියොයං අනෙකසුවිනිච්ඡයරංසිකලාපො,
සංසයන්ධකාරනුදෙ කස්ස මතිපදුමං න විකාසෙ.”

10 වෙනි පරිච්ඡෙදයේ අග පාඨය සහ ගථාව මෙසේය.

“එවං විඤ්ඤූනං නයඤ්ඤූනං සද්දරචනාවිසයෙ පරම විසුද්ධ විපුලබුද්ධිපටිලාභත්ථං පරමසණ්හසුඛුමත්ථෙසු පයොගෙසු අසම්මොහත්ථං සුවණ්ණතාලෙ සීහවිජම්භනෙන කෙසරසීහස්ස විජම්භනාමිව තෙපිටකෙ බුද්ධවචනෙ ඤාණවිජම්භනෙන විජම්භනත්ථං අධිකානෙකක්ඛරවසෙන ලිඞ්ගත්තයං මිස්සෙත්වා නාමිකපද මාලා විභත්තා.

සද්දෙ භවන්ති කුසලා න තු කෙචි අත්ථෙ
අත්ථෙ භවන්ති කුසලා න තු කෙචි සද්දෙ,
කොසල්ලමෙව පරමං දුභයත්ථ තස්මා
යොගං කරෙය්‍ය සතතං මතිමා වරන්ති.”

14 වෙනි පරිච්ඡෙදයෙහි අග.

“ඉධ සාරමතෙ මුනිරාජමතෙ පරමං පටුතං සුජනො පිහයං,
විපුලත්ථධරං ධනි නීතිමිමං සතතං භජතං මති සුද්ධකරං.”

භූවාදිගණවිභාග පරිච්ඡෙදාවසානයෙහි,

“සො සද්දනීතිමයි ඉමං විභාගං
ජානාති සම්මා මුනිසාසනෙ තෙ,
අත්ථෙසු සද්දෙසු පි වීතකංඛා
අච්ඡම්භිනො සීහසමා භවන්ති.

විභූත භූතාගත සම්භවකෙත
සුභූතභූරී වදතා නරානං,
යො සද්දනීතිමයි භූවාදිකණ්ඩො
වුත්තො මයායං භජතත්ථකාමො.”

චුරාදිගණවිභාග පරිච්ඡෙදාවසානයෙහි.

“චුරපමුඛගණෙ මෙ සාසනත්ථං පවුත්තො
සුපවුරහිතකාමො තම්පි සික්ඛෙය්‍ය ධීරො,
සුපවුරනයපාඨෙ සත්ථුනො තං හි සික්ඛං
පිසුද්ධ මිව මනුඤ්ඤං අත්ථසාරං ලභෙථ.”

18 වෙනි පරිච්ඡෙදයේ අග ධාතු ගැණ දක්වනලද ගාථාවක්.

"යෙ නෙකත්ථධරා චරන්ති විවිධා නාථස්ස පාඨෙ පදෙ
තෙ නෙකත්ථ ධරාච හොන්ති සහිතා නානූපසග්ගෙහි ච,
ධාතූනං පන තෙ සමත්ථ පරමං ඤාණස්ස වෙ පණ්ඩිතෙ
වජ්ජෙත්වා පටිසම්භිදාමතියුතො කො සබ්බසො භාසති."

සන්ධි නාම්වූ 19 වෙනි පරිච්ඡෙදාවසානයෙහි.

"විවිධනයවිචිත්තෙන පාළිධම්මෙ පවුත්තං
සරමසරපරස්මිං තීහි සන්ධීහි යුත්තෙන,
බහුවිධනයසාරෙ සන්ධිකප්පම්හි යොගං
කරිය සුමති පොසො අත්ථසාරං ලභෙථ."

සමාස නාම්වූ 22 වෙනි පරිච්ඡෙදාවසානයෙහි.

"සද්දනීතජ්ජනං එකං ඤාණචක්ඛු විසොධනං
මොහක්ඛිපටලුද්ධාරිං අනුයුඤ්ජෙ සදා සතො."

තද්ධිත නාම්වූ 23 වෙනි පරිච්ඡෙදාවසානයෙහි

"විවිධනයවිචිත්‍රං තද්ධිතං නාමකප්පං
සුවිපුලසුබුද්ධත්ථං සංසයච්ඡෙද කාරිං,
නරවරවචනත්ථෙ පාටවං පත්ථයානො
අවිකලසතිපඤ්ඤො කොතු පොසො න සික්ඛෙ."

ආඛ්‍යාත නාම්වූ 24 වෙනි පරිච්ඡෙදාවසානයෙහි.

"ඉඬෙව මඬනත සුසෙවනීයෙ
ධම්මෙ මුනින්දෙන සුදෙසිතෙ ච,
විඤ්ඤූ නමිච්ඡං පරමං පවුත්තං
ආඛ්‍යාත මෙතං විපුලං අභාසි."

චතුර්විධ පදවිභාග නාම්වූ 27 වෙනි පරිච්ඡෙදයේ අග.

"ඉච්ඡෙ නරො සුපවුත්තං පරියත්තිධම්මෙ
වාචොගධෙ චතුපදෙ විපුලත්ථසාරෙ,
යොගං කරෙය්‍ය සතතං බහුධා විභත්තෙ
යොගං කරං සුපවුත්තං සනරො ධිගච්ඡෙ."

පොතේ අගගාථා මෙසේය.

"යෙ ධීරා සද්දනීතිප්පකරණපසුතා නිච්චකාලං භවෙය්‍යුං
තෙ සාරෙ පාළිධම්මෙ නිපුණනයසුභෙ අත්ථසාරං ලභෙය්‍යුං,
තෙ ලද්ධානත්ථසාරං සුගතමතවරෙ සුප්පතිට්ඨා සුබුද්ධා
අච්ඡම්භී සීහවුත්තී පරමමවිතථං සීහනාදං නදෙය්‍යුං.

ඉද මච්ඡකරං කවිපීතිකරං බුවකංබන්ධුදං නිසිතානිසිතං,
වරසද්දනීතිපදං පිහයං සුජනො හිතයුත්තමනො න සුණෙය්‍යනු ඛො

ඉදං සුනිස්සාය සුධී මතං මතං
තං තං සුවුත්තෙහපි සමා හිතං හිතං,
තතත්ථ සාරං පරියෙසතං සතං
විඤ්ඤූ මනෙ චෙත සිඛා කරෙ කරෙ.

විනයඤ්චාපි සුත්තන්ත මභිධම්මඤ්ච ජාතකං,
සාට්ඨකථං නවංගන්තු ඔගාහෙත්වාන සාසනං.

නානාචරියවාදෙහි මණ්ඩිත්වා නිම්මලෙහි වෙ,
සද්දනීති සමක්ඛාතං ඉදං පකරණං කතං.

පාකටා ව රවින්දුව යස්ස කිත්ති මහීතලෙ,
අග්ගවංසාචරියෙන තෙන විරචිතා අයං.”

---

25. සම්බන්ධචින්තා—මීට සම්බන්ධචින්තාන යයිද කියත්-මෙහි සඳහන් වෙන්නේ කාරක ලක්ෂණ විභාග හා උක්තානුක්ත, විභක්ති භේදයෝය—පොත පරිච්ඡෙද වශයෙන් බෙදා නැති නුමුත් ඉතාම වැදගත් පූරාණ පොතක්වත් ඇර ප්‍රමාණය බණවරකට වැඩි නැත—මේ පොතට පූරාණ සන්නයක් හා ටීකාවක්ද තිබෙනුය—මෙහි කර්තෘ අග ගාථාවල සඳහන්ව තිබෙන හැටියට මෙයට අවුරුදු 800 ගණනකට ප්‍රථම වූතෙතාදය, සුබෝධාලංකාර, . සැඳුසිකා ටීකා, මොග්ගල්ලායන ව්‍යාකරණයට අයිති සුසද්දසිද්ධි* යන මේ පොත් කළාවූ සංඝරක්ඛිතනම් ස්ථවිරයන් වහන්සේය—මුන්වහන්සේගේ ගුරුවරයා සෙලන්තරායතනවාසී ස්ථවිරයන්වහන්සේ බව සුබොධාලංකාරාවසානයෙහි පෙනෙන

“සෙලන්තරායතනවංසිකාසිල ථෙර
පාදෙ ගුරූ ගුණගුරූ ජයතං මමෙසො,
යස්සප්පභාව මවලම්බ මයෙදිසොපි
සම්පාදිතො හිමතසිද්ධිකරො පරත්ථො.”

---

* මෙකී පොත කච්චායනසාරටීකාවෙහි “පඩානො පන සුසද්දසිද්ධි ආදිතො ගහෙතබ්බා” යි සඳහන්ව තිබේ—මොග්ගල්ලායන ව්‍යාකරණයට අයිති “සාරත්ථ විලාසිනීනම්” පඤ්චිකාටීකාවෙහිද කර්තෘ “සංඝරක්ඛිත” කියා බැවින් දෙනමක්ද එක නමමද යන්න කල්පනා කටයුතුයි.

යනමේ ගාථාවෙන් පෙනේ—මේ සෙලන්තරායතනවාසී ස්ථවිර යන් වහන්සේ නම් මහාවංශයේ 57 වෙනි පරිච්ඡේදයෙහි හා ඡන්දෝ සාරත්ථවිකාසිනී ටීකාවෙහි පෙනෙන හැටියට දාඨෝපතිස්ස රජ ගේ මුනුපුරය, වැඩසිටියේ බුද්ධවර්ෂ 1602 හරියේදීය—සාරිපුත්‍ර නම් මහාස්ථවිර කෙනෙක්ද මුන්වහන්සේම ගුරුව වැඩසිටිය බව කතු සි.ඤ.ටීකාවේ මුල සඳහන්ව තිබේ.

මහාවංසයේ.

"දාඨොපතිස්සරාජස්ස නත්තා සුගතසාසනෙ,
පබ්බජ්ජූපගතො සන්තො ධුතවා සීලසංවුතො.
උද්දිස්සාරද්ධතං සම්මා ලංකින්දෙන තතං තදා,
සෙලන්තරාභිනික්ඛම්ම යතින්දො සො දයානුගො.
තතො භික්ඛූ සමූහෙත්වා වාසං කප්පෙසි තත්ථ සො,
සෙලන්තරසමූහොති විඛ්‍යාති සො තතො ගතො."

සම්බන්ධචින්තායෙහි මුල ගාථා 2 මෙසේය.

"නිරුත්තිවිසරාපාරසාගරන්තාපගං ජිනං
නමස්සිත්වා කරිස්සාමි සාධුං සම්බන්ධචින්තනං.
ක්‍රියාය කාරකානඤ්ච යොගො සම්බන්ධසම්මතො,
තස්මාස්ස චින්තා සම්බන්ධචින්තා ඤුතාදිනිස්සිතා."

අග.

"යෙ නන්තතන්තරතනාකරමන්ථනෙන
මන්ථාචලොල්ලසිතඤාණවරෙන ලද්ධා,
සාරාමතාතිසුඛිතා සුඛයන්ති චඤ්ඤෙ
තෙ මෙ ජයන්ති ගුරවො ගුරවො ගුණෙහි.
යස්ස සාධු ගුණඤ්ඤු බහුනකිත්ති සබ්බත්ථ පත්ථටා,
මොග්ගල්ලානො මහාපඤ්ඤො ජයතෙ සොහ සබ්බදා.
පරමප්පිච්ඡතානෙක විසෙසූප සමෙසිනං,
සුචිසල්ලෙඛවුත්තීනං සදා රඤ්ඤනිවාසිනං.
සාසනුජ්ජොතකාරීනං ආචෙරතත මුපාගතං,
උදුම්බරගිරිඛ්‍යාතා යතීනං යතිපුංගවං.
මෙධංකරොති ආඛ්‍යාතං නාමධෙය්‍යං තපොධනං,
ථෙරං පීරදයාමෙධානිධානං සාධුපූජිතං.

සිස්සං සහාය මංගමම කල්‍යාණමිත්ත මත්තනො,
සොධෙතුං සාසනං සත්‍ථු පරක්කම මකාසි යො.

සුසද්දසිද්ධි යො යොගනිච්ඡයං සබ්භි වණ්ණිතං,
අකා සුබොධාලංකාරං වුත්තොදය මනාකුලං.

සංඝරක්ඛිතනාමෙන සාසනොදයකාරිනා,
ඛුද්දසික්ඛාය ටීකා ච තථා සම්බන්ධචින්තනං.

ධීමතා මහාථෙරෙන තෙනෙව සාධු රචිතා,
සත්ථසචිත පුඤ්ඤෙන නිබ්බාන සාධකං හිතං,
සාධෙන්තො ලොකනාථස්ස සද්ධම්මො තිට්ඨතං චිරං.

මේ අග ගාථාවල වර්ණනා කරණ ලද, (සංඝරක්ඛිත ස්ථවිරයන් වහන්සේට ගෝලවද කල්‍යාණ මිත්‍රවද සාසනසුද්ධිය කිරීමට උපකාරවද සිටි) දිඹුලාගල මෙධංකරනම් ස්ථවිරයන්වහන්සේ කවරෙක්ද යනු සොයන අතර ඉතා පුරාණ පොතක්වූ විනයසන්නයෙහි තැනක සඳහන්වෙන්නේ මූන්වහන්සේම්‍යෙ කියා අනුමානවශයෙන් කල්පනාවුන නිසා ඒ ඉතා පුරාණ විනයසන්න සිංහල පාඨය එහි තිබුනු ලෙසම මෙහි දක්වනු ලැබේ,

“......මෙසේ දන්නට වටනා බැවින් මේ විනයපාළියට විනය අටුවාවටද සන්න ලියන ‘දිඹුලාගල මේධංකර මහතෙර’ නමට “අසනතැන් වදාළ ආචරියපාචරියන් වහන්සේගේ මහාවිහාරවාසීවූ ආචරියසුද්ධින් සුද්ධිය මෙසේ දතයුතුය—බුදුන් පිරිනිවී සාරසිය “සූපනස් හවුරුද්දෙහි පවන් බිදී එක්වාදහස් දෙසිය සූපනස් අවුරුද්දක් තුබූ බුදුසසුන පරාක්‍රමබාහු මහරජානන් ඇරගෙණ “දෙනානකා බගිරිනකා යන අසුද්ධ දෙනකයෙහි විපන්න තැන් හැර මහාවිහාරවාසීවූ පරිසුද්ධවූ ථෙරවාදයම ගෙණ පවත්නා පිරිසිදු තැන්හා සුද්ධ සංඝයා සමගකොට තුන්නම සමග කළ දිඹුලාගල මාසුප් මහතෙරුන් වහන්සේගේ අනෙතවාසිකවූ එම නිකාය සාමග්ගියට ආචාරීන් වහන්සේට සහයව සිටිය මහාසාරත්ථදීපනී මූලාසාරත්ථදීපනී පච්කාලංකාරාදිවූ මහත් ග්‍රන්ථසාරයන් කළ සැරියුත් මහහිමියන්වහන්සේගේද, මොග්ගල්ලායන ව්‍යාකරණය කළ මුගලන්මහතෙරුන්වහන්සේගේද සමීපයෙහි විනය පිටකයද අටුවාවද ටීකාව සහිත කොට අසා මේ විනය සන්නය අපි ලීම්හ”—යනුයි.

26. සම්බන්ධචින්තා ටීකාව—මෙහි මුල් පොතේ නොකියනාද අමුතු ලක්ෂණාදියක් ක්‍යා නැතුවත් ඇර සන්නය පමණ සැලකිය යුතු පොතක් නොවේ බව හා මේ රටේ කෙනෙක් කළ ටීකාවක් නොවේ බවද සන්නය* මීට පූර්ණ බවද කිය හැකිය—එහෙත් තුඩා පොත් අතරෙන් ඉතා පූර්ණ පොතක්වූ සද්දත්ථභෙදචින්තා වේදී නම සඳහන්ව තිබෙන නිසාද සද්දසාරත්ථජාලිනී ආදීවූ මේ විධියේ වෙන පොත්වල නාමයන් සඳහන්ව නැති නිසාද වඩා මෑත කාලයක නොවන බව පෙනේ—කර්තෘ කොයිකාලක කොයි රටක සිටිය කෙනෙක්ද කියා නිශ්චය කළ නොහැකිය.

මූල ගාථාව මෙසේය.

"වුත්තත්ථ සම්බන්ධචින්තාය කරිස්සාම් හිතායහං,
මයාපි මන්දබුද්ධීනං වන්දිත්වා රතනත්තයං."

අග ගාථාව.

"සුනනෙත්දං සුධාරෙනෙතා සනෙතා යනාතු සුබ්චජිතං,
අනෙන සනාතකාමෙන සබ්බෙපි පාණී නො යථං."

---

27. සද්දසාරත්ථජාලිනිය—මෙය බුධ වර්ෂ 1900 පමණේදී (ශබ්දනීතියට පසුව) බුරුම රටටම අයිති තම්බදීප නම් රටේ විජය† නුවර 'කණ්ටකඛිපනාගිත' නම් ස්ථවිරයන් වහන්සේවිසින් විරචිතවූ ගාථා 500 පමණ ඇති ඉතා මාහැඟි පොතකි—අභිධානප්පදීපිකා ටීකාව සහ මෙය එක කාලේදීය—මෙහි පරිච්ඡෙද නවයක්ය.

1 වෙනිවූ ශබ්ද සාරප්‍රකීර්ණක නම් පරිච්ඡෙදය ශබ්ද පදාර්ථක, අර්ථපදාර්ථක, යනාදියෙන් හා, එකාදසූපචාර, පෙය්‍යාල, අවධාරණ, මිගපදවලඤ්ජනාදි නයවලින්ද, උපලක්ෂණ, ප්‍රතිසෙධ ලක්ෂණ, උපමානොපමෙය්‍ය එකශෙෂ පඤ්චවිධ නිරුත්ති ලක්ෂණ, සංඛ්‍යා ක්‍රම, නිර්ධාරණ, අකාරකලක්ෂණ යනාදි සාරවත් ශබ්ද ලක්ෂණවලින්ද ආකීර්ණයි.

---

* සන්නය ආරණ්‍යවාසී ගොතම නම් තෙරකෙනෙක්විසින් ලියනලද්දකි—එකී සමහර තැන්වල පේලි ගණන් අඩුව තිබෙනුය—අග ගාථාව මෙසේය.

"බුද්ධානං පණමයනෙතන සබ්බසත්තහිතත්ථිනා,
ආරඤ්ඤකෙන යතිනා ලිඛිතං ගොතමෙනිදං."

† මේනුවරට "පංගො" කියාද ව්‍යවහාරයි.

2 වෙනි අර්ථසාර ප්‍රකීර්ණකනම් පරිච්ඡේදය අභිධාන, අභිධෙයාර්ථාදි අර්ථප්‍රභෙදද, අබ්‍යාපිත, පුනරුක්ති ආදිවූ දොෂලක්ෂණද, ජාති ගුණ ක්‍රියාදි අර්ථ ලක්ෂණද, උපන්‍යාසාදි අර්ථයන්ද යන මේආදිවූ අර්ථයන්ගෙන් යුක්තයි.

3 වෙනි පරිච්ඡේදය අක්ෂර සංඥාප්‍රභෙදොත්පත්තිස්ථානාදිය හා සන්ධිප්‍රභෙදාදියයි.

4 වෙනි පරිච්ඡේදය නාම ප්‍රභෙද හා සූත්‍ර ප්‍රභෙදාදියයි.

5 වෙනි පරිච්ඡේදයේ කාරකලක්ෂණ ප්‍රභෙද හා උක්තානුක්ත ලක්ෂණාදියයි.

6 වෙනි 7 වෙනි 8 වෙනි සහ 9 වෙනි පරිච්ඡේද පිළිවෙළින්, සමාස ලක්ෂණ ප්‍රභෙද, තද්ධිත ප්‍රත්‍යය, ආඛ්‍යාත ක්‍රියා, කිබ්බ කිතකප්‍රත්‍යය, ප්‍රභෙදාදියයි.

මූල ගාථා.

“ නමස්සිත්වාන සම්බුද්ධං සද්දසාරත්ථපාරගුං,
ධම්මං සාරත්ථසම්භූතං ගණඤ්ච වයධාරණං.

පුබ්බාචරිය සීහානං මතං නිස්සාය සාධුකං,
වක්ඛාමි සද්දසාරත්ථ ජාලිනිං මතිවඩ්ඪනං.

කෙවලං ඉති සද්දෙන මිස්සො අත්ථ පදත්ථකො,
ඉතිසද්දෙන චෙ යුත්තො භවෙ සද්ද පදත්ථකො.

පුරිසිත්ථි චිත්තසද්දා පුරිසාදි දබ්බවාචකා,
පුරිසොත්‍යාදි වුත්තෙත්ථ සද්දො යෙව පදත්ථකො.”

අර්ථසාර පරිච්ඡේදයෙහි අබ්‍යාපිතාදි දොෂලක්ෂණ දක්වන ගාථා කීපයක් මෙසේය.

“ අබ්‍යාපිතාතිබ්‍යාපිත දොසං පුනරුත්ති තථා,
පුබ්බාපරවිරොධත්ථං එකත්ථ මිති පචධා.

යථිච්ඡිතං අධිප්පායං න පූරයති යත්ථ හි,
තං අබ්‍යාපිතං ඤෙය්‍යං දොසඤ්ඤූහි සභාවතො.

අනිච්ඡිතං අධිප්පායං යත්ථ දිස්සති තං මතං,
අතිබ්‍යාපිතදොසන්ති දොසඤ්ඤූහි සභාවතො.

පුබ්බෙ වුත්ත මධිප්පායං පුන වුච්චති යත්ථ හි,
පුනරුත්තීති තං ඤෙය්‍යං දොසඤ්ඤූහි සභාවතො.

යථිච්ඡිතත්ථං වත්වාන තමෙව වදත්‍යඤ්ඤථා,
තං විරොධීති විඤ්ඤෙය්‍යං දොසඤ්ඤූහි සභාවතො.

අත්ථුලක්ඛ දුවෙ සද්ද යත්ථ වුච්චන්ති තං මතං,
එකත්ථන්ති සභාවෙන ඉමෙ දෙසා විවජ්ජිතා.”

අග ගාථා.

“පංගක්ඛාභිඛ්‍යාතෙ නගරෙ විඤ්ඤූතො
ගන්ධෙසු සුරභි මතං ගහෙත්වා,
යා භාසිතා සා ජ්භයා සමන්තතා
සබ්බෙපි සත්තා නිභයා භවන්තු.

වට්ටෙසු එතතං තිභවෙසු වුය්හං
රොගාදිවජ්ජං විහගො භවෙය්‍යං,
ජූසාමි බුද්ධං රියමෙත්‍ය සබ්‍යං
දනාච දත්වා පිටකං ධරෙය්‍යං.”

මේ ග්‍රන්ථකර්‍තෘවූ තෙරුන්වහන්සේගේ පිළිවෙළ කථාව මෙසේය බුරුම රටේ “සාවළු” නම් ගමෙහි එක්තරා ග්‍රහපති පුත්‍රයෙක් තෙම තමන්ගේ පුත්‍රයා ශාස්ත්‍රාගම ඉගන්වීම පිණිස තෙරුන් වහන්සේ නමකට භාරදුන්නාය—ඔහු විහාරයට යාම ගැණ කම්මැලි නිසා පියාවිසින් තර්ජනය පිණිස කටුගසක් උඩ තබනු ලැබූ හෙයින් “කණ්ටකඛිප” යන නාමය ව්‍යවහාර වුනත් ඇර ඉන්පසු විහාරයෙහිම නැවතී ඉගෙණ ගනිමින් කලකට පසු මහණව උපසම්පදාවද ලබා අරිමද්දන නුවරට ගියාය—පුත්‍රවත්සත්‍ය නිසා ගිය ගිය තැනම මහතෙරුන්නාන්සේලාගෙන් සංග්‍රහ ලැබ රටේ ප්‍රසිද්ධවේගණ එන අතර පියාතෝද උන්වහන්සේව සොයා ගොස් අරිමද්දන නුවරදී සම්භවී එහි පියාද නැවත් උපස්ථාන කළාය—එසේ බොහෝ කාලයක් පසුවෙනතුරුම ආහාරපානාදියක ප්‍රණීතාප්‍රණීතකමක් ගැණ තෙරුන්වහන්සේ කිසිවක් නොකියාහිඳ පසු කාලයකදී නිතරමවගේ ඒ ගැණ සොයන බලන නිසා “ඒකිමෙක්ද” යි පියා ඇසූවිට “පියානෙනි මම යම් අර්ථයක් ගැණ උත්සාහ කළා ඇද්ද ඒ අර්ථය දැනට සම්පූර්ණ නිසා ශරීර බල පරිග්‍රහණය පිණිස එලෙස ලුනු ඇඹුල් ආදිය ගැණ සොයමි” යයි කීයේය—මීට පසු පියාත් සමග මෑනියන් දකිම පිණිස සිය රටට එමින් චෛත්‍ය වැඳීම පිණිස විජය පුරයට පැමිණි විට ඒනුවර “චතුසෙතිභිඥසිහසූර” නම් රජතෙම මහත් විහාරයක් සාදවා ඒ විහාරයෙහි උගත් සීලවන්තයෝම නවතින්වයි කියා ප්‍රසිද්ධයක්කර තිබුනු බව දැනගන්ට ලැබුනු නිසා මෙම තෙරුන්නාන්සේ ඒ විහාරයට ගොස් නැවතුන කල ආරක්ෂකයෝ එපවත් රජහට

ගොස් සැලකළ කල්හි රජතෙම අභිධානප්පදීපිකා ටීකා කර්තෘභූත 'චතුරඞ්ගබල' නම් අමාත්‍යයා යවා තෙරුන්වහන්සේගේ ප්‍රමාණය පරීක්ෂාකළ කල්හි අමාත්‍යයා විචාළ විචාළ ග්‍රන්ථස්ථාන සියල්ලම තෙරුන්වහන්සේ විසර්ජනය කළහෙයින් ඒ බව රජහට සැලකළ විට සතුටුව රජ්ජුරුවෝ විහාරය ඒ තෙරුන්වහන්සේටම පූජාකළ බවද, තෙරුන්වහන්සේගේ පියාට සිටුතනතුරක් දුන්බවද, ඒනිසාම ඒ ගමට 'සෙට්ඨිගාම'යයි නම්වූ බවද, තෙරුන්වහන්සේ මෙකී විහාරයෙහිම වැඩසිටගෙණ සද්දසාරත්ථජාලිනී නම් ප්‍රකරණය කළ බවද, බුරුම්රටේ රාජවලියෙහි සඳහන්ව තිබෙනුය.

---

28. සද්දසාරත්ථජාලිනීටීකාව—මේ ටීකාවද මුද්‍රපොත වාගේම ඉතාවැදගත් පොතක්ය—ගාථා තේරුම්කිරීම බොහෝසෙයින් පදුද්ධාරවශයෙන් නොව ගාථාවල අදහස කීම් වශයෙනි—සුබොධාලංකාර සම්බන්ධචින්තා සුබොධාලංකාරටීකා රූපසිද්ධි බාලාවතාර සද්දනීති චූළනිරුත්ති ආදියෙන් උදාහරණ දක්වා තිබෙනුය—සමහරතැන පාණිනී ආචාර්‍ය්‍යමතයන්ද පෙන්වා තිබේ—කර්තෘගේ නාමය* පොතේ දක්වා නැතුවත් ඈර පෙළට ඉතා කිට්ටු කාලයෙහිම සාදන ලද බව හෙවත් කච්චායනභෙද මහාටීකාවේ මේ නාමය සඳහන්ව තිබෙන නිසා ඊටපසුබව (එනම්, බුද්ධ වර්ෂ 221' ට ඉහත බව) දැනගන්ට තිබේ.

මූලගාථා මෙසේය·

"යො බුද්ධසූරියො අමිතන්ධකාරං
හන්ත්වාන ධම්මෙහි ජුතීහි ලොකෙ,
බොධෙසි වෙනෙය්‍යජනං සරොජං
වන්දෙ මුනින්දං හතවන්තරාගං.

යෙ ධම්මමාලං සිරසා වහන්ති
මුච්චන්ති තෙ වට්ටභයා දුගන්ධා,
තස්මා පදං යන්ති ජනා අසංඛ්‍ය
තං ධම්මසෙට්ඨං පනමාමි සාධුං.

---

* මුල්පොතේ කර්තෘමබව සමහර කියමන්වලින් හැඟෙන්ටද තිබේ.

යෙ සංඝඛෙත්තම්හි සුපුඤ්ඤබීජං
රොපෙන්ති තෙ නන්දබලාභිසඩ්ඪා,
ලුසන්ති මොක්ඛං භවභෙදහෙතුං
තං සංඝසෙට්ඨං සිරසා නමාමි.

යං කිඤ්චි ගන්ථං මතිරමණීයං
කාරෙන්ති ධීරා ඉධ සාසනම්හි,
සික්ඛන්ති තෙසං නිභයාපගන්ථා
නමාමි තෙසං සිරසාව පාදෙ.

නානාගන්ථෙසු ආරද්ධං ගහෙත්වාභිමතං නයං,
වණ්ණයිස්සං සමාසෙන සද්දසාරත්ථජාලිනිං."

මෙහි "පෙය්‍යාලං" යන වචනය තේරුම්කර තිබෙන ක්‍රමය මෙසේය—"තාව අදස්සනතාමෙව දස්සෙත්වා විත්ථාරෙතබ්බස්ස අත්ථස්ස පාතුං පාලෙතුං රක්ඛිතුං අලං සමත්ථන්ති පෙය්‍යාලං—අථවා, යථාවුත්තස්ස පාඨස්ස පාතුං විත්ථාරෙතුං අත්ථං වා පාලෙතුං අලන්ති පෙය්‍යාලං—නිරුත්තිනයෙන බ්‍යාපිතුං විත්ථාරෙතුං අලන්තිපි අපරෙ—පෙය්‍යං අදස්සනං පාකටං කාතුං අලන්තිපි එකෙ—පාතබ්බං රක්ඛිතබ්බන්ති පෙය්‍යං, පෙය්‍යාය අලං පෙය්‍යාලන්ති අම්හාකං මති."

තවද අගගාථාවෙහි ටීකාවේ කොටසක් මෙසේය.

"පංයොති එකස්ස ඉසිනො නාමං සො හි නානප්පකාරෙසු නගරෙසු දෙසචාරිකං චරමානො පුනප්පුනං යාති චරති තෙන පංයො නාම තාපසොති විස්සුතො සො පන කාලන්තරෙන මතො එතස්මිං ඨානෙ මනුස්සාවාසං කප්පයිංසු, සොපි ජනපදෙ උපචාරෙන පංයොති වුච්චති කාලන්තරෙන අමච්චා රාජානං මාරෙත්වා අනුපුබ්බෙන තං ඨානං මහානගරං මාපෙසි තං පොරාණනගරසඤ්ඤාවසෙන පංයොති වුච්චති, පංයොති අභිඛ්‍යාතං විස්සුතන්ති පංයාභිඛ්‍යාතං, තස්මිං— ගන්තබ්බං සුගතිට්ඨානං නවජ්ජන්ති සත්තා එතෙහීති නගා කිලෙසකාම වත්ථුකාමා, තෙහි රමන්ති අභිරමන්ති එත්ථාති නගරං—අථවා, න ගච්ඡන්ති න චරන්තීති නගා, අතිසරීරමහන්තතාය වෙන නගා වියාති නගා, හත්ථී—නගා රවන්ති නදන්ති එත්ථාති නගරං, තස්මිං—විසෙසෙන සලති පත්ථරතීති විසාලං, තස්මිං-තත්ථ සියා, කථඤ්ච තං නගරං ආයාමතො දිඩ්ඪකොසං විත්ථාරතො කොසමත්තං කුතො විසාලභාවොති? සච්චං සාඛා නගරස්ස විසාලත්තා පන තථා වුච්චති—අථවා, ධඤ්ඤපුඤ්ඤධනවිසාලානං ජනානං

නිවාසට්ඨානත්තා ඨානූපචාරෙන තථා වුත්තන්ති දට්ඨබ්බං—අථවා සම්මාසම්බුද්ධස්ස පරියත්තිධරානං භික්ඛුසංඝස්ස විසාලත්තා විපුලත්තාතිපි තථා වුත්තන්ති දට්ඨබ්බං, තස්මිං විසාලභූතෙ පඤ්චාභිඛ්‍යාතෙ නගරෙති සම්බන්ධො කාතබ්බො—කදාති චෙ සීහපුරෙන ජිනනාරඤ්ඤඤ, පංචොධනය නගරං මාපිතං, සො කිර අනභිසිත්තොව ඡබ්බස්සානි රජ්ජං කාරෙසි, අභිසිත්තො තීණි සංවච්ඡරානීති නව වස්සානි රජ්ජං කාරෙසි තතො තස්ස පුත්තො උච්චනා නාම කුමාරො වීසති වස්සානි රජ්ජං කාරෙත්වා අත්තනො කනිට්ඨභාතරං පිතු නාමතුලස්සං සීහපුරං නාම කුමාරං රජ්ජං පටිච්ඡාපෙත්වා අඤ්ඤත්ථ ගතො සීහපුරකුමාරො පන නවසංවච්ඡරානි රජ්ජං කාරෙත්වා කාලං කතො, තතො තස්ස පුත්තො කොසුච්චානො නාම කුමාරො දස සංවච්ඡරානි රජ්ජං කාරෙත්වා කාලං කතො තතො තස්ස කනිට්ඨභාතා පිතු නාම තුලෙක සීහපුරො නාම කුමාරො තීණි සංවච්ඡරානි රජ්ජං කාරෙසි තස්මිං කාලෙ පුබ්බුත්තරතො පරසෙනා ආගන්ත්වා මහායුද්ධං යුජ්ඣමානො පරසෙනා හත්ථගතො—පරසෙනාසු ගතාසු තස්ස ජෙට්ඨභාතා උච්ච නාම කුමාරො රජ්ජං කාරෙසි, සො තීණි මාසානි රජ්ජං කාරෙසි, තස්මිං සමයෙ සතිවනයො නොම උත්තරපාරිරජ් කුමාරො ආගන්ත්වා සිංපහාරං කත්වා ජෙත්වා තං නගරං අග්ගහෙසි, සො චත්තාරි සංවච්ඡරානි රජ්ජං කාරෙත්වා කාලමකාසි තතො තස්ස භගිනිපතිභූතො උච්ච නාම කුමාරො චූළමාතු පුත්තො තරහෙකවහ කුමාරො රජ්ජං කාරෙසි තස්ස වාදස සංවච්ඡරෙ සම්පත්තෙ කාලෙ අයමාචරියො ඉදං පකරණං පඨයති—ගන්ථන්ති බන්ධන්ති නානප්පකාරෙ සද්දනෙ එත්ථ එතෙන වාති ගන්ථො—ගන්ථෙන්ති වා පකාසෙන්ති නානප්පකාරෙ සද්දනෙ යථාවුත්තනයෙනාති ගන්ථො, තෙසු—සරන්ති ගච්ඡන්ති හිත සුද්ධං එතෙනාති සාරො, සරිතබ්බො නිච්චකාලමෙව චින්තෙතබ්බොති වා සාරො, තං—අභි අතිරෙකො මතො ඉච්ඡිතොති අභිමතො, අභිමුඛං මතො ඉච්ඡිතබ්බොති වා, තං—ගහෙත්වාති ආදාය ගහෙතබ්බන්ති ගහෙත්වා, කම්මසාධන වාචකො හි එත්ථ ත්වාපච්චයො භාසිතාති පදස්ස විසෙස්සනත්තා, යාති සද්දසාරත්ථජාලිනී, භාසිතාති කථිතා, මයාති යොජනා, සාති සද්දසාරත්ථජාලිනී, නිභයාති අභයා, සමත්තාති පරියන්තා සංඛෙපතො අභයා ගහිතාති වා—තත් සියා, නනු ච පුබ්බාචරියසීහානං මතං නිස්සායාති පුබ්බෙ වචනතො ගන්ථෙසු තාදිවචනං පුනරුත්තිදොසමෙව භවතීති,?—තනන

නිගගමනාධිකාරත්තා වුත්තස්ස හි පුන වචනං නිගගමනං නාමා තිත්භයා සමන්තාති එත්ථ අමතෙ ගතෙඩ හයා නාම නත්ථි ඨානූප චාරෙන වුත්තනති දඨබ්බං."

29. කච්චායන භෙදය—මෙය බුද්ධවර්ෂ 2152 කට ප්‍රථම දඹදිව මහා යස* නම් ස්ථවිරයන්වහන්සේවිසින් කරණ ලදී—කච්චායනසාරයද කාලේ මෙම තෙරුන්නාන්සේමය—මෙහි න්‍යාස න්‍යාසටීකා රූප සිද්ධි යනා පොත්ද සඳහන් කර තිබෙනුය—සද්දසාරත්ථජාලිනී මුඛ මත්තසාර යන දෙකින්ද කරුණු ගෙණ තිබෙනුය—සන්ධි නාම කාරක සමාස තද්ධිත ආඛ්‍යාත කිතකායන්ගේ ලක්ෂණ හා ප්‍රභෙද උදාහරණ සහිතව දක්වන ලද ගාථා 400 සියයකට වැඩි නොවන තරම්වූ සඞ්ක්ෂිප්ත පරිච්ඡෙද සතක් ඇති පොතකි—මීට "කච්චායන භෙදප්‍රදීපකය" යිද කියත්—මෙම පොතට ටීකා දෙකක් හා සන්න යක් තිබෙනුය—සන්නය ප්‍රේතවස්තුඅටුවාසන්න කුසජාතකසන්න යනාදිය කළාවූ කොස්ගොඩ ගණේගොඩැල්ලේ විහාරයෙහි වැඩ සිටිය පඤ්ඤාසාරතෙරුන්නාන්සේ විසින් කරණ ලද්දකි.

මූලගාථා.

"ජිත මාරාදිකං බුද්ධං ධම්මං මොහවිධංසකං,
වන්දිත්වා උත්තමං සංඝං කච්චායනඤ්ච වණ්ණිතං.
කච්චායනස්ස භෙදඤ්හං සප්පයොගං යථාරහං,
සොතුජ්ජානමත්ථාය පවක්ඛාමි සමාසතො,"

සන්ධි ලක්ෂණ හා ප්‍රභෙද දක්වනලද ගාථා කීපයක්.

"සමාධියන්ති යං තත්ථ අදස්සෙත්වාන මන්තරං,
වඩ්ඪිතා වධීයන්ති සන්ධි තෙන පවුච්චති.
සරබ්‍යඤ්ජනවුත්තානං සන්ධීනඤ්ච වසා තිධා,
සරෙසු වා බ්‍යඤ්ජනෙසු විහිතා සරබ්‍යඤ්ජනා.
ගාථාසු වුත්‍යා හානත්ථං වාචාසිලිට්ඨතාය වා,
ලොපාගමං කරිත්වාන විහිතා වුත්තසන්ධිකං.
සඞ්ඛවිත්තං කිංසුධ තඤ්හි තස්ස මුසා භවෙ,
සෙය්‍යත්ථිකො පදමතො ඉදං තෙසං නිදස්සනං.

* මුන්වහන්සේ ගැණ කච්චායනසාරයේදී බලනු.

ලොපාදෙසච ආගමො විකාරෙ පකති තථා,
දීඝරස්ස වසෙනාපි සන්ධි සත්තවිධා මතා.
තයො තයො තයො චෙ චෙ චෙ චෙව යථාක්කමං,
ත්ළානවීසති සන්ධි පණ්ඩිතෙහි විජානියා."

---

30. කච්චායනභෙදමහටීකාව—මෙය බුඩවර්ෂ 2213 (ශක 1031) දී බුරුමරටේ උත්තමසික්ඛනම් තෙරුන්වහන්සේවිසින් සාදන ලදී—නෙත්තිප්‍රකරණරයෙන් හා එහි අටුවාවෙන්ද, අභිධම්මටීකා, අනු ටීකා, කච්චායන සාර, සද්දවුත්ති, සද්දත්ථභෙදචින්තා, වුත්තොදය, ගන්ධාභරණ, සද්දනීති, මණිමඤ්ජුසා, මණිසාරමඤ්ජුසා, සද්දසාරත්ථජාලිනී, මුඛමත්තසාර, කච්චායනදීපනී, න්‍යාස, මහානිරුත්ති, චූළනිරුත්ති, එකක්ඛරකොස, කච්චායනසාර, අනාගතවංස, අඞ්ගුත්තරටීකා, සන්ධිවිසොධන, එහි ටීකා, යන මේ පොත්වලින්ද උදාහරණ කොට තිබෙනවත් ඇර කුඩාපොත්වලට කරණලද ටීකා අතරෙන් මෙය පළමුවෙනි ටීකාවත්ය—මුල්පොතේ පරිච්ඡෙද 7 නුමුත් මෙහි පරිච්ඡෙද දශයක්ය—එයින් 1 වෙනි පරිච්ඡෙදයනම් මුල්පොතේ මූල ගාථාව (නෙත්තිප්‍රකරණයෙහි හා අටුවාවෙහි දක්වන ලද) දෙසනා හාර, විචයහාර, යුත්තිහාර, පදට්ඨානහාර, ලක්ඛණහාර යනාදි සොළොස්හාර නිඩාරෙපදෙස වශයෙන්ද, නන්දියාවත්තනය, තිපුක්ඛලනය, සීහවික්කීළිතනය, දිසාවිලොචනනය, අංකුසනය, යන පඤ්චප්‍රකාරනය නිඩාරෙපදෙස වශයෙන්ද, වණ්ණනාකිරීම හා, උල්ලිඞ්ගනය, වුත්තිනය, සම්බන්ධනය, උල්ලිඞ්ගසම්බන්ධනය, වුත්තිසම්බන්ධනය, යන පඤ්චප්‍රකාර සංවණ්ණනා නයද, ඊටම අන්තර්ගතවූ, පදවණ්ණනා, අත්ථවණ්ණනා පදත්ථවණ්ණනා යන තුනද, පදවණ්ණනාවටම අයිතිවූ ලිඞ්ගපදවණ්ණනා, විභත්තිපදවණ්ණනා, ප්‍රත්‍යයපදවණ්ණනා, ධාතුපදවණ්ණනා යන අෂ්ටප්‍රකාර වණ්ණනාවන්ද, අත්ථවණ්ණනාවට අයිතිවූ, ලිඞ්ගත්ථවණ්ණනා, ප්‍රත්‍යයාත්ථ වණ්ණනා, ධාත්වත්ථ වණ්ණනා, විභක්ත්‍යර්ථවණ්ණනා, යනාදිවූ නවප්‍රකාර අත්ථ වණ්ණනාවන්ද, උදාහරණ සහිතව විස්තරයෙන් ප්‍රකාශ කිරීමයි.

2 වෙනි පරිච්ඡෙදය නම් පළමුවෙනි දෙවෙනි ගාථා දෙක, සම්බන්ධ, පද, පදත්ථ, පදවිග්‍රහ, චොදනා, පරිහාර, යන ෂට්ප්‍රකාරයට ආගම ශාස්ත්‍ර පිළිබඳ නොයෙක් පොත්වලින් කරුණු ගෙණහැරදක්වා වණ්ණනා කිරීමය.

3 වෙනි පරිච්ඡෙදය "කච්චායනස්ස භෙදං" යන වචන දෙක

ගැණ කච්චායනව්‍යාකරණයාගේ ප්‍රභෙදයෝවූ සන්ධි, නාම, සමාස, තද්ධිත, ආඛ්‍යාත, කිතක, යන කාණ්ඩවල ප්‍රභෙද හා ලක්‍ෂණයන් නොයෙක් පොත්වලින් කාරණා දැක්වීම් වශයෙන් කියන ලදී.

4 වෙනි 5 වෙනි 6 වෙනි 7 නිවෙ 8 වෙනි 9 වෙනි 10 වෙනි පරිච්ඡෙද නම් මුල් පොතේ සන්ධි නාම කාරකාදි පරිච්ඡෙද හතේ ගාථාවල් පදයොජනා විග්‍රහාදි වශයෙන් වර්‍ණනා කරණ ලද්දාවූ පරිච්ඡෙද හතයි—සම්පූර්‍ණ පොත බණවර 24 ක් පමණය.

මූල ගාථාව්.

"බුද්ධං විසුද්ධ කරුණාධික ඤාණ සාරං
ධම්මඤ්ච මොහ මභිධංස ගතං සුපූජං,
නත්වා නිරංගණ ගණං'අභිදක්ඛිණෙය්‍යං
කච්චායනං දසබලෙන සුවණ්ණිතඤ්ච."

අග ගාථා.

"උත්තමසික්ඛා යස්ස උත්තමං සික්ඛතීති වා,
උත්තමසික්ඛාතිචෙහන ථෙරෙන උපසම්පදා.
එකතිංසාධිකෙ සක්කරාජෙ සහස්සකෙ කතා,
ගන්ථා දසහි කාලෙහි පරිපුණ්ණා යථා මයා.
සත්තරසහි වස්සෙහි සම්පන්නෙනාන ච භික්ඛුනා,
සීලාදිගුණ පුණ්ණෙන කච්චායනභෙදවණ්ණනා.
දසහි පාරමිතාහි සම්පජ්ජාමි භාවං භවෙ......,
සාසනං යාවතා ලොකෙ චිරං තිට්ඨති තාවතා.
තිට්ඨතු ච අනාකුලා කච්චායනභෙදවණ්ණනා."

තුන්වෙනි පරිච්ඡෙදයෙහි අකුරු ගැණ කියනලද විභාගයක් මෙසේය.

"අක්ඛරා එකචත්තාලීස භෙදා හොන්ති—අථවා—අක්ඛරා එකං නිග්ගහීතං ද්වත්තිංසබ්‍යඤ්ජනෙසු නවභෙදා හොන්ති තස්මා එකෙකබ්‍යඤ්ජනස්ස නව නව භෙදත්තා අට්ඨාසීති ද්විසත බ්‍යඤ්ජනානි හොන්ති—අට්ඨසු සරෙසු එකෙකස්ස රස්සස්ස වසෙන සරානි තෙත්තිංස භෙදත්තා චතුසට්ඨි ද්වෙසතානි හොන්ති මිස්සවසෙන—අථවා—එකෙකස්ස රස්සස්ස* තෙත්තිංස තෙත්තිංස භෙදත්තා නව නවුති හොන්ති—එකෙකස්ස දීඝස්ස චතුත්තිංස චතුත්තිංස භෙදත්තා සට්ඨි අධි

* සමහර පොතක. "එකෙකස්ස සරස්ස" කියාය.

ක එකසතානි හොන්ති, තස්මා නවපඤ්ඤාස චෙ සතානි සරානි හොන්ති බ්‍යඤ්ජනවසෙන—බ්‍යඤ්ජනවිරහිතෙන අඤ්ඤසරෙන සද්ධිං චාසත්තත්‍යාධිකා චෙසතානි මිස්සකවසෙන හොන්ති—සරරහිතෙන බ්‍යඤ්ජනෙන සද්ධිං එකවීසාධිකතිසතානි හොන්ති, තස්මා සබ්බෙ අක්ඛරා තෙනවුත්‍යාධිකා පඤ්චසතානි හොන්ති—තෙසු ඡත්තිංස බ්‍යඤ්ජනා සරතො පුබ්බා, නිග්ගහීතං සරතො පරං උච්චාරණවසෙනාති-තෙනාහු කෙචි සද්දසත්ථවිදූ, බ්‍යඤ්ජනානං උපරිමො අආ ඉඊ උඌ එ ඔ ත්‍යාදි—එත්ථ ච අඤ්ඤසරා එකං නිග්ගහීතං අආ ඉඊ උඌ එ ඔ අං-සසරා බ්‍යඤ්ජනානි, කකා කිකී කුකූ කෙ කො කං නව—ඛාදීනිපි නෙතබ්බානි, එවං අඨාසීති දුවෙ සත බ්‍යඤ්ජනානි හොන්ති, රස්සසරවසෙන සරානි පන තෙත්තිංස ආකාරෙ, තථා ඉකාරුකාරාච, ආකාරාදයො පන චතත්තිංස චතත්තිංස හොන්ති, එවං රස්සා නවනවුති හොන්ති, දීඝා නවසට්ඨිසතානි† හොන්ති, මිස්සකතො චතුසට්ඨි චෙ සතානි හොන්ති බ්‍යඤ්ජනවසෙන, බ්‍යඤ්ජනෙන සද්ධිං චාසත්තත්‍යාධිකා චෙසතානි හොන්ති, බ්‍යඤ්ජනෙන පන නිස්සරෙන සද්ධිං එකවීසාධිකා තිසතානි හොන්ති, සබ්බෙපි වණ්ණා තෙනවුත්‍යාධිකා පඤ්ච සතානි හොන්ති—එත්ථ ච කකාරාදයො ළකාරන්තා බ්‍යඤ්ජනා පුබ්බකා සරා පරා, අකාරාදයො පන සරපුබ්බකා බ්‍යඤ්ජන පරකා, ක කා ඉත්‍යෙතෙන බ්‍යඤ්ජනා පුබ්බකා සරා පරා, කි කී ඉත්‍යෙතෙන උද්ධං සරා, කු කූ ඉත්‍යෙතෙන අධො සරා, කෙ කෛ ඉත්‍යෙතෙන පුබ්බකා සරා, කො කෞ ඉත්‍යෙතෙන උභයා සරා, කං කඃ ඉත්‍යෙතෙන බ්‍යඤ්ජනා පරා එතෙසං ලක්ඛණා නියමාති."

31, සාරත්ථවිකාසිනිය—මෙය කච්චායන භෙදයේ පුරාණ ටීකා වයි—බුරුමේ තම්බදීප රටේ අරියාලංකාර තෙරුන්වහන්සේවිසින් බුද්ධ වර්ෂ 2152 පමණේදී (ඒනම් මහටීකාවට අවුරුදු 62 කට පමණ ප්‍රථම) සාදනලදී—පරිච්ඡෙද බෙදීම මුල්පොතේ ලෙසටමය—මහටීකාව සහ මෙයද එකම පොතේ ටීකා වුවත් පොත් දෙක එකකට එකක් බොහෝ කාරණාවලින් වෙනස්වත් ඇර ප්‍රමාණයෙන්ද මෙය මහටීකාවෙන් හතරෙන් කොටසකටත් අඩු තරම්ය-කර්තෘගේ වශයෙන්ද පසුව සෑදූහෙයින්ද ප්‍රමාණයෙන්ද මහටීකාව මෙයට වඩා සැලකියයුතුබව පෙනෙන්ට තිබෙනුය—කාරක කාණ්ඩයෙහි

† මූලකියනලද වාරයෙහි ගණනට සම නොවනබව පෙනේ.

“විසෙසනං ටීකා තෙසං” යනාදී ගාථාව පටන් ගාථා නවයකට ටීකා මෙම පොතේ නැති නුමුත් පුරාණ ටීකාවේ තිබෙනුය—මෙහිද ඒවා බැරිවීමකින් ඇරී ත්බෙනවා නොව සමහර පෙළ පොත්වල නැති නිසා එවාට ටීකා නොකර ඇරියබව කියා තිබේ—මහටීකා කතෘ පුරාණ පොත්වල තිබෙනවායයි ටීකා කර තිබේ—මෙය බුරුම රටේ යයි සැක හැර කිය හැකි නුමුත් මහටීකාව ලංකාවේද බුරුමේද යනු සැක හැර නොකිය හැකිය.

මූල අග ගාථා මෙලෙසය.

“ජිනො ජයකාරං ධම්මං සච්චයනෙඩා ජයාකරෙ,
ජිත්වා පරං ජිනාපෙසි සො මෙ දෙතු ජයං ජිනො.

යො මුනින්දිඤ්ද සධම්ම සිතාභාපූටදෙහිනං,
මනං පීනෙති ජනතූනං සො සංම්පීනෙතු මෙ මනං ..”

“බාවීසායු ච්චසෙසන රියලංකාති නාමිනා,
සත්නත්තරෙ ඤයච කවිස්සරෙහි හීමතං.

නයමොගගයහ කතොායං පරමත්ථ විනිච්ඡයො,
නවසඞ්වස්සාධිකෙ සකකරාජෙ නවසගෙත,

සාසනෙ පඤ්ඤසෙකාච් සතාවි සනසසකෙ...”

---

32. සද්දත්ථභෙදච්නතාව—මෙනම් පොතද තාම්බදීපරටේ අරිමද්ද නුවර බනිත්පාද පර්වතය සමීපයෙහි ගමක වාසය කළාවූ සද්ධම්ම සිරි නම් ස්ථවිරයන්වහන්සේ විසින් සංස්කෘත පොත්වලින් බොහෝ ශබ්ද ලක්ෂණ අඩගු කොට ගාථා තුන්සිය අනුගණනකින් සාදනලදී—කාලය බාලාවතාර සම්බන්ධචින්තා, න්‍යාස, රූපසිද්ධි, විසුද්ධිමාර්ගටීකා යනාදී පොත්වලට මෑත බවත් කච්චායනසාර කච්චායනභෙද ටීකා යන පොත්වලට ඉහත බවත් දැනගත හැකිය—අමරපුරේ නොබෝද වැඩසිටිය සංඝ රජ්ජුරුවන්ගේ ගෝලයෙක්වූ බුරුම ශාසනවංශය පාළියට පෙරළුවාවූ පඤ්ඤසාමි නම් රාජගුරු තෙරුන්වහන්සේවිසින් මීට ගුන්ථිපදත්ථ වර්ණනාවක්ද කරණ ලදී—මෙහි කතෘ සංස්කෘත භාෂාවෙහි ඉතා දක්ෂයෙකු නෙක් බව පෙනේ—මුන්වහන්සේ “බ්‍රිහජ” නම්වූ වේදපොතත් බුරුමභාෂාවට සන්නකළබව ශාසනවංශයෙන් දැනගන්ට තිබෙනවත් ඇර මෙම පොතේද පාණිනී චාන්ද්‍ර ආචාර්‍ය්‍ය මතයන්ද පෙන්වා ත්බේ—මෙම පොතේ වැඩි කොටස සංස්කෘත පොත්වලින් ගෙණ පාලිභාෂාවට ගැළපෙන ලෙස සාදා තිබෙනබව කච්චායන

සාරටීකාවේ පෙනෙන "යත්‍ථ ච සක්කතගන්‍ථෙහි වක්ඛති චාන්ද බ්‍යවහාරවසෙන කතා සද්දත්‍ථභෙදචින්තා ගහෙතබ්බා" යන පාඨ යෙන්ද පෙනේ—රත්නශ්‍රී නම් ආචාර්‍ය්‍යයන් විසින් විරචිත සද්දත්‍ථ චින්තානම් සංස්කෘත පොතක්ද ඇති බව හා එයින් සමහර කරුණු බාලාවතාර පදසාධනටීකා කාරකපුෂ්පමඤ්ජරී ආදියටද ගෙණ තිබෙනබව දැනගණ්ට තිබෙනවත් ඇර මෙයද එම පොතෙන් පාලියට නැගුවා වෙන්ටත් පුළුවන—නොහොත් මෙම නාමයෙන්ම සංස්කෘත පොතක් තිබී එයින් මෙය පාලිභාෂාවට පිවිපත් කළාය සිද සිතිය හැකිය-මෙහි ව්‍යාකරණ ශාස්ත්‍රයට අයිති කාරණා පමණක් නොව තර්කශාස්ත්‍රයෙහි නයවල්ද සංග්‍රහිතයි—මෙමපොතේ ගාථා වේනත් නොයෙක් ව්‍යාකරණ පොත්වලදී උදාහරණකර තිබේ—මෙසේවූ වෙන තුඩා ව්‍යාකරණ පොත්වලට වඩා පාඨවශයෙන් හා අර්ථවශයෙන්ද මෙය ගාම්භීරයි.

මූල ගාථා.

"සද්දත්‍ථභෙදවාදීනං පවරං වර වාදිනං,
අත්‍ථවාදිය සද්දත්‍ථ භෙදචින්තා විධීයතෙ.

සද්දො හි දුවිධො චින්තජො කාය දෙතුජොදර,
සද්දත්‍යත්‍ථොපකාරකතා චින්තජො ව්ධ ගය්හතෙ."

අග ගාථා.

"තම්බදීපවනයෙ රම්මෙ පිමද්දනපුරෙ කතා,
සද්ධම්මසිරිනා ගුළ්හා සාරසද්දත්‍ථ භෙදනී.

සද්දත්‍ථභෙද චින්තායං නිඨිතා ගන්‍ථතො පන,
තිසතං නවුති සතත තිපාද චතුරක්ඛරං.

සද්දත්‍ථලක්ඛණෙ භෙදී යො යො නිච්ඡිතලක්ඛණො
සො සො ඤාතු මනිච්ඡන පහොති පිටකත්තයෙ."

මෙහි පරිච්ඡෙද, සද්දභෙදචින්තා—අත්‍ථභෙදචින්තා—සද්දත්‍ථභෙද චින්තා—කියා තුනකට බෙදන ලද්දේ පමණක් නොව 1 වෙනි පරිච්ඡෙදයෙහි, අක්ෂර පද වාක්‍ය වශයෙන් හා නිත්‍යානිත්‍ය වශයෙන්ද ශබ්ද භේදය කියන ලදී—2 වෙනි පරිච්ඡෙදයෙහි, ස්වාර්ථ ද්‍රව්‍ය, ලිඞ්ග, සංඛ්‍යා, කාරක, යන පඤ්චප්‍රකාරයකින් අර්ථ භේදයයි—3 වෙනි පරිච්ඡෙදයෙහි ආචාර්‍ය්‍යමත සහිතව සමාස, තද්ධිත, ආඛ්‍යාත කිතක, උක්තානුක්ත ලක්ෂණාදි වශයෙන් ශබ්දාර්ථ ලක්ෂණ කියන ලදී.

33. සද්දත්ථභෙදචින්තා ටීකාව—මෙහි මුල් පොතේ ගාථාවල අදහස සාමාන්‍යයෙන් කියාගණ යමින් සමහර තැනකදී වෙන පොත්ද සඳහන් කොට තිබෙනුය—අමුතු යම් යම් පොත්වලින් වැඩි උදාහරණාදියක් දක්වා නැති නුමුත් මුඛමත්තදීපනිය-න්‍යාසය-යනු පොත් දෙකක් බව හැඟෙන්ට මෙහි පාඨයක් තිබේ—ඒ මෙසේය—“යස්ස තු කම්මෙ ක්‍රියාය පවත්තෙන්තා කොචි විකාරො න දිස්සති තං පත්තිකම්මං, ආදිච්චං නමස්සන ක්‍රියාය පවත්තෙන්තා කොචි විකාරො දස්සනෙන වා අනුමානෙන වා න දිස්සතෙ, එත්ථ ච විකතිකම්මං කත්ථාති මොග්ගල්ලානෙ, අඞ්ගාරන්ති මුඛමත්තදීපනියං වුත්තං, න්‍යාසෙ රූපසිද්ධියඤ්ච අභෙදූපචාරෙන තුල්‍යාධිකරණං කතං සද්දනීතියං පන කරධාතුස්ස යෙභුය්‍යෙන විකම්මකා පි අත්ථි වුත්තං” යනුයි.

කතීඃ බුරුම රටේ ස්ථවිර කෙනෙක්ය—මුල් පොතේ කතීඃමයයිද සමහරු කල්පනා කෙරෙත්—කාලය මුල් පොතට කී ප්‍රමාණයෙන් දැනගතහැකිතරම මිස ඊට වඩා සුඩලෙස කීම අමාරුය—නුමුත් අග වාසගමක ශක වර්ෂ 704 බවත් ගාථාවක 969 යේදී බවත් කියා තිබේ—ඒ රටවල ශකවර්ෂ කලියුගවර්ෂ දෙකම නොයෙක් නොයෙක් විධියට මේ රටේ ගණනට වෙනස්ව ව්‍යවහාරවෙන නිසා විශ්වාසයක් තබන්ට නොහැකිය.

මූල ගාථා.

“වත්ථුත්තයං නමස්සිත්වා තිභවාභිනතාරහං,
කරිස්සාමහං සද්දත්ථ භෙදචින්තත්ථ දීපනිං.”

අග ගාථාව සහ වාසගම.

“සද්දලක්ඛණ ඤාණස්ස කාරණං කුසලං ඉදං,
පච්චයො හොතු සබ්බඤ්ඤුතඤ්ඤාණස්ස පියස්ස මෙ.

සුවණ්ණමයකූටාදීහි විරොචමානගුහාහි සමන්නාගතත්තා රඤ්ඤු සකු ඉති පාකට නාමධෙය්‍ය මහාවිහාරෙ වසතා මහාථෙරෙන කතායං සද්දත්ථභෙදචින්තත්ථදීපනී චතුවස්සාධික සත්තසත සකක රජ්ජෙ කත්තිකමාසස්ස කාළපක්ඛපොසථෙ ගුරුදිනෙ නිට්ඨපිතා.”

---

34. කාරිකාව—තම්බදීප රටේ අරිමද්දන නුවර නන්ද නම් විහාරයෙහිදී ධම්මසෙනාධිපති නම් ස්ථවිරයන්වහන්සේවිසින් බුද්ධ වර්ෂ 1601 පමණේදී රාජ්‍ය කළ ඡන්දනුගින්ද නම් රජගේ කාලයෙහි කරණ ලදී—මේ කාලයෙහි ගන්ධමාදන පර්වතයෙහි සිට රහතන් වහන්සේලා මේ නන්දනම් විහාරයට පැමිණ වස්වැසූ නිසා උන්වහන්

ශේලාගේ සම්මුඛයෙහිදී මේ පොත ලියූහෙයින් පණ්ඩිතයින්විසින් සාරවශයෙන් ගතයුතු පොතක් යයි ආචාර්ය්‍යවරයෝ කියන බව ශාසනවංශයෙහි සඳහන්ව තිබේ—මේ පොත බණමර දෙකක ප්‍රමාණ නුමුත් ඉතා ප්‍රයෝජනවත් වැදගත් පොතකි—මෙහි ටීකාවද මේ ආචාරීන්වහන්සේ විසින්ම කළ බවද සඳහන්ව තිබෙනුය—කාරිකා යනු ස්වල්පාක්ෂර බහුලාර්ථාවබොධක ශ්ලෝකයට කියන නාමයක් බැවින් මේ පොතද ග්‍රන්ථවශයෙන් කුඩා වුවද බොහෝ ව්‍යාකරණ ලක්ෂණ කියනලද හෙයින් මෙම නාමය තැබුවායයි සිතමි—ආචාර්ය්‍ය මත බොහොමයක්ද වෙන පාළි ව්‍යාකරණ පොත්වල නොකිවුවාවූ සමහර වැදගත් කාරණාද මෙහි කියා තිබේ—පාළිභාෂාවේ ස්වරානන්ත ශබ්ද මිස ව්‍යඤ්ජනාන්ත ශබ්ද ඇති බවත් වෙන පොතක කියා තිබෙනවා දකින්ට නොලැබුනු නුමුත් මෙහි,

"ඉදං කිං එවමාදිකො බ්‍යඤ්ජනන්තො පකාසිතො,
සුබනාමස්ස නත්ථභෙදෙ සමනෙතායං විනිච්ඡයො."

යන මේ ගාථාවෙහි කියා තිබේ—න්‍යාස, රූපසිද්ධි, නිරුත්තිමඤ්ජුසා විසුද්ධිමාර්ගටීකා, සඟීටීකා, කාරිකාවුත්ති ආදියට පසුව බවත් කච්චායන වණ්ණනාදියට ඉහත බවත් දැනගණ්ටද තිබේ.

මෙහි පරිච්ඡේද බෙදීම.

සද්දවිනිච්ඡය—සද්දනුසාසනවිනිච්ඡය—කාරිකාවිනිච්ඡය—සුත්තගණවිනිච්ඡය—අක්ඛරවිනිච්ඡය—සරවිනිච්ඡය—රස්සදීඝවිනිච්ඡය—බ්‍යඤ්ජනාදියාව ඨානවිනිච්ඡය—කාරණාදියාව සන්ධි විනිච්ඡය—සන්ධිකාරිකා—නාමකාරිකා—කාරක කාරිකා—සමාස කාරිකා—තද්ධිත-ආඛ්‍යාත-කිතක කාරිකා යයි—සොළසකි.

මූල ගාථා.

"සුබ සද්දප්ප සම්බන්ධ දෙසකං ජිනපුඞ්ගවං,
තප්පකාසිත ධම්මඤ්ච ගණඤ්ච ගුණ සාගරං.
නත්වා කච්චානත්ථෙරඤ්ච තෙන සද්දනුසාසනං,
යම්දුන් කතං තස්ස කාරිකා වුච්චතෙ මයා."

සර්වනාම ගැණ කියනලද ගාථා කීපයක්.

"තිණ්ණණ්ණනං සුබනාමානං සධාරණ සභාවතො,
සබනාමනාති යං වුත්තං තස්ස කිං ලක්ඛණන්ති චෙ.
සෙහි රූපෙහි අඤ්ඤඤ්ඤෙහි රූපෙහි වූපලක්ඛිතං,
සරූපච පච්චක්ඛාමි තෙසඤ්ඤ අනෙකධා.

සබ්බකතරකතම උභය ඉතරාපි ච,
අඤ්ඤඤ්ඤතර අඤ්ඤඤ්ඤතම පුබ්බ අපර දක්ඛිණා.

උත්තර අධර අඤ්ඤ ය ත එත අමු ඉමා,
කිං තුම්හ අම්හ එතා ච ද්වි ති චතු ච පඤ්ච ඡ.

සත්ත අට්ඨ නව දස වීසාදි යා ච සංඛ්‍යා,
නිද්දිට්ඨ සබ්බනාමෙසු පඤ්ච ඡ සත්තාවජ්ජිතං.

අට්ඨ නව විවජ්ජිතං දස සද්ද විවජ්ජිතං,
තුම්හාම්හ වජ්ජිතඤ්චෙව සකලං සබ්බනාමිකං.

සකලං ගුණනාම ච තිලිඞ්ගික මුදාහටං,
සංඛ්‍යා වසෙන නිද්දිට්ඨ සබ්බනාම විනිච්ඡයං.

මති හෙදෙන දීපෙය්‍ය සද්දසත්ථවිදූ ඉධ,
එකාදසට්ඨාරසන්තා යෙ සද්දා සංඛ්‍යය වාචකා.

ලිඞ්ගත්තයෙන සංයුත්තා එකවචනකා,
වීසාදි ආනවුත්‍යන්තා සංඛ්‍යා සංඛෙය්‍ය වාචකා.

ඉත්ථිලිඞ්ගෙන සංයුත්තා තදෙක වචනන්තකා,
සතාදි යාව සංඛෙය්‍යා සංඛ්‍යා සංඛෙය්‍ය වාචකා.

නපුංසකෙන සංයුත්තා සබ්බදා වචනද්වයා,
සබ්බනාම මිතො අඤ්ඤං විඤ්ඤාතබ්බං විචක්ඛණා.

පාළිප්පදෙ නානත්ථෙ විජ්ජමානං යථාරහං,
ඉදප්පච්චයතා දිම්හි ඉදං සද්ද නිදස්සනා.

විසු කම්මාදි පාඨම්හි විසුං සද්ද නිදස්සනා,
තථා ජාතකපාඨෙසු ත්‍යාසු ත්‍යම්හි නිදස්සනා.

කෙචි ත සද්ද ආදෙස ත්‍යං සද්දන්ති වදන්ති ච,
ජානන්තා සද්දසත්ථම්හි පත්වා පාඨකතාමිං යදි.

පාළි ඤාතුං නසක්කොන්ති සබ්බෙ බාහිරපණ්ඩිතා,
ලොකවොහාර විධුරා තන්තියං බහුකා නයා.

සික්ඛෙය්‍යාමල සාගරං තරං නිබ්බාන තිත්ථගං,
පඤ්චසංඛ්‍යා සබ්බනාමං ඡසත්ත සබ්බනාමිකං.

අට්ඨ නව සබ්බනාමං දස ච සබ්බනාමිකං,
උපසග්ගනිපාතා ච තුම්හාම්හාව්‍යයමෙව ච.

අලිඞ්ගමිති වුච්චන්ති ලිඞ්ගභෙද විචක්ඛණා,
අලිඞ්ග චෙ කථං තුම්හා විගතාති සංභවන්ති චෙ.

ලිඟරූපනත්ථාභාවා අලිඟං ලිඟ මෙව තං,
න තු ආඛ්‍යාතසද්දෙව අලිඟම්ති ඤායතෙ.
ඉත්ථි පුම නපුංසක ලිඟසාධාරණං සියා."

අඟ ගාථා.

"තම්බදීපව්හයෙ රට්ඨෙ රිමද්දන පුරෙ වරෙ,
මහාථෙරනාමාවාසෙ නන්දනාම විහාරකෙ.
වසතා පීර චිතෙතන ජින සාසන නන්දිනා,
ධම්මසෙනාපති නාම ථෙරෙන රචිතා අයං."

---

35. විභත්‍යර්ථ ග්‍රන්ථය—බුද්ධ වර්ෂ 2025 දී අරිමද්දන නුවර රජකම් කළ ක්‍යච්වා නම් රජ්ජුරුවන්ගේ කුමාරිකාවක්විසින් මෙම ග්‍රන්ථය සාදනලදි. මේ කුමාරිකාවගේ පියරජතෙම ත්‍රිපිටකධර්ම, ශාස්ත්‍ර දෙක්හි ඉතා සමර්ථයෙක්ව සිටියනිසා සියළු රාජකෘත්‍යයන් යුවරජ හට භාරදී පොකුණක් මැද ප්‍රාසාදයක් සාදවා එහි නැවතී භික්ෂු සංඝයාටද අන්තඃපුර ස්ත්‍රීන්ටද ආගම ශාස්ත්‍ර ඉගැන්වූ බවද සද්දබින්දු පරමත්ථබින්දු යන ව්‍යාකරණ පොත් දෙකක් සෑදූ බවද, ඒ රජගේ කුමාරිකාවක් විසින් මේ "විභත්‍යර්ථ" නාම් ග්‍රන්ථය සෑදූ බවද බුරුම රටේ රාජවලියෙහි කියාතිබෙනවාය.

එහි අදහසනම් විභක්තීන්ගේ අර්ථ ප්‍රකාශ කිරීමයි—ප්‍රථමං විභක්තියෙහි අර්ථ එක කාණ්ඩයකටද, ද්විතීයා, තෘතීයං, චතුර්ථී, පඤ්චමී, ෂෂ්ඨී, සප්තමී යන විභක්ති හයේ අර්ථ කාණ්ඩ හයකටද, මෙසේ දක්වීමෙන් පොත කාණ්ඩ හතකට බෙදනලදී—මෙය අභිධානප්පදීපිකාවේ අඟට යොදා අච්චුගස්වා ප්‍රසිද්ධකොට තිබෙන හෙයින් එහි ක්‍රමය බලාගත හැකිය.

මූල අඟ ගාථා දෙක මෙසේය.

"විභජ්ජවාදී සම්බුද්ධං ධම්මං සුජන සෙවිතං,
සංඝඤ්ච වන්දිත්වා කස්සං විභත්‍යත්ථං සුදුල්ලභං.
නිස්සිතො ච විභත්‍යත්ථො යථා සබ්බෙපි පාණිනො,
තථාව සම්මා සංකප්පා සිස්සං සිජ්ඣන්තු පත්ථිතං."

---

36. විභත්‍යර්ථ ටීකාව— බුරුමදේශයට අයිති කොටුම්බ නම් රටේ විමලාභිධජ රාජගුරු තෙරුන්නාන්සේ විසින් සාදනලදී—කුඩාතුමුත් වැදගත් ටීකාවකි—යම් කිසි පොතක නාමයක් මෙහි සඳහන්

කරනැති කුමුත් කච්චායනසාර ටීකාවේ වාසගම් එලෙසින්ම ගෙණ ලියා තිබෙන බව පේන නිසා ඒ පොතට මෑතබව පෙණේ.

මූල ගාථාව.

“වත්ථුත්තයං නමස්සිත්වා විප්පසන්නෙන චෙතසා,
සුභාජනාය වක්ඛාමි විභත්‍යත්ථස්ස දීපනිං.”

---

37. වාචකොපදෙසය—හංසාවතී නුවර රජකම් කළාවූ “ජයසීථනි තදු” රජගේ සහෝදරයෙක්වූ සීහසූර රජගේ අමාත්‍යයෙක් විසින් සාදවනලද තුන්මාල් ප්‍රාසාදයෙහි වැඩ සිටිය කාලයෙහිදී (ඒනම් බුඩ වර්ෂ 1725 ට පසු ශක: 967 දී), කච්චායනවණ්ණනා කර්තෘවූ මහාවිජිතාවී නම් තෙරුන්වහන්සේවිසින් දශප්‍රකාර වාචකයන් ගැණ උදාහරණ සහිතව විස්තර උපදෙශ දක්වා ගාථා පාඨ දෙවග්ගයෙන් සාදනලද පොතකි—ප්‍රමාණය සද්දසාරත්ථජාලිනියට සමානයි—මේ පොතට ටීකාවක් ඇති බව දැනගන්ට නැත.

මූල ගාථා සහ පාඨයක්.

“බුද්ධාදිච්චො තමං මොහං හනත්වා ධම්මම්බුජංසුතා,
බොධෙසි කමලා ජනතා සම්මා මං පාතු සො ජිනො.

පුබ්බාචරිය සෙට්ඨානං නයං නිස්සාය සාසනෙ,
වක්ඛං බාලෙ විකාසෙතුං වාචකමුපදෙසකං.”

“වාචකො දසවිධො දුතියා වාචකො තතියා වාචකො චතුත්ථී, පචමී, ඡට්ඨී, සත්තමී වාචකා සමාස වාචකො තද්ධිත වාචකො ආඛ්‍යාත වාචකො කිතක වාචකො චාති—වච්චං අට්ඨවිධං, කත්තු වච්චං කම්මවච්චං කරණ වච්චං සම්පදානවච්චං අවධිවච්චං සම්බන්ධ වච්චං ඔකාසවච්චං භාවවච්චඤ්චාති—එවං දස්සිතෙසු උච්චවාචකෙසු දුතියා තතියාදි විභත්තිවාචකා යථාරහං භාවවජ්ජිතං සසම්බන්ධං සත්තවිධං වච්චං වදන්ති ‘බුද්ධං අනුචරෙ භි’ ත්‍යාදිසු භි බුද්ධසද්දෙ සකත්ථද්ධලිඞ්ගවසෙන ති කප්පං වදති ක්‍රියාපෙක්ඛයති කම්මත්ථං විසයං කත්වා කම්මභෙ දුතියාති සුතෙතන තස්මිං කම්මත්ථසංඛාතෙ විසයෙ දුතියා විභත්ති විසයී භාවෙන පවත්තති සො විසයභූතො කම්මත්ථො වච්චං නාම සක්ත්‍යාදයො තදනුගතා ච විසයීභූතා දුතියා විභත්ති වාචකො නාම—...ඉති චතුරඞ්ග පබ්බතවාසීනං ථෙරානං අලංකාරභූතෙන මහාවිජිතාවී නාමිනා මහාථෙරෙන කතායං වාචකොපදෙසො නාම ගන්ථො.”

38. නයලක්ඛණවිභාවිනිය—අවුරුදු සියයකට පමණ ප්‍රථම බුරුම රටේ රතනාපුරයෙහි "විචිත්‍රාචාර" නම් ස්ථවිරයන්වහන්සේ විසින් නය එකසිය සොළසක් (ලක්ෂණ හා උදාහරණ සහිතව) ප්‍රකාශ කොට සාදනලද කුඩා පොතකි-නය යනු ක්‍රමයට නමකි-ක්‍රම සංඛ්‍යාත නයයන්ගේ ලක්ෂණයන් ප්‍රකාශකරණ ග්‍රන්ථය නයලක්ඛණවිභාවිනී නම් වේ—ඒ නය එකසිය සොළසෙන් සමහරක නාමයන් මෙසේය.

පච්චාසන්න.
පච්චාසත්ති.
පධාන.
උපලක්ඛණ.
නිදස්සන.
යෙභුය්‍ය.
තබ්බහුල.
නානන්තරික.
අවිනාභාව.
අසාධාරණ.
මිගපදවලඤ්ජන.
සිනානසත්තිසමවෙත.
සිලෙස.
පදීප.
තන්ත.
එකසෙස.
සාමඤ්ඤනිද්දෙස.
මහීරුහ.
චන්දරක.
සුරියකන්ත.
අම්බසෙචනගරු
පීනන.]
ගොබලිවද්ද.
පුඤ්ඤඤ්ඤාණසම්භාර.
අධික.
ආවුත්ති.
ආවට්ට.
නාවාසකට.
යථාසම්බන්ධ.
යථාක්කම.
යථාලාභ.
දීපක.
පාරිසෙස.
ගොගණ්ඩා.
කාකොලොකන.
රුක්ඛසකුණ.
දන්තවෙජ්ජ.
දන්තසොණ්ඩ.
තපොසජ්ජන.
භික්ඛාචරිය.
අතිසය.
රුක්ඛාරූළ්හ.
මග්ගගමන.
අවුත්තසිද්ධි.
අත්ථාපන්න.
බ්‍යතිරෙක.
නීතත්ථ.
නෙය්‍යත්ථ.
අන්වත්ථ.
රූළ්හි.
භූතපුබ්බගතික.
උක්කට්ඨ.
අභෙද.
එකදෙසවොහාර.
නිරුත්ති.
විපල්ලාස.
යනමේ ආදීයයි.

මෙයින් සමහරක විස්තර මෙසේය.

"යස්මා කාකෙ වාරය මච්ඡමහාති ආදීසු අාසන්න වචනෙන දූරම්පි ලබ්භති තස්මා තං පච්චාසන්නං නාම—බදිරවනං තක්ඛදීසු ඨානිනා ඨානං සල්ලක්ඛෙත්වා බහුවචනෙන අප්පකම්පි ලබ්භති තස්මා තං යෙභුය්‍යනාම—වනචරකො තක්ඛදීසු ඨානෙ ඨානිං සල්ලක්ඛෙත්වා බහුවචනෙන අප්පකම්පි ලබ්භති, තස්මා තං තබ්බහුලං නාම."

මූල ගාථාව මෙසේය.

"නත්වා නිපුණගම්භීර විචිත්‍ර නයදෙසනෙ(?)
ඡෙකානාථං කරිස්සාමි නයලක්ඛණ විභාවිනිං."

39. ගන්ධාභරණය—බුද්ධවර්ෂ 1980 හරියේදී බුරුම රටට අයිති ඛෙම නම් රටේ රතනාපූරයෙහි රාජ්‍යය කළ මහානරපති රජ්ජුරුවන්ගේ කාලයෙහි එම නුවර වැඩසිටිය මහා අරියාවංස නම් ස්ථවිරයන් වහන්සේ විසින් ගාථා සියයකින් පමණ සාදන ලද පොතකි—මුන්වහන්සේ නම් අපූරු සමර්ථකෙනෙක්වා පමණක් නොව අභිධර්මවිභාවිනී නම්වූ අභිධර්මාර්ථ සංග්‍රහ ටීකාවට, මණිසාර මඤ්ජූසා නම්වූ ඉතා වැදගත් අනුටීකාවක්ද, මණිදීප නම්වූ පොතක්ද ජාතකවිසොධන අනුටීකාවට බුරුම භාෂාවෙන් සන්නයක්ද කළාවූකෙනෙක්ය—මුන්වහන්සේ මණිසාර මඤ්ජූසා නම් අනුටීකාව කරණකාලයෙහිදී එහි තීන්දු කළ කළ කාණ්ඩවල යම් දෝෂයක් ත්‍රෙබිනම් කියන ලෙසට සංඝයාට නියම කොට පෝය දවස්වලදී චෛත්‍ය මළුවට සංඝයා රැස්කොට කියෙව් බවද, ඒ අතර අරිමද්දන නුවරින් චෛත්‍යය වැඳිම පිණිස පැමිණි ස්ථවිර කෙනෙක්ද අසා හිඳ ස්වල්ප දෝෂ දෙකක් ඒ කියෙව් හරියේ තිබුන නිසා එසේ දැන ගණ්ට ලැබුනුබව ග්‍රන්ථකර්තෘට ඇගෙව්වාය, උන්වහන්සේද විහාරයට ගොස් දෙව්නු මුල පටන් බලාගණ යන අතර ඒ දෝෂ දෙක උන්වහන්සේටත් හැඟී දෙවනු ආගන්තුක තෙරුන්වහන්සේට සම්මුඛව උන්වහන්සේට කල්පනාවූන දෝෂ තුමක්දැයි විචාළ කළ අසවල් ඒවායයි කීවාය—ඒද ග්‍රන්ථකර්තෘ කල්පනා කළ දෝෂ දෙකම බව පෙනී ඉතා සතුටුව තමන්වහන්සේ පොරවාගණ සිටි දෙපට සිව්ර ආගන්තුක තෙරුන්වහන්සේට පූජා කොට මෙයින් "නුඹවහන්සේගේ ඤාණයට පූජා කරමි" යයි කී බවද, මෙම තෙරුන්වහන්සේ සූත්‍රනිර්දේශාදිය කළ ඡපට තෙරුන්වහන්සේගේ සමාගමේකෙනෙක් බවද බුරුම රාජවලියෙහි කියා තිබෙනවාය—මෙම ගන්ධාභරණයෙහි අදහස නම් නිපාතයන්ගේ අර්ථ උදාහරණ සහිතව ප්‍රකාශ කිරීමයි—මෙය සහ එකක්ඛරකොසයද නිඝණ්ඩු ශාස්ත්‍රයට අයිති පොත්යයිද කිය හැකි නුමුත් දශග්‍රන්ථයට අයිති දෙකක් බැවින් මෙහි සඳහන් කෙළෙමු.

මූල ගාථා.

"විචිත්‍රනය සම්පන්නා දෙසනා යස්ස තාදිනො,
නමො සද්ධම්මසංඝස්ස තස්ස ආදිච්චබන්ධුනො.
වන්දනෙය්‍ය පණාමස්ස ආනුභාවෙනුපද්දවෙ,
සොසෙත්වාහං කරිස්සාමි නිපාතත්ථ විභාවිනිං."

අග.

"ගන්ධාලංකාර භූතානි නිපාතා අත්‍ර දීපිතා,
ධීරානච මුඛමණ්ඩො තතො තං නාමකො අයං.

පාලි ටීකාදි යං ගන්ථං භාසිතං හි ජිනාදිනා,
සබ්බං තම්පි නිපාතෙහි විචිත්තෙහෙව සොභිතං.

අසික්ඛිත්වා නිපාතානං යො ගන්ථං විධ සික්ඛති,
අලාපුවස්ස තොයම්හි විනතං නාභිමුත්තං සදා.

යං තං භාසති සො මඤ්ඤෙ ලොකිකං පිච පාං විනා,
උම්මත්තක වචනංව අසොභං තස්ස භාසිතං.

සික්ඛිත්වා පනිමං ගන්ථං සික්ඛනෙත්තා පිටකත්තයං.
පාපුණෙය්‍ය ච මෙධාවී යථාභූතාවබොධනං,

සජානිත්වා පනිඛෙවං ගුණසාරමනාකුලං.
සික්ඛිතබ්බො වයං ගන්ථො සෙක දෙසොපි භාසනෙ,

පුඤ්ඤවා පඤ්ඤවා යො සො පාකටො සබ්බ භූතලෙ,
අජ්ජවො මද්දවො සන්තො යුත්තො ච පටිපත්තිහි.

තෙනෙව හිතකාමෙන යතිපොතාන මුත්තමො,
අරියාවංස නාමෙන කතොයං මති වඩ්ඪනො."

---

40. ගන්ධාභරණ ටීකාව—බුරුමරටේ විජයාරාමාධි වාසී "සුවණ්ණ රසි" නම් ස්ථවිරයන් වහන්සේ විසින් බුද්ධ වර්ෂ 2128 දී සාදන ලදී—මෙමටීකාවත් ඉතා ගරුකටයුතු එකක්වත් ඇර සුබොධාලංකාර, ගන්ධාභි, ගන්ධසිටීකා, අභිධම්මාත්ථසංග්‍රහටීකා, සාරත්ථදීපනී සද්ද බින්දුටීකා මණිසාරමඤ්ජුසා, වුත්තොදය, න්‍යාස, මුඛමත්තදීපනී මොග්ගල්ලායනවුත්ති, රූපසිද්ධි, සද්දවුත්ති, සද්දසාරත්ථජාලිනී, යනාදි පොත්වලින්ද උදාහරණ ගෙණ සාදා තිබෙනබව පෙණේ—ප්‍රමාණය බණවර 8 පමණය—මෙහි ක්‍රමය දැනගැණීම පිණිස මූල අග ගාථා සහ දළ්හීකරණ ලක්ෂණය ගැණ දක්වනලද ගාථා දෙකේ ටීකා පාඨද මෙහි දක්වනු ලැබේත්.

"අසෙස ඤෙය්‍යබ්ධි ගතං සුබොධිං
නත්වාන නාථං වර භූරිපඤ්ඤං,
ධම්මඤ්ච සංඝං අභිවන්දනෙය්‍යං
වත්ථුත්තයස්මිං කතපුඤ්ඤතෙජසා."

“ දළ්හියෙ වචනෙ වුත්තෙනත්‍යාදි* දළ්හීකරණලක්ඛණගාථාය පන දළ්හිය වචනෙ අදළ්හෙ දළ්හං කාතබ්බවචනෙ වත්තුනා කෙනචි පුරිමවාක්‍යෙ කථිතෙ යෙව සති යං පච්ඡිමං පච්ඡාවුත්තවචනං දළ්හිය වචනං, එතස්ස දළ්හියවචනස්ස ඔචිත්‍යා ච යුත්තියා ච ආගමෙන ච බුද්ධාදීනං පාඨෙන ච හොති තං පච්ඡාවුත්තවචනං දළ්හීකරණං නාම වුච්චතීති පදත්ථෙන සහ පදසම්බන්ධො වෙදිතබ්බො—අදළ්හස්ස පුරිමවචනස්ස දළ්හීකරණං පච්ඡිමවචනං දළ්හීකරණං නාමාති අය මෙත්ථ අධිප්පායො—තං පන පච්ඡිමවචනං හි ච පන සද්ද සද්ද සහිතං කත්වා වුත්තමෙව හොතීති දට්ඨබ්බං, තද්ද හි ච පන සද්ද දළ්හී ජොතකා නාම හොන්ති, තෙසු හි ච සද්ද යෙභුය්‍යෙන දළ්හී ජොතකා ඉතරෙ අප්පකෙනාති දට්ඨබ්බං—අදළ්හං දළ්හං කාතබ්බන්ති දළ්හියං, වුච්චිත්ථාති වචනං, දළ්හියඤ්ච තං වචනඤ්චාති දළ්හිය වචනං, තස්මිං දළ්හිය වචනෙ—භාවලක්ඛණෙ භුම්මං—වුච්චිත්ථාති වුත්තං, තස්මිං වුත්තෙන—අවගාහෙත්වා පාළියාදීසු අනුපවිසිත්වා වියතීති ඔචිත්‍යන්ති, සම්පිණ්ඩෙත්වා කරීයතීති අත්ථො, යුත්ති සංඛාතා අට්ඨකථාදි සංවණ්ණනා, තාය ඔචිත්‍යා—“ මනොගණාදිතො ” වාදිසුත්තෙන ආදිග්ගහණෙන නාවචනස්ස ආ ආදෙසං කත්වා පසඤ්ඤස්ස සරස්ස යාදෙසං කත්වා තකාරස්ස විසංයොගඤ්ච කත්වා රූපං භවති—තං නිස්සාය ආගමො ගම්යතීති පාපුණීයතීති ආගමො, ආගච්ඡන්ති වා සම්මුති පරමත්ථභූතා අත්ථා සමො සරන්ති එත්ථාති ආගමො, ආගම්යන්ති දානසීලාදි අත්ථා ඤායන්ති එතෙනාති ආගමො, තං තං ආගම්ම අට්ඨකථාදි සංවණ්ණනා විසෙසා ගච්ඡන්ති පවත්තන්තීති වා ආගමො, බුද්ධවචනන්ති වා පාඨො, තෙන ආගමෙන අදළ්හං, දළ්හං කරෙතීති දළ්හීකරණං, කත්ථචි යුප්පච්චයො දළ්හීකාරකන්ත්‍යපි පාඨො, ණවුප්පච්චයො ඡන්දානුරක්ඛණත්ථං කකාරෙ අකාරස්ස දීඝං කතං, සෙසං සුවිඤ්ඤෙය්‍යමෙවාති ඉදමෙත්ථ නිබ්බචනං—ඉදානි ඔචිත්‍යා ආගමෙන ච දළ්හීකරණන්ති වුත්තං ආගම දළ්හීකරණං ඔචිත්‍ය දළ්හීකරණන්ති දුවිධං දළ්හීකරණං සරූපතො දස්සෙතුං ‘ බුද්ධාදීනඤ්හි පාඨෙන ’ ත්‍යාදි† ගාථා වුච්චන්ති, තත්ථ හි ද්වින්නං දළ්හීකරණානං විසෙසතො රූපං වක්ඛාමි—

---

* දළ්හියෙ වචනෙ වුත්තෙන ඔචිත්‍යා ආගමෙන ච
දළ්හීකරණ මෙතස්ස පච්ඡිමං දළ්හීකරණං.

† බුද්ධාදීනං හි පාඨෙන වුත්තං ආගමදළ්හිකං,
කාරණානං විරොධෙන වුත්තං තං යුත්තිදළ්හිකං.

දළ්හීකරණං පණ්ඩිතෙන වුත්තං පාළිභූතෙන වචනප්පබන්ධෙන
බුද්ධාදීහි දෙසිතෙන තං ආගම දළ්හීකරණං නාම දළ්හං, යං පන
දළ්හීකරණං වුත්තං කාරණානං විරොධෙන කාරණානං බුද්ධාදි
වචනානං අවිරොධෙන අවිරුද්ධෙනත්ථෙන අට්ඨකථාදි වචනෙන,
අථවා, කාරණානං විරොධෙන හෙතූදාහරණූපමානං අවිරුද්ධ
ෙනත්ථෙන අට්ඨකථාදි වචනෙන තං දළ්හීකරණානං යුත්තිදළ්හීකං
ඔචිත්‍ය දළ්හීකරණං නාමාති දළ්හන්ති පදත්ථෙන සහ පදසම්බ
න්ධො—තත්ථ ආගමෙන බුද්ධාදිවචනපාඨෙන සාධකභූතෙන අ
ත්තනා වුත්තස්ස දළ්හියවචනස්ස දළ්හීකරණං ආගමදළ්හීකරණං
නාම, යුත්තියා අට්ඨකථාදිකාය සාධකභූතාය අත්තනා වුත්තස්ස
දළ්හියවචනස්ස දළ්හීකරණං යුත්‍යා ඔචිත්‍ය දළ්හීකරණං නාමාති
අධිප්පායො, තෙසු ච ආගමදළ්හීකරණං හෙතුනා නිද්දිසන්තො
ගන්ථකාරකා ඉතිහි වචනතොති ආහු—යුත්තිදළ්හීකරණං පන
ඉතිහි වුත්තත්තාති—අපිච ආගමනිදස්සනං දස්සෙන්තො වුත්තං
හෙතුං තෙන වුත්තං තෙනාහ යථාහ ඉච්චාදීනි ආහංසු—යුත්තිනි
දස්සනං දස්සෙන්තො පන තථාහි වුත්තං වුත්තංච වක්ඛති චාති
ආදීනි—අයමෙතෙසං විසෙසො අඤ්ඤත්‍ර ච බුද්ධො ආදී යෙසං මහා
සාවකානං තෙ බුද්ධාදයො, තෙසං බුද්ධාදීනං මහාසාරිපුත්තත්ථෙර
මහාකච්චායනත්ථෙරාදීනං, කත්තරි ඡට්ඨී—පඨීයති උච්චාරියතීති
පාඨො, අත්ථඤාපකො අක්ඛරප්පබන්ධො සො ච දුබ්බිධො පාළිපාඨො
අට්ඨකථාදි සංවණ්ණනා පාඨො, තෙසු ඉධ පාළිපාඨො අධිප්පෙ
තො බුද්ධාදීනන්ති වුත්තත්තා, ආගමෙන දළ්හං කරෙති එතෙ
නාති වා ආගමදළ්හීකං, පච්ඡිමවචනං දළ්හසද්දූපපදම්හා කරධා
තුතො ඉප්පච්චයං කත්වා කරධාත්වන්තං ඉපච්චයං ච ලොපෙත්වා
දළ්හකා ඉති ඨිතෙ යථාගම මිකාරෙති මජ්ඣෙ පදෙසෙ සඛසරා
ගමා හොන්තීති මහානිරුත්තිනයෙන දළ්හසද්දතො ඉකාරාගමං
කත්වා අකාරං ලොපෙත්වා සිවිහතත්‍රප්පත්තාදිම්හි කතෙ දළ්හීකමිති
රූපං භවති, පුන ආගමෙන දළ්හීකං ආගම දළ්හීකන්ති තප්පුරිස
සමාසො කාතබ්බො, පුරිමවචනත්ථෙ පන ලහුකවිග්ගහො නාම
කාතොති අත්ථො, ආගමදළ්හියන්ති වා පාඨො තකාරස්ස යකාර
දෙසො, යථා සත්‍යපුත්තියො ඉච්චාදී එසනායො යුත්තිදළ්හීකන්ති
එත්ථාපි, කරෙන්ති අට්ඨකථාදයො සංවණ්ණනා එතෙනාති කාර
ණං, බුද්ධාදිවචනපාඨො, ඉදං පුරිමයොජනානයෙන පන කරොති
ඵලං නිප්ඵාදෙතීති කාරණං හෙතු, විරුද්ධානං පටිලොමෙන
වත්තනං විරොධො, බුද්ධාදිවචනෙන හි යුජ්ජති සංසන්දතීති

යුත්ති, අඪකථාදි සංවණ්ණනා, යුත්තියා දල්හිකං යුත්තිදල්හිකං යුත්තිනාමකානත්‍ථිපි පාඨො තථං යුත්තිදල්හිකං යුත්තිති වුත්තං උත්තරපද ලොපෙන යුත්තිති නාමං එතස්ස වචනස්සාති යුත්ති නාමකානත් ඉධ බහුබ්බිහි සමාසො ච කාතබ්බොති ඉදමෙත් නිබ්බ වනං."

අග ගාථා.

ගන්ධාභරණටීකායං විජයාරාම සාමිනා,
සුවණ්ණරංසි නාමෙන සංඝරාජෙන ධීමතා.
සඞ්ඛෙපසීහසස නිබ්බානා වස්සෙ සච්චතිගතෙසු හි,
අඪවීස සතාදීසු වි සහස්සෙසු රචිතා."

---

41. නිරුත්තිසංග්‍රහ—මෙය ද බුරුම රටේ ජම්බුධජ නම් මහාස්ථවිරපාදයානන් වහන්සේ විසින් බුද්ධ වර්ෂ 2195 ට කිට්ටු කාලයෙහිදී සාදන ලද්දක් බවද, මුන්වහන්සේවිසින් සංවණ්ණනානයදීපනී නම් පොතක්ද සාදනලද කෙණෙක් බවද පෙනේ—පොතේ ප්‍රමාණය ගාථා 800 ක් පමණය—පරිච්ඡෙද 7 ක්ය—පළමුවෙනි පරිච්ඡෙදයෙහි සංඥාවිධිය හා සන්ධිලක්ෂණ භෙදාදියයි.

2 වෙනි පරිච්ඡෙදයෙහි සූත්‍රභෙදය සහ නාම ලක්ෂණ භෙදයයි.

3 වෙනි පරිච්ඡෙදයෙහි කාරක ලක්ෂණාදියයි.

4-5-6-7 වෙනි පරිච්ඡෙදවල පිළිවෙළින් සමාස, තද්ධිත, ආඛ්‍යාත, කිතක භෙදාදියයි.

මූල ගාථා.

"නිරුත්තිභෙද විඤ්ඤූනං පරමං සබ්බදස්සිනං,
සමන්තචක්ඛුනා බුද්ධං වන්දෙ නිරුත්තිසානත්තගුං.
විත්තා රතනපුප්ඵානි සංගහෙත්වා සුත්තජාතො,
එවං නිරුත්තියා ධම්මං වන්දෙ තදත්ථ සම්භවං,
සො තමුත්තරි ධාරෙනෙතා නිරුත්තිසරිතම්පතිං,
සංසාරොඝව සංඝනත්තං වන්දෙ තදත්ථ ධාරිනං
ඤාණ සද්ධම්ම නාමෙන ථෙරෙන පිරචෙතසා,
කතාලම්බ කරිස්සාමි නිරුත්ති භෙද සංගහං."

සංඛ්‍යා නාම ගැණ

"මිස්සකගුණිතා සංඛ්‍යා සම්බන්ධසංකෙතා නෙකා,
පචධා තෙසු මිස්සෙකවා ගයහමිස්සා චතුද්දස.

ගුණීත්වාන ගහෙතබ්බා ගුණීතො විසතං ඉති,
සම්බන්ධිත්වා ගහෙතබ්බං සම්බන්ධනාමකං යථා,
අඩ්ඪසට්ඨි සතසහස්සු බෙංධාගිරි රජති,
ලොකසංකෙත ගයහාතු සංකෙතා නාම සං යථා.
කාසි ච නහුතං ලක්ඛං ඉච්චාදිතු නිදස්සනං,
නෙකත්ථ වාචකා සංඛ්‍යා අනෙකා නාම සං යථා.
සතතෙජො සහස්ස රංසිතෙත්ථ නිදස්සනං,

තත්‍රායං සංගහො.

චතුද්දසාදි මිස්සකා ගුණීතා විසතාදිකා,
සම්බන්ධා අඩ්ඪඩ්ඪාදි සංකෙතා කාචි ආදිකා.
අනෙක සත තෙජාදි දෙණ්ණකාදිපමාණිකා.”

අන—“එතතාවතා ච නාමාදි චතුබ්බිධං පදං රූතං,
සුබුමත්ථාදි ලාභම්හි උපකාරාය සාසනෙ.
තස්මා සබ්බාසම්පනෙනාහි කුලපුනෙතාහි සාධුකං,
සාසනස්සොපකාරාය යොගො කරණීයො ඉධ.
බොධොදඛිසුතෙ ගාමෙ ජාතෙන ජාතියා මයා,
ජම්බුධජෙති නාමෙන කතෙං නිරුකත්සංගහො.
සුසඥ්ඥල් චන්‍දරූපම්හි ගොපෙළ්ම්හි පූණ්ණකෙ,
දුතියා සාල්ගියා නිඨො නාත්ථංගෙ බුධවාසරෙ.”

---

42. එකක්ඛරකොසය—මෙය ටීකාවේ පෙනෙන හැටියට බුද්ධ වර්‍ෂ 2009 දී (ඒනම්, ශක: 907) තාම්බදීප රටේ සද්ධම්මකිත්ති නම් ස්ථවිර යන්වහන්සේ විසින් සාදන ලද්දකි—තුමුත් මෙහි නාමය කච්චාය නාභෙදට්කා, කච්චායනවණ්ණනා, සුත්‍රනිද්දේශ, නිරුත්තිමඤ්ජූසාදි බොහෝ පොත්වල සඳහන්ව තිබෙන නිසා ඒ පොත්වලට පූරාණ බව පෙනේ—(කලියුග වර්‍ෂ 887 දී යයි ශා: වං: කියනලදී) මෙම නාම යෙන් සංස්කෘත භාෂාවෙන් තිබෙන පොත බලාගණ පාළිභාෂාවට යොග්‍යලෙස මෙය සාදනලද බව පොතේම කියනලද්දේ පමණක් නොව මුන්වහන්සේවිසින් ලිඟත්ථවිවරණ නාම් ප්‍රකරණයක්ද ධාතු රූප ප්‍රකරණයද, අත්ථවිශෙෂඤ්ඤපක නාම් ප්‍රකරණයද කළබව ටීකාවෙහි කියනලද්දේය—මෙහි අදහසනම් එකාක්ෂර නාමයන් ගේ අර්ථ ප්‍රකාශ කිරීමයි—මෙම පොත අභිධානප්පදීපිකාවේ අගට

යොදා අචිවුනසවා ප්‍රසිඞ කොට තිබෙනහෙයින් එහි ක්‍රමය දැන ගත හැකිය—මෙම පොත සාදා දැනට අවුරුදු 78 ය යනු එහි බැරිව් මකින් වැටී තිබෙනබව දතයුතුයි.

---

43. එකකඛරකොසටීකාව—මෙය තාඹදීප රටේම සංඝවිරකෙ නෙක් විසින් නිරුත්තිමංජුසයට ප්‍රථමකාලයෙහි සාදනලදබව මුත් කතෘගැණ සහ කාලය ගැණද ඊට වැඩි විස්තරයක් කියන්ට නොපෙනේ—මුල් පොතේ කතෘම බව බුරුමරටේ සමහර ලියවිලිවල කියා තිබේ—කවුරුන් විසින් සාදන ලද්දේ නුමුත් අපූරු තරමේ ටීකාවක් බවද සඳහනිති, විදගඩමුඛමඩන, නිඝණ්ඩුටීකා, යනාදියෙන් සමහර කාරණා ගෙණ තිබෙන බවද පෙනේ—මුල් පොතේදී කියනලද අර්ථවල ඒ ඒ අක්‍ෂරයෝ පවත්නාබව උදාහරණ සහිතව මෙහි කියන ලදී—පොතේ ප්‍රමාණය බණවර අටකට අඩු නැත.

මූල ගාථා මෙසේය.

"ලොකාතිලොකිනදසුලොකරජ්ජං
දෙවාති දෙවිනද සුදෙව දෙවං,
බ්‍රහමාතිබ්‍රහ්මිනද සුබ්‍රාත රාජං
වන්දෙ මුනිනදංජිත පචමාරං.
ධම්මාති ධම්මිනද සුධම්ම ධම්මං
මගගාති මගගිනද සුමගගරාජං,
මුතතාති මුතතිනද විමුතතිසාරං
අචචනතසෙඨං සිරසා නමාමි.
ඛෙතතාතිඛෙතතිනදසුපුඤ්ඤඛෙතතං
සීලාති සීලිනද සුසීල සාරං,
සංඝාති සංඝිනද සුසංඝරජ්ජං
අගගාරියසංඝං සිරසා නමාමි.
සංගායිතා වණණිතගණ්ඨකාරා
ආරූළහකා ලෙඛකාරදිචිතතා,
මයෙහාපකාරා ගුරවො පසණා
වනදෙ මහං තෙ සිරසා සුධීරෙ."

කකාරයෙහි අර්ථ දක්වන ලද "කො බ්‍රහ්මතත්තානිලක්කතග්ගි"* යනාදි ගාථාවෙහි ටීකාව මෙසේය—"තත්‍රායං සම්බන්ධො කො කකාරො පුල්ලිඞ්ගසුද්ධනාමපදභූතො කසද්දො බ්‍රහ්මෙ, අත්තනි සරීරෙ, අනිලෙ වාතෙ, අක්කෙ සූරියෙ, අග්ගිම්හි පාවකෙ, මොරෙ පුමෙ පුරිසෙති එතෙසු ච භූමියඤ්ච හොති—තත්‍ර

'ජිනනයෙන ආනීතං ලොකස්ස අමිතං හිතං
තස්ස පාදම්බුජං වන්දෙ කමොළි අළි සෙවිත'න්ති—ආදීසු

කසද්දො බ්‍රහ්මෙ හොති, කමොළි අළි සෙවිතන්ති පාදස්ස වන්දනත්ථානං අනෙකසතානං කානං බ්‍රහ්මානං මොළීහි මකුටසම්බන්ධෙහි අළීහි භමරෙහි සෙවිතන්ති අත්ථො හොති—කරජකායොති ආදීසු අත්තනි සරීරෙ, තත්‍ර හි කො වුච්චති සරීරං තත්‍ර පවත්තො රජොති කරජො, සුක්කසොණිතං, තෙන හෙතුභූතෙන සම්භූතො කායො කරජකායොති අත්ථො හොති—කකුධරුක්ඛො කුම්භණ්ඩො කලිඞ්ගරොති ආදීසු අනිලසඞ්ඛාතෙ වාතෙ, තත්‍ර හි කො වුච්චති වාතො වාතරොගාපනයනවසෙන කං වාතං කුධති නිවාරෙතීති කකුධො, රුක්ඛවිසෙසො—කං වාතං උම්භෙති වඩ්ඪෙතීති කුම්භණ්ඩො, මහාඵලො ලතාවිසෙසො—කෙන වාතෙන ඉකති සුඛසාලිතො අපනමිජ්ජතීති කළිඞ්ගරො වීහිපලාසොති අත්ථො,

'කරංකුකොකකුරරං කලහං කපිරංවිතො
සරොජකොමලොකාරං කිරණංසහ මංරුතො'න්ති

ආදීසු අක්කෙ සූරියෙ තත්‍ර හි කො අංසුමාලීති පුච්ඡායං සරොජකොමලොකාරන්ති එත්ථ කොතිදං විස්සජ්ජනපදං හොති, තෙන එතො සූරියොව අංසුමාලී රංසි පන්තිවන්තතා හොතීති විස්සජ්ජනං කතං හොතීති—කොළුම්භො කුම්භීති ආදීසු අග්ගිම්හි තත්‍ර හි කෙන අග්ගිනා ලුම්භතීති කොළුම්භො, භත්තපචනකො මහාකුම්භො, කෙන අග්ගිනා භවති කෙනෙව පචනභාවතොති කුම්භී, කෙන අග්ගිනා වා භණතීති කුම්භීති අත්ථො හොති—කරවීරො කෙකාති ආදීසු මොරෙ මයූරෙ, තත්‍ර හි කො වුච්චති මයූරො, කා මයූර රවන්ති එත්ථාති කරවීරො, පබ්බතවිසෙසො—කායන්තං තා, කෙ මයූරෙ පවත්තා කාති කෙකා, මයූරානං රවනසද්දොති අත්ථො හොතීති—කඤ්ඤාති ආදීසු පුමෙ පුරිසෙ, තත්‍ර හි කං පුරිසං ඤෙතී තොසෙතීති කඤ්ඤා, පුරිසෙහි අපරිභොගපුබ්බතරු

---

* "කො බ්‍රහ්මතත්තානිලක්කතග්ගි මොරපුමෙසු භූමියං
කං සුඛෙව ජලෙ සීසෙ කො පකාසෙ තිලිඞ්ගිකො."

ණීත්ති අත්ථො හොතීති, කෙදාරන්ති ආදීසු පථවියං, තත්ථ හි කෙ පථවියං දයකකස්සනවසෙන දලන්තං එත්ථාති කෙදාරං, පුබ්බණ්ණාපරණ්ණවිරූහණට්ඨානන්ති අත්ථො හොතීති—අපිච කාරං කුකො කතුරරන්ති ආදීසු පථවියං සප්පාධනං කිත්ති පුච්චායං කොති විස්සජ්ජනභාවතො කො සද්දො පථවිවාචකො හොතීති—කරුණා කතඤ්ඤු නාකොති ආදීසු සුඛෙ, තත්ථ හි කං සුඛං රූහතීති කරුණා, කං සුඛං දෙතීති කතඤ්ඤු සාලු, න කං සුඛන්ති අකං දුක්ඛං, තං නත්ථි එත්ථාති නාකො අකොනාති අත්ථො හොතීති—කාමලං කලසං කනකාරෙ කන්දරෙ කෙවට්ටො කොසරෙති ආදීසු ජලෙ උදකම්හි, තත්ථ හි කං උදකං අලංකරොන්තීති කමලං පදුමං, කෙන උදකෙන ලසතීති කලසො, සුසණ්ඨානො මඞ්ගලඝටවිසෙසො කෙන උදකෙන නරිතබ්බො අතික්කමිතබ්බොති කනත්ථාරෙ, නිරුදකපදෙසො කෙන උදකෙන දරීයති පදාලීයතීති කන්දරෙ, කෙ උදකෙ මච්ඡගහණත්ථාය වට්ටොතීති කෙවට්ටො කෙ උදකෙ සරන්ති ඔසරන්තීති අත්ථො හොති—කෙසා කණ්ඩොති ආදීසු සීසෙ, තත්ථ හි කෙ සීසෙ සෙන්ති උප්පජ්ජන්තීති කෙසා කං සීසං තිට්ඨති එත්ථාති කණ්ඩො අත්ථො හොතීති—

පුමො සබ්බත්ථ කො නාරී දෙති සබ්බත්ථ කා කුලං
දනං සබ්බත්ථ කං සාධුජනානං සබ්බද වරන්ති.

ආදීසු පකාසෙ පාකටෙ, තත්ථ හි සබ්බත්ථ දෙසෙසු කො පාකටො පුමො පුරිසො සබ්බත්ථ සබ්බදෙසෙසු කා පාකටා නාරී ඉත්ථි ච, සබ්බත්ථ සබ්බදෙසෙසු කං පාකටං කුලඤ්ච සාධුජනානං දනං පටිග්ගාහකානං වරං දනං සබ්බද සබ්බකාලං දෙතීති අත්ථො හොතීති.

---

44. කච්චායනසාරය—මෙය ජංඝදාස නම්වූ සංස්කෘත පොත නිශ්‍රයකරගෙණ සාදනලද්දේ පමණක් නොව ඉතා ප්‍රයෝජනවත් පොතක්ය කතෘ පාලි සංස්කෘත භාෂා දෙකම මනාලෙස ඉගෙණ ගත් බුරුමරටේ (කච්චායනභෙදයේ කතෘවූ) මහායස නම් ස්ථවිරයන්වහන්සේය—මේපොත සෑදීමට නිශ්‍රයකරගෙණ තිබෙන ජංඝදාස නම් ප්‍රකරණයද කතෘගේ නාමයෙන් එසේ නමුදු කාතන්ත්‍රව්‍යාඛ්‍යානය හෙවත් දෞර්ගසිංහවෘත්තිය නිශ්‍රය කරගෙණ සාදනලද සම්බන්ධාපදෙස නම් ප්‍රකරණය බව කියනලදී.

“ජංඝදාසකන්ති තනාපාමකො දෙසෙ නිසින්නෙනාන ජංඝාබලෙනසමන්නාගතත්තා දහරකාලෙ ආචරියස්ස දාසත්තා ච ජංඝදාසොති වොහාරිතබ්බභූතෙන කාලෙ ගතෙ නාථා වතාඤ්ඤං අසක්කු

ඤෙය්‍යත්තා ජංඝදාසොති වොහාරිතමෙන ආචරියෙන කතත්තා තනනාමකං සම්බන්ධොපදෙසනාමකඤ්ච පකරණං නිස්සාය...... තං පන සෙහුයෙන කාතන්තබ්‍යාකරණං නිස්සාය සක්කතභාසාය කතත්තා සුද්ධමාගධිකා න වලඤ්ජෙන්ති”-යනාදියෙන් බලනු, මෙම පොතේ කාලය බාලාවතාර රූපසිද්ධි සම්බන්ධචින්තා චූළනිරුත්ති යන පොත්වලට පසුබව සහ කච්චායනභෙද ටීකාවට ඉස්සරබවත් කිය හැකිය—මේ ප්‍රකරණයට පුරාණ අභිනව යන ටීකා දෙකක් තිබෙනවත් ඇර පොතේ ප්‍රමාණය කච්චායනභෙදය පමණය, පරිච්ඡෙද 7 ක්ය—සාමඤ්ඤනිද්දෙස—ආඛ්‍යාතනිද්දෙස—කිතකනිද්දෙස—කාරකනිද්දෙස—සමාසනිද්දෙස—තද්ධිතනිද්දෙස—යන මේවාය—සාමඤ්ඤ නිද්දෙස නම් පරිච්ඡෙදයෙහි උක්තානුක්ත විශෙෂණ විශෙෂ්‍ය ලක්ෂණ කියනලදී.

මූල ගාථා

“මුනින්දක්කො තමං මොහං හනිත්වා බොධෙසි පඞ්කජං,
ජනං සද්ධම්ම රංසීහි සො සංපාලෙතු මං ජිනො.
මාගධිකාය බාලානං වුද්ධියා බුද්ධසාසනෙ,
වක්ඛං කච්චායනං සාරං නිස්සාය ජංඝදාසකං.”

---

45. කච්චායනසාර අභිනවටීකාව—සංස්කෘත භාෂාවෙහි ප්‍රසිද්ධ සමර්ථයෙක්වූ සූනාපරන්ත රටේ එරාවතී ගංගා තීරයෙහි පචසෙති හාරජවිසින් කරවන ලද්දාවූ ප්‍රාසාදයෙහි වැඩසිටිය සිරිසද්ධම්මවිලාස නම් ස්ථවිරයන් වහන්සේවිසින් සාදන ලදී—මෙහි නාමය සම්මොහනාසිනී කියාය— කාලය රූපසිද්ධි අභිධම්මවිභාවිනී සාරත්ථවිලාසිනී නිරුත්තිමඤ්ජුසා යනාදි පොත්වලට පසුය—බාලාවතාර චූළනිරුත්ති සුසද්දසිද්ධි මොග්ගල්ලායන පඤ්චිකා සම්බන්ධචින්තා සාරත්ථවිලාසිනීනම් පඤ්චිකාටීකා යනාදි නොයෙක් පාළිව්‍යාකරණ පොත්වලින් හා පාණිනී, චාන්ද්‍ර, කාතන්ත්‍ර, කාතන්ත්‍රටීකා, ශබ්දාර්ථභෙදචින්තා, භාසකාරී යනාදි නොයෙක් සංස්කෘත ව්‍යාකරණ පොත්වලින්ද උදාහරණාදිය ගෙණ ඒ ඒ ආචාර්ය්‍ය මහයන් දක්වා සාද තිබෙන බව සහ මෙහි වාසනම් විභත්‍යර්ථ ටීකාවටද ගෙණ තිබෙන බවද බණවර දශයකට අඩු නොවන ප්‍රමාණවූ ඉතා විසිතුරු ටීකාවක් බවද කිය හැකිය.

මූල ගාථා.

“සද්දභෙදගතං බුද්ධං ධම්මං තෙන පවෙදිතං,
සංඝං තස්ස ගුණොපෙතං නමස්සිත්වාන සාදරං.

ටීකා කච්චාන සාරස්ස වුච්චතෙ මොහනාසනී,
පුරාතනා ච යා ටීකා න තා සම්මොහනාසනී.

තස්මා චන්දාදි මාලම්බ ගන්ථං කච්චායනාදිකං,
උත්තානත්ථ පදං හිත්වා සාධිප්පායත්ථ වණ්ණනං,

සබ්බා යා වුච්චතෙ ටීකා මයා සම්මොහනාසනී,
ඉදං චින්තෙත නිස්සාමෙත්ථ සාධවො සාරගෙසිනො."

මෙහි පොත්ගැණ උපදෙස දීමක් මෙසේය.

"යත්ථ ච කාතන්තෙති වක්ඛති තත්ථ ජයකතං අග්ගහෙත්වා දෙවං දීකතං අග්ගහෙත්වා සබ්බවම්මකතමෙව ගහෙතබ්බං, යත්ථ ච පඤ්ජිකායාති තත්ථ ච රතන මති කාසිකාදි පඤ්ජිකායො අග්ගහෙත්වා කාතන්තබන්ධනපඤ්ජිකාව ගහෙතබ්බා, යත්ථ ච සක්කතගන්ථෙති වක්ඛති තත්ථ චාන්ද බ්‍යවහාරවසෙන කතා සද්දත්ථභෙදචින්තා ගහෙතබ්බා,"

අග ගාථා.

"නානාදීපෙසු සම්බුද්ධසාසනන්තාති විස්සුතෙ,
රක්ඛඤ්ඤං පණ්ණාර සනනාව මොළිල පාද රාජිනි...

වාසෙ යනාරනෙත්තාගි නාමෙන රට්ඨ රඤ්ඤුත්තමෙ,
නාරායනෙන තුලක්ඛනං රක්ඛඤ්ඤසකබ්බානභාවතො.

අච්චහමූල හෙදිස්ස නානා සම්පත්ති පූණ්ණිනො,
ධම්මිලද්ධාදි කිණ්ණස්ස පච්ඡිමුත්තර භාවතො.

එරාවති නදීතීරෙ මඛපට්ඨ නාමකෙ.
පණ්ණත්ත ධම්මරාජෙන පවසෙත්ථ රාජිනා,

පාසාදෙ කාරිතෙ රම්මෙ නානාලංකාරලංකතෙ
සිරිධම්මවිලාසො සීලභූසන භූසිතො,

පාවචනෙ ච වෙදෙ ච සමාප්පිතචක්ඛුකො.
නානාපකරණ සාරං ආදාය කාරිදං වරං."

---

46. කච්චායනසාර පුරාණ ටීකාව—මෙය කවුරුන්විසින් කොයි කලක කරණලද්දක්ද යනු නියම වශයෙන් දැනගත නොහැකිය—කච්චායනභෙදයට පසුව බව දැනගත හැකිය—මුල් පොතේ ගාථා තේරුම් කිරීම පදුද්ධාර වශයෙන් නොව භාවය දක්වීම් වශයෙනි—අභිනව ටීකාව පමණ ප්‍රයෝජනවත් නොවේ නමුදු ගාථාවල භාවය දක්වීම ඉතා පැහැදිලිය—මුල් පොතේ දක්වන ලද ලක්ෂණ

වලට උදාහරණද මෙහි දක්වනලදී—ගාථාවල භාවය දක්වන්නෙත් මූල්පොතේ ගාථාවල් පෙය්‍යාලම් වශයෙන් දක්වා නොව සම්පූර්ණයෙන් දක්වා නමුදු පොතේ ප්‍රමාණය අභිනව ටීකාවෙන් කොටසක් පමණය—පොතේ මුල අග දෙකේම කර්තෘවිසින් සාදනලද ගාථා ඇති බවත් අපට දකින්ට ලැබුනු පොතෙන් දැනගන්ට නොලැබුනි—මූලට කිව්වුහරිගේ ගාථාවක් හා එහි වර්ණනාව මෙසේය.

“සාධම්මසාධනං සිද්ධ මසිද්ධසෙසාපමාණකං,
උපමෙය්‍ය මසිද්ධ න්තං වයමෙක විභත්තිකං.

අසිද්ධස්ස අපාකටස්ස වත්ථුනො සාධම්මසාධනං සදිසගුණෙන සාධනං තං සිද්ධං පාකටවත්ථු උපමාණකනාම, අසිද්ධං අපාකට වත්ථු උපමෙය්‍යනාම, තං වසං උපමාණකඋපමෙය්‍යවයං එක විභත්තිකං—යථා... ..”

අග—“කච්චායනසාරඅත්ථයොජනා නිට්ඨිතා” කියාය.

---

47. ගන්ධට්ඨිය—මෙනම් පොත ගන්ධාභරණයටත් ප්‍රථම කාලයෙහි දඹදිව මගලනම් ස්ථවිරකෙනෙක් නිපාතාර්ථ ප්‍රකාශකරණපිණිස ආගමේ පොත්වලින් උදාහරණ දක්වා බණවර 1 කින් පමණ කරණලද්දකි—මෙහි බොහෝ අටුවා ටීකාදි පොත්වල නාමයන්ද සඳහන් කර තිබෙනවත් ඇර මෙහි නාමයද ගන්ධාභරණ ටීකාවෙහි සඳහන් කරණලදී—මෙයටද ටීකාවක් හා ව්‍යාඛ්‍යානයක්ද ඇති බව ගන්ධාභරණ ටීකාවෙන් දැනගන්ට තිබෙන නුමුත් දකින්ට නොලැබුනි.

මූල ගාථව මෙසේය

“ගණෙහෙද විද්දුං බුද්ධං සසද්ධම්ම ගණුත්තමං,
අභිවාදිය භාසිස්සං ගන්ධට්ඨිං සොතුජනකං.”

අග ගාථා වරදින් ආකූල හෙයින් තනි පොතකින් සුද්ධකළ නොහැකියි.

---

48. විභත්‍යර්ථප්‍රදීපනිය—මෙයද සතරවිභක්ත්‍යර්ථයන් උදාහරණ සහිතව ප්‍රකාශ කොට වාසගමින් සාදනලද පොතක්වත් ඇර මෙහි නාමය කොයිම පොතකවත් සඳහන්ව තිබෙනවා දකින්ට නොලැබුනසෙයින් මෑත කාලයෙහි කවුදෝ කෙනෙක් විසින් සාදනලදැයි සිතිය හැකිය—ප්‍රමාණය බණවරක් පමණයි—මීට ටීකාවක් ඇති බවතුත් දැනගන්ට නැත.

මූල ගාථා.

"සසද්ධම්ම ගණං බුද්ධං වන්දිත්වා ඉසි සත්තමං,
දස්සයිස්සං විභත්‍යත්ථං නිස්සායාචරියාසභෙ."

යො බො කායෙ ච ගො සාරෙ සො රූපෙ බො සකෙ තථා,
මො රූපෙ ඡො සකෙ චෙති අත්ථා සත්ත විභත්තිනං."

---

49. සංවණ්ණනානයදීපනිය—බුද්ධ වර්ෂ 2195 ට කිට්ටු කාලයෙහි බුරුමරටේ වැඩසිටිය ජම්බුධජ නම් තෙරුන්වහන්සේවිසින් උල්ලිඟ, වුත්ති, සම්බන්ධ, යනාදීවූ සහ පද, අර්ථ, පදාර්ථාදීවූද සංවර්ණනා ක්‍රමය ප්‍රකාශ කොට සාදනලද ගාථා සියයකට වැඩිනොවන තරම් පොතකි—මෙහි උල්ලිඟකාණ්ඩය, පදකාණ්ඩය, නීතාර්ථ කාණ්ඩ යයි කාණ්ඩ තුනකි.

එහි මූල අග ගාථා මෙසේය.

"වණ්ණිතාපි බිණා වණ්ණා යස්සානිධනවණ්ණිනො,
නරාමරා සමෙන්තාපි වන්දෙමි තං සුවණ්ණවං.

වණ්ණනඤ්ඤූහි විඤ්ඤූහි සංවණ්ණිතෙහි වණ්ණිතා,
විචිත්තා යෙව සොභන්ති වන්දෙමි තං ජිනෙරිතං....

තිපෙටක වණ්ණනාසු බහුවිජ්ජන්ති යෙ නයා,
තතො නයගහණූපායා දීපිතෙසා සමාසතො.

පාළිධම්මෙසු විඤ්ඤූනං කොසල්ලත්ථාය යා කතා,
වණ්ණනා වණ්ණනඤ්ඤූහි නානානය විචිත්තකා.

තස්සා තං දීපනත්තෙන වණ්ණනානය දීපනී,
ඉති අන්වත්ථ නාමෙන සන්නිට්ඨාන මුපාගතා.

බොධො දබ්බ සුතෙ ගාමෙ ජාතෙන ජනියා මයා,
රචිතා නිට්ඨිතා එසා ජිද්දිසි චන්දරූපකෙ.

සක්කරාජෙ ජුසෙස්ස ජුණ්හ බුධවාරෙකාදසමෙ,
පච්ඡාභත්තමයි චාවීස පදවාරමයි ඡබ්බකෙ,

---

50. වාච්චවාචකය—අටිමද්දනනුවර සමීපයෙහි වැඩසිටිය ධම්මදස්සී නම් සාමණේර නමක් විසින් කත්‍රෘ කර්මාදි අෂ්ටප්‍රකාර වාච්‍යයන් හා විභක්ත්‍යාදි දශප්‍රකාර වාචකයන්ද ගැණ සාදනලද ගාථා 100 යක පමණ පොතකි—අවුරුදු භාරසියයකට ඉහත බව කියහැකිය.

මූල ගාථා.

“නත්වා ජිනං නිරුත්තඤ්ඤුං වක්ඛාමි වච්චවාචකං,
පුබ්බාචරිය සීහානං නයං නිස්සාය සාසනෙ.

ඡකාරකො ච භාවො ච සම්බන්ධො ඡද්ධා වච්චං,
දුතියා තතියා චාපි චතුත්ථී පඤ්චමී ඡට්ඨී.

අග—වච්චං වුච්චති යො අත්ථො දුතියාදීහි වුච්චති,
අත්ථං වුච්චති යො සද්දො ඉති සද්දො සවාචකො.

උපසග්ගා නිපාතා ච යෙ තෙ හොන්ති අවාචකා,
කතත්ථතාදි විමුත්තත්තා අඤ්ඤවිසයතොපි ච”

---

51. වාච්චවාචකටීකාව—බුරුමරටේ සලලවතී ගඟාව අසල රාජ‍්‍යාමාත්‍යයෙක් විසින් සාදවනලද බෙමාවතාර නම් විහාරයෙහි වැඩ සිටිය සද්ධම්මනන්දි නම් ස්ථවිරයන්වහන්සේ විසින් බුඩ වර්‍ෂ 2312 දී සාදනලද බණවර දෙකකට අඩු නොවන තරම් පොතකි—සද්දත්ථභෙදචින්තා, බාලාවතාර, අභිධානප්පදීපිකා, සද්දනීති යනාදී පොත්වලින් උදාහරණ කර තිබේ.

මූල ගාථා.

“නත්වා නාථං දයාපන්නං සබ්බඤෙය්‍යවිජානකං,
ස්වාක්ඛාත මස්ස ධම්මඤ්ච සංඝං නිරඞ්ගණ මුත්තමං,

පට්ඨානං පරියත්තිම්හි සොතූන මහි කංඛිනා,
ඤාණ රංසීති නාමෙන ථෙරෙන අභියාචිතො.

සමාසෙන කරිස්සාමි වච්චවාචක වණ්ණනං,
පුබ්බාචරිය සෙට්ඨානං නිස්සායෙ වූපදෙසකං.”

සමාසවාචකය ගැණ දක්වනලද පාඨයක් මෙසේය.

“එවං විභත්තිවාචකා විභජිත්වා ඉදානි සමාසවාචකං විභජෙන්තො ද්වන්දදිගුකම්මධාරයසමාසානං එකසෙසවත්ථුස්ස වාචකත්තා තෙ තාව සංඛෙපතො දසෙසතු මාහ සමුච්චයොච්චාදි තත්‍රායං යොජනා ද්වන්දෙන සමුච්චයො එව වුත්තො දිගුනා ච කම්මධාරයෙන ච තුල්‍යත්ථො එව වුත්තො තෙහි සම්බන්ධ දිගුකම්මධාරය සමාසෙහි සම්බන්ධො න වුත්තො කාරකඤ්ච ද්වන්දෙන වුත්තොති—සමොධානෙත්වා උච්චයො ගාහො සමුච්චයො සම්පිණ්ඩනං, සො පන අත්ථවසෙන කෙවලසමුච්චයො අන්වාචයො ඉතරීතරයොගො සමාහාරො චාති චතුබ්බිධො, තත්ථ කෙවලසමුච්චයෙ අන්වාචයෙ ච සමාසො න භවති ක්‍රියා

සාපෙක්ඛතාය නාමාන මඤ්ඤමඤ්ඤං අයුත්තත්ථභාවතො, යථා චීවරඤ්ච පිණ්ඩපාතඤ්ච සෙනාසනං අදාසි, දානඤ්ච දෙති සීලඤ්ච රක්ඛතීති, ඉතරෙ තරයොගෙ සමාහාරෙ ච සමාසො භවති තත්ථ නාමාන මඤ්ඤමඤ්ඤං යුත්තත්ථභාවතො.”

අග මෙසේය—“සලලාවතියා නාම නදියා පච්ඡිමභාගෙ......චෙසු නො රථා නාමස්ස රජ්ජමහාමත්තස්සාරාමභූතෙ බහූනං සාසන වුඩ්ඪිකාමානං නිවාසඨානෙ විහාරෙ බ්‍රහ්මාවතාර නාමකෙ වස නෙතනානෙකගුණසාලිනා සඞ්ඝනන්දීති ගරූහි ගහිත නාම ධෙය්‍යෙන ථෙරෙන කතායං වාච්චවාචක වණ්ණනා.”

---

52. සද්දවුත්තිය—තාම්බදීපරටේ විජය පුරය සම්පවාසී සද්ධම්මගුරු නම් ස්ථවිරකෙනෙක් වෙන ස්ථවිර කෙනෙකුගේ ආරාධනාව පිට බුද්ධ වර්ෂ 2200 ට ප්‍රථම සාදනලද බව කච්චායනභෙදටීකාදියට මෙහි ගාථා ගෙණ තිබෙන හෙයින් පෙනේ.

මෙහි අදහසනම් ජාති, ගුණ, ක්‍රියා, ද්‍රව්‍ය, නාම, යන පඤ්චප්‍රකාර ශබ්දයන්ගේ ප්‍රවෘත්ති හා ස්වාර්ථ, ද්‍රව්‍ය, ලිඞ්ග, සංඛ්‍යා, කාරක වශයෙන් ප්‍රභේදවන බවද, කර්ම්ම කර්තෘාදී අෂ්ටප්‍රකාර වාච්‍යයන් හා ප්‍රථමා ද්විතීයාදි දශ ප්‍රකාර වාචකයන්ද දක්වීමයි—ජාත්‍යාදි පඤ්චකය ගැණ තර්ක ශාස්ත්‍රයෙහුද සමහරකරුණු දක්වනලදී-මෙහි පරිච්ඡෙද බෙදීමක් නැතුවත් ඇර පොතේ ප්‍රමාණය ගාථා 150ක් පමණයි—වෙන පොත්වලදී “සද්දවුත්ති” යන නාමය මීට ව්‍යවහාරකර කර තිබෙන නුමුත් මෙහිදී සඳහන් වෙන්නේ “සද්දවුත්තිපකාසක” යන නාමයයි.

මූල ගාථා සහ වෙනත් ගාථා කීපයක් මෙසේය.

“අනන්ත ගුණ සම්බුද්ධං සද්දවුත්ති පකාසකං,
සද්ධම්මාරියසංඝං ච සක්කච්චං අභිවාදිය.

සද්දවුත්ති නිමිත්තෙන්තසු ඡෙකකාමෙන භික්ඛුනා,
යාචිතොහං කරිස්සාමි සද්දවුත්ති පකාසකං.

සද්දෙ පඤ්චවිධෙ තාව ඤායතෙ පිටකත්තයෙ,
නාම ජාති දබ්බ ක්‍රියා ගුණසද්දන භෙදතො...

සද්දතො ජාති මෙවාති ආහ ජාතිපදත්ථිකො
දබ්බපදත්ථිකො චාහ දබ්බං වාඤ්ඤති චා පරෙ...

සකත්ථ දබ ලිඞ්ගානි සංඛ්‍යා කම්මාදි කාරකං.
ඉති ලිඞ්ගස්ස විඤ්ඤෙය්‍යා අත්ථා විඤ්ඤූහි පඤ්චධා.

ද්විකො තිකො චතුක්කොපි පඤ්චකො වාපි විඤ්ඤුනා
අත්ථො ලිඞ්ගස්ස විඤ්ඤෙය්‍යො භෙදං ලිඞ්ගස්ස දස්සනා.

---

53. සද්දවුත්ති ටීකාව—බුරුමරටේ පොක්කාරාම නම් නුවර සමීපයෙහි මුංකපා නම් උයනේ නිවාසී සාරිපුත්ත නම් ස්ථවිරකෙනෙක් විසින් සාදන ලදී, කාලය අවුරුදු 218 කට මෑත මිස එපිට නොවේ බවද පොතේ ප්‍රමාණය බණවර හතරකට වැඩිනැති බවද කිය හැකිය—බාලාවතාර සද්දසාරත්ථජාලිනී කච්චායනභෙද යනාදියෙන්ද උදාහරණ දක්වා තිබේ.

මූල් ගාථා.

"අනන්තඤාණං සම්බුද්ධං සද්දවුත්ති විජානනං,
මොහස්ස ධංසකං ධම්මං සංඝඤ්චාපි නිරඞ්ගණං.

සක්කච්චං අභිවන්දිත්වා සිස්සානං ජෙක පාපකං,
සද්දවුත්තිං පකාසිස්සං කරිස්සා මත්ථවණ්ණනං."

මෑ දහරියේ පාඨයක්—"සප්පති ගච්ඡතීති සද්දො, උතුජො—සප්පති උච්චාරීයතීති සද්දො, චිත්තජො—පුනපි දුවිධො සවිඤ්ඤාණක අවිඤ්ඤාණක වසෙන සවිඤ්ඤාණකො නාම චිත්තජො, අවිඤ්ඤාණකො නාම උතුජො.

සවිඤ්ඤාණක සද්දොයං හොති චිත්තසමුට්ඨිතො,
අවිඤ්ඤාණකසද්දො යො සො හෙතුජසමුට්ඨිතො.

තෙසු සවිඤ්ඤාණකසද්දො ච නාමාදිවසෙන පඤ්චවිධො, පුනපි දුවිධො නිප්පන්නානිප්පන්නපාටිපදිකවසෙන, ධාතුවසෙන නිප්පන්නං නිප්පන්න පාටිපදිකං නාම, ධාතුවසෙන අනිප්පන්නං අනිප්පන්නපාටිපදිකං නාම-වුත්තඤ්ච.

නිප්පන්නො අපි ධාතුජ් සද්දො හො ඉති ආදයො,
අනිප්පන්නොනාධ බ්‍යඛන්ති ධරබෙ ඛ්පි භෙදතො.

තෙසු නිප්පන්නසද්දො ච නාමාදිවසෙන පඤ්චවිධො, පුන දුවිධො නිප්පන්නසද්දපතිරූපක අනිප්පන්නසද්දපතිරූපක වසෙන අනිප්පන්න සද්දො නාම, මුඛෙන උච්චාරිතො පුරිසොත්තමාදි (?) අනිප්පන්නසද්දො නාම මුඛෙන අනුච්චාරිතො පොත්ථකෙසු ආරොපිතො තප්පතිරූපකො සද්දො තෙසු නිප්පන්නසද්දො ච නාමාදිවසෙන පඤ්ච විධො."

අග ගාථාව.

“ සාරිපුත්තොති නාමෙන මහාථෙරෙන විඤ්ඤුනා,
රචයිතො අයං ගන්ථො සද්දෙසු බ්‍යත්තිජනකො.”

---

54. බාලප්පබොධනය—මෙය කාරක සමාස තද්ධිත ආඛ්‍යාත කිතකයන්ගේ ලක්ෂණ භෙදදිය දක්වන්නාවූ බණවරක ප්‍රමාණ ගාථා පාඨ මිශ්‍රපූරණ පොතකි—කොයි කාලක කවුරුන්විසින් සාද නලදදැයි දැනගණ්ට ක්‍රමයක් නොලැබුන නුමුත් කච්චායනභෙද සද්දත්ථ භෙදචින්තාදීයට පසුව බව පෙනේ.

මූල ගාථා.

“ පයොගමිච්ඡිතා ඤාතුං ඤෙය්‍යං කාරක මාදිතො,
සඞ්ඛෙපය ඡබ්බිදං භෙදං තෙවීසති විධං පුන.
තත්ථ පඤ්චවිධො කත්තා කම්මං සත්තවිධං භවෙ.
කරණං දුවිධං චෙව සම්පදානං තිධා මතං ,
අපාදානං විධා වුත්තං තථා ධාරො චතුබ්බිධො,
කාරෙති කාරකං සබ්බං තස්මා ඤෙය්‍යං කමාදිතො.”

---

55. බාලප්පබොධන ටීකාව—මෙයද පෙළපොත සේම කොයිකාලක කවුරුන් විසින් කරණ ලදදැයි නොකිය හැකි නුමුත් රූපසිද්ධියෙන් උදාහරණ කර තිබේ—මෙහි නාමය “ විචිත්‍රසාර” කියාය, මෙහි මූල ගාථාව සහ ධාතු ගැණ පොතකින් උදාහරණ කොට තිබෙන ගාථාවක් මෙසේය.

“ බාලෙ විනා යොච අනන්ත බොධී
ධීරූප සෙවී වර බොධිලාභී,
බොධෙසි බොධෙය්‍යජනාධිඤාණං
නත්වාන බුද්ධං කරුණාධිකං තං.
ඉච්ච ඉච්චනත්ථානං ධාතවත්ථො යො පකාසිතො,
නානා අත්ථෙසු වත්තන්ති අනෙකත්ථා හි ධාතවො.”

---

56. සද්දබින්දුව—මෙය කච්චායන ව්‍යාකරණයෙහි සන්ධි නාම සමාසාදීන්ගේ උදාහරණ ප්‍රමාණය දක්වන ලද්දාවූ ගාථා 21 ක් පමණ ඇති කුඩා පොතකි—උදාහරණ සංඛ්‍යා කටපයාදී ගණනින් දක්වන ලදුවත් ඇර මෙහි ගාථා ටීකාව නැතිව තේරුම් ගණ්ට අමාරුවූ ගාථාර්ථයන්ගෙන් යුක්තය—පූර්වස්වර ලොප් සන්ධි 64, පරස්වර

ලොප් සන්ධි 52, බ්‍යඤ්ජනාගම සන්ධි 64, බවද (සද්දසාරත්ථජාලිනියෙහි බ්‍යඤ්ජනාගම සන්ධි 256 බව) කියන ලදී—ග්‍රස්වාදි සන්ධි ගණන මෙහි නොකියනලද්දේ නමුදු වෙන පොත්වලදී ග්‍රස්ව සන්ධි 138, දීර්ඝසන්ධි 138, ප්‍රකෘති සන්ධි 320 ක් බව කියන ලදී එසේම පුල්ලිඟුයෙහි විභක්ත්‍යන්ත නාමපද 478—ස්ත්‍රී ලිඟුයෙහි 236—නපුංසක ලිඟුයෙහි 108 යයිද, සමාසයෙහි උදාහරණ 628 යයිද—නොයෙක් අර්ථයන්හි නොයෙක් ප්‍රත්‍යය වනහෙයින් තද්ධිත කිතක උදාහරණවල ප්‍රමාණය නොකිය හැකියයිද—ආඛ්‍යාතයෙහි විභක්ති අටට පචයන ධාතුවෙන් සිද්ධවූ උදාහරණ පද 1525 බව හා, ගමු යන ධාතුවෙන් සිද්ධවූ උදාහරණ පද 4575 බවද කියන ලදී—මෙහි කර්තෘ බුද්ධ වර්ෂ 2025 අරිමද්දන නුවර රජකම්කළ (විභත්‍යත්ථග්‍රන්ථකාරක කුමාරිකාවගේ පියරජවූ) ක්‍යච්වා නම් රජබව් ශාසනවංශයෙහි කියනලද නුමුත් ටීකාකාරයාගේ අදහස රාජගුරු තෙරුන්නාන්සේ නමක්ය කියාය—අග ගාථාවෙන් දෙයාකාර යටම තේරුම් ගතහැකිය—පොත කුඩා නුමුත් සන්ධි නාමාදිවශයෙන් කාණ්ඩ හතකට බෙදන ලදී.

මූල අග ගාථා මෙසේය.

"යස්ස ඤෙය්‍යෙසු ධම්මෙසු නාණුමත්තං පවෙදිතං,
නත්වා සද්ධම්ම සංඝං තං සද්දබින්දුං සමාරභෙ
තෙනෙව කිච් ජලිතො ජලිතො පදීපෙං
කච්චායනුත්ත රතනොචිතගබ්භකොණෙ,
ධම්මාදිරාජගුරුනා ගරුමාමකෙන
ධම්මෙන යොධිපතිනා සගරුතතානීතො."

---

57. සද්දබින්දුටීකාව—මෙහි නාමය "ලීනත්ථසූදනී" කියාය—අරිමද්දන නුවර අසල ඡවිකාරාමවාසී ත්‍රිපිටකධාරී ඤාණවිලාස නම් ස්ථවිරයන්වහන්සේවිසින් බාලාවතාර වාචකොපදෙසාදි නොයෙක් පාළිපොත්වලින් හා සම්බොධවෘත්ති ආදි සංස්කෘත පොත්වලින්ද නොයෙක් කරුණු සංග්‍රහ කිරීමෙන් අලංකාර කොට සාදන ලද්දාවූ බණවර 6 ක පමණ විසිතුරු ටීකාවකි—මූන්වහන්සේ සංස්කෘතටද සමර්ථයෙක් බව සමහර සංස්කෘත ශ්ලොක පාළියට පෙරලා දක්වනලදහෙයින් පෙනේ—සාරස්වතාදියෙහි පෙනෙන

"ක්‍රියායාං පරිනිෂ්පත්තිර් යද්ව්‍යාපාරා දනන්තරං,
විවක්ෂ්‍යතෙ යදා යත්‍ර කරණං තත් තදා ස්මෘතං."

යහමේ ශ්ලෝකය

"කිරියාය පරිනිප්ඵත්ති යබ්‍යාපාරා මනන්තරං,
විවච්ඡතෙ යදා යත්‍ර කරණං තං තදා මතං."යි—මෙසේ පාළි යට පෙරළා තිබේ—පොතේ අග "රම්මං සීසප්පවෙසාය" යනාදි ගාථාවට කර තිබෙන ටීකා වාක්‍යගණ මෙසේය.

"රම්මං සීසප්ප වෙසාය පුරං පිටක සඤ්ඤිතං,
මග්ගොජු මග්ගතං මග්ගං සද්දූරඤ්ඤ විසොධිතො."

පිටකසඤ්ඤිතං රම්මං පුරං සීසං පවෙසාය මග්ගං ගන්තබ්බං මග්ගං, මග්ගතං මග්ගන්තානං ගවෙසන්තානං, සද්දසත්ථසංඛාතා රඤ්ඤ, උජුභූතො සද්දබින්දු ගන්ථසංඛාතො මග්ගො විසොධිතො මයාති සම්බන්ධො—අයමෙත්ථාධිප්පායො සංගීතිකාචරිය භූමිජෙ කාචරියෙහි සුමාපිතං, තීහි සංගීතිපරිඛාහි චෙව අක්ඛරපදව්‍යඤ්ජනානං පාකාරෙහි ච පරික්ඛිත්තං, සංවණ්ණනානං ද්වාරගොපුරසහිතං නානානයමග්ගවීථීහි සුවිභත්තං විය රමණීයතරමපොක්ඛරණීහි චෙව සුත්තන්ත සභාසාලා සන්ථාගාරෙහි ච අභිධම්මපාසාදකූටාගාරඝරෙහි ච සමලංකතං, අභිධම්මිකවිනයධර සුත්තන්තික ඛත්තිය බ්‍රාහ්මණ ගහපතිකෙහි නිවුත්ථං, සද්දසත්ථිකෙහි සුරක්ඛිතං, අභිධම්මිකපුරෙහිතෙහි චෙව විනයධරවිනිච්ඡයකමහාමත්තෙහි ච සුත්තන්තිකසෙනාගුත්තෙහි ච සුවිචාරිතං, නානාකුලා පබ්බජිතෙහි නානා වෙරජ්ජකෙහි උග්ගහණාදිවසෙන සමාකිණ්ණං, වාචනුග්ගහණසජ්ඣායනසද්දෙහි අවිවිත්තං, දෙසනුස්සවසද්දෙහි සංඝුට්ඨං, සීලාදිවිවිධත්ථ විවිධාලංකාර විවිධරතනුපභොගපරිභොගසම්පන්නං, පදව්‍යඤ්ජනපරම්පරාසංයුත්තං සද්ධම්මරාජවරචක්කවත්තිනො සුරම්මපිටකමහානගරං පවිසිත්වා රමිතුං ගන්තබ්බමග්ගං ගවෙසන්තානං කුලපුත්තානං අක්ඛරපදලිඞ්ගවිභත්තිසන්ධිසමාසධාතුප්පච්චයාදෙසාගමලොපාදිජටිතවිධානන්තරවංදනන්තරාදිදුග්ගසහිතෙ සද්දබින්දුසංඛාතෙ ගච්ඡගුම්බ කණ්ටක ගහණාදි ජටිතෙ බාධ තුද කච්ඡනු තටාක කන්දරාදි දුග්ගසහිතෙ අන්තරාමග්ගෙ මහාරඤ්ඤෙ උජුමග්ගභූතො අයං සද්දබින්දුගන්ථමග්ගො විසොධිතො සමංකතො යො ච පිටක සංඛාතසුරම්මමහාපුරං පවිසිතුකාමො ඉමං සද්දබින්දු ගන්ථමහාමග්ගං පටිපජ්ජතූති."

58. කාරකපුප්ඵමඤ්ජරිය—මහනුවර රජකළ කීර්ත්තිශ්‍රී මහරජතුමන්ගේකාලයෙහි ජීවත්ව සිටිය අතතාරගම බණ්ඩාරරාජගුරුතුමන්විසින් කාරක ලක්ෂණාදිය ගැණ සනාථ සහිතව කච්චායන රූපසිද්ධි න්‍යාස මොග්ගල්ලායනවුත්ති පදසාධන ශබ්දනීති පඤ්චිකා ප්‍රදීප බාලාවතාර පදාවතාර ශබ්දත්ථචින්තා පාණිනී සාරස්වත අමරකෝෂ යනාදී නොයෙක් පොත්වලින් වැදගත් කරුණු සංග්‍රහකොට සාදන ලද (බණවර 25 ක පමණ) පොතක්—කාරක කාණ්ඩය ඉගෙණගන්නාවුන්ට මෙය ඉතාම ප්‍රයෝජනවත්ය.

මූල අග ගාථා මෙසේය.

“පුරිස සීහමුඛම්බුජ වාසිනී සරසභාව පඤ්චවිලාසිනී,
මනසි මෙ පරමත්ථපසූදනී රමතු චාරු පවාග සුභාරතී.

ක්‍රියාකාරකසම්බන්ධං යෙ න ජානන්ති මාණවා,
පසූහිස්සහ තෙ තුල්‍යා ඛුරසිඟ විවජ්ජිතා.

ක්‍රියාදලාකිණ්ණ මනොපසාධනී
සධාතු කාලාදි පරාගපූරණී,
සුධීර සාරත්ථ සුගන්ධවාසනී
කාරියතෙ කාරකපුප්ඵමඤ්ජරී.”

“භාසායං මාගධීසාති ඤායතෙ තෙන ධීමතා,
මඤ්ඤූ විඤ්ඤූතමතෙතාන තානි ඡකාරකානිහ.

ගම්භීර සද්දසරසත්ථ විසාරදෙන
කාණ්ඩීරවොව කවිකුඤ්ජර භඤ්ජනෙන,
සංසාර සාගරසමුත්තරණාය තෙන
භණ්ඩාර රාජගුරුනා ගුරුනා ගුණෙන.

වසිල්කිචා දිසු ඤය කුඤ්ජරී
විසිල් සදත් විහඟපඤ්ජරී,
වරිල් සතතානනපූරණඤ්ජරී,
සුනිමිතා කාරකපුප්පමඤ්ජරී.

---

59. සුධීරමුඛමණ්ඩනය—සමාසචක්‍රය යන නාමයෙන්ද ප්‍රසිද්ධවූ මෙම ග්‍රන්ථයද අතතාරගම බණ්ඩාර රාජගුරුතුමන්විසින් සංග්‍රහකරණලද්දකි—සංස්කෘත භාෂාවෙන් තිබුනු සමාස චක්‍රයෙන් පාළිභාෂාවට පෙරලණලදබව පොතේ අගගාථාවලම කියනලද්දේ නමුදු මෙහි සංග්‍රහ කොට තිබෙන්නේ රූපසිද්ධියෙහි සමාස තද්ධිත කිතක

ඌණාදි යන කාණ්ඩවල උදාහරණම බව මෙකී පොත්දෙක සම කර බලන කෙනෙකුට දැනගත හැකිය—මෙහි සමහර දෝෂයන්ද ඇති බව මේ කාලයෙහි සමහර උගතුන්ගේ කල්පනාවයි—මූල ගාථාවෙහි "තිලොකෙහි නුතං නාථං" යන්නෙහි "තිලොකෙහි" යන බහුවචනය සදොෂ යයි "තිලොකාභිනුතං නාථං" කියා සමහරු ව්‍යවහාර කෙරෙත්-එහෙත් සද්දසාරත්ථජාලිනී ආදියෙහි "තිගවෙසු වූයහං" යනාදි තැන්වලද එසේවූ බහුවචන දක්නා ලැබෙත්—ශ්‍රීපාදස්ථානයෙහි හා සබරගමු පළාතේද නායක පදවියට පැමිණ වැඩසිටිය ශබ්දශාස්ත්‍රාතිදක්ෂ ආචාර්‍ය්‍ය සුමංගල මේධංකර මහා ස්ථවිරාදි අත්තරගම පරම්පරාවේ සමහර ගුරුවරු ව්‍යාකරණයෙහි බහුශ්‍රුතත්වය පිණිස ශිෂ්‍යයන්ට මෙකී පොතද අර්ථ කියවති—පොතේ ප්‍රමාණය බණවර තුනකට අඩු නැත.

මූල ගාථාව මෙසේය.

"තිලොකෙහි නුතං නාථං නත්වා බුද්ධිපසවඩ්ඪනං,
වක්ඛාමි සහිතත්ථානං සුධීරමුඛමණ්ඩනං."

අග ගාථා.

"යදා සකිත්තිසසිරිරාජසීහො
සදා සමාපජ්ජ පුරමග්ගමස්මිං,
තදා සුසෙඛඛණ්ඩසිලාභිධානෙ
උදූර රජ්ජතත මයං විරාජෙ.

පුරා සක්කතභාසාය ඨිතමත්ථාය තං සතං,
සමාසවක්ඛාතං විහිතං සුධීරමුඛමණ්ඩනං.

භණ්ඩාරරාජගුරුනා අත්තරගාම වාසිනා,
තමෙව පරිවත්තෙත්වා පාළියා නිහිතං මයා."

---

60. ධාතුමඤ්ජූසාව—පාලිභාෂාවේ වචනවල බීජයන්වැනිවූ ධාතූන් අර්ථ සහිතව ප්‍රකාශ කොට අන්තස්ථ අකුරු පිළිවෙළින් ගළපා ගාථා 150 කින් පමණ "යක්ඛද්දිලෙන" හෙවත් යක්ගිරිලෙන (යක් දෙසසානලයසිද කියත්) නම් විහාරයෙහි වැඩසිටිය සීලවංස නම් ස්ථවිරයන් වහන්සේ විසින් විරචිතවූ ධාතු පොතක්ය—ග්‍රන්ථ 100ක් පමණවූ ධාතු පාඨය මිට පූර්ණ වුවද එහි නොකියන ලද්දවූ ධාතු මෙහි සංග්‍රහිතයි—වොපදෙව නම් පණ්ඩිතයා විසින් සංස්කෘත ධාතු සංග්‍රහ කොට කරණලද "කවිකල්පද්‍රුම" නම් ධාතු පොත

ගුරු කරගණ මෙය සාදා තිබෙන බව පෙනේ—මීටපුරාණ සන්න සතුදු ඇති නමුදු එයින් ආධුනිකයන්ට සම්පූර්ණ ප්‍රයෝජන අඩු හෙයින් දෙන් අන්ද්‍රිස්ද සිල්වා බටුවන්තුඩාවේ පඬිතුමන් විසින් ශුද්ධ කොට යහපත් පිළිවෙළකට යොදා ඉංග්‍රීසි සිංහල අර්ථ සහිතව අච්චුගසවා ප්‍රසිද්ධ කොට තිබෙන හෙයින් එහි ක්‍රමය ඇඟවීම පිණිස වැඩි කරුණු මෙහි කියන්ට ඕනෑ නැත.

මූල අග ගාථා දෙක මෙසේය

"නිරුත්තිනිකර පාර පාර වාරනාගං මුනිං,
වන්දිත්වා ධාතුමඤ්ජුසං බෘූමි පාවචනඤ්ඤං.

සද්ධම්මපංකෙරුහරාජහංසො
අංසිල්ඛම්මඛිති සීලවංසො,
යක්ඛද්දිලෙනාඛ්‍ය නිවාසවාසී
යතිස්සරො සොයමිදං අකාසි."

61. පාලිනාමවරනැගිල්ල—කාත්‍යායන පාලිව්‍යාකරණ ක්‍රමය පුහුණු කිරීමට පටන්ගන්නවුන්විසින් පළමුවෙනි පොතක් වශයෙන් භාවිතාකරන්නාවූ මෙකී පොත පූරාණ ආචාර්‍ය කෙනෙක්විසින් රූපසිද්ධියෙන් සංග්‍රහකරණ ලද්දත් නුමුත් බාලාවතාර ක්‍රමයටද ගැළපෙනුය—රූපමාලා නම් ප්‍රකරණයද මීට උපකාරවශයෙන් කරණලද්දකි—ආඛ්‍යාත ක්‍රියාවරනැගිල්ලද ක්‍රියා පද ගැණ මෙසේම ගළපන ලද්දකි—වගේගොඩ ස්ථවිරයන් වහන්සේ විසින් විරචිතවූ "ආඛ්‍යාතපදය" නම් ප්‍රකරණයද ආඛ්‍යාත වරනැගිල්ලට උපකාරපිණිස ගළපන ලද්දකි—මෙසේම අපවිසින් සංග්‍රහකරණු ලබන මෙම "නාමමාලා" නම් ග්‍රන්ථයද පාලිනාමවරනැගිල්ල ගැණ උපකාර පිණිස ගළපන ලද්දක් බව දත යුතුයි.

තවද—මෙහි නම් සඳහන්කරණු ලැබූවාවූ පොත් හැර අපවිසින් නොදක්නා ලද්දාවූ මහානිරුත්තිප්‍රකරණ, සන්ධිවිසොධනාදී පාලි ව්‍යාකරණ පොත්ද බොහෝය.

මෙසේ පාලිභාෂාවේ ශබ්දශාස්ත්‍රය නොයෙක් ආචාර්‍යවරයන් හන්සේලාවිසින් විරචිතවූ අන්‍යොන්‍ය විසදෘශ මතභෙද ඇති නොයෙක් ග්‍රන්ථසාරයන්ගෙන් ආකීර්ණහෙයින් බාලාවතාරාදි යම්කිසි එක ග්‍රන්ථයකින් ව්‍යාකරණ ලියා කියා ඉගෙණගත්තාහු නමුදු ඔවුන් ශබ්දශාස්ත්‍රයෙහි සම්පූර්ණ බහුශ්‍රැතත්වය ප්‍රාර්ථනාකරන්නාහු නම් ඉතර ග්‍රන්ථයන්ද අසා බලා ගත යුතු වන්නාහුය—පදසිද්ධිකුමයේ පොත් අතරෙන් අනික් පොත්වලට වඩා බාලාවතාරය

තුඩාහෙයින් පාඩම්කිරීමේ ඵාසුතම සලකා ලංකාවේ ගුරුවරයන් විසින් කාලයක පටන් එයින්ම ශිෂ්‍යයන්ට ව්‍යාකරණ පුහුණු කරවන නමුත් බුරුම සියම් රට දෙකේ එසේ නොවේය—බාලාවතාරයෙහි කාරක කාණ්ඩය ඉතා විසිතුරු නමුදු සන්ධි නාමාදි කාණ්ඩ කච්චායන රූපසිද්ධ්‍යාදියෙහි මෙන් සම්පූර්ණ නුවූ නිසා බාලාවතාරයෙන් ව්‍යාකරණ පුහුණුකරවනු ලබන ශිෂ්‍යයන් විසින් පසුවවත් කච්චායන රූපසිද්ධ්‍යාදියෙහි දක්නාලද අමුතු පද සිද්ධික්‍රමාදියද අවශ්‍යයෙන්ම අසා බලා ගතයුතු වෙත්—එසේත් බොහෝදෙනා විසින් එකියන ලද පොත් නිරායාසයෙන් ලබා ගැණීමත් දුෂ්කරවා පමණකුත් නොව එසේ ලබාගත්තාහු නමුදු ඒවා පණ්ඩිතයන් විසින් ශුද්ධ කොට අච්චුගසවා නැති නිසා අතින් අතට ලිවීමෙන් සජාතවූ නොයෙක් ලිපි දෝෂවලින් ආකූලහෙයින් ආධුනිකයන් විසින් ඒ ලිපි දෝෂ ශුද්ධ කොට ප්‍රයොජන ගැණීමත් දුෂ්කරවූ කාරණයක්ය—යන මේ ආදී කරුණු කල්පනා කළාවූ අපවිසින් බාලාවතාරයෙන් ව්‍යාකරණ ලියා කියා ඉගෙණගන්නාවූ ආධුනිකයන්ගේ ප්‍රයොජනය පිණිස නාමකාණ්ඩය ගැණ පමණවත් රූපසිද්ධ්‍යාදි කොයි පොත්වලත් සඳහන්වූ විභාගාදිය ප්‍රකාශ කොට සංග්‍රහයක් කරණු කැමතිව මෙම “නාමමාලා” නම් ප්‍රකරණය සම්පාදනය කරණු පිණිස නොයෙක් පොත්වලින් (ඒනම්, කච්චායන, මොග්ගල්ලායනවෘත්ති, රූපසිද්ධි; පයොගසිද්ධි, ශබ්දනීති, චූළනිරුත්ති, පදසාධන, එහි ටීකා සම්බන්ධචින්තා, එහි ටීකා, සද්දසාරත්ථජාලිනී, එහි ටීකා, කච්චායනසාර, එහි ටීකා, කච්චායනභෙද, එහි ටීකා යනාදි ශබ්ද ශාස්ත්‍රයට අයිති බොහෝ පාළි පොත්වලින් හා, පඤ්චිකා ප්‍රදීප, ගඩලාදෙනිසන්න, රූපසිද්ධිසන්නාදි සන්න පොත්වලින්ද, පාණිනී, සාරස්වත, කාතන්ත්‍ර, ප්‍රබොධචන්ද්‍රිකාදි සංස්කෘත පොත්වලින්ද, සඟි, අටුවා, ටීකා, අනුටීකා, යනාදි ආගමට අයිති පොත්වලින්ද) ඒ ඒ ස්ථානවලට ප්‍රයොජනවත් වැදගත්කරුණු උපුටා සංග්‍රහ කරණ ලද්දේ පමණක් නොව, මෙහි ශබ්දමාලාවල බාලාවතාර ක්‍රමයෙන් සිද්ධකළ නොහැකි හෙවත් බාලාවතාරයෙහි නොදක්වන ලද්දාවූ විභක්ත්‍යන්ත පදයන් වෙන්වශයෙන් මේයයි දැනගණු පිණිස ඒ පද මෙලෙස [ ] ලකුණු දෙකකට ඇතුල් කොට දක්වන ලද්දේය.

තවද ශබ්දමාලා කාණ්ඩයෙහි ඒ ඒ පිටුවල පාඩම් කටයුතුවූ කොටස වෙන් කොට දැනගණු පිණිස ඒවා ඉරකින් ඉහලට වෙන් කොට ඒ ඒ ශබ්දමාලා ගැණ දතයුතුවූ විශෙෂ විභාග ඒ ඉරෙන් පහත දක්වන ලදී.

ශබ්දමාලා අවසන්වූ තැන්වල දක්වනලද්දාවූ ගාථාපාඨයන්ගේ වචනවල අර්ථ ඒ ඒ තැන්වලම සඳහන් නොකළ නිසා ශබ්දමාලා කාණ්ඩය අවසානවූවායින් පසු ඒ සියලු වචන අකාරාදි ක්‍රමයෙන් යොදා එහිදී දක්වන ලද්දේය.

ශබ්දමාලාවලට අයිති ප්‍රථමා ද්විතීයාදි විභක්තීහු අනන්‍ය විභක්ත්‍යර්ථයන්හිද පවත්නා හෙයින් ඒ ප්‍රභෙද පෙන්වාදීම පිණිස "විභක්තිභෙද" නම්වූ කාණ්ඩයක්ද—විභක්තිභෙද කාණ්ඩයෙහි සඳහන්වූ කර්ම කර්තෘ ආදීන්ගේ ප්‍රභෙද හා ලක්ෂණ දක්වනු සඳහා "කර්මකාරක ලක්ෂණ—කර්තෘකාරක ලක්ෂණ—කරණකාරකලක්ෂණ—සම්ප්‍රදානකාරක ලක්ෂණ—අපාදානකාරක ලක්ෂණ—සාමිලක්ෂණ—ආධාරකාරක ලක්ෂණ—කර්මප්‍රවචනීය ලක්ෂණ—භාවලක්ෂණ"—යන කාණ්ඩ නවයක්ද—යථොක්ත විභක්තීන්ගේ එකවචන බහුවචනවල ප්‍රභෙද දක්වනු සඳහා "එකවචන බහුවචන ප්‍රභෙද" නම්වූ කාණ්ඩයක්ද—යථොක්ත කර්ම කර්තෘ ආදීන්ගේ උක්ත අනුක්ත ක්‍රම දක්වනු සඳහා "උක්තානුක්තභෙද" නම්වූ කාණ්ඩයක්ද—විභක්තිසංඛ්‍යාදීන්විසින් ආශ්‍රය කරණු ලබන්නාවූ විශෙෂණ විශෙෂ්‍යයන්ගේ ප්‍රභෙදාදිය පෙන්වාදීම පිණිස "විශෙෂණවිශෙෂ්‍ය විභාග" නම්වූ කාණ්ඩයක්ද—විශෙෂණයාගේම විශෙෂ්‍යයන්වූ ක්‍රියා විශෙෂණයාගේ ප්‍රභෙද දක්වනු සඳහා "ක්‍රියා විශෙෂණ ලක්ෂණ" නම් වූ කාණ්ඩයක්ද—පූර්වාරම්භකාණ්ඩය පුල්ලිංගික—ස්ත්‍රීලිංගික—නපුංසකලිංගික—සර්වනාම—සර්වනාමසංඛ්‍යා අසර්වනාමසංඛ්‍යා—ඉලක්කම් ක්‍රම—සංඛ්‍යාශබ්දනිෂ්පත්ති ක්‍රම—අකාරාදිය—යනාදී කාණ්ඩත් සමග මෙසේ කාණ්ඩ 24 කින් සම්පූර්ණ කොට මෙම ප්‍රකරණය නිෂ්ඨාකරණ ලද්දේය—මෙසේ අපවිසින් ලොකශාසනාභිවෘද්ධිකාමී අදහසින් බොහෝ වෙහෙස මාන්සි ගෙණ නොයෙක් පොත්පත් බලා සම්පාදනය කරණ ලද්දාවූ මෙම ග්‍රන්ථයෙන්, ශාස්ත්‍රාගමධාරී පණ්ඩිතයින්ගේ ඥාණාභිවෘද්ධියක් නොවේ නමුදු ශබ්දශාස්ත්‍රාභිලාෂී ආධුනිකයන්ගේ ඥාණාභිවෘද්ධියට හේතුවක් නොවේයයි නොසිතිය හැකිය—මෙබඳුවූ සහ

මීට වඩා උත්කෘෂ්ටතරවූද ග්‍රන්ථසාරයන් සම්පාදනය කිරීමෙන් මුද්‍රණයන්ත්‍රාධාරයෙන් ශබ්දශාස්ත්‍රාර්ථීන්ගේ සිත් සතුටු කිරීමට ශක්තිවන්ත පණ්ඩිතයෝ මේකාලයෙහි ලංකාද්වීපයෙහි ඉතාම දුර්ලභ නොවන්නාහු නමුදු, මෙබඳු ක්‍රියා ගැණ ව්‍යාවෘත වීම ශාස නොපකාරී තුච්ඡ දුෂ්ට ක්‍රියාවලට අනතාගීත කොට අර්ථද්‍රෝහී සමහර කුහක පුද්ගලයන් විසින් ලෝකයාට ඇඟවීමෙන් යථොක්ත සමහර පණ්ඩිතයින්ගේ සිත් බොහෝ සෙයින් මන්දෝත්සාහයට පැමිණ තිබෙන හෙයින් ආධුනිකයන්ගේ අත්වලට ශාස්ත්‍රාගමාභිවෘද්ධි හෙතුභූත අභිනව පොත්පත් ලැබීම දුර්ලභව තිබේ—යම් යම් දේවල ප්‍රමාණාදියක් නොදන්නා ඊර්ෂ්‍යාවතුන්ගේ කල්පනා කෙසේ නමුදු සුදුසුවූ විධිවලින් ශාස්ත්‍රාගම සම්බන්ධ පොත්පත් සුලභ කිරීම පණ්ඩිතයන් විසින් කටයුතුවූ ලෝකශාසනාභිවෘද්ධිහෙතුක ක්‍රියාවක් යයි අර්ථානර්ථවේදී පණ්ඩිතයින්ගේ කල්පනාවයි—මේකාලයෙහි ලොකයාවිසින් ඒත්තුගණු ලැබූවාවූ පණ්ඩිතයෙක් විසින්ද,

"සතව්තු වා නින්දතු වා පෘථග්ජන
සතතසතු කිං සඤත් මම කොවිදෛජනඃ,
ප්‍රමාණ මස්මින් දයතෙ ච යඃ පරාන්
ශ්‍රමච ජානාති කෘතෞ තථෛ දෘශී."

යන්නෙන් කියනලද්දක් මෙන් එබන්දෙවත් එබන්දන්ගේ නින්දා ප්‍රශංසා දෙකවත් මෙසේවූ දෙයෙහි ප්‍රමාණ නොව, මෙබන්දෙහි ප්‍රමාණයෝ නම් මෙබන්දක් කිරීමෙහි ප්‍රමාණයද වෙහෙස මාත්‍රයි යද දන්නාවූ ලොකාර්ථසිද්ධිකාමී අනුසූයක කාරුණාවන්ත පණ්ඩිතයෝමය—එසේහෙයින් යථොක්ත කල්පනාවලට පිටුවහල් නොවී ශක්තිවන්ත පණ්ඩිතයන්විසින් ශාස්ත්‍රාගම සම්බන්ධ පොත්පත් සුලභ කිරීමෙන් ලොකශාසනාභිවෘද්ධිය කිරීම යහපත්මය.

තවද—විශෙෂ බුද්ධිසම්පන්නවූ මහා පණ්ඩිතොත්තමයන් විසින් ලැබිය යුතු ග්‍රන්ථකර්තෘත්වකීර්තිය මෙම "නාමමාලා" නම් සුළු සංග්‍රහය කිරීමෙන් ලබනු කැමති මන්දබුද්ධිවූ අපගේ ප්‍රමාද භ්‍රමාදිය ආශ්‍රය කළාවූද මුද්‍රාධිකරණවශයෙන්වූද යම් යම් දෙස් මෙහි ඇතුව තිබෙන්ට පුළුවන—කාලිදාස නම් මහා කවීශ්‍රවිසින් පවා රඝුවංශ නම් මහා කාව්‍යය පටන් ගැන්මේදී

"මන්දඃ කවියශඃ ප්‍රෙප්සුඃ ගමිෂ්‍යාම්‍යුපහාස්‍යතාං,
ප්‍රාංශුලභ්‍යෙ ඵලෙ මොහා දුද්වාහුරිව වාමනඃ."

යන්නෙන්—“ පණ්ඩිතයන්විසින් ලැබිය යුතුවූ (කාව්‍ය නිර්මාණයෙන් සඤ්ජාතවූ) කීර්තිය ලබනු කැමැත්තාවූ මෝඩවූ මම, උස් මිනිසෙකුවිසින් නෙලා ගතයුතුවූ ගෙඩියකට අත එසෙවූවාවූ මිටි මිනිසෙක් මෙන් සිනාසිය යුතු බවට පැමිණෙන්නෙමි”—යි මෙසේද කියා තිබියදී අපවැන්නන්ගේ ග්‍රන්ථවල ගුණදොෂ ගැණ කියනුම කිම—එපමණකුත් නොව කෙනෙකුට නොපෙනුනු දොෂයක් තවත් කෙනෙකුට පෙනීමද, එක්කෙනෙකුට නිදොස්ලෙස වැටහෙන යමක් අනික් කෙනෙකුට සදොස්ලෙස වැටහීමද, මනුෂ්‍ය සවභාවකි—එසේහෙයින් මෙංන මෙංන ආකාරයකින් තාමුදු මෙහි විද්‍යමාන වියහැකිවූ උපස්ඛලිතයන් ලොකශාසනාභිවෘද්ධිකාමී ශාස්ත්‍රඥපණ්ඩිතවරයෝ ශොධනයකිරීමෙන් ලොකාර්ථසිද්ධිය කෙරෙත්වා යනු අපගේ ප්‍රාර්ථනාවයි.

W. Subhuti Terunnanse.

ශබ්දමාලා කාණ්ඩයේ
පටන් ගැනීම.

සප්ත විභක්තීන්ගේ අර්ථකියන ක්‍රමය පෙන්වනු සඳහා බුද්ධ ශබ්දය පමණක් අර්ථ සහිතව දක්වා එතැන්පටන් පුල්ලිඞ්ගාදී ශබ්දයන්ගේ නාමමාලාක්‍රමය පිළිවෙළින් දක්වනු ලැබේ.

බුද්ධ ශබ්දයෙහි අර්ථ.

Declension of *Buddha*.

	එකවචන. Singular.	බහුවචන. Plural.
ප්‍රථමා—	බුද්ධො, සර්‍වඥතෙම.	බුද්ධා, සර්‍වඥවරයෝ තුමූ.
Nom.	Buddha.	Buddhas.
ආල—(හෙ)	බුද්ධ, බුද්ධා, (පින්වත්) සර්‍වඥයන්වහන්ස.	(භවන්තො) බුද්ධා, (පින්වත්) සර්‍වඥවරයිනි.
Voc.	O Buddha.	O Buddhas.
විති—	බුද්ධං, සර්‍වඥයන්වහන්සේ.	බුද්ධෙ, සර්‍වඥයන්වහන්සේලා.
Acc.	Buddha.	Buddhas.
තෘති—	බුද්ධෙන, සර්‍වඥයන්වහන්සේ විසින්.	බුද්ධෙහි, බුද්ධෙභි, සර්‍වඥයන්වහන්සේලාවිසින්.
Ins.	by Buddha.	by Buddhas.
කරණ—	බුද්ධෙන, සර්‍වඥයන්වහන්සේකාරණකොට (ගෙණ.	බුද්ධෙහි, බුද්ධෙභි, සර්‍වඥයන්වහන්සේලාකාරණ (කොට ගෙණ.
Aux.	with Buddha.	with Buddhas.
චතුර්ථි—	බුද්ධාය, බුද්ධස්ස, සර්‍වඥයන්වහන්සේට.	බුද්ධානං, සර්‍වඥයන්වහන්සේලාට.
Dat.	to Buddha.	to Buddhas.
පඤ්චමි—	බුද්ධා, බුද්ධම්හා, බුද්ධස්මා, සර්‍වඥයන්වහන්සේකෙරෙන්.	බුද්ධෙහි, බුද්ධෙභි, සර්‍වඥයන්වහන්සේලාකෙරෙන්.
Abl,	from Buddha.	from Buddhas.
ෂෂ්ඨි—	බුද්ධස්ස, සර්‍වඥයන්වහන්සේගේ.	බුද්ධානං, සර්‍වඥයන්වහන්සේලාගේ.
Gen.	of Buddha.	of Buddhas.
සප්ත—	බුද්ධෙ, බුද්ධම්හි, බුද්ධස්මිං, සර්‍වඥයන්වහන්සේකෙරෙහි.	බුද්ධෙසු, සර්‍වඥයන්වහන්සේලාකෙරෙහි.
	in Buddha.	in Buddhas.

නමො බුද්ධාය.

NOUNS ENDING IN අ. (A.) MES. *Buddha.*

1. අකාරන්ත පුල්ලිඞ්ගො බුද්ධසද්දො.

එකවචන.	බහුවචන.
පඨමා....බුද්ධො	බුද්ධා
ආලපන..(හෙ) බුද්ධ, බුද්ධා	(භවන්තො) බුද්ධා
දුතියා....බුද්ධං	බුද්ධෙ
තතියා...බුද්ධෙන	බුද්ධෙහි, බුද්ධෙභි
කරණ....බුද්ධෙන	බුද්ධෙහි, බුද්ධෙභි
චතුත්ථී...බුද්ධාය, බුද්ධස්ස, [බුද්ධත්ථං*]	බුද්ධානං
පඤ්චමී......බුද්ධා, බුද්ධම්හා, බුද්ධස්මා	බුද්ධෙහි, බුද්ධෙභි
ඡට්ඨී...... බුද්ධස්ස	බුද්ධානං
සත්තමී...බුද්ධෙ, බුද්ධම්හි, බුද්ධස්මිං	බුද්ධෙසු.

එවං සුරා[1]සුර නරො[2]රග නාග යක්ඛා
ගන්ධබ්බ කින්නර මනුස්ස පිසාච පෙතා
මාතඞ්ග ජඞ්ගම තුරඞ්ග වරාහ සීහා
ව්‍යග්ඝ[3]ච්ඡ කච්ඡප තරච්ඡ මිගා[4]ස්ස සොණා.

ආලොක ලොක නිලයා[5]නිල චාග යොග
වායාම ගාම නිගමා[6]ගම ධම්ම කාමා
සංඝො[7]ඝ ඝොස පටිඝා[8]සව කොධ ලොභ
සාරම්භ ථම්භ මද මාන පමාද මක්ඛා.

පුන්නාග පූග පනසා[9]සන චම්පකා[10]ම්බ
හින්තාල තාල බකුල[11]ජ්ජුන කිංසුකා(ච)
මන්දාර කුන්ද පුචිමන්ද කරඤ්ජ රුක්ඛා
(සෙය්‍යථා)මයූර සකුණ[12]ණ්ඩජ කොඤ්ච හංසා.

"ඵස්සො යක්ඛො ඉන්දො චන්දො හත්ථො පබ්බතො සොසො ගොධො
සොමො රාමො ගවජො ඉස්සො ගෙහො මාලො අට්ටො සන්තො.

සාලො ධවො(ච) ඛදිරො ගොධුමො සසීකො යවො
කලායො(ච) කුලත්ථො(ච) තිලො මුග්ගො(ච) තණ්ඩුලො.
ඛත්තියො බ්‍රාහ්මණො වෙස්සො සුද්දො ධුත්තො(ච) පුක්කුසො
චණ්ඩාලො පථිකො පත්ථො මාණවො රථිකො රථො.

---

* "බුද්ධත්ථං" යනුද චතුර්ථ්‍යෙකවචන "ස" විභක්තියට "ත්ථං" යනාදෙශව සිද්ධවූ පදයකි.

2

පබ්ජිතො ගහණො(ච) ගොගණො ඔඝො(ච) ගද්දභො
මාතුගාමො(ච) ඔරොධො (ඉඩාදීනි විභාවයෙ.")

අකාරන්ත ශබ්දවලින් පරවූ චතුර්ථී එකවචන "ස" විභක්තියට "ආය' ආදෙශව සිඩවූ "බුඩාය" යනාදී පද* ගත්‍යර්ථකර්ම, නයනාර්ථකර්ම, විභක්තිවිපරිණාම, තාදර්ථ්‍ය, යනාමේ සතරතන්හි මුත් දනාරෙවන ධාරණ නමොයොගාදීවූ වෙන යම්කිසි සම්ප්‍රදාන විශයෙක්හි පෙළෙහි හා පූරාණ අටුවාවලද නැතිබව සමහර ආචාර්යමතයකි.

එම දක්වනු සඳහා ශබ්දනීතියෙහි.

"චතුත්ථෙකවචනස්ස ආයාදෙසෙන සංයුතං
රූපං අනිත්ථිලිඞ්ගානං ඨානෙසු චතුසූදිතං.
ගත්‍යත්ථකම්මනි චෙව නයනත්ථස්ස කම්මනි
විභත්තියා විපල්ලාසෙ තාදත්ථෙ චාපි නිද්දිසෙ.
මූලාය පටිකස්සෙය්‍ය අප්පො සග්ගාය ගච්ඡති
එවං ගත්‍යත්ථකම්මස්මිං දිට්ඨ[1]මෙමෙහි සාසනෙ.
දකාය නෙති ඉච්චෙවං නයනත්ථස්ස කම්මනි
වචනායාති නිස්සක්කො විරමණප්පයොගතො.
ගණාය ඉති සාමිස්මිං හතතාති සද්දයොගතො
ධනජයායාති පදං කත්වෙත්ථ සාමි සූචකං.
අසක්කතාති සද්දස්ස යොගතොති විනිද්දිසෙ
අක්ඛෙසු චාපි විපල්ලාසො මග්ගිතබ්බො විභාවිනා.
අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානායාති[2]චාතිතු
ලිඞ්ගත්තයවසෙනෙව තාදත්ථස්මිං විනිද්දිසෙ.
එවං පාඨානුලොමෙන කපිතො "ආය" සම්භවො
ඉදානි සුබ්බුං ඨානං විනෙත්තබ්බං පුනප්පුනං."

---

* ගමනාර්ථවාචී ධාතුවකින් සිඩවූ ක්‍රියාපදයහා සම්බන්ධවන්නාවූ කර්මය ගත්‍යර්ථකර්මනම් වේ—ඒනම්, "අප්පො සග්ගාය ගච්ඡති" යනාදී උදාහරණයන්හි ගච්ඡති යනාදී ක්‍රියාපදහා සම්බන්ධ වන "සග්ගාය" යනාදියයි.

පැමිණීම අර්ථකොට ඇති ධාතුවකින් සිඩවූ ක්‍රියාපදය හා සම්බන්ධවන්නාවූ කර්මය නයනාර්ථකර්මයයි—ඒනම්, "දකාය නෙති" යනාදියෙහි "නෙති" යන ක්‍රියාපදයහා සම්බන්ධ වන "දකාය" යනාදියයි.

මෙහි විභක්තිවිපරිණාමනම් චතුර්ථීවිභක්ත්‍යන්තපදය පචමීවිභක්ති අර්ථයට පෙරලෙන බවයි—එය "විරමථ යස්මා මම වචනාය" යන්නෙන් දතයුතුය.

තාදර්ථනම් ඒ පිණිස යනාර්ථයි—"අභිඤ්ඤාය සම්බොධාය නිබ්බානාය සංවත්තති" යන පාඨයෙහි "අභිඤ්ඤාය" යනාදී පද තුන තාදර්ථයෙහි චතුර්ථීයි.

NOUNS ENDING IN අ. (A.) MES. *Atta.*

2. අකාරන්ත පුල්ලිංගො අත්තසද්දො.

එකවචන.		බහුවචන.
ප....අත්තා		අත්තා, අත්තානො
ආ..(හෙ) අත්ත, අත්තා	(භව:)	අත්තා, අත්තානො
දු....අත්තානං, අත්තං		අත්තෙ, අත්තානො
ත...අත්තෙන, අත්තනා		අත්තනෙහි, අත්තානෙහි
ක...අත්තෙන, අත්තනා		අත්තනෙහි, අත්තානෙහි
ච....අත්තනො, අත්තස්ස		අත්තානං
පං...අත්තනා, අත්තම්හා, අත්තස්මා		අත්තනෙහි, අත්තනෙහි
ඡ....අත්තනො, අත්තස්ස		අත්තානං
ස....අත්තනි, අත්තම්හි, අත්තස්මිං		අත්තනෙසු.

එවං.—"*රාජා බ්‍රහ්මා සඛා (චෙව) ආතුමා සා පුමා රහා
අලාභධම්මා(ච) පඤ්චබධම්මා(ච) විවට චඤද.
වත්තහා(ච) (කථා) වුත්තාසිරා (චෙව) යුවා (පිච)
මඝවා අඩ මුඛා(දී විඤ්ඤූතඛා විභාවිනා.")

මේ අත්ත ශබ්දයෙහි ප්‍රථමා ආලපන බහුවචනවයෙහි "අත්තං" යන පදයද ද්විතීයා බහුවචනයෙහි "අත්තෙ" යන පදයද, චතුර්ථි ෂෂ්ඨී එකවචනවයෙහි "අත්තස්ස" යන පදයද, සප්තම්‍යෙකවචන යෙහි "අත්තෙ අත්තම්හි අත්තස්මිං" යන පදත්‍රයද, මොග්ගල්ලායන ව්‍යාකරණයෙන් ගත්බව රූපමාලානම් ප්‍රකරණයෙහි කියනලද් දේය. එසේන් (ඒපද අතුරෙන්) ශබ්දනීති ව්‍යාකරණයෙහිදු ප්‍රථමා ආලපන බහුවචනවයෙහි "අත්තා" යනු ආයේය. චූලනිරුත්තියෙහි චතුර්ථී ෂෂ්ඨී එකවචනවයෙහි "අත්තස්ස" යනු ආයේය. කච්චායන නිරුත්තිපිටක ශබ්දනීති යන ප්‍රකරණයන්හි නායේය. එසේ නමුදු මේ සියලු පෙළ අටුවාවලට සමකාර බලා පිළිගතයුතුබව ශබ්දනීතිකාරාචාර්‍ය්‍යතෙම කියා තිබේ.

කෙවලවූ අත්තශබ්දය මෙහි දක්වනලැබූ ක්‍රමයට වරනැගෙණ නමුදු වෙන ශබ්දයක් හා සමාසව පරපද භාවයෙහි සිටි "භාවිතත්තා" යනාදී ශබ්ද බුද්ධශබ්දයමෙන් "භාවිතත්තො; භාවිතත්තා" යනාදි වශයෙන් වරනැගිය යුතුයි.

---

* අත්තශබ්දයෙහි විභක්තිරූපවලට සමවූ බොහෝ විභක්තිරූප රාජශබ්දයෙහි දක්නාලදහෙයින් රාජශබ්දයද, අත්තශබ්දයා මෙන් වරනැගිය යුතු ශබ්ද සංග්‍රහ කරණලද ගාථාවෙහි දක්වනලදී.

NOUNS ENDING IN අ. (A.) MES. *Rága.*

3. අකාරන්ත පුල්ලිඞ්ගො රාජසද්දො,

ඒකවචන.	බහුවචන.
ප....රාජා	රාජා. රාජානො
ආ...(හෙ)රාජ, රාජා	(සං:) රාජා, රාජානො
දු...රාජානං, රාජං	රාජානො
ත...රඤ්ඤා, රාජේන, [රාජිනා]	රාජූහි, රාජූභි, රාජේහි, රාජේභි
ක...රඤ්ඤා, රාජේන, [රාජිනා]	රාජූහි, රාජූභි, රාජේහි, රාජේභි
ච....රඤ්ඤො, රාජිනො	රඤ්ඤං, රාජූනං, රාජානං
පං...රඤ්ඤා, රාජම්හා, රාජස්මා	රාජූහි, රාජූභි, රාජේහි, රාජේභි
ඡ....රඤ්ඤො, රාජිනො	රඤ්ඤං, රාජූනං, රාජානං
ස....රඤ්ඤෙ, රාජිනි, රාජම්හි, රාජස්මිං]	රාජූසු, රාජේසු.

මෙහි "රාජා" යන බහුවචනය නිරුත්තිපිටක කච්චායනාදියෙහි නායේ නමුදු චූලනිරුත්ති, ශබ්දනීති දෙක්හි ආයේය. "අථඛො චත්තාරො මහාරාජා මහතියා ච යක්ඛසෙනාය මහතියා ච කුම්භණ්ඩ සෙනාය" යනුද, "චත්තාරො තෙ මහාරාජා ලොකපාලා යසස්සිනො" යනුද, "සෙනාදියා සබ්බා හොන්ති" යනුද දක්නාලදබැවින් "රාජා" යන ප්‍රථමා ආලපන බහුවචනය කැමතිවිය යුතුය, "බ්‍රහ්මා අත්තා සබ්බා" යනාදියද එසේමය—විතීයා එකවචනයට "රාජානං" යනු මුත් "රාජං" යනු නිරුත්තිපිටකයෙහි නායේය—"රාජේන, රාජේහි, රාජේභි, රාජම්හා, රාජස්මා, රාජම්හි, රාජස්මිං, රාජේසු" යනු තෘතීයාදී යට චූලනිරුත්ති නිරුත්තිපිටක ශබ්දනීති යන පොත්වල නායේය– "රාජිනා" යන තෘතීයා කරණ එකවචනය කච්චායන රූපසිද්ධි බාලාවතාරාදියෙහි නායේ නමුදු පාළියෙහි "සබ්බදත්තෙන රාජිනා" යනාදිය දක්නාලදබැවින් ශබ්දනීතියෙහි පමණක් ආයේය–තවද, "රාජේන, රාජේහි, රාජේභි, රාජේසු" යන පද කච්චායනාදියෙහි ආයේ නමුදු පෙළෙහි නොදක්නාලද බවද, මෙබඳු පද වෙන ශබ්ද යක් හා සමාස වීමෙන් පරපදභාවයෙහි සිටියාවූ රාජශබ්දයෙහි මුත් කෙවල රාජශබ්දයෙහි නැතිබවද අග්ගවංසාචාර්ය මතයයි— ඒ ගැණම-"අවුත්තං ධම්මරාජේන—සීවිරාජේන පෙසිතො" යනු හා "නික්ඛමනෙත්ත මහාරාජේ සිවීනං රට්ඨවඩ්ඪනෙ" යනාදී උදාහරණ යන්ද දක්වා මේගැණ යහපත් කොට පරීක්ෂා කටයුතුබවද, අටුවා

කථා සහිතවූ පිටකත්‍රයෙහි සර්‍වප්‍රකාරයෙන් ක්‍රම සලකන්ට සිව්පිළිසිඹියාපත් මහරහතන් වහන්සේලාට හැර සෙස්සන්ට දුෂ්කර බවද දක්වා තිබේ.

අත්‍තවූ ශබ්දයක්හා සමාස වීමෙන් පරපදභාවයට ගියාවූ රාජශබ්දය (ඒනම් සිවිරාජ, ධම්මරාජ යනාදිය) බුඩශබ්දය මෙන් හා රාජශබ්දය මෙන්ද යන ද්විප්‍රකාරයටම වරනැගිය යුතුයි.

අත්තශබ්දය මෙන් වරනැගිය යුතුයයි මෙහි දක්වනුලැබූ "බ්‍රහ්ම" ශබ්දාදීන්ගෙහි අත්තශබ්දයට වෙනස්වූ රූපද ඇතිබැවින් ඒ සියලු වෙනස් මෙහි දක්වනු ලැබේත්.

1. බ්‍රහ්මශබ්දයෙහි වෙනස.

තෘතීයා කරණ පඤ්චමී එකවචනත්‍රයෙහිම "බ්‍රහ්මුනා" යන පදයක්ද, යථෝක්ත බහුවචනත්‍රයෙහි "බ්‍රහ්මූභි, බ්‍රහ්මූහි" යනා පදවයක්ද, චතුර්ථී ෂෂ්ඨී ඒකවචනවයෙහි "බ්‍රහ්මුනො" යන පදයක්ද බහුවචනවයෙහි "බ්‍රහ්මූනං" යන පදයක්ද වෙත්—අත්තශබ්දයෙහි පෙනෙන "අත්තස්ස, අත්තනෙහි, අත්තනෙහි" යන රූපවලට සමානවූ (බ්‍රහ්මස්ස යනාදී) රූප බ්‍රහ්මශබ්දයෙහි නැත-සප්තමී එකවචනයෙහි "බ්‍රහ්මෙ" යන්නක්ද වියයුතුයි—යථෝක්ත පදයන් අතුරෙන් "බ්‍රහ්මූභි, බ්‍රහ්මූහි, බ්‍රහ්මූනං, බ්‍රහ්මෙ" යනපද සතර ශබ්දනීතියෙහි මිස කච්චායන රූපසිඩි නිරුත්තිපිටක චූලනිරුත්ති ආදියෙහි නොදක්වන ලද්දක්හුය-එසේ නමුදු "පණ්ඩිතපුරිසෙහි දෙවෙහි බ්‍රහ්මූහි" යන ටීකා පාඨයද "බ්‍රහ්මූනං විමානාදීසු ඡන්දරාගො කාමාසවො න හොති" යන අටුවා පාඨයද "ධම්මං පණීතං මනුජෙසු බ්‍රහ්මෙ" යන දෙශනා ගාථා පදයද, සාධකවශයෙන් දක්වනලද බැවින් ශබ්දනීතිකාරාචාර්‍ය්‍යයා මතය ස්ථිරවූ බැව් පෙනේ.

2. සඛ ශබ්දයෙහි වෙනස.

ප්‍රථමා ආලපන විතීයා බහුවචනයන්හි "සඛිනො, සඛායො" කියාත් පදවයක්ද, විතීයා ඒකවචනයෙහි "සඛාරං" යනුද, තෘතීයා කරණ පඤ්චමී බහුවචනයන්හි "සඛාරෙභි, සඛාරෙහි, සඛෙභි, සඛෙහි" යනුද, තෘතීයා එකවචනයෙහි "සඛිනා" යනුද, චතුර්ථී ෂෂ්ඨී එකවචනයන්හි "සඛිනො, සඛිස්ස" යනුද, පඤ්චමී එකවචනයෙහි "සඛාරා, සඛාරස්මා, සඛිනා" යනුද පමණක් බවද, චතුර්ථී ෂෂ්ඨී එකවචනබහුවචනයන්හි "සඛිස්ස, සඛිනො, සඛාරානං සඛීනං" යනුද, සප්තමී එකවචනයෙහි "සඛෙ" කියාද, බහුවචනයෙහි "සඛාරෙසු, සඛෙසු" කියාද, දතයුතුය—අත්ත රාජ යන ශබ්දවයෙහිම ආලපන එකවචනයෙහි අත්තා, රාජා, යනු ශබ්දනීතිකාර

කාචායඝීයන්විසින් නොදක්වනලද්දේ නමුදු සච්ඡණ්ණකක්කටක ජාතකයෙහි "අරෙ සඛා කිස්ස නු මං ජහාසි?" යනු දක්නාලදබැවින් ආලපනෙකවචනයෙහි සඛා කියාද දක්වනලදී—අන්‍ය ශබ්දයක්හා සමාසව පරපදත්‍වයෙහි සිටියාවූ (සබ්සඛ යනාදී) සඛශබ්ද බුද්ධ ශබ්දය සේ වරනැගිය යුතුයි.

3. ආතුමශබ්දයෙහි වෙනස.

විතියාව දක්වා අත්තාශබ්දයමෙන්ද, තෘතීයාවෙහි පටන් බුද්ධශබ්දය මෙන්ද, වරනැගිය යුතුය. අත්තශබ්දයෙහි විතීයාව දක්වා ලැබෙන පද ගැණ දක්වනලද්දවූ ආචාඝීමත භේදයන් මීටද යෙදේ.

4. *සා ශබ්දයෙහි වෙනස.

"සා" ශබ්දය වනාහි සමහර රූපවලින් අත්තාශබ්දයට සමාන වූවද ආකාරනත ප්‍රකෘති ශබ්දයකි—එහි වෙනස ශබ්දමාලාව බලාම දැන ගණු පිණිස මෙහි සඳහන් කරණු ලැබේ.

එක.	බහු.
ප....සා	සා, සානො
ආ...(හෙ) ස	(භවː) සා, සානො
දු....සානං	සානෙ
ත...සානා	සානෙහි, සානෙභි
එවං කරණෙ.	
ච....සාසස	සානං
පං...සානා	සානෙහි, සානෙභි
ඡ....සාසස	සානං
ස....සානෙ	සානෙසු.

සමහර ආචාඝීකෙනෙක් විතීයා තෘතීයාදියෙහි "සං, සෙ; සෙන, සෙහි, සෙභි; ස්සඃ; සම්හා, සස්මා, සෙහි, සෙභි; සස්සඃ; සෙ, සමහි, සස්මිං, සෙසු;" යන රූපද කැමතිවනලද්දේ නමුදු නිරුත්ති පිටක ශබ්දනීතිආදියෙහි නොමැතිවත් ඇර බුද්ධවචනයෙහිද නො ලැබෙනබව කියති.

සුනඛ වංචකවූ සා ශබ්දය යථෝක්ත ක්‍රමයට වරනැගෙණ නාමුත් සකියාතීයෙහිවූ ස, සා, ශබ්ද බුද්ධ, කඤ්ඤ, චිත්ත ශබ්ද නයින් වරනැගෙත්.

---

* ස ශබ්දයයිද කියහැකියි

5. පුම ශබ්දයෙහි වෙනස.

එක.	බහු.
ප....පුමා	පුමා, පුමානො
ආ...(හෙ)පුම	(භව:) පුමා, පුමානො
දු....පුමානං	පුමානෙ
ත...පුමානා, පුම්නා	පුමානෙහි, පුමානෙභි
එවංකරණෙ.	
ච....පුමස්ස, පුම්නො	පුමානං
පං...පුමානා, පුම්නා	පුමානෙහි, පුමානෙභි
ඡ....පුමස්ස, පුම්නො	පුමානං
ස....පුමානෙ	පුමානෙසු, පුමාසු.

“හෙ පුමං” කියා අනුසවාරසහිත ආලපනෙක වචනයක්ද කච්චා නයෙහි දක්වනලද්දේ නමුත් එබඳු පදයක් අටුවාකථා සහිතවූ පාළියෙහි නොදක්නාලද බැවින් පරීක්ෂාකොට ගතයුතු බව සමහර ආචාය්‍යී මතයකි.

තවද—“සොළසිත්ථී සහස්සානං නවිජ්ජති පුමො තදා”—යනුද,
“යථා බලාකයොනිම්හි නවිජ්ජති පුමො සදා
මෙඝෙසු ගජ්ජමානෙසු ගබ්භං ගණ්හන්ති තා සදා”—යනුද

පාළියෙහි දක්නාලද බැවින් “පුමො; පුමා” යනාදීන් බුධ ශබ්දය මෙන්ද පුමශබ්දය වරනැගිය යුතුයි.

6. රහ ශබ්දයෙහි වෙනස.

එක.	බහු.
ප....රහා	රහා, රහිනො
ආ...(හෙ) රහ	(භව:) රහා, රහිනො
දු....රහානං	රහානෙ
ත...රහිනා	රහිනෙහි, රහිනෙභි
එවං කරණෙ	
ච....රහස්ස	රහානං
පං...රහා	රහානෙහි, රහානෙභි
ඡ....රහස්ස	රහානං
ස....රහෙ	රහානෙසු.

7. දළ්හධම්මශබ්දයෙහි වෙනස

එක.	බහු,
ප....දළ්හධම්මා	දළ්හධම්මා, දළ්හධම්මානො
ආ...(භො)දළ්හධම්ම	(භව:)දළ්හධම්මා, දළ්හධම්මානො
දු....දළ්හධම්මානං,	දළ්හධම්මෙ
ත...දළ්හධම්මිනා	දළ්හධම්මෙහි, දළ්හධම්මෙභි
එවං කරණෙ	
ච....දළ්හධම්මස්ස	දළ්හධම්මානං
පං...දළ්හධම්මිනා	දළ්හධම්මෙහි, දළ්හධම්මෙභි
ඡ....දළ්හධම්මස්ස	දළ්හධම්මානං
ස....දළ්හධම්මෙ	දළ්හධම්මෙසු.

8. පඩකබ්ධම්මශබ්දයද මෙසේමය.

"ඉස්සත්ථෙ චම්මි කුසලො දළ්හධම්මොති විස්සුතො"—යනුද "බාරාණසියං දළ්හධම්මො නාම රාජා රජ්ජං කාරෙසි" යනුද දක්නා ලදබැවින් බුඩශබ්දය මෙන්ද දළ්හධම්මශබ්දය වරනැගිය යුතුයි.

9. විවටච්ඡද ශබ්දයෙහි වෙනස.

අත්තානො යන රූපයට සමවූ විවටච්ඡාදනො යන්නක් නො ගෙණ විතීයාව දක්වා අත්තශබ්දය මෙන්ද සෙස්ස බුඩශබ්දය මෙන්ද වරනැගිය යුතුයි.

"ලොකෙසි විවටච්ඡදෙ" යනාදියෙහි විවටච්ඡදෙ යනාදිය දක්නා ලදහෙයින් කෙවලව බුඩශබ්දය මෙන්ම වරනැගිය යුතු විවටච්ඡද ශබ්දයක්ද ඇතිබව දතයුතුයි.

10. වත්තහ ශබ්දයෙහි වෙනස.

විතීයාව දක්වා විවටච්ඡද ශබ්දයමෙනි, තෘතීයා පචමී දෙක්හි වත්තහානා; වත්තහානෙහි, වත්තහානෙභි, කියාද—චතුර්ථී ෂෂ්ඨී එකවචනවයෙහි වත්තහිනො කියාද සප්තමියෙහි වත්තහානෙ; වත්තහානෙසු, කියාද වේ.

11. වුත්තසිර ශබ්දයෙහි වෙනස,

තෘතීයා පචමී එකවචනවයෙහි වුත්තසිරා සීද—චතුර්ථී ෂෂ්ඨී එකවචනවයෙහි වුත්තාසිරස්ස, සීද-සප්තමියෙහි වුත්තසිරෙ; වුත්ත සිරෙසු, සීද-විතීයාව දක්වා වත්තහශබ්දයෙහි මෙන්ද, තෘතීයා පචමී බහුවචන බුඩ ශබ්දයෙහි මෙන්ද, සෙස්ස අත්තශබ්දයෙහි මෙන්ද, දතයුතුය–එසේත් වුත්තසිරෙ, යී බුඩශබ්දයෙහි මෙන් ප්‍රථමා එකවචනයක්ද දක්නා ලැබේ.

12. යුව ශබ්දයෙහි වෙනස.

එක.	බහු.
ප....යුවා	යුවා, යුවානො, යුවානා
ආ...(හෙ)යුව, යුවාන	(භව:) යුවානා
දු....යුවානං, යුවං	යුවානෙ, යුවෙ
ත...යුවානා, යුවෙන, යුවානෙන	යුවානෙහි, යුවානෙභි, යුවෙහි, යුවෙභි
එවං කරණෙ.	
ච...යුවානස්ස, යුවස්ස	යුවානානං, යුවානං
පං....යුවානා, යුවානම්හා, යුවානස්මා	යුවානෙහි, යුවානෙභි, යුවෙහි, යුවෙභි
ඡ....යුවානස්ස, යුවස්ස	යුවානානං යුවානං
ස....යුවානෙ, යුවෙ, යුවානම්හි යුවානස්මිං, යුවම්හි, යුවස්මිං	යුවානෙසු, යුවාසු, යුවෙසු.

13. මඝව (නොහොත් මඝවන්තු) ශබ්දයෙහි වෙනස.

මඝව ශබ්දයාගේ පදමාලාව යුවශබ්දයාගේ මෙන් ආචාර්යවරයෝ යොදත් නමුදු නිරුත්තපිටක චූලනිරුත්ති දෙක්හි මඝවා මඝවන්තො යනාදීන් ගුණවන්තුශබ්දය මෙන් කියනලදහ. ඒ මතය පෙළහා සංසන්දනය වේ. කෙසේද, පෙළෙහි "සක්කො මහාලි දෙවානමින්දො පුබ්බෙ මනුස්සභූතො සමානො මඝො නාම මාණවො අහොසි තස්මා මඝවාති වුච්චති"යි කියන ලදහෙයින්–"මඝො (ඉති නාමං) අස්ස අත්ථීති මඝවා"–මඝ යන නාමය ඔහුට ඇත්තේනුයි යනාර්ථයෙහි මඝශබ්දයෙන් පරව "වන්තු" ප්‍රත්‍යයව මඝවන්තු ශබ්දය සිද්ධවූ බව පෙනේ, එහෙයින් ගුණවන්තුශබ්දයාගේ මෙන්ද පදමාලාව යෙදිය යුතුයි.

14. අද්ධ ශබ්දයෙහි වෙනස.

එක.	බහු.
ප....අද්ධා	අද්ධා, අද්ධානො
ආ...(හෙ)අද්ධ	(භව:) අද්ධා, අද්ධානො
දු....අද්ධානං	අද්ධානෙ
ත...අද්ධුනා	අද්ධානෙහි, අද්ධානෙභි
එවං කරණෙ.	
ච....අද්ධුනො	අද්ධානං
පං...අද්ධුනා	අද්ධානෙහි, අද්ධානෙභි
ඡ....අද්ධුනො	අද්ධානං
ස....අද්ධනි, අද්ධානෙ	අද්ධානෙසු.

15. මුද්ධ ශබ්දයෙහි වෙනස.

ද්විතීයාව දක්වා අද්ධශබ්දය මෙන්ය, එසේත් ද්විතීයා එකවචනය මුද්ධං කියාය. තෘතීයා පඤ්චමී සප්තමී එකවචනයන්හි මුද්ධනා මුද්ධනි කියාය–සප්තමී බහුවචනයෙහි මුද්ධෙසු කියාය, සෙසු බුද්ධශබ්දයෙහි මෙනි.

NOUNS ENDING IN උ. OR අ. (U.) MAS. *Gunawantu*

4. උකාරන්ත (අථවා අකාරන්ත) පුල්ලිඞ්ගො ගුණවන්තුසද්දො.

එකවචන.	බහුවචන.
ප... ගුණවා	[ගුණවං] ගුණවන්තො, ගුණවන්තා
ආ... (හෙ) ගුණවං, ගුණව, ගුණවා	(සම්:) [ගුණවා] ගුණවන්තො, ගුණවන්තා
දු... ගුණවන්තං	ගුණවන්තෙ
ත... ගුණවතා, ගුණවන්තෙන	ගුණවන්තෙහි, ගුණවන්තෙභි
ක.. ගුණවතා, ගුණවන්තෙන	ගුණවන්තෙහි, ගුණවන්තෙභි
ච... ගුණවතො, ගුණවන්තස්ස	ගුණවතං, ගුණවන්තානං
පං... ගුණවතා, ගුණවන්තා ගුණවන්තම්හා, ගුණවන්තස්මා	ගුණවන්තෙහි, ගුණවන්තෙභි
ඡ... ගුණවතො, ගුණවන්තස්ස	ගුණවතං, ගුණවන්තානං
ස... ගුණවති, ගුණවන්තෙ, ගුණවන්තම්හි, ගුණවන්තස්මිං	ගුණවන්තෙසු.

එවං මඝවා කුලවා ඵලවා යසවා ධනවා සුතවා භගවා හිමවා බලවා සීලවා පඤ්ඤවා සතිමා ධිතිමා ගතිමා මුතිමා ජුතිමා හිරිමා ධුතිමා රතිමා යතිමා සුචිමා කලිමා බලිමා කසිමා රුචිමා බුද්ධිමා චක්ඛුමා බන්ධුමා හෙතුමා සෙතුමා කෙතුමා රාහුමා භානුමා ඛානුමා විජ්ජුමා පාපිමා දූතන්තිමා, "ගණවා විවා කතවා හිතවා ඕතවා රස්මිවා මස්සුවා යතවා ථාමවා රසවා."

ඉච්චාදයො ගුණවන්තුසද්දසමා.

මේ ගුණවන්තුශබ්දයෙහි වනාහි "එථ තුම්හෙ ආවුසො සීලවා හොථ"-"චක්ඛුමා අන්ධිකා හොන්ති මාතුගාම විසං ගතා." යනාදි තැන්වල ප්‍රථමෛකවචනභාවයෙන් "සීලවා, චක්ඛුමා" යනාදිය දක්නාලදහෙයින් ප්‍රථමා ආලපන බහුවචනවයෙහි "ගුණවා" යන පදය චූලනිරුත්තියෙහි හා ශබ්දනීතියෙහිද දක්වනලද නමුදු කච්චා යන රූපසිද්ධි බාල වතාරද්‍යෙහි නොදක්වන ලද්දේය.

"හෙ ගුණව" යි ආලපනෛකවචනය හ්‍රස්වවශයෙන් පමණක් චූලනිරුත්ති නිරුත්තිපිටක යන දෙක්හි කියන ලදහ-ශබ්දනීති

යෙහි “භෙ ගුණවා” යි දීර්ඝවශයෙන් පමණක්ද–“කථන්නු භගවං තුය්හං සාවකො සාසනෙ රතො” “තස්ස භගවා* බොජ්ඣඞ්ගා” යනාදී නොයෙක් තැන්වල දීර්ඝවශයෙන්ම දක්නාලදහෙයින් “වන්තු” ප්‍රත්‍යයව සිඬවූ ගුණවන්තු යසවන්තු යනාදී ශබ්දවල දීර්ඝ වශයෙන්ම යුතුබවද “මන්තු” “ඉමන්තු” ප්‍රත්‍යයන්ගෙන් සිඬවූ “සතිමන්තු ගතිමන්තු වඩ්ඪිමන්තු” යනාදී ශබ්දවල “භො සතිම” “භො ගතිම” “භො වඩ්ඪිම” යි මේආදිය හ්‍රස්වවශයෙන් කීම යුතු බවද ශබ්දනීතිකාරාචාර්ය්‍ය මතයයි.

කච්චායන රූපසිද්ධි බාලාවතාර යන තුනෙහි “භෙ ගුණවං ගුණව, ගුණවා” යී නිග්ගහීත හ්‍රස්ව දීර්ඝාන්තවශයෙන් ආලපනෙකවචන තැනක්ම ආ හෙයින් මෙහිද දක්වනලද්දහුයයි දතයුතුය.

තවද ප්‍රථමා බහුවචනස්ථානයෙහි පද තුනක් (කච්චායනාදියට එකඟ ලෙස) මෙහි දක්වනලද නමුදු “ගුණවන්තො” යනු පමණක් අග්ගවංසාචාර්ය්‍යයන්විසින් දක්වන ලද්දේය.—එසේම,

“තුය්හං ධීතා මහාවීර පඤ්ඤවන්ත ජුතින්ධර”
“සබ්බං ඛිරෙවං පරිනිට්ඨිතානි යසස්සිනං පඤ්ඤවන්ත විසය්හ
යසො ච ලද්ධා පුරිමං උළාරං නප්පජ්ජහෙ වණ්ණබලං පුරාණං.”

යනාදී තැන්වල “පඤ්ඤවන්ත” යනාදිය ආලපනඑකවචන භාවයෙන් දක්නාලදහෙයින් භො ගුණවන්ත, භො සතිමන්ත යනාදි වශයෙනුදු ආලපන එකවචනයක් කැමති විය යුතුය.

“ගඞ්ගා භාගීරථී නාම හිමවන්තා පභාවිතා” යනාදියෙහිද “කුතො ආගතාත්ථ භන්තෙ, හිමවන්තා මහාරාජ” යනාදියෙහිද හිමවන්තා යනාදිය දක්නාලදහෙයින් පඤ්චමී එකවචනස්ථානයෙහි ගුණවන්තා යනුද යෝග්‍යයි.

ශබ්දශාස්ත්‍රාර්ණව පාරප්‍රාප්ත අග්ගවංසාචාර්ය්‍යොත්තමයන්විසින් මේ ගුණවන්තුශබ්දය මුල්කොට දක්වනලද විස්තරයක් මෙසේය.

ගුණවන්තාදි ශබ්දයන්ගේ නිෂ්පත්ති ක්‍රමය කෙසේදයත්—පුල්ලිඞ්ගවූද නපුංසකලිඞ්ගවූද අකාරාන්තශබ්දයන්කෙරෙන් බොහෝසෙයින් “වන්තු” ප්‍රත්‍යයව ගුණවා ගණවා කුලවා යනාදි ශබ්ද උපදිත්. ස්ත්‍රීලිඞ්ගවූ ආකාරාන්ත ඉවර්ණාන්ත උකාරාන්ත ශබ්දයන්කෙරෙන් “වන්තු” ප්‍රත්‍යයව සඤ්ඤාවා රස්මිවා යසස්සිවා මස්සුවා යනාදියද—ඉවර්ණාන්ත උකාරාන්ත ඔකාරාන්ත ශබ්දයන්කෙරෙන් පරව “මන්තු” ප්‍රත්‍යයව යතිමා බලිමා චක්ඛුමා ගොමා

---

* “තස්ස භගව බොජ්ඣඞ්ගා” යීද සමහරු ව්‍යවහාරකෙරෙත්.

යනාදි ශබ්ද උපදීත්—අකාරාන්ත ඉකාරාන්ත ශබ්දයන්කෙරෙන් "ඉමන්තු" ප්‍රත්‍යයව පාපිමං පූතන්තිමා යනාදි ශබ්දයෝ උපදිත්-මෙහි චෝදනාවක්—පාපිමා පූතන්තිමා වසීමා යනාදී ශබ්දයන් "මන්තු" ප්‍රත්‍යය කිරීමෙන් සිඬකාටයුතු නොවේද? යත්—පරිහාර—කිසිම තැනෙකත්හි අකාරාන්ත ශබ්දයන්කෙරෙන් පරව මන්තු ප්‍රත්‍යය සුවූහෙයින් එසේ නොහැකිය—එසේනම් පළමුකොට පාප පූතන යනාදි ශබ්දයන්කෙරෙන් පරව ඉකාරාගම කොට ඒ ඉකාරයෙන් පරව මන්තු ප්‍රත්‍යය කිරීමෙන් සාදන්ට හැකි නොවේද? යත්—පද සිඬිය වනහෙයින් හැකිය එහෙත් ක්‍රමය ශෝභන නොවේ-එසේ පාප පූතනාදිවූ අකාරාන්ත ශබ්දයන්කෙරෙන් පරව ඉකාරාගම කොට මන්තු ප්‍රත්‍යයක් කළේ වීනම් ගුණ යස යනාදි අන්‍යවූද අකාරාන්ත ශබ්දවලින් පරව ඉකාරාගම කොට මන්තු ප්‍රත්‍යය කටයුතු බව පැමිණේ-නොයෙක් සිය දහස් ගණන් පාළි ප්‍රදේශයන්හි කිසි තැනෙකත්හි ගුණ යසාදි ශබ්දවලින් පරව ඉකාරාගම කොට මන්තු ප්‍රත්‍යයව සිඬවූ පදයක් නොපෙනේ. එසේහෙයින් පාප පූතන යනාදි අකාරාන්ත ශබ්දවලින් පරව ඉකාරාගම නොකොට ඉමන්තු ප්‍රත්‍යය කළකල්හි පාපිමං පූතන්තිමා යනාදිය සිඬවේත්-එසේනම් කච්චායනයෙහි ඉමන්තු ප්‍රත්‍යයක් නොකියා මන්තු ප්‍රත්‍යයක්ම කුමක් හෙයින් කියනලද්දේද යත්-මන්තු ප්‍රත්‍යය පමණක් නොව ඉමන්තු ප්‍රත්‍යයක්ද කච්චායනයෙහි නයවශයෙන් කියනලද්දේය. කෙසේදයත්, කච්චායනයෙහි තද්ධිත ප්‍රත්‍යයන් දක්වන්නාවූ ඈවා යසීතෙම

"තපාදිතො සී.
දණ්ඩාදිතො ඉකඊ.
මධ්වාදිතො රො.
ගුණාදිතො වන්තු."

යනමේ සූත්‍ර සතරම පිළිවෙළට තො ප්‍රත්‍යයාන්ත වශයෙන් කියා ඒ මධ්‍යයෙහි "සත්‍යාදීහි මන්තු" යන සූත්‍රය (බහුවචනාන්තව) අන් පරිද්දකින් දක්වා නැවතත් ඊට අනන්තරූ සූත්‍රයෙන් "සඬාදිතො ණො" යී තො ප්‍රත්‍යයාන්තවශයෙන්ම දක්වනලද්දේය. එකාපිළිවෙළටම සූත්‍ර කිපයක් දක්වාගෙණ යන අතර ඒ මධ්‍යයෙහි අන්‍යාකාරයකින් සූත්‍රයක් දක්වනුලැබූයේ අනෑවූ යම්කිසි අභිප්‍රායක් හැඟවීම පිණිසයයි අවශ්‍යයෙන්ම සිතිය යුතුය-එහෙයින් එහි විශේෂ කොට දක්වන් ලද "සත්‍යාදීහි මන්තු" යන සූත්‍රයාගේ වශයෙන් "මන්තු" ප්‍රත්‍යය පමණක් නොව "ඉමන්තු" ප්‍රත්‍යයක්ද කියනලද්දේයයි

සිතිය හැකිය-සම්කිසි ආකාරයකින් තමන්ගේ අභිප්‍රාව හැඟවීම ආචාර්‍ය්‍යවරයන්ගේ ප්‍රකෘතියකි-මෙහි පළමුවෙනි අර්ථය ව්‍යඤ්ජනසන්ධිවශයෙන්ද දෙවෙනි අර්ථය ස්වරසන්ධිවශයෙන්ද ගතයුතුය්-"සත්‍යාදීහි මන්තු" යනු පළමුවෙන් අර්ථයයි-"සත්‍යාදීහි ඉමන්තු" යනු දෙවෙනි අර්ථයයි-අතිශයින් ගැඹුරුවූ අර්ථ ඇති මේසූත්‍රයෙන් කිසි තැනෙකත්හි, සති, ගති, සෙතු, යනාදි ශබ්දයන්කෙරෙන් "මන්තු" ප්‍රත්‍යය වසතිමා, ගතිමා, සෙතුමා, යනාදි ශබ්දද, පාප, පුත්ත, යනාදි ශබ්දයන් කෙරෙන් පරව "ඉමන්තු" ප්‍රත්‍යයව පාපිමං, පුත්තිමා යනාදි ශබ්දයන්ද සිද්ධවෙත් යයි දතයුතුයි.

තවද සතිමා, බන්ධුමා, චන්දිමා, යනාදි ශබ්දයන්ද ගුණවන්තු ශබ්දය මෙන් වරනැගිය යුතුයයි දක්වනලද්දේ නමුදු "සතිමං භික්ඛුං-බන්ධුමං රාජානං-චන්දිමං දෙවපුත්තං මුඤ්චථං තරමානරූපො" යනාදි තැන්වල දක්නාලද විතීයා එකවචනයද "සතිමස්ස භික්ඛුනො-බන්ධුමස්ස රඤ්ඤො" යනාදියෙහි දක්නාලද චතුර්ථී ෂෂ්ඨී එකවචනද ගුණවන්තු ශබ්දයෙහි රූපවලට වෙනස්යයිද, එසේම "හිමවන්තොපි පබ්බතො" යනාදියෙහි වූ හිමවන්තො යනාදි එකවචනාන්තපද ගාථාවල පමණක්යයිද දතයුතුයි.

NOUNS ENDING IN අ. (A.) MAS. *Gacchanta.*

5. අකාරන්ත පුල්ලිංගො ගච්ඡන්ත සද්ද,

	එකවචන.	බහුවචන.
ප...	ගච්ඡං, ගච්ඡන්තො	ගච්ඡන්තො, ගච්ඡන්තා, [ගච්ඡං]
ආ...	(හෙ)ගච්ඡං, ගච්ඡ, ගච්ඡා	(භො)ගච්ඡන්තො, ගගච්ඡන්තා
දු...	ගච්ඡන්තං	ගච්ඡන්තෙ
ත...	ගච්ඡතා, ගච්ඡන්තෙන	ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි
ක...	ගච්ඡතා ගච්ඡන්තෙන	ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි
ච...	ගච්ඡතො, ගච්ඡන්තස්ස	ගච්ඡතං, ගච්ඡන්තානං
පං...	ගච්ඡතා, ගච්ඡන්තම්හා, ගච්ඡන්තස්මා	ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි
ඡ...	ගච්ඡතො, ගච්ඡන්තස්ස	ගච්ඡතං, ගච්ඡන්තානං
ස...	ගච්ඡති, ගච්ඡන්තෙ ගච්ඡන්තම්හි, ගච්ඡන්තස්මිං	ගච්ඡන්තෙසු.

එවං මහං චරං තිට්ඨං දදං භුඤ්ජං සුණං පචං,
ජයං ජීරං චවං මීයං සරං කුබ්බං ජපං වජං.
ඉච්චාදයො ගච්ඡන්තසද්දසමා.

මෙහි ප්‍රථමා බහුවචනස්ථානයෙහි "ගච්ඡං" යන්න "තෙ ගච්ඡං චක්ඛුං ලභමානා—භවං අපි නූ තුම්හෙ ආයස්මන්තො ජනං පස්සං විහරථ" යනාදියෙහි දක්නාලදහෙයින් කියන ලදී—තෘතීයා කරණ පංචමී ෂෂ්ඨී සප්තමී ඒකවචනස්ථානයන්හි ගච්ඡන්තෙන, ගච්ඡන්තා, ගච්ඡන්තම්හා, ගච්ඡන්තස්මා, ගච්ඡන්තම්හි, ගච්ඡන්තස්මිං, යන පදයන් ආචාර්ය යමකමහාස්ථවිරයන්වහන්සේගේ මතයට නොගන්නා ලද්දාහුය-එසේත් එබඳු පද පාලියෙහි ඇතිහෙයින් ගත යුතු බවම අග්ගවංසාචාර්යයෝද කියති—ගච්ඡන්තො-මහන්තො-චරන්තො-යනාදිය ආලපනස්ථානයෙහි බහුවචන වශයෙන්ද ප්‍රථමා විභක්තිස්ථානයෙහි ඒකවචන වශයෙන්ද යමකමහාස්ථවිරයන්වහන්සේ දක්වති—කිසිවෙක් වනාහි ප්‍රථමාවිභක්තිස්ථානයෙහි ඒකවචන බහුවචන වශයෙන්ද, ආලපනස්ථානයෙහි බහුවචනවශයෙන්ද කියත්—ගච්ඡං, මහං, චරං, යනාදිය ආලපන ඒකවචනවශයෙන් පමණක් කියති-එසේත් අග්ගවංසාචාර්යතෙම සානුස්වාර ආලපනෛකවචනයක්ද ගච්ඡන්තො මහන්තො යන බහු වචන යන්ද අටුවාකථා සහිත බුද්ධවචනයෙහි නැතිබව ස්ථිරලෙසම කියති.

නිරුක්තිපිටයෙහි මහන්තො, චරන්තො, භවන්තො, යනාදිය ප්‍රථමා ආලපන බහුවචන වශයෙන් පමණක් දක්වන ලද්දේය—"සන්තො භවන්තො අරහන්තො" යන පදයන් විජ්ජිතකොට ඇති ගච්ඡන්තො, මහන්තො, චරන්තො යනාදි පදයන් පාලියෙහි බහු වචන වශයෙන් නොදක්නා ලදබව දක්වනනාවූ අග්ගවංසාචාර්යෝත්තමයන්විසින් "බවහන්තෙ" යනාදිය කියන ලදී.

"බවහන්තෙ කත්ථචි ඨානෙ ජනමිච්චාදයො යථා
දිස්සන්ති නෙවං බවහන්තෙ ගච්ඡන්තො ඉති ආදයො.

බවහන්තෙ කත්ථචි ඨානෙ සන්තො ඉච්චාදයො පිච
දිස්සන්ති නෙවං බවහන්තෙ ගච්ඡන්තො ඉති දිස්සති.

අරහන්තොති බවහන්තෙ ඒකන්තෙනෙව දිස්සති
නෙවං දිස්සත් බවහන්තෙ ගච්ඡන්තො ඉති ආදයො.

අනෙකසතපාදෙසු විහරන්තොති ආදිසු
ඒකස්සාපි බහුකත්තෙ පවත්තත් නාතු දිස්සති.

බහුවචනනයෙන ගච්ඡන්තොති පදස්ස හි
ගහණෙ සති බහවො දොසා දිස්සන්ති සබ්බතො.

යෙඑකම්හි ඝරෙ අඩෙඪ අඩ්ඪා සාම්පිකා ඝරා
තථා බවහත්ථ වාඩ්ඩෙනත ගච්ඡෙනතං ති පදස්සතු.
විහරනෙතාති ආදීනං බව්හත්ථ වාචිතා සියං
රූපනයො අනිඩො ච ගහෙතබෙබා අනෙකධා.”

මහනෙතා, චරනෙතා, හවනෙතා යනාදිය බහුවචන වශයෙන් කියනලද්දවූ නිරුත්තිපිටකය නම් සිව්පිළිසිඹියා පත් මහාකච්චා යන ස්ථවිරයන්වහන්සේවිසින් කරණ ලදදැයි ලොකප්‍රසිඬහෙයින් මේ ස්ථානය නැවත නැවතත් පරීක්‍ෂා කටයුතු බවද අග්ගවංසාචාර්‍ය්‍යයන්විසින් කියනලදී.

සනත, අරහනත, හවනත යන ශබ්ද තුනද ගච්ඡනත ශබ්දය මෙනි.

එසේත් සමහර රූප වෙනස් වෙත්-ඒනම් “සබ්භිරෙව සමාසෙථ සබ්භි කුබෙබථ සන්ථවං” යනුද “අබාහි තාත සත නෙසධම්මො” යන ජයද්දිසජාතකපාළියද දක්නාලදහෙයින් සනතශබ්දයාගේ තෘතීයා පචමී බහුවචනයන්හි සබ්හි* කියාද, චතුර්ථී ෂෂ්ඨී බහුවචනයන්හි සතානං කියාද වෙත්—අභිධානප්පදීපිකාවෙහි “වීතරාගො තථාරහා” යනුද-උත්තරිමනුස්සධම්මපාළියෙහි “මයචම්හා අරහනෙතා” යනුද දක්නාලදහෙයින් ප්‍රඥප්තිවාචකවූ අරහනත ශබ්දයාගේ ප්‍රථමා එකවචනයෙහි අරහා† කියාද, බහුවචනයෙහි අරහනෙතා කියාද වෙත්—වඩ්ඪනාර්ථ හවනාර්ථ දෙක්හි වැටෙන හවනත ශබ්දයාගේ ප්‍රථමා බහුවචනය හවනතා කියාද එයින් ප්‍රථමත් අර්ථයන්හි වැටෙන කාල “හවනෙතා ආගච්ඡනති” යනාදි තන්හි මෙන් “හවනෙතා” කියාද වේ—වඩ්ඪනාර්ථවාචී හවනත ශබ්දය නම් “අනුපුබෙබන හවනෙතා විඤ්ඤුතං පාපුණාති” යනාදි තන්හිය—භාවනාර්ථවාචී භාවනත ශබ්දයනම් “සමණෙන නාම ඊදිසෙසු කාමෙසු අවසාවටෙන භවිතබ්බං එවං හවනෙතා හි සමණා සුසමණා අස්ස” යනාදි තන්හිය.

තාවද ප්‍රඥප්තිවාචකවූ සනතශබ්දය, විද්‍යමානාර්ථවාචී සනත ශබ්දය, ශාන්තාර්ථවාචී සනතශබ්දය, විශ්‍රපසමනාර්ථවාචී සනත ශබ්දය, නිර්ධාරණාර්ථවාචී සනතශබ්ද යයි සනතශබ්දය නොයෙක්

---

* සනත ශබ්දයෙන් පරවූ හි විභක්තිහට භි යනාදෙශ කොට ඒ භකාරයා පරකල්හි “සනතස්සදිසස සො හෙ බො වනෙත” යන සූත්‍රයෙන් සනතශබ්දයාගේ සකාරාදෙශද අනත්‍යයේ බකාරාගමද කළ කල්හි “සබ්භි” කියා වේ.

† “සෙසස්සු නතුව” යන සූත්‍රයෙහි “නතු” යන යෝග විභාගයෙන් සි විභක්තිපර කල්හිද නත ප්‍රත්‍යය නතුවත් වන බැවින් “ගුණවා” යනු මෙන් “අරහා” යි සිඬවේ.

ප්‍රභේදවේ-එහි ප්‍රඥප්තිවාචකවූ සන්තශබ්දයෙහි ප්‍රථමා බහුවචන යට පමණක් "සන්තො" යන රූපය වේ—විද්‍යමානාර්ථවාචී සන්ත ශබ්දයෙහි ප්‍රථමා එකවචන බහුවචන දෙකටම සන්තො කියා වේ—සෙසු අර්ථවාචී සන්තශබ්ද බුද්ධශබ්දය මෙනි.

තවද, මේ ගච්ඡන්ත ශබ්දය පුල්ලිඟුයෙහි ගච්ඡං, ගච්ඡන්තො, ගච්ඡන්තා, යනාදිවශයෙන්ද-ස්ත්‍රීලිඟුයෙහි ගච්ඡන්තී. ගච්ඡන්තී, ගච්ඡන්තියො යනාදි වශයෙන්ද-නපුංසකලිඟුයෙහි ගච්ඡන්තං, ගච්ඡන්තානි, යනාදි වශයෙන්ද, රූපමාලා කටයුතු වෙත්—එසේම අරහන්තශබ්දයත් ලිඟත්‍රයටම අයිති වුවද රූපාන්තරවශයෙන් තුන් ආකාරයකට නොබිදේ—"ඉත්ථී අරහං සම්මාසම්බුද්ධො" යනාදී අර්ථනපාළියෙහි ස්ත්‍රීලිඟු ප්‍රථමා එකවචනයද පුල්ලිඟුයෙහි මෙන් "අරහං" කියාද ප්‍රඥප්තිවාචකවූ ස්ත්‍රීලිඟික අරහන්ත ශබ්දයෙහි "ඉත්ථී අරහා අහොසි" යනාදියෙහි මෙන් "අරහා" කියාද-නපුංසක ලිඟික අරහන්තශබ්දයෙහි (අරහන්තං කියා නොව) පුල්ලිඟුයෙහි මෙන්("අරහං චිත්තං" යනාදිය දක්නා ලදබැවින්) අරහං කියාද වේ.

මහන්ත ශබ්දයත් ගච්ඡන්ත ශබ්දය හා සම වුවද සමහර විභක්ති වලදී ඊට වෙනස් ආකාර රූපයන් ඇති වෙත්—මහං මහා මහන්තො මහන්තා කියා ප්‍රථමා විභක්තිය වේ-තවද මහන්තො මහන්තා යනාදීන් බුද්ධ ශබ්දය මෙන් පුල්ලිඟුයෙහිද මහතී මහතී මහතියො යනාදීන් නදී ශබ්දය මෙන්ද, මහන්තා මහන්තා මහන්තායො යනාදීන් කඤ්ඤා ශබ්දය මෙන්ද, ස්ත්‍රී ලිඟුයෙහිද මහන්තං මහන්තානි යනාදීන් චිත්ත ශබ්දය මෙන් නපුංසක ලිඟුයෙහිද වරනැගෙත්-ස්ත්‍රීලිඟුයෙහි ගච්ඡන්තී ගච්ඡන්තී ගච්ඡන්තියො කීවාක් මෙන් මහන්තී යනාදිය නොවේ—"මහතියා ච යක්ඛසෙනාය මහතියා ච කුම්භණ්ඩසෙනාය"—"මහන්තා නිබ්බුම්භියො" යනාදියෙහි දක්නාලද හෙයිනි.

මේ අග්ගවංසාචාර්ය්‍ය මතයයි—නුමුත් කච්චායන බලාවතාරාදියෙහි ගුණවන්තී කුලවන්තී ගච්ඡන්තී යනු මෙන්ම මහන්තී යනුද දක්වන ලද්දේය—පෙළෙහි අප්‍රසිද්ධ බැවින් විමසිය යුත්තය—පෙළෙහි හා අටුවාවලද "සෙය්‍යථාපි භික්ඛවෙ මහතී සාලසීසා..." "ඉත්ථී සියා රූපවතී..." "සාච සීලවතී අත්ථිකතී චක්ඛුමතී චිත්තිමතී" "මහතිං සෙනං දිස්වා මහොසධස්ස සෙනා මන්දා අයං අතිවිය මහතී සෙනා දිස්සති" යනාදී පාඨයන්හි මහතී ශබ්දය මුත් මහන්තී ශබ්දය නොදක්නා ලදහෙයිනි—මහා යනු (මහා දුරියො යනාදී) සමාස පදවල මුත් කෙවලව නැතිබව සමහරෙක් කියත්—"මහා තෙ උපාසක පරිච්චාගො"—මහා වතායං භූමිචාලො"—"ඝොසො ච විපුලො මහා"—

"මහා තෙස ලොකසන්නිවාසො" යනාදී තන්හි ප්‍රථමා එකවචනා නත කෙවලවූ "මහා" යනු දක්නාලදහෙයින් යථෝක්ත නියමන නොගත යුතුයි.

තවද "ජානනත, පසනත" යන ශබ්දවයත් ගච්ඡනත ශබ්දය හා සම වුවද වෙනස්වූ පදයන් දක්නා ලැබෙත්.

කෙසේදයත්–"සා ජානං යෙව ආහ න ජානාමීති, පස්සං යෙව ආහ නපස්සාමීති" යනාදියෙහි දක්නාලද "ජානං, පස්සං" යන ස්ත්‍රීලිඟික ප්‍රථමා එකවචන රූපයන් පුල්ලිඟික රූපාකාරයෙන්ම සිටිත්–මේ ආදියෙහි "ජානනාති, පස්සනාති" කියා ලිඟානතර පරිවත්තනය වේ.

එසේම "තුමෙහ ආයසමනෙතා එකානතසුඛං ලොකං ජානං පස්සං විහරථ" යනාදියෙහි "ජානනෙතා, පස්සනෙතා" කියා වචනානතර වශයෙන් පරිවත්තනය වේ.

"භරනාති මාතාපිතරෙ පුබෙබ කතමනුස්සරං" යන මෙහිද "අනුස්සරං" යන්න "අනුස්සරනතා" යී වචනානතරවශයෙන් පරිවත්තනය වේ.

"සඩමෙමා ගරුකාතබෙබා සරං බුඬානසාසනං" යන මෙහි "සරං" යනු "සරනෙතනා" යී විභකත්‍යනතර වශයෙන් පරිවත්තනය වේ.

"ප්‍රුසං භූතානි සංඛාානං මනසා ගණයනො යථා" යන මෙහිද "ප්‍රුසං" යන්න "ප්‍රුසනතසස" යී විභකත්‍යනතර වශයෙන් පරිවත්තනය වේ.

එසේම "යාචං අදදමපපියො" යන මෙහි "යාචං" යන්න "යාචනතසස" කියා විභකත්‍යනතර වශයෙන් පරිවත්තනය වේ.

තවද අකාරානත පුල්ලිඟික සනත ශබ්දයාගේ තෘතීයා පඤ්චමී බහුවචනවශයෙහි "සබහි" යන රූපයක් මෙහි දක්වන ලද්දේය. එසේද වුවත් ඉකාරානත පුල්ලිඟික "සබහි" ශබ්දයකුදු ඇතිබව "සනෙතා හවෙ සබහි පවෙදයනාති"–"බහුපෙතං අසබහි ජාතවෙද–"සබහිනි සප්පුරිසො නිබ්බානව–සුනදරබිවචනං වා එතං සබහීති" යනාදියෙන් පෙනේ.

NOUNS ENDING IN ඉ. (I) MAS. *Aggie.*

6. ඉකාරන්ත පුල්ලිංගයො අග්ගිසද්දො.

එකවචන.	බහුවචන.
ප...අග්ගි	අග්ගී, අග්ගයො
ආ...(හෙ)අග්ගි	(භො:) අග්ගී, අග්ගයො
දු...අග්ගිං	අග්ගී, අග්ගයො
ත...අග්ගිනා	අග්ගීහි, අග්ගීභි
ක..අග්ගිනා	අග්ගීහි, අග්ගීභි
ච...අග්ගිනො, අග්ගිස්ස	අග්ගීනං
පං...අග්ගිනා, අග්ගිම්හා, අග්ගිස්මා	අග්ගීහි, අග්ගීභි
ඡ...අග්ගිනො, අග්ගිස්ස	අග්ගීනං
ස..අග්ගිම්හි, අග්ගිස්මිං	අග්ගීසු.

ජොති පාණි ගණ්ඨි මුට්ඨි කුච්ඡි වත්ථි සාලි වීහි,
ව්‍යාධි ඔධි බොධි සන්ධි රාසි කෙසි සාති දීපි.

ඉසි මුනි මණි ධනි ගිරි රවි කවි කපි
අසි මසි නිධි විධි අහි කිමි පති හරි.
අරි තිමි කලි බලි ජලනිධි ගහපති
උරුබිති වරමති නිරූපධි අධිපති.

"අඤ්ජලි සාරථි අතිථි සමාධි උදධි දධි අග්ගිනි තිනි බොන්දි
දිවි රගි ඤාති ජලධි සිරිභූති සොත්ථිභූති ධනභූති යසභූති."

ඉච්චාදයො අග්ගිසද්දාව.

මේ අග්ගි ශබ්දයෙහි යමකමහාස්ථවිර මතයෙහි පඤ්චමී එකවචනස්ථානයෙහි අග්ගිම්හා අග්ගිස්මා යනු නැත්තේය. ඒ සමාන ප්‍රයෝගයන් පෙළෙහි දක්නාලදහෙයින් ගතයුතුබව අග්ගවංසාචාර්ය්‍ය මතයයි.

මෙහි ගාථාවල දක්වනලද අධිපති ශබ්දය අග්ගිශබ්දය හා සමාන නමුදු "අධිපතියා සන්තා" යන පාලිය දක්නාලදහෙයින් "අධිපතියා" යී සප්තමී එකවචන රූපයක්ද වියයුතුය—"අසාරෙ සාරමතිනො" යනාදියෙහි දක්නාලද සමාසවූ මති ශබ්දයාගේ ප්‍රථමා ද්විතීයා බහුවචන දෙක්හි "-මතිනො" යන්නාත්ද, අධිපති ගහපති ජානිපති යනාදි ශබ්දයන්ගේ අධිපතිනො ගහපතිනො ජානි

පතිනො යනාදී ප්‍රථමා විතීයා බහුවචන රූපයන්ද (ඊකාරාන්තාදී ශබ්දයෙහි මෙන්) විය යුත්තාහුය-තවද ඉසි මුනි යන ශබ්දයන්ගේ ආලපනස්ථානයෙහි "ඉසෙ" "මුනෙ" කියාද එකවචන විය යුතුය. "පුනෙතා උප්පජ්ජතෙ ඉසෙ" යනුද—"පරිග්ගණ්හා මහාමුනෙ" යනාදියද පෙළෙහි දක්නාලද හෙයිනි.

අග්ගි ශබ්දයෙහි මෙන් රූපමාලා කටයුතුයයි මෙහි දක්වනු ලැබූ අග්ගිනි, ගිනි යන ශබ්දවයෙහි විභාගයක් මෙහි දක්වනු ලැබේ.

"අග්ගිනි" යනු ප්‍රථමා එකවචනයෙහි විනා සෙසු විභක්තිවල නැතැයි සමහරෙක්ද, පාළියෙහි අග්ගිනි ශබ්දයක් නැත්තේමය්යි සමහරෙක්ද, එසේම ගිනි ශබ්දයක්ද නැත්තේය ගිනි යනු අග්ගි ශබ්දයාගේ ප්‍රථමා රූපයක්යයි සමහරෙක්ද කියත්—මේ සියල්ලම නොගතයුතුබැව් අග්ගවංසාචාර්‍ය්‍යතුම කියයි-කුමක්හෙයින්දයත්-සුත්තනිපාතයෙහි "නගි වග්ගු වදන්ති වදන්තං, නාභිජ්ජන්ති න තාණමුපෙන්ති අගාරෙ සජ්ජතෙ සෙන්ති, අග්ගිනි සම්පජ්ජලිතං පවිසන්ති" යන මෙහි අග්ගිනිං යන උපයෝග වචනයක් දක්නාලද්දේය. එහෙයින්ම එම සූත්‍ර අටුවාවෙහි "අග්ගිනි සම්පජ්ජලිතන්ති සමන්තතො ජලං සබ්බදිසාසු ච සම්පජ්ජලිතමග්ගිං" කියාද-කොකාලිය සූත්‍රයෙහි "අථ ලොහමයං පන කුම්භිං අග්ගිනි සම්පජ්ජලිතං පවිසන්ති පචන්ති හි තාසු චිරරත්තං අග්ගිනි සමාසු සමුප්පිලවාසො" යන මෙහි "අග්ගිනිසම්පජ්ජලිතං යනාන සමාස පදයක් බැවින් අග්ගිනීහි සම්පජ්ජලිතං යන අර්ථය ලැබේ-එසේම "අග්ගිනි සමාසු" යනු අග්ගිනීහි සදිසාසු යන අර්ථයද ලැබේ-මෙසේ සමාසවිධානමුඛයෙන් අග්ගිනීහි යන කරණ වචනයද ලැබේ-"තමෙව කට්ඨං දහති තස්මා සො ජායතෙ ගිනි" යන මෙහි ගිනි ශබ්දයද දක්නාලද්දේය—එහි අටුවාවේ "තස්මාති යතො කට්ඨා, ගිනීති අග්ගි" මෙසේ ගිනිශබ්දයෙහි අර්ථ අග්ගි ශබ්දයෙන් දක්වන ලද බැවිනුද-එසේම "ඡන්නා කුටි ආහිතො ගිනි" යනාදි ධනියසූත්‍ර ගාථාවට කරණලද අටුවාවෙහිද "...ගිනීති අග්ගි" කියා දක්වා තිබෙන බැවිනුද-"මහාගිනි පජ්ජලිතො අනාගාරෙපසම්මති" යනාමේ ථෙරගාථාවට කරණලද සංවණ්ණනාවෙහිද "ගිනීති අග්ගි" යී තිබැවින්ද, ගිනි ශබ්දයක් පාලිභාෂාවේ ඇතිබැව් හැගේ—එහෙයින්, ගිනි ශබ්දයක් නැත කියන්නවුන්ගේ වචනය නොගතයුතුබැව් අග්ගවංසාචාර්‍ය්‍යමත යයි.

ගිනි ශබ්දයද අග්ගි ශබ්දය මෙන් වරනැගිය යුතු බවද—යම්සේ (ලබුවලට නම්වූ) ලාබු-අලාබු යන ශබ්දවයක් ඇත්තේද, එසේම (වහ්නියට නම්වූ) ගිනි-අග්ගිනි යන ශබ්දවයක් ඇති බවද—

යම්සේ සංස්කෘතභාෂාවෙහි සංයොගීව කියවෙනු ලබන්නාවූ "පද්ම" යනාදී ශබ්දයන් මාගධ භාෂාවට පැමිණ "පදුම" යනාදීන් විසංයෝගීව කියනු ලබන බවද—යම්සේ සංස්කෘත වෛයාකරණිකයන්විසින් "අග්නි" ශබ්දය සියළු විභක්තිවචනයන්හි යොදනලද් දැක් මෙන් පාළිභාෂාවෙහි අග්ගිනි ශබ්දයද එසේම යෙදියයුතු බවද අග්ගවංසාචාර්‍ය්‍යයන්විසින් කියනලදී.

ඉදින් "අග්ගිනි" ශබ්දය සියළු විභක්ති වචනයන්හි යෙදියයුතු නම්, කච්චායනයෙහි "අග්ගිස්සිනි" යනසූත්‍රයෙන් සි විභක්ති පර කල්හි අග්ගි ශබ්දයාගේ අන්තයාහට "ඉනි" යනාදෙශයක් කුමක් හෙයින් දක්වන ලද්දේද යත්—ඒ නැණ මෙසේ කියන ලදී.

යම්සේ දස ශබ්ද දසයක් වන්ද සමාස කොට ඒකශේෂ කරණලද දස ශබ්දයට යො විභත්ති පරකල්හි "නව" යනාදෙශ කොට යො විභත්තියට "උති" යනාදෙශකොට "නවුති" යන රූපය නිපන් කල්හි නැවත ඒ නවුති යන ප්‍රකෘතිය තබා සි විභත්ති නං විභත්ති ආදිය කොට ("නවුතියා හංසසහස්සෙහි පරිවුතො" යනාදියෙහිද "ජනනවුතීනං පසාධානං පවරං යදිදං සුගතවිනයං" යනාදියෙහිද දක්නාලද) "නවුතියා–නවුතීනං" යනාදි රූපයන් නිපදවන ලද්දාහුද, එසේම සි විභත්ති පරකල්හි අග්ගි ශබ්දයාගේ අන්ත ඉකාරයාට ඉනි යනාදෙශ කිරීම්වශයෙන් අග්ගිනි යන රූපය නිපන් කල්හි නැවත අග්ගිනි යන ප්‍රකෘතිය තබා යින් පරව යො ආදි විභත්ති කොට "අග්ගිනි අග්ගිනී අග්ගි යො" යනාදි රූපයන් නිපදවනා ලද්දාහුයයි දතයුත්තේය.

NOUNS ENDING IN ඉ. (I) MAS. *A'di.*

7. ඉකාරාන්ත පුල්ලිංගො ආදි සද්දො

එකවචන.	බහුවචන.
ප...ආදි	ආදී, ආදයො
ආ...(හෙ)ආදි	(භව:)ආදී ආදයො
දු ..ආදිං	ආදී, ආදයො
ත...ආදිනා	ආදීභි, ආදීහි
ක...ආදිනා	ආදීභි, ආදීහි
ච...ආදිනො, ආදිස්ස	ආදීනං
පං...ආදිනා, ආදිම්හා, ආදිස්මා	ආදීභි, ආදීහි
ඡ...ආදිනො, ආදිස්ස	ආදීනං
ස...ආදිං, ආදෙ, ආදිම්හි, ආදිස්මිං	ආදීසු, ආදීසු.

NOUNS ENDING IN ඊ. (I′) MAS. *Dandí*

8. ඊකාරන්ත පුල්ලිඞ්ගො දණ්ඩී සද්දො.

ඒකවචන.	බහුවචන.
ප...දණ්ඩී	දණ්ඩී, දණ්ඩිනො
ආ...(හෙ)දණ්ඩී	(භව:)දණ්ඩී, දණ්ඩිනො
දු...දණ්ඩිනං, දණ්ඩිං	දණ්ඩී, දණ්ඩිනො,[දණ්ඩිනෙ]
ත...දණ්ඩිනා	දණ්ඩීහි, දණ්ඩීභි
ක...දණ්ඩිනා	දණ්ඩීහි, දණ්ඩීභි
ච...දණ්ඩිනො, දණ්ඩිස්ස	දණ්ඩීනං
පං...දණ්ඩිනා, දණ්ඩිම්හා, දණ්ඩිස්මා	දණ්ඩීහි, දණ්ඩීභි
ඡ...දණ්ඩිනො, දණ්ඩිස්ස	දණ්ඩීනං
ස...දණ්ඩිනි, දණ්ඩිම්හි, දණ්ඩිස්මිං[දණ්ඩිනෙ]	දණ්ඩීසු, [දණ්ඩිනාසු.]

ධම්මී සංඝී ඤාණී හත්ථී චක්කී පක්ඛී දායී රථී,
ඡත්තී මාලී වම්මී යොගී භාගී භොගී කාමී සාමී.
ධජී ගණී සසී ඤාතී ජටී යානී සුඛී සිඛී,
දන්තී මන්තී කරී චාගී කුසලී මුසලී බලී.
පාපකාරී සත්තුඝාතී මාලාකාරී දීඝජීවී,
ධම්මවාදී සීහනාදී භූමිසායී සීඝයායී.

ඉච්චාදයො දණ්ඩී සද්දසමා.

"තොමරී හලී සුඛී මෙධී නාථී අත්ථී චාරී පාණී යසස්සී වච්ඡදස්සී"
ඉච්චාදයොපි.

දණ්ඩී ශබ්දයාගේ "දණ්ඩිනං" යන ද්විතීයා ඒකවචනයද—"දණ්ඩිම්හා දණ්ඩිස්මා" යන පඤ්චම්‍යෙකවචනයන්ද "දණ්ඩිනි" යන සප්තම්‍යෙකවචනයද මූලනිරුක්තියෙහි නොදක්වන ලදී.

"එවං ජරා ච මච්චු ච අධිවත්තන්ති * පාණිනෙ" යනුද—"වච්ඡදස්සිනෙ පස්සති" යනාදියද දක්නාලද හෙයින් ද්විතීයා බහුවචනස්ථානයෙහි "දණ්ඩිනෙ" යනානක්ද "උපහච්ච මානං මෙජ්ඣං මාතඞ්ගස්මිං යසස්සිනෙ" යනුද "වච්ඡදස්සිනෙ පත්ථිතං" යනුද දක්නාලදහෙයින් සප්තමී ඒකවචනස්ථානයෙහි "දණ්ඩිනෙ" කියාද "සුසුඛං වත ජීවාම වෙරිනෙසු අවෙරිනො" යනාදිය දක්නා ලදබැවින් සප්තමී

* "අධිවත්තන්ති පාණිනො" කියාද පබ්බතොපම සූත්‍රාදියෙහි ව්‍යවහාරයි.

බහුවචනස්ථානයෙහි "දණ්ඩිනො" යනුද යෙදියයුතු බවහා ගාමණී, සෙනානී, යනාදි ශබ්ද හැර සෙසු ඊකාරාන්ත පුල්ලිඞ්ග ශබ්දයන්ටද මෙම ක්‍රමය යෙදිය යුතුබව ශබ්දනීතියෙහි කියන ලදී.

තවද දණ්ඩී ශබ්දය මෙන් රූපමාලා කටයුත්තේ හෙවත් වරනැඟිය යුත්තේ "අස්සත්ථි තද්ධිතයෙහි ඊ ප්‍රත්‍යය වනලද්දාවූ ශබ්දයි—එනම් දණ්ඩ ශබ්දයෙන් පරව (එය ඔහුට ඇත්තේනුයි යනාර්ථයෙහි දණ්ඩො අස්ස අත්ථි යන වාක්‍යයෙහි) ඊ ප්‍රත්‍යයව දණ්ඩී ශබ්දය සිද්ධ වූවාක් මෙන්ම ධම්මො අස්ස අත්ථි ධම්මී, සංඝො අස්ස අත්ථි සංඝී, ඤාණං අස්ස අත්ථි ඤාණී, හත්ථානි අස්ස අත්ථි හත්ථී, චක්කං අස්ස අත්ථි චක්කී, පක්ඛං අස්ස අත්ථි පක්ඛී, දාඨං අස්ස අත්ථි දාඨී, රථං අස්ස අත්ථි රථී, යනාදි වශයෙන් විග්‍රහ කරණු ලබන්නාවූ ඊප්‍රත්‍යයාන්ත ශබ්දයෝයි.

NOUNS ENDING IN උ. (U) MAS. *Bhikkhu.*

9. උකාරාන්ත පුල්ලිඞ්ගො භික්ඛු සද්දො.

එකවචන.	බහුවචන.
ප භික්ඛු	භික්ඛවො, භික්ඛූ
ආ...(හෙ)භික්ඛු	(භව:)භික්ඛවෙ, භික්ඛවො, භික්ඛූ
දු..භික්ඛුං	භික්ඛවො, භික්ඛූ
ත..භික්ඛුනා	භික්ඛූභි, භික්ඛූහි
ක...භික්ඛුනා	භික්ඛූභි, භික්ඛූහි
ච...භික්ඛුනො, භික්ඛුස්ස	භික්ඛූනං
පං...භික්ඛුනා, භික්ඛුම්හා, භික්ඛුස්මා	භික්ඛූභි, භික්ඛූහි
ඡ...භික්ඛුනො, භික්ඛුස්ස	භික්ඛූනං
ස...භික්ඛුම්හි, භික්ඛුස්මිං	භික්ඛූසු.

එවං—සෙතු කෙතු රාහු භානු සංකු උච්ඡු වේළු මච්චු සිඞ්ගු බන්ධු නෙරු මෙරු සත්තු කාරු හෙතු ජන්තු භාණු ගරු රුරු පටු බබ්බු ඵඵ බින්දු විණ්හු—ඉච්චාදයො භික්ඛුසද්දසමා.

මේ භික්ඛු ශබ්දයාගේ "භික්ඛවෙ" යන ආලපනෛක වචනය පෙළෙහි හා පුරාණ අටුවාවලද වංසගම්වලමුත් ගාථාවල නැති බවද "භික්ඛවො" යන ප්‍රථමා බහුවචනය ගාථාවලමුත් වංසගම්වල නැත් බවද—එසේම "භික්ඛවෙ" යන ආලපන බහුවචනය ශ්‍රාවකයන් වහන්සේලාවිසින් භික්ෂූන්ට ආමන්ත්‍රණය කිරීමෙහිදී සන්ධිවිශ

යෙහි මුත් අසන්ධිවිශයෙහි නැති බවද—බුදුරජාණන්වහන්සේ විසින් භික්ෂූන්ට ආමන්ත්‍රණය කිරීමෙහිදී සන්ධිවිශයෙහිද අසන්ධිවිශයෙහිද දක්නාලද බවද—“භික්ඛවො” යන ආමන්ත්‍රණ බහුවචනයෙන් බුදුරජාණන් වහන්සේවිසින් භික්ෂූන්ට ආමන්ත්‍රණය කිරීම ගාථාවල දක්නාලද බව හා වාසගම්වලත් සන්ධි විශයෙහි පමණක් දක්නාලද බවද—ශ්‍රාවකයන් වහන්සේලාවිසින් භික්ෂූන්ට ආමන්ත්‍රණය කිරීමෙහිදී “භික්ඛවො” යන ආමන්ත්‍රණ බහුවචනය නොයොදන ලද බවද කියන ලදී.

“එවඤ්ච පන භික්ඛවෙ ඉමං සික්ඛාපදං උද්දිසෙය්‍යාථ” යනාදි තන්හි “භික්ඛවෙ” යන ආලපනෛකවචනය වාසගම්වලම දක්නා ලද්දේය.

“භික්ඛවො ති සතා ඉමෙ, යාවන්ති පඤ්ජලී කතා” යනාදි තන්හි “භික්ඛවො” යන ප්‍රථමා බහුවචනය ගාථාවලම දක්නා ලද්දේය.

“ආයස්මා සාරිපුත්තො භික්ඛූ ආමන්තෙසි ආවුසො භික්ඛවෙති” යනා මේ ආදි තන්හි ශ්‍රාවකයන්වහන්සේලාවිසින් භික්ෂූන්ට ආමන්ත්‍රණය කිරීමෙහිදී සන්ධි විශයෙහිම භික්ඛවෙ යන ආමන්ත්‍රණෛකවචනය දක්නා ලද්දේය.

“භික්ඛූ ආමන්තෙසි සොතු කාමත්ථ භික්ඛවෙති” යනාදිතන්හි හා—“ඉධ භික්ඛවෙ භික්ඛූ අනුප්පන්නානං පාපකානං අකුසලානං ධම්මානං පහානාය” යනාදි තන්හි බුදුරජාණන්වහන්සේ විසින් භික්ෂූන්ට ආමන්ත්‍රණය කිරීමෙහිදී සන්ධිවිශයෙහි හා අසන්ධිවිශයෙහිද “භික්ඛවෙ” යන ආමන්ත්‍රණ බහුවචනය දක්නා ලද්දේය.

“අරඤ්ඤෙ රුක්ඛමූලෙ වා සුඤ්ඤාගාරෙව භික්ඛවො” යනාදියෙහි හා “තත්‍ර ඛො භගවා භික්ඛූ ආමන්තෙසි භික්ඛවොති” යනාදි තන්හි බුදුරජාණන්වහන්සේවිසින් භික්ෂූන්ට ආමන්ත්‍රණය කිරීමෙහිදී ගථාවල හා වාසගම්වල සන්ධි විශයෙහිද “භික්ඛවො” යන ආමන්ත්‍රණ බහුවචනය දක්නා ලද්දේය.

මේ සඳහා ශබ්දනීතියෙහි.

“චුණ්ණියෙව පදෙ දිස්සං භික්ඛවොති පදං විධා
යතො පවත්තන්ති සන්ධි විසයා විසයෙසු තං.
භික්ඛවො ති පදං දිස්සං ගාථායං චෙව චුණ්ණියෙ
පදස්මිංපිච සන්ධිස්ස විසයෙවාපි නිද්දිසෙ”—යනුු කියන ලදී.

හෙතු, ජන්තු, ගරු යන ශබ්දයන්ද භික්ඛු ශබ්දය මෙන් වර නැගිය යුතු ශබ්ද පන්තියෙහිම දක්වන ලද්දේ නමුදු ප්‍රථමා විභක්ති දෙකෙහි සමහර රූප වෙනස්ය—ඒනම්-හෙතු; හෙතූ, හෙතවො,

හෙතුනො, හෙතුයො, යි ප්‍රථමා විභක්තීයද—හෙතුං; හෙතූ, හෙතුනො, හෙතුයො, යි ද්විතීයා විභක්තියද වේ—"යාගුයා" යන ස්ත්‍රී ලිඞ්ග රූපය හා සදෘශවූ "හෙතුයා" යන රූපයක්ද සප්තමී විභක්තියෙහි දක්නාලද බවද- එසේම ස්ත්‍රීලිඞ්ග රූපවලට සමාන වූ සමහර පුල්ලිඞ්ග රූපයන් පාළියෙහි දක්නාලද බවද කියන ලද්දේය—ඒනම්-"උණ්හි කතෙත තරමානො" යනාදියෙහි හා "එහි බාලෙ ඛමාපෙහි කුසරාජං මහබ්බලං" යනාදියෙහි "කතෙත" "බාලෙ" යනාදිය හා අධිපතියා, හෙතුයා, පෙතයා, යනාදියයි.

ජන්තු ශබ්දයෙහි භික්ඛු ශබ්දයට වෙනස් රූප මෙහි දක්වනු ලබන ජන්තු ශබ්දයාගේ පදමාලාවෙන් දත යුතුයි.

NOUNS ENDING IN උ. (U.) MAS. *Jantu.*

10. උකාරන්ත පුල්ලිඞ්ගො ජන්තු සද්දො.

එකවචන.		බහුවචන.
ප..ජන්තු		ජන්තූ, ජන්තවො, ජන්තුනො, ජන්තුයො
ආ...(හෙ)ජන්තු	(භවා:)	ජන්තූ, ජන්තවෙ, ජන්තවෙං, ජන්තුනො, ජන්තුයො
ද්වි...ජන්තුං		ජන්තූ, ජන්තවො, ජන්තුනො, ජන්තුයො
ත...ජන්තුනා		ජන්තූභි, ජන්තූහි
ක...ජන්තුනා		ජන්තූභි, ජන්තූහි
ච...ජන්තුනො, ජන්තුස්ස		ජන්තූනං
පං...ජන්තුනා, ජන්තුම්හා, ජන්තුස්මා		ජන්තූභි, ජන්තූහි,
ඡ...ජන්තුනො, ජන්තුස්ස		ජන්තූනං
ස...ජන්තුම්හි, ජන්තුස්මිං		ජන්තූසු, ජන්තූසු.

ගරු ශබ්දයද.

ගරු; ගරූ, ගරවො, ගරුනො-(හෙ) ගරු; (භවන්තො) ගරූ, ගරවො, ගරුනො-ගරුං; ගරූ, ගරවො, ගරුනො-කියා වේ—සෙස්ස භික්ඛු ශබ්දයෙහි මෙනි.

සමහර ආචාර්‍ය්‍යවරයෝ වනාහි මාගධ භාෂාවෙහි ගරු ශබ්දය හා ගුරු ශබ්දයක්ද ඇතිබවද ගරුශබ්දය භාර (නොහැකිල්ල) වාචීයයිද, ගුරු ශබ්දය ආචාර්‍ය්‍යවාචීයයිද කියත්—ශබ්දනීතිකාරකා

රසාංචාය්‍ය්‍යීතෙම මාගධභාෂාවෙහි ගුරුශබ්දයක් නැතිබව හංසපෝත්ත අජීවයෙහිම "ගරු" ශබ්දය පවත්නාබව කියති—සංස්කෘත භාෂාවෙහි ගරුශබ්දයක් ඇතිහෙයින් ඒ ශබ්දයෙන් තද්ධිතප්‍රත්‍යය වීමෙන් සිද්ධවූ "ගාරව" ශබ්දයක්ද දක්නා ලද්දැත් මෙන්ම ඉදින් ගුරුශබ්දයක්ද ඇත්තේනම් එයින්ද තද්ධිත ප්‍රත්‍යය වීමෙන් සිද්ධවූ "ගොරව" ශබ්දයක්ද විය යුතු නමුදු එබඳු ශබ්දයක් පාළියෙහි නො දක්නාලදබවද—සංස්කෘත භාෂාවෙහි ගුරුශබ්දයක් ඇතිහෙයින් ඒ ශබ්දයෙන් තද්ධිතප්‍රත්‍යයව සිද්ධවූ "ගෞරව" ශබ්දයකුදු එම භාෂාවෙහි ඇතිබවද කියනලදී.

NOUNS ENDING IN උ. (U.) MAS. *Satthu.*

11. උකාරන්ත පුල්ලිඞ්ගො සත්ථුසද්දො.

එකවචන.	බහුවචන.
ප... සත්ථා	[සත්ථා] සත්ථාරො
ආ... (හෙ) සත්ථ, සත්ථා	(භව:) සත්ථාරො
දු... සත්ථාරං	සත්ථාරෙ, සත්ථාරො
ත... සත්ථාරා [සත්ථුනා]	සත්ථාරෙහි, සත්ථාරෙභි
ක... සත්ථාරා, [සත්ථුනා]	සත්ථාරෙහි, සත්ථාරෙභි
ච... සත්ථු, සත්ථුනො, සත්ථුස්ස	සත්ථාරානං, සත්ථානං, [සත්ථූනං]
ප... සත්ථාරා	සත්ථාරෙහි, සත්ථාරෙභි
ඡ... සත්ථු, සත්ථුනො, සත්ථුස්ස	සත්ථාරානං, සත්ථානං, [සත්ථූනං]
ස... සත්ථරි	සත්ථාරෙසු

"වත්තා ධාතා ගන්තා නෙතා දාතා කත්තා චෙතා තාතා,
ඡෙත්තා භෙත්තා හන්තා ජෙතා භාතා බොද්ධා සුතා සොතා.
ගජ්ජිතා වස්සිතා හන්තා පුච්ඡිතා පටිසෙධිතා,
භාසිතා බුජ්ඣිතා බන්තා උඨාතො [1] කක්කමිතා (තථා.)
ඤාතා පඤ්ඤාතා අක්ඛාතා සහිතා පටිසෙඛිතා,
ඛන්තා [2] පණෙතා (ඉච්චාදි වත්තාතෙ සුද්ධකත්තරි.)
උප්පාදෙතා විඤ්ඤාපෙතා සන්දස්සෙතා පබ්‍රූහෙතා,
බොධෙතා (දි චණෙඤ්ඤ සද්දා ඤෙය්‍යා හෙතුසම්ං අත්ථසම්ං)
සක්කමන්ධාතු මහාමන්ධාතු ඉච්චාදයොපි සත්ථුසද්දෙව."

මේ සත්ථු ශබ්දයාගේ ප්‍රථමාබහුවචනස්ථානයෙහි "සත්ථා"යන පදය කච්චායන රූපසිද්ධි බාලාවතාරාදීයෙහි නොකියන ලද්දේ නමුදු ශබ්දනීතියෙහි කියනලද්දේය. "අවිතක්කිතා මච්චු මුපගච්ඡන්ති" යන පාලියෙහි (සත්ථා යන්නට සමානවූ) "අවිතක්කිතා" යන ප්‍රථමා බහුවචනයක් දක්නාලදබැවිනි—වත්තා ධාතා යනාදියද තද්ගතික බැවින් එසේමය. "සත්ථුනා" යනුද බාලාවතාරාදියෙහි නොදක්වනලද්දේය. "ධම්මරාජෙන සත්ථුනා" යනාදියෙහි එබඳු පද දක්නා ලදහෙයින් ශබ්දනීතියෙහි දක්වනලද්දේය.

"සත්ථාරෙ" යන විත්‍යා බහුවචනය නිරුත්ති පිටකයෙහි නො දක්වන ලද්දේය-චූලනිරුත්ති ශබ්දනීති දෙක්හි දක්වන ලද්දේය. "භාතරෙ අතික්කමන්ති" යනාදියෙහි එබඳු පද දක්නාලදහෙයිනි- "සත්ථුස්ස, සත්ථානං" යන චතුර්ථී ෂෂ්ඨී එකවචන බහුවචනවය චූළනිරුත්ති ශබ්දනීති දෙක්හි නොදක්වන ලද්දේය-තවද "හෙ සත්ථ, සත්ථා" යි හ්‍රස්ව දීර්ඝ වශයෙන් ආලපනඑකවචන දෙකක් කච්චායන බාලාවතාරාදියෙහි දක්වනලද නමුදු නිරුත්තිපිටයෙහි හ්‍රස්ව වශයෙන් පමණක්ය-චූලනිරුත්තියෙහි එකවචනය හ්‍රස්ව වශයෙන්ද බහුවචනය දීර්ඝවශයෙන්ද දක්වන ලද්දේය.
"සත්ථූනං" යන චතුර්ථී ෂෂ්ඨී බහුවචනය බාලාවතාරාදියෙහි නො කියනලද්දේ නමුත් "ඉමෙසං මහානාම තිණ්ණං සත්ථූනං එකා නිට්ඨා උදාහු පුථු නිට්ඨා" යනාදිය දක්නා ලදහෙයින් අග්ගවංසාචාර්යයන් විසින්ද දක්වනලදී.

තවද ඤාතු ඛත්තු නෙත්තු භත්තු පිතු භාතු යනාමේ ශබ්දයො සත්ථුශබ්දයා හා සමාන වූවද රූපාන්තරවශයෙන් කිසි වෙන සක් ඇත්තේය—ඒනම්-"උණ්හි කත්තෙත අතරමානො ගන්ත්වා වෙස්සන්තරං වද" යන මෙහි "කත්තෙත" යන ආලපනඑකවචනයක් දක්නාලදහෙයින් එයද සත්ථු ශබ්දයෙහි රූපවලට වෙනස් රූපයක්ය—"තෙන හි භො ඛත්තෙත යෙන චම්පෙය්‍යකා බ්‍රාහ්මණ ගහපතිකා තෙනුපසංකම" යන මෙහි දක්නාලද "ඛත්තෙත" යනුද එසේමය—"නෙත්තෙත උජ්ජුගතෙ සති" යනාදියෙහි පෙනෙනා සප්තමී එකවචන රූපයද "සත්ථරි" යන්නට වෙනස් රූපයක්ය- "ආරාධයන්ති රාජානං පූජං ලභන්ති භත්තුසු" යන මෙහි පෙනෙන "භත්තුසු" යනුද "සත්ථාරෙසු" යන සප්තමී එකවචනයට වෙනස්රූපයක්ය—මෙහි "භත්තුසු" යනුද "මාතාපිතුසු පණ්ඩිතා" යනාදි යෙහි "පිතුසු" යනුද දක්නා ලදහෙයින් වත්තුසු, ධාතුසු, ගන්තුසු, නෙත්තුසු, ඤාතුසු, කත්තුසු, යනාමේ ආදියද ගත්‍යුතුබව හා

මෙම ක්‍රමය සත්ථු ශබ්දයෙහිද කැමති වියයුතුවාත් මෙන් හැගෙන බවද ශබ්ද නීතියෙහි කියනලදී.

NOUNS ENDING IN උ. (U) MAS. *Nattu.*

12. උකාරන්ත පුල්ලිංග නත්තුසද්දෙ.

එකවචන.	බහුවචන.
ප...නත්තා	නත්තාරෝ
අ...(හෙ)නත්ත, නත්තා	(භවː) නත්තාරෝ
දු...නත්තාරං	නත්තාරෙ, නත්තාරෝ
ත...නත්තාරා	නත්තාරෙභි, නත්තාරෙහි
ක...නත්තාරා	නත්තාරෙභි, නත්තාරෙහි
ච...නත්තු, නත්තුනො, නත්තුස්ස	නත්තාරානං, නත්තානං, [නත්තූනං]
ප...නත්තාරා	නත්තාරෙභි, නත්තාරෙහි
ඡ...නත්තු, නත්තුනො, නත්තුස්ස	නත්තාරානං, නත්තානං [නත්තූනං]
ස...නත්තරි	නත්තාරෙසු, නත්තුසු

NOUNS ENDING IN උ. (U) MAS. *Pitu.*

13 උකාරන්ත පුල්ලිංගො පිතු සද්දෙ.

එකවචන.	බහුවචන.
ප...පිතා	[පිතා] පිතරො
අ...(හෙ)පිත, පිතා,	(භවː) පිතරො
දු...පිතරං	පිතරෙ, පිතරො
ත...පිතරා, පිතුනා,[පෙත්‍යා]	පිතරෙභි, පිතරෙහි, පිතූභි, පිතූහි
ක...පිතරා, පිතුනා,[පෙත්‍යා]	පිතරෙභි, පිතරෙහි, පිතූභි, පිතූහි
ච...පිතු, පිතුනො, පිතුස්ස	පිතරානං, පිතානං, පිතූනං
ප...පිතරා [පෙත්‍යා]	පිතරෙභි, පිතරෙහි. පිතූභි, පිතූහි
ඡ...පිතු, පිතුනො, පිතුස්ස	පිතරානං, පිතානං, පිතූනං
ස...පිතරි	පිතරෙසු, පිතූසු

"පෙත්‍ය" "පිතූනං" යන රූපයන්ට සමානවූ රූප නැතිනමුදු භාතු, ජාමාතු ශබ්දයන්ද මෙසේමය—පෙත්‍ය, පිතූභි, පිතූහි, යන පද හා, පිතරෙ යනාදියෙහි හ්‍රස්වබවද පිතුශබ්දයාගේ සන්ධිශබ්ද යට වෙනස් බවයි—"මත්‍යං ච පෙත්‍යං ච කාතං සුඛාවහං" යනාදිය දක්නා ලදහෙයින් "පෙත්‍ය" යනු තෘතීයාදියෙහි දක්වනලදී. "පෙත්‍ය" යනමෙම පදයද ජන්තුයො, හෙතුයො, හෙතුයා, අධිපතියා, යනා පදයන් මෙන් අවිනත්‍යවූ පුල්ලිඟු රූපයක් බව කියනලද්— තවද නිද්දෙස පාලියෙහි "සත්ථාරතො සත්ථාරං ගච්ඡති" යන් තෙහිද, විනයඨකථාදියෙහි "හෙතු සත්ථාර දස්සනං" "සාතතාරනි ද්දෙසො" "අයං ජිම්මාතාපිතරෙ ඉමස්මිං පහරෙ දණ්ඩො නත්ථි" යන් තෙහිද උම්මග්ගජාතක අටුවාවෙහි "පිතරෙ නිසාකොත් අජ්ඣතානි කො එකාපිතරෙ" යන්තෙහිද චුල්ලවග්ගපාළියෙහි "අසස්මිණී අස සාසධීතරෙ" යන්තෙහිද මේආදී තැන්වල අසමාස විශයෙහි තො ප්‍රත්‍යයා පරකල්හිද, සමාස විශයෙහි උත්තරපදයා පරකල්හිද, සමාසයාගේ උත්තර පදයෙහි වූ සඞදින් පරකල්හිද "ආර" යනාදෙශව බවූසී පදයන්ද දක්නාලදී.

NOUNS ENDING IN උ. (U) MAS. *Bhátu.*

14. උකාරනන්ත පුල්ලිඟො භාතුසද්දෙ.

එකවචන.	බහුවචන.
ප...භාතා	[භාතා] භාතරො
අ...(හෙ)භාත, භාතා	(භව:) භාතරො
දු...භාතරං	භාතරෙ, භාතරො
ත...භාතරා	භාතරෙභි, භාතරෙහි, භාතූභි, භාතූහි
ක...භාතරා	භාතරෙභි, භාතරෙහි, භාතූභි, භාතූහි
ච...භාතු, භාතුනො, භාතුස්ස	භාතරානං, භාතානං, භාතූනං
ප...භාතරා	භාතරෙභි, භාතරෙහි, භාතූභි, භාතූහි
ඡ..භාතු, භාතුනො, භාතුස්ස	භාතරානං, භාතානං, භාතූනං
ස...භාතරි	භාතරෙසු, භාතූසු

NOUNS ENDING IN ඌ. (U′) MAS. *Abibhu.*

15 ඌකාරන්තො පුල්ලිඞ්ගො අභිභූසද්දො.

එකවචන.		බහුවචන.
ප...අභිභූ		අභිභුවො, අභිභූ
ආ...(හෙ)අභිභූ	(භව:)	අභිභුවො, අභිභූ
දු...අභිභුං		අභිභුවො, අභිභූ
ත...අභිභුනා		අභිභූහි, අභිභූභි
ක...අභිභුනා		අභිභූහි, අභූභි
ච...අභිභුනො, අභිභුස්ස		අභිභූනං,
ප...අභිභුනා, අභිභුම්හා, අභිභුස්මා		අභිභූහි, අභිභූභි
ඡ...අභිභුනො, අභිභුස්ස		අභිභූනං
ස...අභිභුම්හි, අභිභුස්මිං		අභිභූසු

එවං * සයම්භූ වෙස්සභූ සහභූ ගොත්‍රභූ විතතභූ සබ්බාභිභූ අධිභූ පරාභිභූ පභූ විභූ ඉච්චාදයොපි.

NOUNS ENDING IN ඌ. (U′) MAS. *Sabbanñú.*

16 ඌකාරන්තො පුල්ලිඞ්ගො සබ්බඤ්ඤූසද්දො.

එකවචන.		බහුවචන.
ප...සබ්බඤ්ඤූ		සබ්බඤ්ඤුනො, සබ්බඤ්ඤූ
ආ...(හෙ)සබ්බඤ්ඤු	(භව:)	සබ්බඤ්ඤුනො, සබ්බඤ්ඤූ
දු...සබ්බඤ්ඤුං		සබ්බඤ්ඤුනො, සබ්බඤ්ඤූ
ත...සබ්බඤ්ඤුනා		සබ්බඤ්ඤූහි, සබ්බඤ්ඤූභි
ක...සබ්බඤ්ඤුනා		සබ්බඤ්ඤූහි, සබ්බඤ්ඤූභි
ච...සබ්බඤ්ඤුනො, සබ්බඤ්ඤුස්ස		සබ්බඤ්ඤූනං
ප...සබ්බඤ්ඤුනා, සබ්බඤ්ඤුම්හා, සබ්බඤ්ඤුස්මා		සබ්බඤ්ඤූහි, සබ්බඤ්ඤූභි
ඡ...සබ්බඤ්ඤුනො, සබ්බඤ්ඤුස්ස		සබ්බඤ්ඤූනං
ස...සබ්බඤ්ඤුම්හි, සබ්බඤ්ඤුස්මිං		සබ්බඤ්ඤූසු

"එවං විදූ විඤ්ඤූ කතඤ්ඤූ මග්ගඤ්ඤූ ධම්මඤ්ඤූ අකතඤ්ඤූ අත්තඤ්ඤූ කාලඤ්ඤූ රත්තඤ්ඤූ මත්තඤ්ඤූ වෙදගූ පාරගූ ඉච්චාදයොපි."

---

* "සයම්භු ඤාණං, ගොත්‍රභු චිත්තං" යනාදීන්හි වූ සයම්භු ගොත්‍රභු යනාදී ශබ්ද නපුංසක ලිඞ්ගය. එහෙයින් සයම්භු සයම්භූ සයම්භූනි යනාදිවශයෙන් ආයු ශබ්දය මෙන් වරනැගිය යුතුයි.

විද්දූ, විඤ්ඤූ ශබ්දාදිය ස්ත්‍රීලිඞ්ගිකාවත්‍ව ලබනකල "ඉනී" ප්‍රත්‍යය වී මෙන් "විද්දූනී" කියා වේ. නදී ශබ්දය මෙන් විද්දූනී; විද්දූනී, විද්දූනියො, යනාදිවශයෙන් වරනැගියයුතුයි. එසේද වුවත් "විඤ්ඤූ පටිබලා සුභාසිතදුබ්භාසිතං දුල්ලභාදුල්ලභා ආජානිතුං" යන්හෙහි විඤ්ඤූ යනු ස්ත්‍රීලිඞ්ගිකාව දක්නාලදහ–"කොධනා අකතඤ්ඤූ ච පිසුනා ච විභෙදිකා" යන්හෙහි "අකතඤ්ඤූ" යනුද එසේමය— එහෙයින් එබඳුවූ පද–අකතඤ්ඤූ; අකතඤ්ඤූ, අකතඤ්ඤුයො— යනාදිවශයෙන් ජම්බු ශබ්දය මෙන් වරනැගියයුතුයි. අත්ථඤ්ඤූ ධම්මඤ්ඤූ යනාදියද එසේමැයි.

NOUNS ENDING IN ඔ. (O) MAS. *Gó.*

17 ඔකාරන්ත පුල්ලිඞ්ගො ගො සද්දො.

එකවචන.	බහුවචන.
ප ..ගො	ගාවො, [ගවො]
ආ...(හෙ) ගො	(භව:) ගාවො, [ගවො]
දු.. ගාවුං, ගාවං, ගවං	ගාවො, [ගවො]
ත. .ගාවෙන, ගවෙන	ගොහි, ගොභි
ක...ගාවෙන, ගවෙන	ගොහි, ගොභි
ච...ගාවස්ස, ගවස්ස	ගවං, ගුන්නං, ගොනං
ප...ගාවා, ගවා, ගාවම්හා, ගවම්හා, ගාවස්මා, ගවස්මා	ගොහි, ගොභි
ඡ...ගාවස්ස, ගවස්ස	ගවං, ගුන්නං, ගොනං
ස...ගාවෙ, ගවෙ. ගාවම්හි, ගවම්හි, ගාවස්මිං, ගවස්මිං	ගාවෙසු, ගවෙසු, ගොසු

ගො ශබ්දය ගැණ දක්වියයුතු විස්තර ස්ත්‍රීලිඞ්ගික ගොශබ්දයෙහිදී දක්වනුලැබේ.

අනාවූ සමහර පුල්ලිඞ්ගිකශබ්දයන් ගැණ දතයුතු විභාගයක් පූර්වාචාර්ය මතානුකූලව මෙහි දක්වනු ලැබේ—කෙසේද,

ඊකාරන්තපුල්ලිඞ්ගික "බ්‍රහ්මචාරී" ශබ්දය දණ්ඩී ශබ්දය මෙන් වරනැගියයුතුබව ආචාර්යවරයන්විසින් දක්වනලදහෙයින් "බ්‍රහ්මචාරී,

බ්‍රහ්මචාරී, බ්‍රහ්මචාරිනො" යනාදි (දණ්ඩීශබ්දයෙහි මෙන්) රූප වෙත්- එසේ නමුදු මහාවග්ගාදියෙහිවූ "සඤ්ඤතා බ්‍රහ්මචාරයො" "අපචෙ බ්‍රහ්මචාරයො" යනාදියෙහි "බ්‍රහ්මචාරයො" යන්නත් දක්නාලද හෙයින් මේ ආදිය ආධුනිකයන්ගේ ඥාණචක්ෂුර්විමෝහන ස්ථාන බැවින් ඒ ගැණ මෙසේ දතයුතුයි.

බ්‍රහ්මචාරීශබ්දය ඊකාරාන්ත වශයෙන් පමණක් නොව ඉකාරාන්ත වශයෙනුදු කල්පනාකටයුතුය-ඉකාරාන්ත ඊකාරාන්තයන ද්විප්‍රකාරයකට වන්නේ කෙසේද යත්—මුනිශබ්දය ඉකාරාන්තපුල්ලිංගිකය-"මුනාතීති මුනි" යනු විග්‍රහයි-මුන (ඥානෙ) යන ධාතුවෙන් පරව "මුනාදීහිචි" යන සූත්‍රයෙන් කර්තෘයෙහි ඉප්‍රත්‍යයව සිද්ධවේ—මෙසේ සිද්ධවූ මුනි ශබ්දයාගේ ප්‍රථම බහුවචනයෙහි "මුනයො" කියාවේ—එසේම "බ්‍රහ්මං චරතීති බ්‍රහ්මචාරී"යි විග්‍රහ බැවින් බ්‍රහ්ම ශබ්දය උපපද කොට ඇති චර (ගත්‍යං) යන ධාතුවෙන් පරව යථොක්ත සූත්‍රයෙන් කර්තෘයෙහි ඉප්‍රත්‍යයව සිද්ධවූ කල ඉකාරාන්ත පුල්ලිංගිකවිය හැකිහෙයින් ප්‍රථමා බහුවචනාදියෙහි "බ්‍රහ්මචාරයො" යනු විය හැකිය—ඊකාරාන්ත වන්නේ කෙසේද යත්—"බ්‍රහ්මං චරණසීලො බ්‍රහ්මචාරී" යි විග්‍රහබැවින් බ්‍රහ්මශබ්දය උපපද කොට ඇති චර (ගතියං) යන ධාතුවෙන් පරව තස්සීලාර්ථයෙහි "තස්සීලාදීසු ණීත්වාවී ච" යන සූත්‍රයෙන් ණී ප්‍රත්‍යයව සිද්ධවූ කල ඊකාරාන්ත විය හැකිය—එකල ඊකාරාන්ත දණ්ඩී ශබ්දයාගේ රූපමෙන් ප්‍රථම බහුවචනාදියෙහි "බ්‍රහ්මචාරිනො"යි විය හැක්කේය—මෙසේ ඉකාරාන්තවශයෙන් ගත්කල අග්ගි,මුනි යන ශබ්දයන් මෙන් බ්‍රහ්මචාරි; බ්‍රහ්මචාරී, බ්‍රහ්මචාරයො" යනාදි ක්‍රමයට වරනැගිය යුතුය—ඊකාරාන්තවශයෙන් ගත්කල දණ්ඩී ශබ්දය මෙන් බ්‍රහ්මචාරී; බ්‍රහ්මචාරී, බ්‍රහ්මචාරිනො, යනාදික්‍රමයට වරනැගිය යුතුයි.

තවද "යති" ශබ්දය අග්ගිශබ්දය මෙන් වරනැගියයුතුබව ආචාර්‍ය්‍යවරයො කියත්. එසේකල විසුද්ධිමාර්ගයෙහි "යථා සොභන්ති යතිනො සීලභූසණභූසිතා" යන්නෙහි යතිනො යනු කෙසේ වියහැකිද? "යතයො" කියයුතු තන්හි "යතිනො" යනු ප්‍රමාද ලියවිල්ලකැයි සමහරෙක් කියති—ප්‍රමාදලියවිල්ලක් නොව යතිනො කියාම බව අග්ගවංසාචාර්‍ය්‍යමතයයි—"යතන්ත්සීලෙනාති යතී" කියා විග්‍රහකාරණලබනාවූද, යත (පයතනෙ) යන ධාතුවෙන් පරව තස්සීලාර්ථයෙහි තස්සීලාදී සූත්‍රයෙන් ණීප්‍රත්‍යයව සිද්ධවූද ඊකාරාන්ත යතී ශබ්දය දණ්ඩීශබ්දය මෙන් වරනැගෙන හෙයින් ප්‍රථමාබහුවචනාදියෙහි "යතිනො" කියාද—තස්සීලාර්ථය නොගෙණ එම ධාතුවෙන් පරව

කත්තෘයෙහි ඉප්‍රත්‍යයව සිඛවනු ලබන්නාවූ (යතති විරියං කරෙතීති යති යි විග්‍රහ කටයුතුවූ) ඉකාරාන්ත යතිශබ්දය අග්ගි ශබ්දය මෙන් වරනැගෙන හෙයින් ප්‍රථමාබහුවචනාදියෙහි "යතයො" කියාද විය හැකියයි දතයුතුයි.

එසේනම් සාරමතී, සම්මාදිඨී, වජිරබුඩි, යනාදි ශබ්දයන්හි සාරමතිනො.සම්මාදිඨීනො, වජිරබුඩිනො, යනාදි ප්‍රථමා ආලපන බහුවචන රූපයන් කෙසේදයත්, මේ ශබ්දයො කෙවලව ඉකාරාන්තනමුදු සමාස පදබැවින් අග්ගිශබ්දයාගේ ක්‍රමයෙහි නොසිට දණ්ඩිශබ්දයාගේ ක්‍රමයෙහි සිටිබැවින් "අසාරෙ සාරමතිනො" යනාදි තැන්වල "සාරමතිනො"යි නොකාරාන්ත රූපම වනබව කියන ලදී—ඉදින් නොකාරාන්ත රූපම වෙත්නම්, කච්චායනයෙහි කිතක ප්‍රාරම්භයෙහි "අත්‍ථෙ විසාරදමතයො" යන මෙහි "විසාරදමතයො"යි නොවියයුතු නොවේද? එහි "විසාරදමතයො" යි වියයුතුනම් සාරමතයො- සම්මාදිඨයො— වජිරබුඩයො-- යනුත් එසේම නොවේද යත්—"විසාරදමතයො" යන රූපයට සමානවූ රූප ඉකාරාන්ත පුල්ලිඞ්ගිකසමාසපදයන් පිළිබඳව බුඩවචනයෙහි නැතිබැවින් "සම්මාදිඨයො" යනාදි රූප එසේ නොවියයුතුයි— "විසාරදමතයො" යනුහා සදෘශවූ "යො" කාරාන්ත රූප ඉකාරාන්ත පුල්ලිඞ්ගික සමාස පදයන් පිළිබඳව නැතිනම් "තෙ හොන්ති ජානිපතයො අඤ්ඤමඤ්ඤපියංවදා"-"පඤ්චිමෙ ගහපතයො" යනාදි තන්හි දක්නාලද"ජානිපතයො" යනාදි පද කුමක් කටයුතුද? "ජානිපතයො" යනාදිය බුඩවචනයෙහි තිබියදී "විසාරදමතයො යනු හා සමානවූ ඉකාරාන්තපුල්ලිඞ්ගික සමාසපදයන් පිළිබඳව යොකාරාන්තරූප බුඩවචනයෙහි නැත" යනු කිම කෙසේ යෙදේද යත්–"ගහපතයො, ජානිපතයො" යනාදියෙහි ප්‍රකෘතිපදවූ ගහපති ජානිපති යනාදියෙහි වූ, පතිශබ්දය ස්වභාවෙන්ම පුල්ලිඞ්ගිකය පෙර ස්ත්‍රීලිඞ්ගිකව සිට සමාස වූවායින් පසු පුල්ලිඞ්ගික වූයේ නොවෙයි,එහෙයින් "ගහපතයො" "ජානිපතයො"යි යොකාරාන්ත රූපද "ගහපතිනො ජානිපතිනො" යි නොකාරාන්ත රූපද වෙත්—සාරමති, සම්මාදිඨි, වජිරබුඩි" යනාදි සමාසපදයන්ගේ, මති, දිඨි, බුඩි, යන ශබ්දයො වනාහි සමාස වීමට පූර්වයෙහි ස්ත්‍රීලිඞ්ගිකව සිට සමාස වූවායින් පසු 'බහුබ්බීහි සමාසයාගේ වශයෙන් පුල්ලිඞ්ගික වූවාහුය–එසේහෙයින්, ප්‍රථමා ආලපන විභක්ති ස්ථානයන්හි සාරමතිනො, සම්මාදිඨිනො, වජිරබුඩිනො,යි නොකාරාන්ත රූපම වන්නාහුයයි දතයුතුයි.

තවද අකාරාන්ත පුල්ලිඞ්ගික නාමයන්ගේ එකාරාදෙශ සහිතවූ ප්‍රථමා එකවචන බහුවචන රූපයන්ද ඇත්තාහුය—එනම්—

"වනප්පගුම්බෙ යථා ඵුස්සිතග්ගෙ" යනාදියෙහි, "*වනප්පගුම්බෙ" යනුද "නත්ථි අත්තකාරෙ නත්ථි පුරිසකාරෙ" යනාදියෙහි අත්තකාරෙ-පුරිසකාරෙ-යනුද-"බාලෙ ච පණ්ඩිතෙ ච සන්ධාවිත්වා සංසරිත්වා දුක්ඛස්සන්තං කරිස්සන්ති" යන මෙහි බාලෙ-පණ්ඩිතෙ, යනුද "ව්පදෙ තුල්‍යාධිකරණෙ කම්මධාරයො" යන සූත්‍රයෙහි විපදෙ, තුල්‍යාධිකරණෙ--යනුද † මේආදීයයි.

තාවද බුද්ධවචනයෙහි ශබ්දවශයෙන්ද අර්ථවශයෙන්ද අභිප්‍රාය වශයෙන්ද අක්ෂරචින්තකයන්ගේ ඥානචක්ෂුස විමෝහනය කරන්නාවූ නොයෙක් පාළික්‍රමයන් ඇත්තාහුයයි කියනලදී.

එනම්, "විරත්තා කොංසියායනී" යයි කියයුතු තන්හි "විරත්තො කොසියායනො‡" යි ප්‍රථමා එකවචන දක්නාලද්දැහුය-"කො පුරිසො" කියයුතු තන්හි "කෙ පුරිසෙ" කියාද-"කිංනාමො තෙ උපජ්ඣායො" කිය යුතු තන්හි "කො නාමො තෙ උපජ්ඣායො" කියාද "කිං තෙ බලං මහාරාජ" කිය යුතු තන්හි "කො තෙ බලං මහාරාජ" කියාද-"ඉති හෙමන්ත ගිම්හෙසු" කිය යුතු තන්හි "ඉති හෙමන්ත ගිම්හිසු" කියාද—"න තෙනත්ථං අබන්ධිසො" කිය යුතු තන්හි "න තෙනත්ථං අබන්ධිසු" කියාද පාළියෙහි දක්නාලදහෙයින් මේ ආදිය ශබ්දවශයෙන් මුළාවියයුතු ස්ථානයි.

"යනාන ඛණනදෙවිච අන්ධෙන තමසා කතං" යන මෙහි නකාරය ප්‍රතිෂෙධාර්ථයෙහි නොව උපමාර්ථයෙහි වැටෙනබැවින් කතං යනු හා සම්බන්ධව කරණලද්දක් මෙන් යන අර්ථය ප්‍රකාශ කෙරේ.

"අස්සද්ධො අකතඤ්ඤූ ච සන්ධිච්ඡෙදො ච යො නරො,
හතාවකාසො වන්තාසො ස වෙ උත්තමපොරිසො."

යන මේආදිය අර්ථවශයෙන් මුළාවිය යුතු ස්ථානයි.

---

* "වනප්පගුම්බෙ" යනු ප්‍රථමාර්ථයෙහි සප්තමියයි සමහර කෙනෙකුගේ මතයයි-එය ප්‍රතික්ෂෙප කටයුතුබවට කරුණු අග්ගවංසාචාර්‍ය්‍යයන්විසින් කියනලදී.

† "සුඛෙ දුක්ඛෙ ජීවෙ" යනුද එසේම බව සන්ධි විසොධනයෙහි හා එහි ටීකායෙහිද කියනලදී.

‡ "න ඛං රථ විජානාසි අබ්භරතෙන අනාගතෙ
අබ්භාසිතං විලපසි විරත්තෙ කොසියායනෙ."—රථජාතකයෙහිය.
අටුවාවේ—"විරත්තෙ කොසියායනෙති මාතා නො කොසියායනී
බ්‍රාහ්මණී විරත්තා, අම්හාකං පිතරි නිප්පෙමා ජාතා"-යනුයි.

"තණ්හං අස්මිමානං සස්සතුච්ඡෙදදිට්ඨියො වාදසායතනානිස්සිතං නන්දිරාග ච හන්ත්වා බ්‍රාහ්මණො අනීඝො යාති" යි කියයුතු තන්හි එසේ නොකියා එම අර්ථයම ගෙණ අන්‍යවූ ක්‍රමයකින්

"මාතරං පිතරං හන්ත්වා රාජානො ද්වෙ ච ඛත්තියෙ
රට්ඨං සානුචරං හන්ත්වා අනීඝො යාති බ්‍රාහ්මණො–" යි කියනලදී.

"වනං ඡින්දථ මා රුක්ඛං වනතො ජායතෙ භයං
ඡෙත්වා වනඤ්ච වනථඤ්ච නිබ්බානා හොථ භික්ඛවො"—යනුද
මේ ආදිය අභිප්‍රාය වශයෙන් මූලාවියයුතු ස්ථානයි.

මෙසේ බුද්ධවචනසංඛ්‍යාත පාළියෙහි ශබ්දවශයෙන්ද අර්ථවශයෙන්ද අභිප්‍රායවශයෙන්ද අක්ෂරචින්තකයන්ගේ ඥාණචක්ෂුස විමෝහණය කරන්නාවූ නානාප්‍රකාර පාළික්‍රම ඇත්තාහුයැයි දතයුතුයි.

එහෙයින් කීහ.

"ඤාණාත්‍ථං අපි සද්දසත්ථ මඛිලං මුය්හන්ති පාළිනයාමෙ
යෙහුයෙසන හි ලොකනීති විවිධා පාඨෙන යා විජ්ජරෙ,
පඤ්චවම්පි පහාය බාහිරගතං එතෙසුව තස්මා බුධො
සික්ඛෙය්‍යාමල ධම්මසාගර තරෙ නිබ්බාන තිත්ථූපගො."

පුල්ලිංගික ශබ්ද කාණ්ඩයයි.

NOUNS ENDING IN ආ. (Ā.) FEM. *Kaññá.*

1. ආකාරන්තිත්ථිලිඞ්ගො කඤ්ඤාසද්දො.

එකවචන.	බහුවචන.
ප... කඤ්ඤා	කඤ්ඤා, කඤ්ඤායො
ආ... (හෙ) කඤ්ඤෙ	(භොතී) කඤ්ඤා, කඤ්ඤායො
දු... කඤ්ඤං	කඤ්ඤා, කඤ්ඤායො
ත... කඤ්ඤාය	කඤ්ඤාහි, කඤ්ඤාභි
ක... කඤ්ඤාය	කඤ්ඤාහි, කඤ්ඤාභි
ච... කඤ්ඤාය	කඤ්ඤානං
පං... කඤ්ඤාය	කඤ්ඤාහි, කඤ්ඤාභි
ඡ... කඤ්ඤාය	කඤ්ඤානං
ස... කඤ්ඤායං, කඤ්ඤාය	කඤ්ඤාසු.

සද්ධා මෙධා පඤ්ඤා විජ්ජා චින්තා මන්තා තණ්හා වීණා,
ඉච්ඡා පුච්ඡා එජා මායා මෙත්තා මත්තා සික්ඛා භික්ඛා.
ජංඝා ගීවා ජිව්හා වාචා ජායා ආසා ගඟා නාවා,
ගාථා සෙනා ලෙඛා සාලා මාලා වෙලා පූජා ඛිඩ්ඩා.

පිපාසා වෙදනා සඤ්ඤා චෙතනා තසිනා පජා,
දෙවතා වට්ටකා ගොධා බලාකා පරිසා සභා.,
ඌකා සෙඵාලිකා ලංකා සලාකා වාළිකා සිඛා,
විසාඛා විසිඛා සාඛා වචා වඤ්ඣා ජටා ඝටා.
ජෙට්ඨා සොණ්ඩා විතණ්ඩා(ච) කරුණා වනිතා ලතා,
කථා නිද්දා සුධා රාධා වංසනා සිං සපා පපා.
පභා සීමා ඛමා ඡායා ඛත්තියා සක්ඛරා සුරා,
දොලා තුලා සිලා ලීලා ලාලෙ[1]ලා මෙඛලා කලා.
වළවා [2]ලම්බුසා මූසා මඤ්ජූසා සුලසා දිසා,
නාසා ජුණ්හා ගුහා ඊසා ලසිකා වසුධා පි[illegible]ා.
“අභිජ්ඣා සුණිසා ඛහා භාසා කීළා(ච) කාරණා,
වංලිකා භාවිකා සිකතා කාන්තා ලාඛා කුසා *නිසා.

---

* “නිසා” ශබ්දයාගේ සත්තමී එකවචන කඤ්ඤාශබ්දයෙහි මෙන් “නිසායං, නිසාය” යනු පමණක් නොව “නිසෙ” කියාද වේ. සම්ංහට “නිසාතො ච” යන සූත්‍රයෙන් එකාරාදෙශව සිඩයි, “නිසෙ අගයිව භාසති”–යනාදිය බලනු.

පීළා සුණිසා සංඛා අක්ඛුද මුද්ද භාසතා සතාතා දතා,
අම්මා අනනා අම්බා තාතා (එතෙ සද්ද කඤ්ඤා සාදී)”

කඤ්ඤාශබ්දයෙහි මෙහි දක්වනු ලැබූ පදමාලා ක්‍රමය කච්චායන බාලාවතාර ශබ්දනීති යනාදියට එකඟ නමුදු “කඤ්ඤා” යනු ප්‍රථමායෙහි එකවචන වශයෙන් මුත් බහුවචන වශයෙන් නිරුත්ති පිටකයෙහි නොදක්වන ලදී—එහෙත් “බාහා පග්ගය්හ කඤ්ඤං” “අහෙතුඅප්පච්චයං පුරිසස්ස කඤ්ඤා උප්පජ්ජන්ති පි නිරුජ්ඣන්ති පි” යනාදියෙහි ප්‍රථමා බහුවචන භාවයෙන් දක්නාලද බැවින් නිරුත්ති පිටකයෙහි ක්‍රමයට වඩා මෙහි දක්වනු ලැබූ කච්චායනාදි ක්‍රමය සැලකිය යුතු බව ශබ්දනීතියෙහි කියන ලදී.

තවද ආලපනයෙහි “හෙ කඤ්ඤෙ කඤ්ඤා” යි එකවචන දෙකක් බව හා “භොතී කඤ්ඤායො” යි බහුවචන එකක් බවද මූලනිරුත්තියෙහි කියනලද්දේ නමුදු “එහි බාලෙ ඛමාපෙහි කුසරාජං මහබ්බලං” යනාදී උදාහරණ දක්වා ඒ ක්‍රමය අග්ගවංසාචාර්යයන්විසින් ප්‍රතික්ෂෙප කරණ ලදී.

තවද “හෙ කඤ්ඤෙ” යන ක්‍රමය “අම්බා” ආදිවූ ශබ්දවලදී නොලැබේ. එහි කෙසේද යත්-අම්බා, අම්මා, අනනා, තාතා, යන ශබ්දයන් කෙරෙණ් ඝසංඥයාට “ඝතෙ ච” යන සූත්‍රයෙන් එකාරාදෙශ පැමිණි කල්හි “න අම්මාදිතො” යන සූත්‍රයෙන් එය ප්‍රතිෂෙධ කොට “ආකාරො වා” යන සූත්‍රයෙන් විකල්පයෙන් හ්‍රස්වකළ කල්හි හෙ අම්බ, අම්බා-හෙ අම්ම, අම්මා-හෙ අනන, අනනා-හෙ තාත, තාතා යි සිඬයි.

තවද පරිසා සභා යන ශබ්ද දෙකත් කඤ්ඤාශබ්දය හා සම වූවද සප්තමී එකවචනයෙහි පමණක් වෙනසක් තිබේ—ඒනම්, “එකමිදං භො ගොතම සමයං තොදෙය්‍යස්ස බ්‍රාහ්මණස්ස පරිසතිං පරූපාරම්භං පවත්තෙන්ති” යන මේ පාළියෙහි *පරිසතිං යනු දක්නාලද හෙයින් සප්තමී එකවචනයෙහි පරිසතිං, පරිසායං, පරිසාය, කියාද, එසේම සභතිං, සභායං, සභාය, කියාදවේ.

---

* “සභා පරිසාහි ස්මිනො තිං” යන සූත්‍රයෙන් ස්මිංහට තිං යනාදෙශ හා “ඝො ස්සං...” යනාදි සූත්‍රයෙන් හ්‍රස්වද කළකල්හි “පරිසතිං, සභතිං” යනු සිඬයි

NOUNS ENDING IN ඉ. (I) FEM. *Ratti.*

2. ඉකාරන්තිත්ථිලිඞ්ගො රත්තිසද්දො.

එකවචන.	බහුවචන.
ප ..රත්ති	රත්තී, රත්තියො
ආ...(හෙ) රත්ති	(හොන්ති) රත්තී, රත්තියො
දු.. රත්තිං	රත්තී, රත්තියො
ත...රත්තියා	රත්තීහි, රත්තීභි
ක..රත්තියා	රත්තීහි, රත්තීභි
ච...රත්තියා	රත්තීනං
පං...රත්තියා	රත්තීහි, රත්තීභි
ඡ...රත්තියා	රත්තීනං
ස...රත්තියං, රත්තියා	රත්තීසු.

පත්ති යුත්ති වුත්ති කිත්ති මුත්ති තිත්ති ඛන්ති කන්ති,
සන්ති තන්ති සිද්ධි සුද්ධි ඉද්ධි බුද්ධි වුද්ධි *බොධි.
භූමි ජාති පීති සූති නන්දි සන්ධි සාණි කොටි,
දිට්ඨි වුට්ඨි තුට්ඨි යට්ඨි පාළි ආළි නාළි කෙළි.

සති මති ගති මුති ධීති රති රුචි ඡවි, යුවති කන්ති රස්මි අසනි වසනි, ඔසධි අඞ්ගුලි ධූලි දුන්දුභි දොණි, අටවි පාටලි සිරි ධුති ආකති. ඉච්චාදයො රත්තිව—"සත්ති සත්ථී නන්ති වුත්ති බොන්දි †නාභි" ඉච්චාදයොපි.

* "නාඤ්ඤත්‍ර බොජ්ඣා තපසා" යනාදියෙහි "බොජ්ඣා" යනාදී පදයන් දක්නාලදහෙයින් බොධිශබ්දයාගේ ප්‍රථමා ආලපන විතීයා බහුවචනස්ථානයන්හි "බොජ්ඣා" යන්නක්ද–තෘතීයා පඤ්චමී එකවචනස්ථානයන්හි "බොජ්ඣා" යන්නක්ද, සප්තමී එකවචනස්ථානයෙහි "බොජ්ඣං" යන්නක්ද–එසේම "බුජ්ඣිස්සං ජින බොධියං" යනාදියෙහි "බොධියං" යන්නක් දක්නාලදහෙයින් විතීයා එකවචනස්ථානයෙහි "බොධියං" යන්නක්ද විය යුතුයි.

† "ඉමාව නභ්‍යා සතරංසි විත්තිතා සතෙරිතා විජ්ජුරිව පභාසරෙ" යනාදි උදාහරණයන් දක්නාලද බැවින් "නාභි" ශබ්දයාගේ ප්‍රථමා ආලපන විතීයා බහුවචනස්ථානයන්හි "නභ්‍යා" යන්නක්ද–තෘ. ච. ප. ෂ. ස. එකවචනස්ථානයන්හි "නභ්‍යා" යන්නක්ද සප්තමී එකවචනස්ථානයෙහි "නභ්‍යං" යන්නක්ද වියයුතුයි.

මේ බාලාවතාර ක්‍රමයට සහ ශමක මහාස්ථවිර මතය ලෙසද රතන ශබ්දයයි—කච්චායන රූපසිද්ධි දෙක්හි පචමි ඒකවචනස්ථානයෙහි *රතනා යන්නත්ද සප්තමී ඒකවචනස්ථානයෙහි "රතනං† රතෙනා, රතනිං" යි රූපත්‍රයක්ද කියනලදී. ශබ්දනීතියෙහි යථොක්ත රූපයන්හා ප්‍රථමා ආලපන ද්විතීයා බහුවචනස්ථානයන්හි "රතෙනා" යන්නත්ද, තෘතීයා චතුර්ථී ෂෂ්ඨී සප්තමී ඒකවචනස්ථානයන්හි "රතනා" යන්නත්ද කියනලදී—"රතෙනානං" යනු හැර මත් භූමි ශබ්දයන්හිද මෙසේමය—"රතෙනා අමොඝා ගච්ඡන්ති"—"රතනා රූඪනී චන්දු—රතනා තියාමිං" යනුද "දිවා ච රතෙනා ච හරන්ති යෙ බලිං" යනුද "න භූමා චතුරඞ්ගුලා"—"සෙත් භූමා අනුත්ථුනං"—"භූමා සො පතිතං පංසං ගීවාය පටිමුඤ්චති" යනුද යථොක්ත සම්හර පද ගැණ උදාහරණයෝයි.

NOUNS ENDING IN ඊ. (Ī) FEM. *Nadì.*

3. ඊකාරනාන්තිත්ථිලිංගො නදී සද්දෙ.

ඒකවචන.	බහුවචන.
ප...නදී	නදී, නදියො
ආ...(හෙ) නදි	(භොති) නදී, නදියො
දු...නදිං	නදී, නදියො
ත...නදියා	නදීහි, නදීභි
ක...නදියා	නදීහි, නදීභි
ච...නදියා	නදීනං
පං...නදියා	නදීහි, නදීභි
ඡ...නදියා	නදීනං
ස...නදියං, නදියා	නදීසු.

---

* ඉවණ්ණ (පසංඥ)යා කෙරෙන් පරවූ සමා සම්ං විභක්තීන්ට "අම්ාපතො සම්ං සමානං වා" යන් සූත්‍රයෙන් ආ අං යනාදෙශයන්ද එකි "ආපතො" යන යොග විභාගයෙන් නා ස විභක්තීන්ට ආ ආදෙශද කළ කල්හි "රතනා, රතනං, මතනා, මතනං" යනාදිය සිඬයි.

† "ආදිතො ඔ ච" යන සූත්‍රයෙකි ච ශබ්ද ග්‍රහණයෙන් සම්ංහට ඔ ආදෙශව "තෙනා" යනු සිඬයි.

මහී වෙතරණී වාපී පාටලී කදලී ඝටී,
නාරී කුමාරී තරුණී වාරුණී බ්‍රාහ්මණී සඛී.
ගන්ධබ්බී කින්නරී නාගී දෙවී යක්ඛී අජී මිගී,
වානරී සූකරී සිඟී හංසී කාකී (ච) කුක්කුටී.
"මාතුලානී ච භගිනී භික්ඛුනී කාමුකී අවී,
පාපී පොක්ඛරණී දාසී රජ්ජි ඊසීකයානීනී.
(තත්‍ර පොක්ඛරණී දාසී බ්‍රාහ්මණී චචාදිනං ගති,
අඤ්ඤථාපි සියා ගාථා චුණ්ණියෙසු යථා රහං.
කුසාවතීති ආදීනං ගාථාසෙවව විසෙසතො,
රූපානි අඤ්ඤථා හොන්ති එකවචනතො වදෙ.
කාසී අවන්ති ඉච්චාදි බහුවචනතො වදෙ,
චක්ඛුවතීති ආදීනි පයොගස්සානු රූපතො.)"

මේ නදී ශබ්දය බාලාවතාර ක්‍රමයට මෙසේ නමුදු කච්චායනාදි යෙහි ප්‍රථමා ආලපන ද්විතීයා බහුවචනස්ථානයන්හි "නජ්ජෝ" යන්නක්ද, එකවචනස්ථානයන්හි "නදියං" යන්නක්ද, ද්විතීයා තෘතීයා චතුර්ථී පඤ්චමී ෂෂ්ඨී සප්තමී එකවචනස්ථානයන්හි "නජ්ජා" යන්නක්ද, සප්තමී එකවචනස්ථානයෙහි "නජ්ජං" යන්නක්ද කියන ලදී—එසේනුදු සප්තමියෙහි "නජ්ජා" යනු රූපසිද්ධියෙහි නොකියන ලදී.

පොක්ඛරණී ශබ්දයෙහි "පොක්ඛරඤ්ඤො, පොක්ඛරඤ්ඤා, පොක්ඛරඤ්ඤං" යනුද එසේමය—"පොක්ඛරඤ්ඤො සුමාපිතා" යනාදියෙහි බලනු. මෙහි ගාථාවල නොදක්වනලද නමුදු නාලිනී ශබ්ද යත් එසේමය—"රජ්ජා යථා ගචඡස්සචනො නාලිඤ්ඤං..." යනාදියෙන් පෙනේ—දාසී, බ්‍රාහ්මණී යන ශබ්දවයෙහි ප්‍ර. ආ. ද්වි. බහුවචන ස්ථානයන්හි "දාස්‍යො, බ්‍රාහ්මණ්‍යො" යනුද, තෘ. ච. ප. ෂ. එකවචනස්ථානයන්හි "දාස්‍යා, බ්‍රාහ්මණ්‍යා" යනුහා සප්තමී එකවචන ස්ථානයෙහි "දාස්‍යං, බ්‍රාහ්මණ්‍යං" යනුද විය යුතුයි—"තාව සතත සතා භරියා දාස්‍යො සතාත සතානි ච" යනාදියෙන්හා "බ්‍රාහ්මණ්‍යො පරිචාරකෙ" යනාදියෙන්ද දතයුතුයි—"ලඞ්යා පතිකොටෙසි ඝරෙ ජාතංව දාසියං" යනු දක්නාලදහෙයින් ද්විතීයා එකවචස්ථානයෙහි *"දාසියං" යන්නක්ද වියයුතුයි.

---

* "අං යම්වණ්ණා පා වා" යන සූත්‍රයෙන් හෝ "අං යමීතො පසඤ්ඤාතො" යන සූත්‍රයෙන් හෝ ඉවණ්ණ (පසංඥ) යාකෙරෙන් පරවූ අං හට යං යනාදෙශ කළ කල්හි දාසියං, බොධියං, ඉත්‍ථියං, යනාදිය සිද්ධයි.

තවද නියමයක් නම්—ආකාරාන්ත ඉවණ්ණාන්ත උවණ්ණාන්ත කඤ්ඤා රත්ති නදී යාගු වධූ යනාදී ස්ත්‍රීලිඞ්ගික ශබ්දයන් කෙරෙන් නා-ස-සමා-සම්ං-මහා-මයි-යන මොවුන් පරබවට නොපැමිණෙත්—එහෙයින් කඤ්ඤාස්ස, රත්තිස්ස, නදිමහා, යාගුමයි යනාදී රූප පාළියෙහි නොලැබෙත්—එසේ නමුදු ඉවණ්ණාන්ත ස්ත්‍රීලිඞ්ගික ශබ්දයන් කෙරෙන් "මයි" යන්නු පමණක් පර වීමෙන් සිද්ධවූ "බලාකයොනිමයි" "කුසාවතිමයි" යනාදී පද ගාථාවලදී පමණක් ලැබෙනබව ශබ්ද නීතියෙහි කියන ලදී.

ඒ මෙසේය.

"ගාථායං චුණ්ණියෙ චාපි නා ස සමාදි සරූපතො,
නාකාරන්තා ඉවණ්ණුණ්ණන්තා ඉත්ථිහි පරතං ගතා.
මයි සද්දො පන ගාථායං ඉවණ්ණන්තිත්ථිහි සසහ,
යාතො පරතා, මෙතස්ස පයොගාන්ති භවන්ති හි.
යථා බලාකයොනිම්හි නවිජ්ජති පුමො සදා,
කුසාවතිම්හි නගරෙ රාජා ආසි මහීපති."

තවද කුසාවතී යනාදී නගර නාම එකවචනාන්ත බවද, කාසී අවන්තී යනාදී ජනපදනාම බහුවචනාන්ත බවද, චන්දවතී යනාදී ප්‍රඥප්තිශබ්ද උභය වචනාන්ත බවද කියන ලදී.

NOUNS ENDING IN උ. (U) FEM. *Yágu.*

4. උකාරන්තිත්ථිලිඞ්ගො යාගු සද්දො.

එකවචන.		බහුවචන.
ප...යාගු		යාගු, යාගුයො
ආ...(භෙ) යාගු	(භොති)	යාගු, යාගුයො
දු...යාගුං		යාගු, යාගුයො
ත...යාගුයා		යාගුහි, යාගුභි
ක...යාගුයා		යාගුහි, යාගුභි
ච...යාගුයා		යාගුනං
පං...යාගුයා		යාගුහි, යාගුභි
ඡ...යාගුයා		යාගුනං
ස...යාගුයං, යාගුයා		යාගුසු.

එවං ධාතු ධෙනු කාසු දද්දු කණ්ඩු කච්ඡු රජ්ජු කණෙරු පියඞ්ගු සස්සු—ඉච්චාදයොපි.

මෙහි දක්වනලද ධාතුශබ්දයද සාගු ශබ්දය හා සමයයි කියන ලද්දේ නමුදු රස රුධිර මාංශ මේද නහර ඇට ඇටමිදුළු සුක්‍ර යන මේ ධාතූන් වාචකවූ කල්හි පුල්ලිඞ්ගිකය-ස්වභාවාර්ථ වාචකවූද, බුද්ධාස්ථ්‍යාදි ශරීර ධාතු වාචකවූද, ලොකධාතු වාචකවූද, චක්ෂු ශ්‍රොත්‍රාදි වාචකවූද කල්හි ස්ත්‍රීලිඞ්ගිකය—භූ (සත්තායං) කර (කරණෙ) පච (පාකෙ) යනාදි පදයන්ට යොනිවූ ධාතු වාචක කල්හි ත්‍රිලිඞ්ගිකයි.

තවද ධාතුශබ්දයාගේ ලිඞ්ග විභාගය ගැණ මෙසේද කියන ලදී.

☞ "ධාතු සද්දො ජිනමතෙ ඉත්ථිලිඞ්ගත්තනෙ මතො
සත්ථෙ පුල්ලිඞ්ගභාවස්මිං කච්චායනමතෙ විඤ්ඤූ"-යනුයි.

NOUNS ENDING IN උ. (U) FEM. *Mátu.*

5 උකාරන්තිත්ථිලිඞ්ගො මාතුසද්දො.

	එකවචන.	බහුවචන.
ප..	මාතා	[මාතා] මාතරො
ආ..	(හෙ) මාත, මාතා	(හොති) [මාතා] මාතරො
දු...	මාතරං	මාතරෙ, මාතරො
ත...	මාතරා, මාතුයා [මත්‍යා]	මාතරෙභි, මාතරෙහි, මාතූභි, මාතූහි
ක...	මාතරා, මාතුයා [මත්‍යා]	මාතරෙභි, මාතරෙහි, මාතූභි, මාතූහි
ච...	මාතු, මාතුයා, මාතුස්ස, [මත්‍යා]	මාතරානං, මාතානං, මාතූනං
පං..	මාතරා, මාතුයා [මත්‍යා]	මාතරෙභි, මාතරෙහි මාතූභි, මාතූහි
ඡ...	මාතු, මාතුයා, මාතුස්ස, [මත්‍යා]	මාතරානං මාතානං, මාතූනං
ස...	මාතරි, මාතුයා, මාතුයං [මත්‍යා, මත්‍යං]	මාතරෙසු, මාතූසු.

ධීතා, ධීතරො—දුහිතා, දුහිතරො—ඉච්චාදයොපි *මාතුසද්දොව.

---

* එසේද වූවත් සමහර විශෙෂ දක්නා ලැබේ.

මේ මාතුශබ්දයාගේ පදමාලාවෙහි "මාතරෙහි, මාතරෙභි, මාතූසු, මාතරෙසු" යන පදයන් රූපසිද්ධි බාලාවතාරාදියට එකාන ලෙස මෙහි දක්වන ලද්දැහු නමුදු ස්ත්‍රීලිඞ්ග ශබ්දවල (ස-එහි-එභි-එසු-අන්තවූ) එබඳු පදයන් පෙළෙහි නොදක්නාලදහෙයින් ශබ්දනීතිකාරකාචාර්‍ය්‍යයන් විසින් නොදක්වන ලදී.

තවද "තං බො පනෙතං පාපං කම්මං නෙව මාතරා කතං" යනාදියෙහි "මාතරා" යනුද—"අනුසාසතො අහං මත්‍යා..." යනාදියෙහි "මත්‍යා" යනුද—"මාතුස්ස සරන්" යනාදියෙහි "මාතුස්ස" යනුද දක්නාලද හෙයින් මෙහිද ගන්නා ලද්දැහුය—යම්සේ ඛත්තියා, ඛත්තියං යන පදයො (මජ්ඣයෙහි ස්වර හා පූර්ව තකාර ලොප් කොට) "ඛත්‍යා, ඛත්‍යං" යී වෙත්ද එසේම මාතුයා මාතුයං යන පදයො (ස්වරලොප් ආදිය කොට) "මත්‍යා, මත්‍යං" යී වෙත්. මෙහි ස්වරලොප් ආදියනම් නා-ස-ස්මා-විභක්තීන්ට "පතො යා" යන සූත්‍රයෙන් යා යනාදෙශද, ස්මිං විභක්තිහට "සපතො ස්මිං යං වා" යන සූත්‍රයෙන් යං යනාදෙශද, "ලොපූ' වුඩ්ඪාදි" සූත්‍රයෙන් උකාර ලොප් හා හ්‍රස්වද කිරීමයි.

තවද සත්ථුශබ්දයාගේ පදමාලාවෙහි ප්‍රථමා බහුවචනස්ථානයෙහි සත්ථා යනු මෙන් මෙහිද "මාතා" යනු ශබ්දනීතියෙහි දක්වන ලදී.

ධීතු (Ḍhītu) declined.

6. ධීතුසද්දස්ස භෙදෙ

එකවචන.	බහුවචන.
ප...ධීතා	[ධීතා] ධීතරො
ආ...(හෙ)ධීත, ධීතා	(භොතී) [ධීතා] ධීතරො
දු...ධීතරං [ධීතං*]	ධීතරෙ, ධීතරො
ත...ධීතරා, ධීතුයා	ධීතරෙහි, ධීතරෙභි, ධීතූහි, ධීතූභි
ක...ධීතරා, ධීතුයා	ධීතරෙහි, ධීතරෙභි, ධීතූහි, ධීතූභි
ච...ධීතු, ධීතුයා	ධීතරානං, ධීතානං, ධීතූනං
පං...ධීතරා, ධීතුයා	ධීතරෙහි, ධීතරෙභි, ධීතූහි, ධීතූභි
ජ...ධීතු, ධීතුයා	ධීතරානං, ධීතානං, ධීතූනං
ස...ධීතරි, ධීතුයා, ධීතුයං	ධීතරෙසු, ධීතූසු.

---

* "ධීතුයා අතතමමහි" යනසූත්‍රයෙන් අං විභක්ති පරකල්හි ධීතුශබ්දයාගේ අන්ත්‍යයා හට අභාවකොට පරනයනාදිය කළ කල්හි "ධීතං" යනු සිඬයි.

ධීතු ශබ්දයද දුහිතු ශබ්දයද මාතු ශබ්දය මෙන් වරනැගිය යුතු යයි බාලාවතාරාදියෙහි කියනලද්දේ නමුත් මාතු ශබ්දයෙහිදී ලැබෙන "මත්‍යා" යනාදියට සමවූ පදයන් ධීතු ශබ්දයෙහි නොලැබෙත්—මාතුශබ්දයෙහි නොලැබෙන "ධීතං" යන්නත්ද මෙහි ලැබේ—ඒපද

"ජාලි කණ්හා ජිනං ධීතං මද්දිදෙවි පතිබ්බතං,
චජමානො න චින්තෙසිං බොධියා යෙව කාරණා."

යනාදියෙහි දක්නා ලද හෙයින් ශබ්දනීතියෙහි දක්වනලදී.

තවද විනයපාළියෙහි "අස්සමණී හොති අසක්‍යධීතරා" යනාදියෙහි (තෘතීයා බහුවචනය මෙන්) "අසක්‍යධීතරා" යි ප්‍රථමා එකවචනාන්ත පදයක් දක්නාලද්දේය. "සෙට්ඨිධීතරා" යිද එසේම දක්නා ලදී—මෙබඳුවූ ප්‍රථමාඑකවචනාන්ත පදයන් වෙන ශබ්ද යන්හි සමාස වූ ධීතුශබ්දයෙහි මුත් කේවල ධීතුශබ්දයෙහි නොලැබෙන බව දතයුතුය.

තවද නිරුත්තිපිටකයෙහි වනාහි "මාතා, ධීතා" යන පදවය කඤ්ඤාශබ්දයාගේ රූපමාලා ක්‍රමයෙහිම ඇතුලත්කරණ ලදහ-එසේත් "කඤ්ඤෙ, කඤ්ඤාය" යන පදයන් මෙන් "ධීතෙ, ධීතාය" යන පද පාළියෙහිදී අසමාසවිෂයෙහි නොදක්නාලද හෙයින් එය ශබ්දනීතිකාරකාචාර්යයන් විසින් ප්‍රතික්ෂෙපකරණ ලදී-"රජමාතාය, රජධීතාය" යනුද-"අච්ඡරියං නන්දමාතෙ අබ්භුතං නන්දමාතෙ" යනාදියෙහි හා "අත්ථි බො නකුලමාතෙ ධම්මෙහි සමන්නාගතො, මාතුගාමො" යනාදියෙහි වූ "නකුලමාතෙ" යනාදියද දක්නාලද බැවින්, සමාස පද බවට ගියාවූ මාතු-ධීතු-දුහිතු ශබ්ද යන්ගේ රූපයන් දෙකොඨාසයක් යයි දත යුතුය—ඒනම්, මෙහි දක්වනු ලැබූ කේවල ධීතුශබ්දාදිය වරනැගීමෙන් ලැබෙන රූප යන් එක් කොඨාසයක—කඤ්ඤාශබ්දය මෙන් වරනැගීමෙන් ලැබෙන රූපයන් එක් කොඨාසයක—යන මේ දෙකොටසයි.

ධීතුශබ්දයට කීවාවූ මේ සියළු විභාගයන්
දුහිතු ශබ්දයටද ගතයුතුයි.

NOUNS ENDING IN ඌ. (U′) FEM. *Jambū.*

7. ඌකාරනත්ථිලිංගො ජම්බූසද්දො.

ඒකවචන.	බහුවචන.
ප...ජම්බූ	ජම්බූ, ජම්බුයො
ආ...(හෙ)ජම්බු	(භොති) ජම්බූ, ජම්බුයො
දු...ජම්බුං	ජම්බූ, ජම්බුයො
ත...ජම්බුයා	ජම්බූහි, ජම්බූභි
ක...ජම්බුයා	ජම්බූහි, ජම්බූභි
ච...ජම්බුයා	ජම්බූනං
පං...ජම්බුයා	ජම්බූහි, ජම්බූභි
ඡ...ජම්බුයා	ජම්බූනං
ස...ජම්බුයං, ජම්බුයා	ජම්බූසු.

"වධූ(ච)සරභූ (චෙව) සරබූ, සුතනූ චමූ,
චාමූරූ නාගනාසූරූ (ඉච්චාදී ජම්බුයා සමා.)"

අපිච

"වදඤ්ඤූ මග්ගඤ්ඤූ කාලඤ්ඤූ අත්ථඤ්ඤූ අකතඤ්ඤූ
ඉච්චාදයොපි"

"සොහං නූන ඉතො ගන්ත්වා යොනිං ලද්ධාන මානුසිං,
වදඤ්ඤූ සීල සම්පන්නො කාහාමි කුසලං බහුං."

මේආදි තැන්වල වදඤ්ඤූ ශබ්දදිය පුල්ලිඟිකත්වයෙන් දක්නා ලද්දක් මෙන්

"සාහං ගන්ත්වා මනුස්සත්තං වදඤ්ඤූ වීත මච්ඡරා,
සංඝෙ දානානි දස්සාමි අප්පමත්තා පුනප්පුනං."

යනාදි තැන්වලද

"කොධනා අකතඤ්ඤූ ච පිසුනා ච විභෙදිකා"

යනාදියෙහිද

වදඤ්ඤූ අකතඤ්ඤූ ආදීවූ ශබ්දයන් ස්ත්‍රී ලිඟිකත්වයෙන් දක්නාලද්දහුය—එසේහෙයින් වදඤ්ඤූ යනාදි ශබ්දයන් ජම්බූ ශබ්දය මෙන් වරනැගිය යුතු වන්නාහුයයි අග්ගවංසාචාය්‍යීයන් විසින් කියනලදී.

NOUNS ENDING IN ඔ. (O) FEM. (ගො) *Go.*

8. ඔකාරන්තිත්ථිලිඞ්ගො ගොසද්දො.

	එකවචන.	බහුවචන.
ප...	ගො, ගාවී	ගාවී, ගාවො, ගවො
ආ...	(හෙ) ගො	(භොති) ගාවී, ගාවො, ගවො
දු...	ගාවිං, ගාවං, ගවං	ගාවී, ගාවො, ගවො
ත...	* *	ගොහි, ගොභි
ක...	* *	ගොහි, ගොභි
ස...	* *	ගවං, ගුන්නං, ගොනං
පං...	* * * * * *	ගොහි, ගොභි
ඡ...	* *	ගවං, ගුන්නං, ගොනං
ස...	* * * * * *	* * ගොසු.

මේ අග්ගවංසාචාර්‍ය්‍ය මතය ලෙස ස්ත්‍රී ලිඞ්ගික ගො ශබ්දයයි.

රූපසිද්ධියෙහි "තස්ස පුල්ලිඞ්ගෙ ගොසද්දස්සෙව රූපනයො" යන්නෙන් ස්ත්‍රීලිඞ්ගික ගොශබ්දයාගේද පුල්ලිඞ්ගික ගොශබ්දයාගේ පදමාලාවම යයි කියන ලදී. මොග්ගල්ලායනයෙහිද එසේමය.

ශබ්දනීතියෙහිද

"ඔකාරන්තං ඉත්ථි ලිඞ්ගං ගො සද්දොති විභාවයෙ,
ගො සද්දස්සෙව පුල්ලිඞ්ගෙ රූපමස්සාහු කෙවල."

යනු කියන ලදී.

රූපසිද්ධි ආදියෙහි එසේ කියන ලද්දේ නමුදු පුල්ලිඞ්ගික ස්ත්‍රී ලිඞ්ගික ගො ශබ්දයන් දෙදෙනාගේ පදමාලාවන් එකකට එකක් වෙනස් බවට බොහෝ හේතූදාහරණයන් අග්ගවංසාචාර්‍ය්‍යයන් විසින් කියන ලදී—කෙසේද,

"පුබ්බනාථානං ධාතු සද්දානං යථා දිස්සති නානතා,
ගො සද්දානං තථා විඤ්ඤූනං ඉච්ඡිතබ්බාව නානතා."

තවද පුල්ලිඞ්ගවූ මාතුගාම ශබ්දය (බුද්ධශබ්දය මෙන්) මාතුගාමො, මාතුගාමා, යනාදි වශයෙන් දෙවරක් වරනගා "එකත් පුල්ලිඞ්ගය එකක් ස්ත්‍රී ලිඞ්ගය" යි යමෙක් කියන්නේ වේද "පුල්ලිඞ්ගික ස්ත්‍රී ලිඞ්ගික ගො ශබ්දයන් දෙදෙනාගේ පදමාලාවන් එකාකාරය" යි කීමත් එසේමයයි කියන ලදී—ඉදින් එසේ සමාන වූයේනම් වෙනසක් නැතිහෙයින් ගො ශබ්දයාගේ ස්ත්‍රී ලිඞ්ගිකත්වය කෙසේ

ඇති වේද? යම්සේ අග්ගි-රත්ති-අක්ඛි-යන මේ ශබ්දයෝ ඉකාරාන්තභාවයෙන් සදෘශයෝ නමුදු, ස්ත්‍රී පුං නපුංසක ලිඞ්ග ලක්ෂණ වූ පදමාලාවන්ගේ වෙනස දක්නා ලැබේද, එසේම ගො ශබ්දයන් දෙදෙනාගේද වෙනසක් ඇති වියයුතුය—එසේ වෙනසක් නැති කල්හි පුං ස්ත්‍රී ලිඞ්ග ව්‍යවස්ථාව කෙසේ වේද? පුං ස්ත්‍රී ලිඞ්ගයන් දෙදෙනාගේ විසඳ අවිසඳ ව්‍යවහාරත්වය කෙසේ වේද? නොවේමය-අග්ගවංසාචාර්ය්‍ය මතය ලෙස වූ ගො ශබ්දයන් දෙදෙනාගේ වෙනසද දක්නා ලද්දේය. පුං ස්ත්‍රී ලිඞ්ග ව්‍යවස්ථාවද, විසඳවිසඳ ව්‍යවහාරත්වයද දක්නා ලද්දේයයි දත යුතුයි.

ඔකාරාන්ත පුල්ලිඞ්ගික ස්ත්‍රීලිඞ්ගික ගොශබ්දයන් දෙදෙනාගේ පදමාලා දෙකක්ද ගො ශබ්දයෙන් පරව ස්ත්‍රීලිඞ්ගයෙහි ඊ ප්‍රත්‍යයව සිද්ධවූ ගාවීශබ්දයාගේ පදමාලාවක්දැයි පදමාලා තුනක් වෙත්. එයින් ඔකාරාන්ත පුල්ලිඞ්ගික ගොශබ්දයෙන් පිරිමි ගවයන් කියන ලද්දේය එහි පදමාලාතොමො පුල්ලිඞ්ග කාණ්ඩයෙහිදී කියන ලද්දීය—ඊකාරාන්ත ස්ත්‍රීලිඞ්ගික ගාවී ශබ්දයෙන් ස්ත්‍රී ගවයන් හෙවත් දෙනුන් කියන ලද්දීය—පදමාලාතොමෙං නදී ශබ්දය වැන්නීය. ඔකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගික ගො ශබ්දයෙන් සාමාන්‍යවශයෙන් ස්ත්‍රී පුරුෂ යන උභයපක්ෂයෙහිම ගවයන් කියන ලද්දැහුය. පදමාලා තොමො අග්ගවංසාචාර්ය්‍ය මතය ලෙස මෙහි දක්වනු ලැබූ ප්‍රකාර නමුදු රූපසිද්ධිකාරක ආචාර්ය්‍යාදි මතය ලෙස පුල්ලිඞ්ගික පදමාලාවමැයි දතයුතුයි.

මෙහි දක්වනු ලැබූ ස්ත්‍රී ලිඞ්ගික ගො ශබ්දයාගේ පදමාලාවෙහි “ගාවුං” යනු නොදක්වන ලද්දේ ඒකාන්ත පුම්වාචක බැවින්—ඒ පදයාගේ ඒකාන්ත පුම්වාචකත්වය “ඉධ පන භික්ඛවෙ වස්සූපග
“තං භික්ඛුං ඉත්ථි නිමන්තෙති එහි භණෙත හිරඤ්ඤං වා තෙ දෙමි
“සුවණ්ණං වා.. ඛෙත්තං වා... වත්ථුං වා... ගාවුං වා... ගාවිං වා...
“දාසං වා... දාසිං වා... ධීතරං වා තෙ දෙමි අහං වා තෙ භරියා
හොමි අඤ්ඤං වා තෙ භරියං ආනෙමි”—යන මේ පාඨයෙන් පෙනේ—මෙහි “ගාවුං” යන පදයෙන් පිරිමිගවයන්ද “ගාවිං” යන පදයෙන් දෙනුන්ද කියන ලද්දේය—එහෙයින් “ගාවුං” යනු ඒකාන්ත පුම්වාචකයයි දත යුතුය.

තවද මේ ස්ත්‍රීලිඞ්ගික ගො ශබ්දයාගේ පදමාලාවෙහි තෘතීයා ඒකවචනස්ථානයෙහි ගාවෙන, ගවෙන, යනුද-සප්තමීබහුවචන ස්ථානයෙහි ගාවෙසු, ගවෙසු, යනුද-නොදක්වන ලද්දේ ස්ත්‍රී ලිඞ්ගික ශබ්දයන් “එන” “එසු” යන්නාවුන් හා කිසිතැනෙක්හි යෙදීමක් නැතිහෙයින් හා, කාය තාය යනාදී සමානාධිකරණ පදයන්

සමග යොදන්ට යුතු නැති බැවිනි—චතුත්ථී ඡට්ඨී ඒකවචනස්ථාන යන්හි ගාවස්ස, ගවස්ස යනුද—පඤ්චමී ඒකවචනස්ථානයෙහි ගාවා, ගවා, ගාවම්හා, ගවම්හා, ගාවස්මා, ගවස්මා, යනුද—සත්තමී ඒකවචනස්ථානයෙහි ගාවෙ, ගවෙ, ගාවම්හි, ගවම්හි, ගාවස්මිං, ගවස්මිං, යනුද නොදක්වනු ලැබුයේ ස්ත්‍රී ලිඞ්ගික ශබ්දවලින් පරව ස-ස්මා-ස්මිං-ම්හා-ම්හි-යන්නවුන් ස්වකීය රූපවලින් නොසිද්ධනා හෙයින්ද ස්මා-ස්මිං--විභක්තිවලට ආදෙශවූ ආ-එ-යන්නවුන් හා යෙදීමක් නැතිහෙයින්ද, යාය, තාය, යනාදි සමානාධිකරණ පදයන් හා යොදන්ට යුතු නැති බැවින්දැයි දත යුතුය—ගාවියො, ගාවියා ගාවීහි, ගාවීභි, ගාවීනං, ගාවියං, ගාවීසු, යන පදයන් ඔකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගික ගො ශබ්දයාගේ පදයන් නොව ඊකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගික ගාවී ශබ්දයාගේ පදයන් බැවින් යථොක්ත පදමාලාවෙහි නොදක්වන ලද්දුහුයයි දත යුතුය.

තවද මේ ඔකාරාන්ත ස්ත්‍රී ලිඞ්ගික ගො ශබ්දයාගේ පදමාලාවෙහි "ගාවි" යන පදය (කඤ්ඤා ශබ්දයාගේ පදමාලාවෙහි කඤ්ඤා යන පදය මෙන්) සතර වරක් ආ හෙයින් එය ස්ත්‍රී ලිඞ්ගික ශබ්දයන්ගේ අවිසදෘකාර ව්‍යවහාරත්වය විඥාපනයෙහි කාරණාක්ය—පුංලිඞ්ගික කොයිම ශබ්දයකගේ පදමාලාවකවත් එකම පදය සතර වරක් නායේය.

ස්ත්‍රී ලිඞ්ගික ගො ශබ්දයෙන්.සාමාන්‍ය වශයෙන්ම ගවයන් කියනු ලබන බව මේ මතු දක්වනු ලබන උදාහරණවලින්ද දැනගත හැකිය.

විනය අටුවාවෙහි "ඡෙකො හි ගොපාලකො සක්ඛරායො උච්ඡං "ගෙන ගහෙත්වා රජ්ජුදණ්ඩහත්ථො පාතොව වජං ගන්ත්වා 'ගාවො' "පිට්ඨියං පහරිත්වා පලිඝත්ථම්භමත්ථකෙ නිසින්නො ද්වාරප්පත්තං "පත්තං ගාවිං එකා වෙත් සක්ඛරං ඛිපිත්වා ගණෙති" යන මේ පාඨයෙහි "ගාවො" කියා, නැවත "ගාවිං" කීමෙන් ස්ත්‍රී ලිඞ්ගික ගො ශබ්දයාගේ අවිසදෘකාර ව්‍යවහාරත්වයද දක්නා ලැබේ—"ගාවො" යන වචනයෙන් යම්සේ ස්ත්‍රී පුරුෂ ගවයන් දෙපක්ෂයම ගතයුතු වේද, එසේම "ගාවිං" යන වචනයෙන්ද සර්වසංග්‍රාහික වශයෙන් ස්ත්‍රී පුරුෂ ගවයන් දෙපක්ෂය ගන්නා ලැබෙත්.

"ගාවීපි දිස්වා පලායන්ති සීහන්ති මඤ්ඤමානා" යන මේ පාඨයෙහිද ගාවී යන පදයෙන් සාමාන්‍යවශයෙන් ස්ත්‍රී පුරුෂ දෙපක්ෂයෙහිම ගවයන් වාච්‍ය වෙත්.

ඉදින් ස්ත්‍රී පුරුෂ ගවයන් වාචකවූ ස්ත්‍රී ලිඞ්ගික ඕකාරාන්ත ගො ශබ්දයාගේ පදමාලාවෙහි "ගාවී, ගාවිං" යන රූපයන් නොවිය

ශූනතාශූනම් අටුවාවෙහි "ගාවො" යනු කියා "ගාවං" සී කියයුතු වන්නේය. යම්හෙයකින් අටුවාචාරීන්වහන්සේ විසින් ස්ත්‍රී පුරුෂ ගවයන්ගේ වශයෙන් සියළු ගවයන් සංග්‍රහ වනු ලබන්නාවූ "ගවො" යන වචනය කියා එම ගවයන් සඳහා නැවත "වාරපප පාතං පතතං ගාවිං" සී කියන ලද්දේද එහෙයින් "ගාවිං" යනුද ස්ත්‍රී පුරුෂ ගව දෙපක්ෂයම සංග්‍රහවනු ලබන්නාවූ සර්වසංග්‍රාහික වචනයක් යයි දත යුතුය—ඉදින් එය ඔකාරාන්ත ස්ත්‍රී ලිගික ගො ශබ්දයාගේ සර්වසංග්‍රාහික වචනයක් නොව ඊකාරාන්ත ස්ත්‍රී ලිගික ගාවී ශබ්දයාගේ වචනයක් වූව හොත් සියළුම ගාලෙහි දෙනුන්ම විය යුක්තීය-එසේ නොවිය හැකිය.

"ගාවීපි දිස්වා පලායන්ති භීතබුත්ති මක්ඛකා" යන මෙහිද ගාවී යනු ස්ත්‍රී ලිගික ගාවී ශබ්දයෙහි වචනයක් වූවහොත් සියළුම ගවයන් සංග්‍රහ නොවනහෙයින් "ගාවී" යනු ඔකාරාන්ත ස්ත්‍රී ලිගික ගො ශබ්දයාගේ සර්ව සංග්‍රාහික වචනයක්ම යයි දත යුතුය- "සෙය්‍යථාපි භික්ඛවෙ වස්සානං පච්ඡිමෙ මාසෙ සරදසමයෙ කිට්ඨසම්බාධෙ ගොපාලො ගාවො රක්ඛෙය්‍ය තා ගාවො තතො තතො දණ්ඩෙන ආකොටෙය්‍ය" යන මෙහිද—"අනානද බලද වෙතා වණ්ණද සුඛද ච තා එතමත්ථවසං ඤත්වා නාස්සු ගාවො හනිංසු තෙ" යන මෙහිද "ගම්ස්සන්ති හනෙත ගාවො වච්ඡගිද්ධිනියො" යන මෙහිද "ගොසු දුහ්‍යමානාසු ගතො" යන මෙහිද දක්නා ලද්දාවූ "ගාවො-ගොසු" යන මේ පදවලින් ගො ශබ්දයාගේ පුල්ලිගිකත්වය මෙන් ස්ත්‍රී ලිගිකත්වයද සාරවශයෙන් කල්පනා කට යුතුය.

මෙහි ගො, ගාවී-ගාවී. ගාවො, ගවො-යනාදිය කිසිසේත් ස්ත්‍රී ලිගිකත්වයෙන් කියන ලදදේ නමුදු ප්‍රයෝගවූ පරිදෙන් (පජා-දෙවතා යනාදි පදයන් මෙන්) ස්ත්‍රී පුරුෂ උභය පක්ෂයම වාචක වෙත්—එබැවින් ස්ත්‍රී ලිගිකත්වයෙන් "සා ගො" කියා හෝ "තා ගාවො" කියා හෝ කියනලද කල්හි ස්ත්‍රී පුරුෂ ගව සංඛ්‍යාත උභය පක්ෂයම ගන්නා ලද්දාහුයයි දත යුතුය.

මෙබඳුවූ තැන්වල ඒකාන්තවශයෙන් ලිගයම ප්‍රධාන නොව අර්ථයම ප්‍රධාන හෙයිනි—"ගාවො දුහන්ති" සී කියනලද කල්හි "ගාවො" යන්න කිසි සේත් පුල්ලිංගයෙහිද පවත්නේ නමුදු දෝහණ ක්‍රියාව වනාහි පුරුෂ ගවයා කෙරෙහි අසම්භව හෙයින් අර්ථ වශයෙන් කල්පනා කොට දෙනුන්ම දන්නා ලදී.

“ගාවී දුහනති” යී කියන ලද කල්හි චතාංගි ලිග වශයෙන්ද අත්ථ වශයෙන්ද යන උභයාකාරයෙන්ම කියන ලද බැවින් දෙනුන් බවට නුවණැති කවරෙක් සැක කෙරේද නොකෙරේමය.

“තා ගාවො චරනති” යී කී කල්හි ස්ත්‍රීලිංගවශයෙන් කියනලද හෙයින් දෙනුන් දෝ හෝ යී සමහරවිට සැක ඉපදිය හැකිය—පුංලිංග වශයෙන් “තෙ ගාවො චරනති” යී කියනලද කල්හි සැකයක් නැත්තේය ස්ත්‍රී පුරුෂ දෙපක්‍ෂයෙහි ගවයන්ම හැගෙත්—පුංලිංග බහුවචනයෙන් සමහර තැන්හි ස්ත්‍රී පුරුෂ දෙපක්‍ෂයම ගන්නාලද හෙයිනි—ගාවී ශබ්දයෙන් දෙනුන්ම ගතයුතු බැවින් සමහර ශාසනික ප්‍රයෝගවලද ලෞකික ප්‍රයෝගවලද “ගාවී, ගාවිං” යන පද වලින් ධෙනුවම වාචකවන ලද්දී නමුදු සමහර ශාසනික ප්‍රයෝග වල සාධාරණ වශයෙන් දෙපක්‍ෂයම වාචක වන ලද්දේය.

“අචිරපක්කනතසස භගවතො බාහියං දරුචීරියං ගාවී තරුණවච්ඡා අධිපතිත්වා ජීවිතා වොරොපෙසි.”

යනාදියෙහි “ගාවී” යන පදයෙන් ධෙනුවම වාචක වන්නීය—“තිණසීහො කපොතවණ්ණගාවී සදිසො.” යනාදියෙහි ගාවී ශබ්දයෙන්ද එසේමය.

“සෙය්‍යථාපි භික්ඛවෙ දක්ඛො ගොඝාතකො වා ගොඝාතක නෙතවාසී වා ගාවිං වධිත්වා චාතුම්මහාපථෙ බිලසො පටිවිභජිත්වා නිසින්නො අස්ස”-යනාදියෙහි ගාවිං යන පදයෙන් ස්ත්‍රී පුරුෂ යන උභයපක්‍ෂයෙහි ගවයන්ම කියනු ලැබෙත් යයි දතයුතුයි.

“ගො, ගාවී-ගාවී, ගාවො, ගවො, යනාදීන් ස්ත්‍රී ලිංගික ගොශබ්දයාගේ යම් පදමාලාවක් මෙහි දක්වන ලද්දීද එහි ගො ශබ්දයා ඔකාරෙන් පරවූ—සි–යො–යන විභක්තීන්ට ඊකාරාදෙශද අං විභක්තිහට ඉං යනාදෙශද කිරීමෙන් “ගාවී, ගාවිං” යන පදයෝ සිඬ වන්නාහුය.

මුඛමත්තදීපනී කාරක වජිරබුද්ධි ආචාර්‍ය්‍යයන්විසින් යො විභක්තිහට ඊකාරාදෙශයක් කියන ලද්දේය—ශබ්දනීතිකාරක අග්ගවංසාචාර්‍ය්‍යයන් විසින්ද යො විභක්තිහට ඊකාරාදෙශ හා අං විභක්තිහට ඉං යනාදෙශද කියන ලද්දේය-එසේහෙයින් මේ ස්ත්‍රී ලිංගික ඔකාරාන්ත ගොශබ්දයාගේ “ගො, ගාවී—ගාවී, ගාවො, ගවො” යනාදි වශයෙන් දක්වනු ලැබූ පදමාලාතොම පාලික්‍රමය වද අටුවා ක්‍රමයටද කච්චායනාචාර්‍ය්‍ය මතය නෙණ පද නිෂ්පත්තිය කළාවූ වජිරබුද්ධි ආචාර්‍ය්‍ය මතයටද අනුකූල වන්නීයයිද-යථෝක්ත පදමාලාවෙහි “ගාවී” යන පදය සතරවරක් ආ හෙයින් ඔකාරාන්ත

ස්ත්‍රීලිඟික ගො ශබ්දයාගේ අවිසදකාර ව්‍යවහාරත්වයද සිද්ධයයි ශබ්දනීතියෙහි කියන ලදී.

විසදකාර ව්‍යවහාරය පුල්ලිඟුය, අවිසදකාර ව්‍යවහාරය ස්ත්‍රීලිඟුය, උභයමුක්තාකාර ව්‍යවහාරය නපුංසකලිඟුය—මේ විසදකාරාදිය තනි තනි පදයන්ගේ වශයෙන් නොව සන්ධිප්‍රබන්ධසංඛ්‍යාත පදමාලාවගේ වශයෙන් දතයුතුය.

එහෙයින් රූපසිද්ධියෙහිද

"විසද[1]විසදකාර ආකාරො[2]භය මුත්තතො,
ලිඟස්ස ලක්ඛණං එතං ඤෙය්‍යං සන්ධිපබන්ධතො." යි
කියනලදී.

කෙසේද—පුල්ලිඟුවූ ගොශබ්දයාගේ පදමාලාවෙහි "ගාවුං, ගවං, ගාවෙන, ගවෙන" යනාදී සමහර පදයෝ එක එක වරද—ගොහි, ගොභි, යනාදී සමහර පද දෙවර දෙවරද—ගාවො, ගවො, ගවං, යනාදී සමහර පද (සත්ථා රාජා යනාදිය මෙන්) තුන් තුන් වරද ආවාහුය—මෙහි සතරවරක් හෝ පස්වරක් හෝ ආවාවූ එකම පදයකුදු නැත්තේය—එසේහෙයින් මෙහි විසදකාරය දත්නේය.

පුරිස ශබ්දයාගේ පදමාලාවෙහි "පුරිසො, පුරිසං" යනාදිය එක එක වරය-පුරිසෙ යනාදිය දෙවර දෙවරය-පුරිසා යනු පමණක් තුන්වරක් ආයේය—මෙසේ මෙහිද විසදකාරය දත්නේය.

කඤ්ඤාශබ්දයාගේ පදමාලාවෙහි "කඤ්ඤං" යනාදිය එක එක වරද, කඤ්ඤාහි යනාදිය දෙවර දෙවරද, කඤ්ඤායො යනාදිය තුන් තුන් වරද, කඤ්ඤා යනු සතර වරක්ද, කඤ්ඤාය යනු පමණක් පස්වරක් ආයේය—එසේහෙයින් මෙහි අවිසදකාරය දත්නේය. සෙසු ස්ත්‍රීලිඟික ශබ්දයන්ගේද මෙසේමය—මෙසේම ඔකාරාන්ත ස්ත්‍රීලිඟික ගො ශබ්දයාගේ පදමාලාවෙහි ගො යන පදය දෙවරක්ද ගාවො යනු හා ගවො යනුද තුන් තුන් වරද ගාවී යනු සතර වරක්ද, ගාවියා යනු පස් වරක්ද ආයේය—මෙසේ මේ ස්ත්‍රීලිඟික ගොශබ්දයාගේ පස්වරක් ආවාවූ පදයන්ගේ වශයෙන් අවිසදකාරය දත්නේය.

නපුංසකලිඟු චිත්තශබ්දයාගේ පදමාලාවෙහි "චිත්තෙන" යනාදිය එක එක වරද, චිත්තං යනාදිය දෙවර දෙවරද, චිත්තානි යනු තුන් වරක්ද ආයේය—අඩ්ඨි ආයු යනාදියෙහිද මෙසේමය—මෙහි උභයමුක්තාකාරය දත්නේය-කිසිසේත් මෙහි සතරවරක් හෝ පස්වරක් හෝ ආවාවූ පදයන්ගේ අභාවයෙන් විසදකාරයද දත් නාලද්දේ නමුදු, යම්හෙයකින් චිත්ත අඩ්ඨි ආයු යනාදී ශබ්දයෝ

ගච්ඡන්ත, අග්ගි, භික්ඛු යනාදිවූ පුල්ලිඞ්ගික ශබ්දයන්ගේ ක්‍රමයෙහිද, කඤ්ඤා, රත්ති, යාගු යනාදි ස්ත්‍රීලිඞ්ගික ශබ්දයන්ගේ ක්‍රමයෙහිද නොපවත්නා හෙයින් විසඳ අවිසඳ යන උභයාකාරයටම නොපැමිණ “චිත්තානි” යන සනිකාර රූප ඇත්තාහු වෙත්ද- එහෙයින් උභයමුක්තාකාරයයි දත යුතුයි.

මේ ත්‍රිවිධාකාරය සංස්කෘත භාෂාවෙහිද අසම්භාව හෙයින් සියලු ශබ්දශාස්ත්‍රයෙහි නොකියනලද්දේ නමුදු පාලිභාෂාවෙහි සම්භව හෙයින් නිරුත්ති මඤ්ජූසා රූපසිද්ධි ශබ්දනීති යන පොත්වල පමණක් කියන ලදී.

සාමාන්‍යවශයෙන් මේ ලිඟුනම් කුමක්ද යත්.

“ලිඞ්ගං නාම පදපකතිරූපං”-යී රූපසිද්ධි ටීකායෙහි කියනලද හෙයින් ලිඟයනම් පදප්‍රකෘතිරූපයයි සමහරෙක්ද*

“ථන කෙසවතී ඉත්ථී මස්සුවා පුරිසො සියා,
උභින්නමන්තරං එතං ඉතරෙහයමුත්තකො-” ති

“වුත්තත්තා විසිට්ඨා ථන කෙසාදයො ලිඞ්ගන්ති කෙචි වදන්ති” යනු බැවින් විශිෂ්ටවූ ස්ථන කෙශාදීහු ලිඟයයි සමහරෙක්ද කියත්. ගඟා සාලා වෘක්ෂාදීහු ස්ථනාදිය හා සම්බන්ධයක් නැතිහෙයින් පසුව කී ලිඟ ලක්ෂණය සර්වසාධාරණ නොවන බව හා පරමාර්ථවශයෙන් ලිඟනම්වූ කිසිවක් නැත්තේය, ලොක සංකෙතාරූඪවූ ව්‍යවහාරය ලිඟනම් වන්නේයයි සමහරෙක්ද කියත්.

ඉදින් පරමාර්ථ වශයෙන් ලිඟයක් ඇත්තේනම් “තට” යනාදි සර්වලිඟික ශබ්ද සංඛ්‍යාත එකස්ථානයෙහි අන්‍යොන්‍ය විරුද්ධවූ ඒ ලිඟයන්ගේ සමාවේශය වන්නේ කෙසේද—එසේහෙයින් යම් කිසි අර්ථයක්හුගේ අවිසදෘකාර ව්‍යවහාරය ස්ත්‍රීලිඟුයයිද, විසදෘකාර ව්‍යවහාරය පුල්ලිඟුයයිද, උභයමුක්තාකාර ව්‍යවහාරය නපුංසකලිඟුයයිද දතයුතුයි.

එහෙයින් කියන ලදී.

“ඉද මෙත්ථ සන්නිට්ඨානං සබ්බලිඞ්ගිකොපි සද්දො හොති, තටං, තටී, තටො ති, යදි ච පරමත්ථතො ලිඞ්ගං නාම සියා කථං අඤ්ඤ

---

* ලිඟ-නාම-පාටිපදික-යනු සමානාර්ථබව කච්චායනභෙද ටීකාවෙහි
“ලිඞ්ගනාම පාටිපදිකසද්දානං සමානත්ථා තෙනවුත්තං ලිඞ්ගංනාමන්ති විඤ්ඤෙය්‍යන්ත්‍යාදි—නාමලිඞ්ග පාටිපදිකසද්දානං සමානභාවං දස්සෙන්තො මායවරියො
“ලීනං අපාකටං අඞ්ගං ලීනං ගමයතීති වා
ලිඞ්ගං නාමන්ති විඤ්ඤෙය්‍යං නාමං ලිඞ්ගන්ති සදිසං”-න්‍යාදිමාහ.

ම සද්දා විරුද්ධානං තෙසං එකත්ථ සමාවෙසො භවති තස්මා යස්ස කස්ස චි අත්ථස්ස අවිසදාකාරවොහාරෙ ඉත්ථිලිඞ්ගං විසදාකාරවොහාරෙ පුල්ලිඞ්ගං උභයමුත්තාකාරවොහාරෙ නපුංසකලිඞ්ගන්ති වෙදිතබ්බන්ති. ”

මේ ත්‍රිවිධාකාර ව්‍යවහාරය තනි තනි පදයන්ගේ වශයෙන් නොව ඝාදිප්‍රබන්ධයාගේ වශයෙන් සිද්ධ නමුදු සමුදායවබැවින් තනි තනි පදයාගේද අවිසදාකාරාදි ව්‍යවහාරත්‍රය සිද්ධවන්නේමය.

තවද අවිසදාකාරාදි අර්ථයන් වාචකවූ ව්‍යවහාරයන් (ශබ්දයන්) ස්ත්‍රීලිංගාදිය යයිද සමහරෙක් කියත් නමුදු එය නොගතයුතු බව කියන ලදී—ඉදින් අවිසදාකාර අර්ථයන් වාචකවූ ව්‍යවහාරය ස්ත්‍රීලිංගික වියයුතුනම් මාතු ගාම කලත්‍ර යනාදි ශබ්දයන්ද ස්ත්‍රීලිංගික විය යුතු වෙත්, ඒ අර්ථයන් අවිසදාකාර බැවිනි.

එසේම විසදාකාර අර්ථයන් වාචකවූ ශබ්දය හෙවත් ව්‍යවහාරය පුල්ලිංගික විය යුතුනම් දෙවතා, සද්ධා, සඤ්ඤා යනාදි ව්‍යවහාරයන්ද පුල්ලිංගික විය යුත්තාහුය, ඒ අර්ථයන් විසදාකාර බැවිනි.

උභයමුක්තාකාරාර්ථයන් වාචකවූ ව්‍යවහාරයන් නපුංසකලිංගික වියයුතුනම් (උභයමුක්තාකාරාර්ථයන්ගේ නියමයක් නැතිහෙයින්) තිණ, රුක්ඛ, යනාදියෙහි ලිඟ වචනද විරුද්ධවන්නේය—තවත්, සාරිපුත්ත මොග්ගල්ලායන සාවකයුග යනාදිය නපුංසකලිංගික බැවින් ඒ අර්ථයන්ගේද උභයමුක්තාකාරත්වයක් කියන ලද්දේනම් වන්නේය-

එකම සඤ්ඤායද සඤ්ඤා, පඤ්ඤා, පඤ්ඤා, පජානනා, අමොහො, යනාදි වශයෙන් තුන් ලිඟුයෙන් නොකිය හැකි වන්නේය—එහෙයින් පසුව කී ක්‍රමය නොගත යුතුබව හා මුල කී ක්‍රමයම ගතයුතු බව අග්ගවංසාචාර්‍ය්‍යයන් විසින් කියන ලදී.

ලොකයෙහි වනාහි ස්ත්‍රීන්ගේ හෙළීම ශරීරය විසදය, ඌඩී ශරීරය අවිසදය, උරමාංසයද අවිසදය, ගමනාදි ඉරියව්ද අවිසදය, ස්ත්‍රීහු යන්නීද අවිසදව යන්නිය-සිටින්නීද, සයනය කරන්නීද, ඉන්නීද, කන්නීද, අනුභවකරන්නීද, අවිසදවමය-අවිසදවූ ලෙස ඉරියව් ආදිය පවත්වන්නාවූ පුරුෂයෙක්ද දුටුකල්හි මොහු ස්ත්‍රියෙක් මෙනැයි ලෝකයාද කියත්-මෙසේ හෙයින් යම්සේ ස්ත්‍රීහු බොහෝ සෙයින් අවිදාකාර ඇත්තීද එසේම සවිඤ්ඤාණකවූ හෝ අවිඤ්ඤාණකවූ හෝ අර්ථයන්හුගේ අවිසදාකාරවූ යම් ව්‍යවහාරයෙක් ඇත්තේද ඒ ස්ත්‍රීලිඟුනම් වන්නේය-ඒ මෙසේය කඤ්ඤා, දෙවතා, සද්ධා, රත්ති, ඉත්ථී, යාගු, වධූ යනාදියයි.

පුරුෂයන්ගේ අධඃශරීරය අවිසදය ඌර්ධ්වශරීරය විසදය උරමාංස යද විසදය ගමනාදියද විසදය පුරුෂයෝ යන්නාහුද විසදව යෙත් සිටින්නාහුද ශයනය කරණණාහුද ඉන්නාහුද කන්නාහුද අනුභවකරණ්ණාහුද එසේමය-විසද ලෙස ඉරියව් ආදිය පවත්වන්නාවූ ස්ත්‍රීන් දුටු කල්හි මැ පුරුෂයෙක් මෙනැයි ලොකයාද කියත්. මෙසේහෙයින්, යම්සේ පුරුෂයෝ බොහෝසෙයින් විසදාකාර ඇත්තාහුද, එසේම සවිඤ්ඤාණකවූ හෝ අවිඤ්ඤාණකවූ හෝ යම්කිසි අර්ථයක්හුගේ යම් ව්‍යවහාරයෝ බොහෝ සෙයින් විසදාකාර වූවාහුද ඒ ව්‍යවහාරයෝ පුල්ලිඟුනම් වෙත්—ඒ මෙසේය—පුරිසො, මාතුගාමො, ඔරොධො, ආපො, රුකෙඛා, මොංහො, සත්‍ථා, යන මේ ආදියයි.

යම්සේ නපුංසකයෝ උභයමුක්තාකාර ඇත්තාහුද, එසේම සවිඤ්ඤාණකාදී යම්කිසි අර්ථයක්හුගේ යම් ව්‍යවහාරයෝ උභයමුක්තාකාර ඇත්තාහුද ඒ නපුංසක ලිඟුනම් වෙත්—ඒ මෙසේය, චිත්තං, රූපං, ඉත්‍ථාගාරං, කලත්තං, නාටකං, රතනං, ඤාණං අඞ්, ආයු, යන මේ ආදියයි.

මෙසේ සියළුම නාමික පදයන්ගේ සඞ්දිප්‍රබන්ධ නිශ්‍රිතවූ අවිසදාකාර ව්‍යවහාරාදිභාවයෙන් ස්ත්‍රීලිඟාදිභාවය වන හෙයින් ගොශබ්දවයගේද සඞ්දිප්‍රබන්ධ සංඛ්‍යාත නාමික පදමාලා නිශ්‍රිතවූ අවිසදාකාර ව්‍යවහාරාදිභාවයෙන් යථාක්‍රමයෙන් ස්ත්‍රීලිඟාදිත්වය දත යුත්තේයි.

ස්ත්‍රීලිඟික ශබ්ද කාණ්ඩයයි.

NOUNS ENDING IN අ. (A) NEUT. *Chitta.*

1. අකාරන්ත නපුංසකලිඞ්ගො චිත්තසද්දො.

එකවචන.	බහුවචන.
ප...චිත්තං	චිත්තා, චිත්තානි
ආ...(හෙ) චිත්ත, චිත්තා	(භව:) චිත්තා, චිත්තානි
දු...චිත්තං,	චිත්තෙ, චිත්තානි
ත...චිත්තෙන	චිත්තෙභි, චිත්තෙහි
ක...චිත්තෙන	චිත්තෙභි, චිත්තෙහි
ච...චිත්තාය, චිත්තස්ස	චිත්තානං
ප...චිත්තා, චිත්තම්හා, චිත්තස්මා,	චිත්තෙභි, චිත්තෙහි
ඡ ..චිත්තස්ස	චිත්තානං
ස...චිත්තෙ, චිත්තම්හි, චිත්තස්මිං	චිත්තෙසු.

පුඤ්ඤ පාප ඵල රූප සාධනං සොත ඝාන සුඛ දුක්ඛ කාරණං
දාන සීල ධන ඣාන ලොචනං මූල කූල බල ජාල මඞ්ගලං.

නලිනලිඞ්ග මුඛ[1]ඞ්ග ජල[2]ම්බුජං පුලින ධඤ්ඤ හිරඤ්ඤ පදු[3]මතං
පදුම පණ්ණ සුසාන වනා[4]යුධං හදය චීවර වත්ථ කුලි[5]ස්සං.

නයන වදන යානො[6]දන සොපාන පානං
භවන භුවන ලොහා[7]ලාත තුණ්[8]ඩ පීඨං,
කරණ මරණ ඤාණා[9]රම්මණා[10]රඤ්ඤ තාණං,
තගර නගර තීරච්ඡත්ත ජිද්ද[11]ද කානි.

ඉච්චාදයො චිත්ත සද්දාව.

"වත්තං වජ්ජං සඞ්ඛං වස්සං අගං පිඨං මාලං කණකං
තරණං සවණං පවනං ගමනං අම්බතං සකටං ආසනං උප්පලං
පුරං ඉච්චාදයොපි—ඉමානි චිත්තසද්දෙන සබ්බථා සදිසානි.

චම්මං වෙස්මං සම්මං-ඉමානි එකධා භිජ්ජන්ති.
කම්මං ථාමං-ඉති ඉමානි අනෙකධා භිජ්ජන්ති."

පුඤ්ඤශබ්දය පටන් පුර ශබ්දය දක්වා මෙහි දක්වනු ලැබූ ශබ්දයෝ සර්වප්‍රකාරයෙන්ම චිත්ත ශබ්දය හා සදෘශ නමුදු චම්ම වෙස්ම සම්ම යන ශබ්ද තුනෙහි සප්තමී එකවචනස්ථානයෙහි "චම්මනි වෙස්මනි සම්මනි" කියාත් රූප තුනක් ඇති බැවින් ඒ ශබ්ද තුන

එකප්‍රකාරයකින් විතතශබ්දය හා විසදෘශශබ්දයෝය—කම්ම ථාම යන ශබ්ද දෙකෙහි තෘතීයා පචමී එකවචනස්ථානයන්හි කම්මුනා, කම්මනා, ථාමුනා. ථාමසා, යනුද චතුර්ථී ෂෂ්ඨී එකවචනස්ථානයන්හි කම්මුනො-ථාමුනො-යනුද, සප්තමී එකවචනස්ථානයෙහි කම්මනි යනුද දක්නාලද හෙයින් ඒ ශබ්දවය නොයෙක් ප්‍රකාරයෙන් විතත ශබ්දය හා විසදෘශයයි.

විතත ශබ්දයාගේ පදමාලාවෙහි ප්‍රථමා බහුවචනස්ථානයෙහි "විතතා" යනුද, ද්විතීයා බහුවචනස්ථානයෙහි "විතෙතත" යනුද, මූලනිරුක්තියෙහි නොදක්වන ලදී—එහෙත් "ඡ විතතා අබ්‍යාකතං" යනාදී විභඞ්ගපාළි ආදී ඒ ඒ තැන එබඳු පද දක්නා ලද හෙයින් බුද්ධප්පිය අග්ගවංස යනාදී ආචාර්‍ය්‍යවරයන් විසින් රූපසිද්ධි ආදියෙහි දක්වන ලදී—එසේවූ පද ගෙනවත් (ප්‍රථමා එකවචනයෙහි ඔකාරාන්තව සිටින්නාවූ) අකාරාන්ත පුල්ලිංගික ශබ්දයන්ගේ ප්‍රථමා ද්විතීයා බහුවචන රූප වැනි (ප්‍රථමා එකවචනයෙහිනිග්ගහීතාන්තව සිටින්නාවූ) අකාරාන්ත නපුංසක ලිංගික ශබ්දයන්ගේ ප්‍රථමා ද්විතීයා බහුවචන රූප පුල්ලිංගිකාදි පදයන් සමග සමානාධිකරණව යෙදුනාවූ තැන් පාළියෙහි දක්නා ලද්දාහුය—ඒනම් "චත්තාරො සතිපට්ඨානා—චත්තාරො සම්මප්පධානා—සඞ්ඛෙ මාලා උපෙනන්ති මං—යස්ස එතෙ ධනා අත්ථි ඉත්ථියා පුරිසස්ස වා—තීණි ඉන්ද්‍රියා—වෙ ඉන්ද්‍රියා-පඤ්ච විඤ්ඤාණා-චත්තාරො අඞ්ගෙ අධිට්ඨාය සෙම්වම්මිකාමත්ථකෙ-රූපා සද්දා ගන්ධා රසා ඵොට්ඨබ්බා-රූපෙ ච සද්දෙ ච අථො රසෙ ච—චක්ඛුඤ්ච පටිච්ච රූපෙ ච උප්පජ්ජති චක්ඛු විඤ්ඤාණං" යන මේ ආදියයි.

මෙහි "සතිපට්ඨානා" යනාදී පදයන් ලිඞ්ගවිපල්ලාස වශයෙන් දක්වන ලද්දාහු නොව "චත්තාරො" යනාදී පදයන්ම ලිඞ්ගවිපල්ලාස වශයෙන් දක්වනලද්දාහු යයි දත යුතුය—සතිපට්ඨානාදී ශබ්දයන්ගේ ප්‍රථමා එකවචනස්ථානයෙහි ඔකාරාන්තව සිටියාවූ පදයන් පාළියෙහි නොදක්නා ලදහෙයින් හා ප්‍රථමා එකවචනස්ථානයෙහි නිග්ගහීතාන්තවූ නපුංසක ලිඞ්ගික සතිපට්ඨානාදී ශබ්දයන් සමග "චත්තාරො" යනාදිය සමානාධිකරණභාවයෙන් යොදනු ලැබූ හෙයිනි.

"සතිපට්ඨානො ධම්මො-විතෙතා ධම්මො-විතතා ධම්මා" යනාදියෙහි සතිපට්ඨානාදී ශබ්ද ඔකාරාන්ත පුල්ලිඞ්ගිකව තිබියදී "සතිපට්ඨානාදී ශබ්දයන්ගේ ප්‍රථමා එකවචනයෙහි ඔකාරාන්තව සිටින්නාවූ රූප පාළියෙහි නොදක්නාලද" යයි කුමක් නිසා කියන ලදද? එසේව (නොහොත්) "සතිපට්ඨානො ධම්මො" යනාදී

යෙහි සතිපට්ඨානො යනාදිය ලිඟ විපල්ලාස වශයෙන් නම් "චත්තාරො සතිපට්ඨානා" යනාදියෙහිද "සතිපට්ඨානා" යනුත් ලිඟවිපල්ලාස වශයෙන් යයි කල්පනා කටයුතු නොවේද? යත්—

එසේ කල්පනා නොකට යුතුය—"සතිපට්ඨානො ධම්මො-චිත්තො ධම්මො" යනාදියෙහි "සතිපට්ඨානො-චිත්තො" යනු ලිඟ විපල්ලාස වශයෙන් යයි නොගතයුතු හෙයිනි—එහි "ධම්ම" ශබ්දය සමග යෙදීම පිණිස "ධම්මො" යනු අපෙක්ෂා කොට "සතිපට්ඨානො-චිත්තො" යි බුදුරජානන්වහන්සේ වදාළේය—(අන්‍යශබ්දයක් අපෙක්ෂා කිරීමෙන් මිස) කෙවලවූ "සතිපට්ඨාන-චිත්ත" යන ශබ්දයෝ ප්‍රථමා එකවචනයෙහි නිග්ගහීතාන්තව මුත් ඔකාරාන්තව සිටියාවූ තැන් පාළියෙහි නැත්තාහුය—"චිත්තො ගහපති" යන්නෙහිද (පුල්ලිඟිකවූ) "ගහපති" ශබ්දය අපෙක්ෂා කොට විඤ්ඤාණයෙහි පවත්නා චිත්තශබ්දය නාම ප්‍රඥප්ති වශයෙන් පුද්ගලයා කෙරෙහි ආරෝපනය කොට පුද්ගල වාචක කිරීමෙන් "චිත්තො ගහපති" යි කියන ලද්දේය—විඤ්ඤාණ සංඛ්‍යාත චිත්ත වාචක කල්හි චිත්තං කියාම වන්නේය—එසේ හෙයින් "චිත්තො ගහපති-චිත්තං ඉති" යනාදියෙහි ලිඟවිපල්ලාසය කැමති නොවිය යුතුය—චිත්තශබ්දය සාපෙක්ෂ හෙයිනි.

මෙසේම "සතිපට්ඨානො ධම්මො-චිත්තො ධම්මො-චිත්තා ධම්මා" යනාදියෙහිද ලිඟ විපල්ලාසය කැමති නොවිය යුතුය—"චත්තාරො සතිපට්ඨානා" යනාදියෙහි වනාහි යම් පදකෙණෙක් කාරණකොට ගෙණ සතිපට්ඨානාදි ශබ්ද පුල්ලිඟික විය යුත්තාහු වෙත්ද (සතිපට්ඨානාදි ශබ්දයන් විසින් අපෙක්ෂා කරණු ලබන්නාවූ) එසේවූ (පුල්ලිඟික) පදයෝ යථොක්ත උදාහරණවල නැතිහෙයින් "චත්තාරො" යනාදී පදයන්ම පෙරලා "චත්තාරි-සඛානි-එතානි" යි නපුංසකලිඟික වශයෙන් ගෙණ සතිපට්ඨාන සම්මප්පධාන මාල යනාදී පදයන් හා යෙදිය යුත්තාහුය.

තවද "සඛෙ මාලා උපෙනන්ති මං" යන උදාහරණයෙහි "මාලා" යනු ස්ත්‍රීලිඟිකයයි ගෙණ පුල්ලිඟිකවූ "සඛෙ" යන්න ස්ත්‍රී ලිඟික වශයෙන් "සඛා" යි පෙරලා "සඛා මාලා" යි ගෙණ සමහරෙක් අර්ථ බණනා නමුදු විසදෘශ ලිඟික පදයන් වෙනත් වදාළ තැන් ඇති හෙයින් එසේ යොදා අර්ථ බිණීම නොගත යුතු බවද—පුල්ලිඟිකවූ "සඛෙ" යන්න "සඛානි" යි නපුංසක වශයෙන් පෙරලා නපුංසක ලිඟිකවූ "මාලා" යනු සමග යොදා "සඛානි මාලානි" යන්නෙහි යම් අර්ථයක් ඇත්තේද ඒ අර්ථය එහිද ගතයුතු බවද කියන ලදී.

"මාල" ශබ්දය ස්ත්‍රීනපුංසකවශයෙන් ද්විලිඞ්ගිකව තිබියදී මෙහිදී ස්ත්‍රීලිඞ්ගත්වය කල්පනාකිරීමෙහි වරද කවරේද? යත්-

ස්ත්‍රීලිඞ්ගිකවූ ශබ්දයන් පුල්ලිඞ්ගික සර්වනාමපදයන් සමග සමානාධිකරණ බව නොවන,හෙයින් හා නපුංසක ලිඞ්ගික ශබ්දයන් පුල්ලිඞ්ගික සර්වනාමශබ්දයන් සමග සමානාධිකරණබව වනහෙයින් යයි කියනලදී—එසේහෙයින් "ඒතෙ ධනා" යනාදි ප්‍රයොගයන්ද පාළියෙහි ඇත්තාහුය.

තවද "එතෙ ධනා" යනාදි උදාහරණවලද එතෙ යනාදි (පුල්ලිඞ්ගික) සමානාධිකරණ පදයන් හා යොදනුලැබූහෙයින් "ධනා" යනාදියද විපල්ලාසවශයෙන් පුල්ලිඞ්ගිකම නොවේද? යත්-නොවේය ධනශබ්දය නපුංසක ලිඞ්ගිකමය, ඉදින් පුල්ලිඞ්ගිකනම් "එසො" යනාදි සමානාධිකරණපදයන් හා යොදනුලැබූවාවූ "ධනො" යනාදි රූපයන්ද විය යුත්තාහුය—ධනශබ්දයාගේ එසේවූ රූපයන් පෙළෙහි නැති බැවින් ධනශබ්දයද ඉන්ද්‍රිය විඤ්ඤාණ යනාදි ශබ්දයන් මෙන් නපුංසක ලිඞ්ගිකමය-යනුද, මේ දක්වනු ලැබූ ක්‍රමය ප්‍රථමා බහුවචනයෙහිමය-යනුද, සමහර නපුංසකලිඞ්ගිකරූපයො (පුරුෂවේෂධාරී නපුංසකයන් මෙන්) විසමාකාර ඇතිව පුල්ලිඞ්ගික රූපයන් මෙන් වනලදුව පුල්ලිඞ්ගික රූපයන් සමග හැසිරෙත්ය යනුද ශබ්දනීතියෙහි කියනලදී.

තවද "චිත්තො ගහපති-චිත්තා ඉත්ථී" යනාදියෙහි (චිත්තං එතස්ස අත්ථීති චිත්තො-චිත්තං එතස්සා අත්ථීති චිත්තා යී) අස්සත්ථිතද්ධිතවශයෙන් "සද්ධො-සද්ධා" යනු මෙන් ගතයුතු බැවින් ලිඞ්ගවිපල්ලාසය නොකමැති විය යුතුය "සපතිට්ඨානො ධම්මො-චිත්තො ධම්මො-චිත්තා ධම්මා" යනාදියෙහි මෙබඳු අර්ථයක් නොගතයුතු බැවින් "සතිපට්ඨානං ධම්මො-චිත්තා ධම්මො-චිත්තානි ධම්මා" යී කියයුතු තන්හි ලිඞ්ගවිපල්ලාස වශයෙන් "සතිපට්ඨානො ධම්මො-චිත්තො ධම්මො-චිත්තා ධම්මා" යී කියන ලද්දේද් යයි යමෙක් කියේ වීනම් කෙසේද? යත්—ඒ එසේ නොවේය "චිත්තො ගහපති-සතිපට්ඨානො ධම්මො" යනාදියෙහි "චිත්ත-සතිපට්ඨාන" යනාදි ශබ්ද "ගහපති-ධම්ම" යනාදි ශබ්දයන් අපෙක්ෂාකිරීම්වශයෙන් පුල්ලිඞ්ගිකවන ලද්දාහුය—ඒ එසේමතුයි, ඒකාන්ත නපුංසකලිඞ්ගිකවූ "පුඤ්ඤ" ශබ්දය "අභිසංඛාර" ශබ්දය අපෙක්ෂාකිරීම් වශයෙන් "පුඤ්ඤො අභිසංඛාරො" යී පුල්ලිඞ්ගික වන ලද්දේය—එසේම ඒකාන්ත නපුංසක ලිඞ්ගිකවූ "පදුම-මඞ්ගල" යනාදි ශබ්ද අන්‍යාර්ථාපෙක්ෂා වශයෙන් "පදුමො භගවා-පදුමා දෙවී-මඞ්ගලො භගවා-මඞ්ගලා ඉත්ථී" යී පුම්ස්ත්‍රීලිඞ්ගික වන ලද්

දැහුය-ඒකාන්ත පුල්ලිඞ්ගිකවූද (භක්ෂ්‍යවිශෙෂ වාචකවූ) "කාලාවක, ගාංගෙය්‍ය" යනාදි ශබ්ද, කුල ශබ්දය අපෙක්ෂාකිරීම්වශයෙන් "කාලාවකංච ගාංගෙය්‍යං" යී මේආදිවශයෙන් නපුංසක ලිඞ්ගික වන ලද්දැහුය.

මෙසේ ඒ ඒ අර්ථයන් අපෙක්ෂාකිරීම් වශයෙන් ඒ ඒ ප්‍රකෘති ලිඞ්ගයන් නසා අන්‍ය ලිඞ්ගයන් පිහිටුවා නිර්දෙශයන් දක්නා ලද්දැහුය—ඒසියල්ලම තද්ධිත ප්‍රත්‍යයවශයෙන් අන්‍ය ලිඞ්ගික වූවාහු නොව "ගහපති, ධම්ම" යනාදි ශබ්දයන් අපෙක්ෂාකිරීම් වශයෙන්මය.

එහෙයින්

"පෙතානි භොන්ති පුත්තානි ඛාදමානා තුවං පුරෙ,
......................................සිවිපුත්තානි චච්ඡය."
"එවං ධම්මානි සුත්වාන විප්පසීදන්ති මාණවා."

යනාදි තන්හිම ලිඞ්ගවිපල්ලාසය කැමති විය යුතුද—කුමක්හෙයින්ද "පුත්ත, ධම්ම" යන ශබ්දයො අන්‍යශබ්දයන් අපෙක්ෂා නොකරණ හෙයිනි.

"චිත්තො ගහපති-චිත්තා ඉත්ථී—සතිපට්ඨානා ධම්මා-චිත්තා ධම්මා-චිත්තා ධම්මා" යනාදීයෙහි "චිත්ත" ශබ්දාදීහු "ගහපති, ධම්ම" යනාදි ශබ්දයන් අපෙක්ෂා නොකරණ බැවින් චිත්තශබ්දාදීන්ගේ ලිඞ්ගවිපල්ලාසභාවය නොකමැති විය යුතුය යනු මෙහි නිශ්චයයි.

NOUNS ENDING IN අ. (A) NEUT. *Mana.*

2. අකාරන්ත නපුංසකලිඞ්ගො මනසද්දො.

එකවචන.	බහුවචන.
ප...මනං	මනා, මනානි
ආ...(හෙ)මන, මනා	(භො:) මනා, මනානි
දු...මනං,	මනෙ, මනානි
ත...මනසා, මනෙන	මනෙභි, මනෙහි
ක...මනසා, මනෙන	මනෙභි, මනෙහි
ච...මනසො, මනස්ස	මනානං
පං...මනසා,* මනා, මනම්හා, මනස්මා	මනෙභි, මනෙහි
ඡ...මනසො, මනස්ස	මනානං
ස...මනසි, මනෙ, මනම්හි, මනස්මිං	මනෙසු.

මනං සිරං උරං තෙජං රජං ඔජං වයං පයං,
යසං තපං වචං චෙතං එවමාදි මනො ගණො.

මනො තමො තපො තෙජො වචො ඔජො උරො සිරො,
රජො යසො පයො චෙතො සරො වාසො වයො අයො.

†(ජලාසයෙ සරො හොති අයො ලොහෙ යදක්ඛයෙ,
වයො ඛෙදයෙ පටෙ වාසො මනෙ චෙතො මනාදිසු.)

---

* "මනසා" යන්නු පඤ්චමියෙහි බාලාවතාරයෙහි මුත් රූපසිද්ධි ශබ්දනීති ආදියෙහි නොදක්වන ලදී.

† මේ ගාථාවට ටීකාකරන්නාවූ වාචිස්සරසංඝරාජමහාසාමිපාදයන්විසින් පදසාධනී ටීකාවෙහි–"සරො සරසද්දො ජලාසයෙ හොති ච, අයො අයසද්දො ච කාළලොහෙ හොති ච, යදි අක්ඛයෙති පදච්ඡෙදො-වයසද්දො අක්ඛයෙ සරීරාවත්ථායං හොති ච, වාසසද්දො පටෙ චෙතසද්දො මනෙ හොති ච, මනාදිසු ඛෙදයෙති ගාථායත්ථො–අනෙන වචනච්ඡෙදෙන සරසද්දො බාණෙපි වයසද්දො ඛයෙපි අයසද්දො සුඛෙපි වාසසද්දො නිවාසනට්ඨානෙපි චෙතසද්දො රජ්ජුසුපි වත්තන්තෙ තත්ථ වත්තමානා සරාදයො සද්දා මනාදිසු න පඨියන්තීති දස්සෙති—කච්චායනෙ හි "එවං වචො වයො තෙජො තපො චෙතො තමො යසො අයො පයො සරො සිරො උරො රහො අහො පිවා" ති අහ රහ සද්දාපි මනාදිසු පඨිතා—ඉධ පන අහසද්දස්ස මනාදිසු කාරියා සම්භවා රහසද්දස්ස ච නිපාතත්තා මනාදිසු න පඨිතා"—. යන්නු දක්වන ලදී.

“ මනොගණ ” ශබ්ද ලක්ෂණ කෙසේද? යත්.

යම් ශබ්දකොට්ඨාසයක් නා-ස-ස්මිං-යන විභක්තිවිෂයෙහි පිළිවෙළින් සා-සො-සි-යන අක්ෂරයන් කෙළවරකොට ඇති රූපයන් ඇත්තේ වේද (ඒනම් මනසා-සිරසා-මනසො-සිරසො-මනසි-සිරසි-යනාදියයි.)

එසේම සමාසාන්ත තද්ධිතාන්තවූ කල්හි මධ්‍යයෙහි ඔකාර සහිතවූ රූප ඇත්තේ වේද, (ඒනම්, මනොධාතු-මනොමයං-යනාදියයි) ක්‍රියාපදයන් සමග යෙදීමෙහිදී ඔකාරාන්ත උපයොගවචන ඇත්තේ වේද (කස්සපස්ස වචො සුත්වා—සුත්වාන මුනිනො වචො යනාදියෙහි වූ වචො යනාදියයි) මෙසේවූ ශබ්ද කොටස මනොගණ නාම් වේ.

එහෙයින් කීහ.

“යෙ තෙ නා ස ස්මිං විසයෙ සා සො ස්‍යන්තා භවන්ති ච,
සමාස තද්ධිතන්තෙ තු මජ්ඣොකාරා භවන්ති හි.

සො[1]කාරන්තු[2]පයොගා ච ක්‍රියා යොගම්හි දිස්සරෙ,
එවං විධා ච තෙ සද්ද ඤෙය්‍යා මනො ගණෙ ඉති.

මනසා මනසො මනසි ඉති ආදි වසා ඨිතා,
සා සො ස්‍ය[3]න්තානි රූපානි වුත්තා මනො ගණෙ ඉති.

මනො ධාතු වචො රස්මි පයො වුඩ්ඪො තපොධනො,
තෙජොධාතු තමොනාසො යසොභොගසමප්පිතො.

ඡන්දෙ භගො අහො රත්තං මනොමය [4]මයොමයං,
එවංවිධො විසෙසො යො ලක්ඛණං තං මනොගණෙ.

වචො සුත්වා සිරො ඡින්දි අයො කන්තති ඉධපි,
උපයොගස්ස සංසිද්ධි ලක්ඛණං තං මනොගණෙ.

මනොගණෙ වුත්තනයො ඉත්ථී ලිංගෙ න ලබ්භති,
පුනපුංසක ලිංගෙසු ලබ්භතෙව යථාරහං.”

ගණන් වශයෙන් මනොගණ ශබ්ද කෙතෙක්ද? යත්.
බාලාවතාරයෙහි–“මනං සිරං......එවමාදි මනොගණෙ”—
යන්නෙන් මනොගණය කියන ලදී.

රූපසිද්ධියෙහි හා සූත්‍ර නිර්දේශයෙහි,

“මනො වචො වයො තෙජො තපො චෙතො තමො යසො,
අයො පයො සිරො ඡන්දො සරො උරො රහො ථාමො.
ඉච්චේවමාදයො සද්දා මනොගණාති දීපිතා.”—යනුද,

ශබ්දනීතියෙහි මීට වෙනස්ලෙස ගණන් වශයෙන්ම "[1]මන [2]වච [3]වය [4]තෙජ [5]තප [6]චෙත [7]තම [8]යස [9]අය [10]පය [11]සිර [12]ඡන්ද [13]සර [14]උර [15]රහ [16]අහ*" යන මේ ශබ්ද සොළස මනොගණයයි කියන ලදී.

ඒ මෙසේය.

"මනො වචො වයො තෙජො තපො තෙජො තමො යසො
අයො පයො සිරො ඡන්දො සරො උරො රහො අහො—
ඉමෙ සොළස" යනුයි.

මේ ශබ්දයන් අතුරෙන් (3) "වය" ශබ්දය තෙම පරිහානි වාචක කල්හි මනොගණයෙහි ඇතුලත් නොවන බව හා ආයු කොටස් වාචක කල්හි මනොගණයෙහි ඇතුලත් බවද-එසේම (6) "චෙතො" ශබ්දය ප්‍රඥප්තිවාචක කල්හි මනොගණයෙහි ඇතුලත් නොවන නමුදු චිත්තවාචක කල්හි ඇතුලත් බවද—(13) "සර" ශබ්දයත් උසු ශබ්ද ශර වන අකාරාදිස්වර යන මේ අර්ථයන් වාචක කල්හි මනොගණයෙහිම ඇතුලත් නැති නමුදු තටාක වාචක කල්හි මනොගණයෙහි ඇතුලත් බවද දතයුතුයි.

එහෙයින්ම ශබ්දනීතියෙහි

"වයො ඉති අයං සද්දො පරිහානි වාචකො චෙ පුරිසනයෙ සඞ්ගහං
"පවිට්ඨො, ආයුකොට්ඨාසවාචකො චෙ මනොගණපක්ඛිකත්තා පුරි
"සනයෙ එකදෙසෙන පවිට්ඨො—චෙතො ඉති සද්දො යදි පණ්ණ
"ත්තිවාචකො පුරිසනයෙ සඞ්ගහං පවිට්ඨො—යදි පන චිත්තවාචකො
"මනොගණපක්ඛිකත්තා පුරිසනයෙ එකදෙසෙන පවිට්ඨො—
"සරො ඉති අයං සද්දො උසුසද්ද සරවන අකාරාදි සරවාචකො චෙ
"පුරිසනයෙ සඞ්ගහං පවිට්ඨො—රහදවාචකො චෙ මනොගණපක්ඛි
"කත්තා පුරිසනයෙ එකදෙසෙන පවිට්ඨො"—යනු කියන ලදී.

තවද මනශබ්දයාගේ ප්‍රථමා එකවචනයෙහි "මනො" යන රූපයක් පාළියෙහි බොහෝ තැන්වල දක්නා ලද්දේය. එය (අකාරාන්ත පුල්ලිඟික බුද්ධශබ්දයෙහි "බුද්ධො" යන පදය හා සමාන නමුදු) නපුංසකලිඟික රූපයක් යයි සමහරු කියත්-මනශබ්දය පුං නපුංසක වශයෙන් ද්විලිඟික බැවින් "මනො" යනු නපුංසකලිඟික රූපයක් නොව පුල්ලිඟික රූපයක්මයයි දත යුතුය-ඉදින් "මනො" යනු නපුංසකලිඟික වන්නේ නම් "වචො, වයො" යනාදියද

---

* අහ ශබ්දයාගේ සප්තමී එකවචනස්ථානයෙහි මනශබ්දයෙහි පදයන් මෙන් පමණක් නොව "අහනි, අහු," කියාද පදද්වයක් විය යුතුයි.

(තත් සදෘශ බැවින්) පුල්ලිඞ්ගික විය යුතුය—එපමණකුත් නොව පාළියෙහි "මනො අනිට්ඨො, කායො අනිට්ඨො, මනො දුක්ඛො කායො දුක්ඛො"--යනුද "මනො නිච්චො වා අනිච්චො වාති? අනිච්චො භන්තෙ"—යනුද, මේආදීවූ බොහෝ පුල්ලිඞ්ග ප්‍රයෝගයන් දක්නාලැබුය-එහෙයින් "මනො" යනු ඒකාන්තයෙන්ම පුල්ලිඞ්ගිකයයි කියාම හැඟේ—ඉදින් නපුංසක ලිඞ්ගික වූයේනම් ඒ හා සමානාධිකරණවූ "අනිට්ඨො-දුක්ඛො" යනාදිවූ නොයෙක් සිය ගණන් පදයන්ද නපුංසක ලිඞ්ගික වන්නාහුය-ඒ පදයෝ නපුංසකලිඞ්ගික නොව අභිධෙය්‍ය ලිඞ්ගානුවර්තීවූ වාච්‍ය ලිඞ්ගිකයෝය—එහෙයින් "මනො" යනුද පුල්ලිඞ්ගිකයයි කල්පනා කටයුතුයි.

තවද, ඉදින් "මනො" යනු පුල්ලිඞ්ගික රූපයක් නොවේනම්

"ගරු චෙතියපබ්බත වත්තනියා පමදා පමදා විමදං සමණං,
සුනිසම්ම අකාසි සිතං පත්තං පතිතං අසුභෙසු මුනිස්ස මනො."

යන මේ ගාථාවෙහි "මනො" යනු හා සමානාධිකරණවූ "පතිතං" යන පදය කුමක් නිසා නපුංසකලිඞ්ගිකත්වයෙන් දක්වන ලද්දේද? මෙසේ ශබ්දාන්තර සන්නිධාන වශයෙන් "මනො" යනු නපුංසක ලිඞ්ගිකයයි හැඟෙන්නේ නොවේද? යත්,

එසේ නොහැඟෙයි-සමානාධිකරණ පදයා සමහර තැනෙක්හි ලිඞ්ගවිශෙෂය ප්‍රකාශ නොකෙරේ—ඉදින් සමානාධිකරණ පදයො හැමතැන්හිම ලිඞ්ග විශෙෂය ප්‍රකාශ කෙරෙත්නම් "චත්තාරො ඉන්ද්‍රියානි" යන්නෙහි වූ "චත්තාරො" යන සමානාධිකරණ පදයාවිසින් "ඉන්ද්‍රියානි" යනු පුල්ලිඞ්ගික කටයුතුය—එසේ නොහැකිය ඉන්ද්‍රියශබ්දයනම් ඒකාන්තයෙන්ම නපුංසකලිඞ්ගිකය—ඉදින් "පතිතං මනො" යන්නෙහි වූ "පතිතං" යන සමානාධිකරණපදය නිසා "මනො" යනු නපුංසක ලිඞ්ගිකයයි සිතිය හැක්කේනම් "චත්තාරො ඉන්ද්‍රියානි" යන්නෙහි වූ "චත්තාරො" යන සමානාධිකරණපදය නිසා "ඉන්ද්‍රියානි" යනු පුල්ලිඞ්ගික යයිද සිතිය යුතු වන්නේය—එහෙයින් එසේ නොසිතිය යුතුය.

සමානාධිකරණපදයනම් සමහර තැනෙක්හි ප්‍රධාන ලිඞ්ගයට අනුව පවත්නේය. සමහර තැනෙක්හි එසේ නොපවත්නේය-එහෙයින් සමානාධිකරණපදයතෙම ලිඞ්ගවිශෙෂ ද්‍යෝතනයෙහි ඒකාන්ත ප්‍රමාණ නොවේ—රූප විශෙෂයම ප්‍රමාණයි.

එහෙයින් බාලාවතාරයෙහිද,

"විසෙසෙස්ස දිස්සමානා යා ලිඞ්ගසංඛ්‍යා විභත්තියො,
තුල්‍යාධිකරණෙ භියෙය්‍යා කාතබ්බා තා විසෙසනෙ."

යන්නෙන් විශෙෂ්‍ය පදයෙහි දක්නාලද ලිඟ සංඛ්‍යා විභක්තීහු සමානාධිකරණ විශෙෂණයෙහිද බොහෝසෙයින් යෙදිය යුත්තාහුයයි කියන ලදී.

එසේහෙයින් "චත්තාරො ඉන්ද්‍රියානි" යන්නෙහි "චත්තාරො" යනු පුල්ලිඟිකය "ඉන්ද්‍රියානි" යනු නපුංසක ලිඟිකය—එසේම "මනොපතිතං" යන්නෙහිද "මනො" යනු පුල්ලිඟිකය "පතිතං" යනු නපුංසකලිඟිකයයි දතයුතුයි—පුල්ලිඟිකවූ මනොගණශබ්දයන්ට සමානාධිකරණවූ පදයන් සමහර තැනෙක්හි නපුංසකවශයෙන්ම යෙදිය යුතුබව පූර්වාචාර්‍ය්‍යවරයන් විසින්ද

* "සද්ධම්ම තෙජ විහතං විලයං ඛණෙන,
වෙනෙය්‍යසත්තහදයෙසු තමො පයාති."

"දුක්ඛං වචො එතස්මින්ති දුබ්බචො-"
"අවනතං සිරො යස්ස සො අවනතසිරො-"

යනාදියෙන් හඟවනලද බවද, "තමො-වචො-සිරො" යනාමේ රූපයො නපුංසකලිඟික යයි හැඟවීම පිණිස යථෝක්ත පාඨයන් රචනාකළා නොව මනොගණයෙහි පැවති පුල්ලිඟිකවූ "තමො-වචො-සිරො යනාදි පදයන්ට (විපල්ලාස වශයෙන් සිටියාවූ) නපුංසකලිඟිකවූ සමානාධිකරණපදයන් ඇත්තාහු යයි ශ්‍රොතෘ ජනයාට හඟවනු පිණිස යොදනලද බවද දතයුතුයි—එහෙයින් අභිධර්ම විභාවිනී ටීකා සංවර්ණනාවෙහිද මෙසේ කියන ලදී.

"සුන්දරං මනො සුමනොති එත්ථ සුන්දරන්ති නපුංසකලිඟං,
"මනොති පුල්ලිඟං මනසද්දෙ පුමනපුංසකලිඟවසෙන විලිඟො,
"මනොති පුල්ලිඟං, මනන්ති නපුංසක ලිඟං—නනු මනොති පදං
"අපෙක්ඛිත්වා සුන්දරොති වත්තබ්බං? කස්මා එවමවත්වා සුන්දරන්ති
"වුත්තන්ති?—සච්චං සුන්දරන්ති පදං නපුංසකලිඟං මනොති පුල්ලි
"ඟෙන සමානාධිකරණං නොතීති විඤ්ඤාපනත්ථං සුන්දරං මනොති
"වුත්තන්ති—නහි අයමාචරියො සුන්දරන්ති සමානාධිකරණ
"පදෙන මනොති පදස්ස නපුංසකලිඟභාවවිඤ්ඤාපනත්ථං සුන්දරං
"මනොති සද්දුද්ධාරණං කරි-අථඛො? මනොගණෙ පවත්තානං
"පුල්ලිඟානං පයොගෙ නපුංසකලිඟභාවෙන පි සමානාධිකරණ
"පදානි කත්ථචි හොන්තීති දස්සනත්ථං එවං කරි" යනුයි.

---

* "වෙනෙය්‍යසත්තහදයෙසු සද්ධම්මතෙජවිහතං තමො විලයං පයාති"-යි විහතං යනු තමො යනුහා සමානාධිකරණව යොදන ලදී.

තවද කෙවලවූ පුනනපුංසක සංඛ්‍යාත විලිගික නමුදු වෙන ශබ්සඞ්ඛා සමාස වනලද්දවූ (අබ්‍යග්‍යසමන-බ්‍යාසතතමන-අලීනමන යනාදි) මන ශබ්ද ලිගත්‍රයෙහි වෙත්—අබ්‍යග්‍යසමනො-බ්‍යාසතතමනො-අලීනමනො—අබ්‍යග්‍යසමනා-බ්‍යාසතතමනා-අලීනමනා—අබ්‍යග්‍යසමනං-බ්‍යාසතතමනං-අලීනමනං-යනාදි වශයෙනි.

ලිගත්‍රයෙහි අබ්‍යග්‍යසමනසො-අබ්‍යග්‍යසමනසා-අබ්‍යග්‍යසමනසං—බ්‍යාසතතමනසො-බ්‍යාසතතමනසා-බ්‍යාසතතමනසං—අලීනමනසො-අලීනමනසා-අලීනමනසං—යනාදි වශයෙන්ද වරනගතුලැබේ.

NOUNS ENDING IN උ. (U) (OR අ. A) NEUT. *Gunawantu.*

උකාරනත (අථවා අකාරනත) නපුංසකලිගො
ගුණවනතු සද්දො.

එකවචන.	බහුවචන.
ප..ගුණවං, [ගුණවනතං]	ගුණවනතා, ගුණවනතානි
ආ..(හෙ)ගුණවං, ගුණව,ගුණවා	(භවා:)ගුණවනතා,ගුණවනතානි
දු...ගුණවනතං	ගුණවනෙත, ගුණවනතානි
ත...ගුණවතා, ගුණවනෙතන	ගුණවනෙතභි, ගුණවනෙතහි
ක...ගුණවතා, ගුණවනෙතන	ගුණවනෙතභි, ගුණවනෙතහි
ච...ගුණවතො, ගුණවනතස්ස	ගුණවතං, ගුණවනතානං
පං..ගුණවතා, ගුණවනතා, ගුණවනතම්හා, ගුණවනතස්මා	ගුණවනෙතභි, ගුණවනෙතහි
ඡ...ගුණවතො, ගුණවනතස්ස	ගුණවතං, ගුණවනතානං
ස...ගුණවති, ගුණවනෙත ගුණවනතම්හි,ගුණවනතස්මිං	ගුණවනෙතසු.

"එවං රුචිමං පාපිමං ගණවං එලවං යසවං සතිමං ගතිමං ඉඩ්ඩාදයොපි."

මෙහි ප්‍රථමා එකවචනස්ථානයෙහි "ගුණවනතං" යන රූපය මොග්ගල්ලායනවෘත්තියෙහි මුත් බාලාවතාර රූපසිද්ධි ශබ්දනීති ආදියෙහි නොදක්වන ලදී—ආලපන එකවචනස්ථානයෙහි "(හෙ) ගුණව" යන රූපය මුත් ඉතරවය අග්ගවංසාචාර්‍යයන්විසින් නොදක්වන ලද්දේ නමුදු පුල්ලිගික ශබ්දයෙහිදී "ගුණවා" යනු පමණක් කියන ලදී—පුල්ලිගික ශබ්දයෙහි මෙන්ම මෙහිද ප්‍රථමා

ආලපන බහුවචනස්ථානයන්හි "ගුණවන්තා" යනු නොදක්වන ලදී—තවද ප්‍රථමා ආලපන විතීයා බහුවචනස්ථානයන්හි "ගුණවන්ති" යන රූපයක් රූපසිද්ධි බාලාවතාර කච්චායනාදි කිසිම ප්‍රකරණක නොදක්වනලද්දේ නමුදු ශබ්දනීතියෙහි පමණක් දක්වනලදී—"නපුංසකෙ යොසු යොනම්හිභාවං" යන සූත්‍රයෙන් යො විභක්තීන්ට ඉකාරාදෙශ කොට පර නයනාදිය කිරීමෙන් සිද්ධකටයුතුබව හා "ගුණවන්ති කුලානි" යන උදාහරණයද කියන ලදී.

NOUNS ENDING IN අ. (A) NEUT. *Gacchanta.*

7. අකාරාන්ත නපුංසකලිඞ්ගො ගච්ඡන්තසද්දො.

එකවචන.	බහුවචන.
ප... ගච්ඡං, ගච්ඡන්තං	ගච්ඡන්තා, ගච්ඡන්තානි
ආ... (හෙ) ගච්ඡං, ගච්ඡ, ගච්ඡා	(භව:) ගච්ඡන්තා, ගච්ඡන්තානි
දු... ගච්ඡන්තං,	ගච්ඡන්තෙ, ගච්ඡන්තානි
ත... ගච්ඡතා, ගච්ඡන්තෙන	ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි
ක... ගච්ඡතා, ගච්ඡන්තෙන	ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි
ච... ගච්ඡතො, ගච්ඡන්තස්ස	ගච්ඡතං, ගච්ඡන්තානං
පං... ගච්ඡතා, ගච්ඡන්තම්හා ගච්ඡන්තස්මා	ගච්ඡන්තෙහි, ගච්ඡන්තෙභි
ඡ... ගච්ඡතො, ගච්ඡන්තස්ස	ගච්ඡතං, ගච්ඡන්තානං
ස... ගච්ඡති, ගච්ඡන්තෙ ගච්ඡන්තම්හි, ගච්ඡන්තස්මිං	ගච්ඡන්තෙසු.

"එවං චරන්තො අදන්ත විනයන්ත මහන්ත කරෙන්ත තිට්ඨන්ත ඉච්චාදයොපි."

මෙහි ප්‍රථමා එකවචනස්ථානයෙහි "ගච්ඡන්තං" යනු මුත් "ගච්ඡං" යන රූපයද—ආලපන එකවචනස්ථානයෙහි (හෙ) "ගච්ඡ" යනු මුත් "ගච්ඡං, ගච්ඡා" යන රූපවයද ශබ්දනීතියෙහි නොදක්වන ලදන—එසේම ආලපන එකවචනස්ථානයෙහි "ගච්ඡන්තා" යන්නක්ද බහුවචනස්ථානයෙහි "ගච්ඡා" යන්නක්ද දක්වනලදී.

තවද මහන්ත ශබ්දයත් ගච්ඡන්ත ශබ්දය හා සම වුවද එහි ප්‍රථමා තොම "මහං, මහා, මහන්තං—මහන්තා, මහන්තානි" කියා වේ—"බාරාණසී රජ්ජං නාම මහා" යනාදියෙහි මහා යනු නපුංසකලිඞ්ග ප්‍රථමා එකවචනයක් බැවිනි.

NOUNS ENDING IN ඉ. (I) NEUT. *Aṭṭhi.*

8. ඉකාරන්තො නපුංසකලිඞ්ගො අට්ඨිසද්දො.

එකවචන.	බහුවචන.
ප ..අට්ඨි*	අට්ඨීනි, අට්ඨී
ආ...(හෙ)අට්ඨි	(භවඃ) අට්ඨීනි, අට්ඨී
දු...අට්ඨිං	අට්ඨීනි, අට්ඨී
ත...අට්ඨිනා	අට්ඨීහි, අට්ඨීභි
ක...අට්ඨිනා	අට්ඨීහි, අට්ඨීභි
ච...අට්ඨිනො, අට්ඨිස්ස	අට්ඨීනං
පං...අට්ඨිනා,† අට්ඨිම්හා, අට්ඨිස්මා	අට්ඨීහි, අට්ඨීභි
ඡ...අට්ඨිනො, අට්ඨිස්ස	අට්ඨීනං
ස...අට්ඨිම්හි, අට්ඨිස්මිං	අට්ඨීසු.

එවං සත්ථි දධි වාරි අක්ඛි අච්ඡි අච්චි ඉච්චාදයොපි.

NOUNS ENDING IN ඊ. (I') NEUT *Daṇḍī.*

9. ඊකාරන්තො නපුංසකලිඞ්ගො දණ්ඩිසද්දො.

එකවචන.	බහුවචන.
ප...දණ්ඩි	දණ්ඩීනි, දණ්ඩී
ආ...(හෙ)දණ්ඩි	(භවඃ) දණ්ඩීනි, දණ්ඩී
දු...දණ්ඩිං	දණ්ඩීනි, දණ්ඩී
ත...දණ්ඩිනා	දණ්ඩීහි, දණ්ඩීභි
ක...දණ්ඩිනා	දණ්ඩීහි, දණ්ඩීභි
ච...දණ්ඩිනො, දණ්ඩිස්ස	දණ්ඩීනං
පං...දණ්ඩිනා, දණ්ඩිම්හා, දණ්ඩිස්මා	දණ්ඩීහි, දණ්ඩීභි
ඡ...දණ්ඩිනො, දණ්ඩිස්ස	දණ්ඩීනං
ස...දණ්ඩිනි, දණ්ඩිම්හි, දණ්ඩිස්මිං	දණ්ඩීසු.

එවං සුඛකාරී අත්ථවිභාවී ධම්මවිභාවී චිත්තානුපරිවත්තීනි සීඝයායී ඉච්චාදයොපි.

---

* “අට්ඨි සත්ථි අදීනි පධාන ලිඞ්ගානි අනඤ්ඤාපෙක්ඛත්තා-අත්ථවිභාවීආදීනි අප්පධාන ලිඞ්ගානි අඤ්ඤාපෙක්ඛත්තා” යනු රූපසිද්ධි ටීකායි.

† පඤ්චමී එකවචනස්ථානයෙහි “අට්ඨිම්හා, අට්ඨිස්මා” යනු යමකමහාස්ථවිර මතයෙහි හෙවත් මූලනිරුක්තියෙහි පමණක් නොදක්වන ලදී.

NOUNS ENDING IN උ. (U) NEUT. *A'yu.*

10. උකාරන්ත නපුංසකලිඞ්ගො ආයුසද්දො.

එකවචන.	බහුවචන.
ප...ආයු	ආයූනි, ආයූ
ආ...(හෙ) ආයු	(භව:)ආයූනි, ආයූ
දු...ආයුං	ආයූනි ආයූ
ත...ආයුනා	ආයූහි, ආයූභි
ක...ආයුනා	ආයූහි, ආයූභි
ච...ආයුනො, ආයුස්ස	ආයූනං
ප...ආයුනා, ආයුම්හා, ආයුස්මා	ආයූහි, ආයූභි
ෂ ..ආයුනො, ආයුස්ස	ආයූනං
ස...ආයුම්හි, ආයුස්මිං	ආයූසු.

එවං චක්ඛු වසු ධනු දරු තිපු මධු සිඞ්ගු හිඞ්ගු වත්ථු මත්ථු ජතු අම්බු අස්සු—ඉච්චාදයොපි.

මෙහිද පචමි එකවචනස්ථානයෙහි "ආයුම්හා, ආයුස්මා" යන රූපයන් යමක මහාස්ථවිර මතයෙහි නොගන්නා ලදී.

ආයුශබ්දය නපුංසක ලිඞ්ගිකවශයෙන් මෙහි දක්වනු ලද්දේ නමුදු පුල්ලිඞ්ගික ආයුශබ්දයක්ද ඇති බව ශබ්දනීතියෙහි කියන ලදී.

"පුනරායු ච මෙ ලද්ධො එවං ජානාහි මාරිස"
"ආයු වස්ස පරික්ඛීණො අහොසි"

යනාදී උදාහරණවලින්ද දතයුතුය.

"අග්ගං ආයු ච වණ්ණො ච"—"කිත්තකං පනස්ස ආයු?" යනාදිය නපුංසක ලිඞ්ගික ආයු ශබ්දයට උදාහරණයි.

තවද ඌකාරාන්ත නපුංසක ලිඞ්ගික ශබ්දයක් බාලාවතාරයෙහි නොදක්වන ලදහෙයින් වරනැගිල්ලෙහිද සංග්‍රහ නොකළ නමුදු සඤ්ඤ විතත වාචකවූ ගොත්‍රභූ ශබ්දය ඌකාරාන්ත නපුංසක ලිඞ්ගික යයි රූපසිද්ධි මොග්ගල්ලානවෘත්ති ආදියෙහි කියන ලද බැවින් එහි පදමාලා ක්‍රමයද මෙහි දක්වනු ලැබේ—කෙසේද?

NOUNS ENDING IN ඌ. (U') FEM. *Gotrubhû.*

11. ඌකාරන්ත නපුංසකලිඞ්ගො ගොත්‍රභූ සද්දො.

එකවචන	බහුවචන
ප. ගොත්‍රභු	ගොත්‍රභූ, ගොත්‍රභූනි
ආ. (හෙ) ගොත්‍රභු	(භව:) ගොත්‍රභූ, ගොත්‍රභූනි
දු... ගොත්‍රභුං	ගොත්‍රභූ, ගොත්‍රභූනි
ත... ගොත්‍රභුනා	ගොත්‍රභූභි, ගොත්‍රභූහි
ක... ගොත්‍රභුනා	ගොත්‍රභූභි, ගොත්‍රභූහි
ච... ගොත්‍රභුනො, ගොත්‍රභුස්ස	ගොත්‍රභූනං

සෙසං පුල්ලිඞ්ගෙ අභිභූසද්දසමං.

එවං සයම්භූ වත්‍රභූ චිත්තසහභූ ධම්මඤ්ඤූ ආදයොපි.

ගොත්‍රභූ ශබ්දය ප්‍රථමා එකවචනයෙහි හ්‍රස්වවශයෙන් "ගොත්‍රභු" කියා සිටි කල නපුංසක ලිඞ්ගිකය, ඤාණ, චිත්තයන් කියනු ලැබෙත්—දීර්ඝවශයෙන් "ගොත්‍රභූ" කියා සිටි කල පුල්ලිඞ්ගිකයි පුද්ගලාදීන් කියනු ලැබෙත්.

එහෙයින් කීහ.

"ගොත්‍රභු ඉති රස්සන්ත වසෙන කථිතං පදං,
නපුංසකන්ති විඤ්ඤෙය්‍යං ඤාණචිත්තාදි පෙක්ඛකං.
ගොත්‍රභූ ඉති දීඝන්ත වසෙන කථිතං පන,
පුල්ලිඞ්ගම්ති විඤ්ඤෙය්‍යං පුග්ගලාදික පෙක්ඛකං.
ඊකාරන්තො ච ඌදන්තො රස්සත්තං යාති සාසනෙ,
නපුංසකත්තං පත්වාන සහභූ සීඝයායිනි."

තවද "ගොත්තසංඛාතං අමතමහානිබ්බානං ආරම්මණං කත්වා භූතොන්ති ගොත්‍රභූ" යනු බැවින් ගොත්‍රසංඛ්‍යාතවූ (හෙවත් ගොත්‍ර යයි කියන ලද්දාවූ) අමෘත මහානිර්වාණය අරමුණුකොට වනලද හෙයින් ගොත්‍රභූ නම් වේ-ඒ කවරේදයත්-සොවාන් මාර්ගයට අනන්තරප්‍රත්‍යය වූ සිඛාප්‍රාප්තවූ බලවත් විදර්ශනා චිත්තයෙන් යුක්තවූ පුද්ගලයාය—එහෙයින් වදාළහ-"කතමො ච පුග්ගලො ගොත්‍රභූ? යෙසං ධම්මානං සමනන්තරා අරියමග්ගස්ස අවක්කන්ති හොති තෙහි ධම්මෙහි සමන්නාගතො පුග්ගලො ගොත්‍රභූ"

එසේම-"ගොත්තමත්තං අනුභවන්ති විඳන්තීති ගොත්‍රභූ සමණධම්ම අත්තනි අවිජ්ජමානත්තා" යනුබැවින් ශ්‍රමණ ධර්මයන් තමන්

කෙරෙහි නැතිබැවින් (ශ්‍රමණ) ගොත්‍රය පමණක් අනුභවකරණ
හෙයින් විඳිනහෙයින් (ලබනහෙයින්) ද ගොත්‍රභූ නම් වේ-ඒකාව
රෙක්දයත්-කාසාවකණ්ඨක ශ්‍රමණයි-එහෙයින් වදාළහ—"භවි
සසන්ති ඛො පනානන්ද අනාගත මද්ධානං ගොත්‍රභුනො කාසාව
කණ්ඨා."

තවද-"කාමාවචරගොත්ත මභිභවති මහග්ගතගොත්තඤ්ච භාවෙ
ති නිබ්බත්තෙතීති ගොත්‍රභූ" යනුබැවින් කාමාවචර (ගොත්‍රසං
ඛ්‍යාත ප්‍රථග්ජන) ගොත්‍රය අභිභවනයකරණහෙයින් මහද්ගත
ගොත්‍රය උපදවනහෙයින් ගොත්‍රභූ නම් වේ-ඒ කවරෙක්දයත්-ප්‍රඥ
ප්ත්‍යාරම්මණවූ හෝ මහද්ගතාරම්මණවූ හෝ (ගොත්‍රභූ) චිත්තයයි-
නිර්වාණය අරමුණුකොට ඇති මාර්ගවීථියෙහි පැවති ඥානය හෝ
සංස්කාරයන් අරමුණුකොට ඵලසමාපත්ති වීථියෙහි පැවති ඥානය
හෝ ගොත්‍රභූ නම්වේ—එහි ප්‍රථමකොට කී ඥානය—"පුථුජ්ජන
ගොත්ත මභිභවති අරියගොත්තඤ්ච භාවෙති ගොත්තාභිධානාච
නිබ්බානතො අරම්මණකරණවසෙන භවතීති ගොත්‍රභූ" යනු
බැවින් පෘථග්ජන ගොත්‍රය අභිභවනය කෙරේනුයි ආර්‍ය්‍ය ගොත්‍රය
උපදවානුයි ගොත්‍ර නම් වූ නිර්වාණය කෙරෙන් අරමුණුකිරීම් වශ
යෙන් වන්නේනුයි ගොත්‍රභූ නම් වේ-දෙවෙනිව කී ඥානය "සංඛා
රාරම්මණම්පි සමානං ආසෙවනපච්චයභාවෙන සම්පයුත්තානි ඵල
චිත්තානි ගොත්තාභිධානෙ නිබ්බානම්හි භාවෙතීති ගොත්‍රභූ"-යනු
බැවින් සංස්කාරයන් අරමුණු කොට ඇත්තේ නමුදු ආසෙවන
ප්‍රත්‍යය බැවින් සම්ප්‍රයුක්ත ඵලචිත්තයන් ගොත්‍රනම් වූ නිර්වාණ
යෙහි ලා වර්ධනය කෙරේනුයි ගොත්‍රභූ නම් වේ.

නපුංසක ලිඞ්ගික ශබ්ද කාණ්ඩයයි.

සර්වනාම ශබ්ද.

PRONOUNS &c.

සබ්බ කතර කතම උභය ඉතර අඤ්ඤ අඤ්ඤතර අඤ්ඤතම පුබ්බ පර අපර දක්ඛිණ උත්තර අධර ය ත ඒත ඉම අමු කිං එක උභ ද්වි ති චතු තුම්හ අම්හ—ඉති සත්තවීසති සබ්බනාමානි නාම.

1. සකලත්ථෝ සබ්බසද්දෝ.

පුම (අ.)—*Sabba* (ALL) M.

එකවචන,	බහුවචන,
ප..සබ්බෝ	සබ්බෙ
ආ...(හෙ) සබ්බ, සබ්බා	(භව:) සබ්බෙ
දු..සබ්බං	සබ්බෙ
ත...සබ්බෙන	සබ්බෙභි, සබ්බෙහි
ක...සබ්බෙන	සබ්බෙභි, සබ්බෙහි
ච...සබ්බස්ස	සබ්බෙසං, සබ්බෙසානං
පං.,සබ්බම්හා, සබ්බස්මා	සබ්බෙභි, සබ්බෙහි
ඡ සබ්බස්ස	සබ්බෙසං, සබ්බෙසානං
ස...සබ්බම්හි, සබ්බස්මිං	සබ්බෙසු.

ඉත්ථිලිංග (ආ.)—*Sabba* (F.)

ප...සබ්බා	සබ්බා, සබ්බායො
ආ...(හෙ)සබ්බෙ	(භොතී) සබ්බා, සබ්බායො
දු...සබ්බං	සබ්බා, සබ්බායො
ත...සබ්බාය, [සබ්බස්සා]	සබ්බාභි, සබ්බාහි
ක...සබ්බාය, [සබ්බස්සා]	සබ්බාභි, සබ්බාහි
ච...සබ්බස්සා, සබ්බාය	සබ්බාසං, සබ්බාසානං
පං..සබ්බාය, [සබ්බස්සා]	සබ්බාභි, සබ්බාහි
ඡ...සබ්බස්සා, සබ්බාය	සබ්බාසං, සබ්බාසානං
ස...සබ්බස්සං, සබ්බායං [සබ්බස්සා]	සබ්බාසු.

* සර්වනාම ශබ්ද විසිහතක්බව රූපසිද්ධියෙහි හා ශබ්දනීතියෙහිද, විසිහතරක්බව පදසාධනි ටීකාවෙහිද, විසිතුනක්බව මොග්ගල්ලායන වෘත්තියෙහිද, විසිදෙකක්බව බාලාවතාරයෙහිද, තිස්පහක් බව මුග්ධබෝධයෙහිද, කියනලදී-කොටස් වශයෙන් දශයක් බව කච්චායන භෙදයෙහි කියන ලදී.

නපුංසකො (අ.)—*Sabba* (N.)

ඒකවචන.	බහුවචන.
ප...සබ්බං	සබ්බානි
ආ...(හෙ)සබ්බ, සබ්බා	(භව:) සබ්බානි,
දු...සබ්බං	සබ්බානි
ත...සබ්බෙන	සබ්බෙහි, සබ්බෙභි
ක...සබ්බෙන	සබ්බෙහි, සබ්බෙභි
ච...සබ්බස්ස	සබ්බෙසං, සබ්බෙසානං
පං..සබ්බම්හා, සබ්බස්මා	සබ්බෙහි, සබ්බෙභි
ඡ . සබ්බස්ස	සබ්බෙසං, සබ්බෙසානං
ස...සබ්බම්හි, සබ්බස්මිං	සබ්බෙසු.

එවං කතර කතම උභය ඉතර අඤ්ඤ අඤ්ඤතර අඤ්ඤතම සද්ද.

අග්ගවංසාචාර්‍ය්‍යප්‍රණීතයෙහි වූ සබ්බශබ්දයෙහි ආලපන ඒකවචනයෙහි පුංනපුංසක ලිඞ්ගයෙහිම "සබ්බා" යනු නොගන්නා ලදී.

පඤ්චමී ඒකවචනස්ථානයෙහි "සබ්බා" යනුද සප්තමී ඒකවචනස්ථානයෙහි "සබ්බෙ" යනුද (නිද්දෙසපාළියෙහි දක්නාලද හෙයින්) මූලනිරුක්තියෙහි දක්වන ලද්දේ නමුදු කච්චායනාදියෙහි ("නායො නෙව ච සබ්බනාමෙහි" යන සූත්‍රයෙන් ප්‍රතිෂෙධ කළ හෙයින්) නොදක්වන ලදී—එහෙත් පුබ්බ පර අපර යන ශබ්දතුනෙහි පමණක් "පුබ්බෙ" යනාදී එසේවූ පදයන් සිද්ධවන බව කියන ලදී.

ස්ත්‍රීලිඞ්ගික "සබ්බා" ශබ්දයෙහි තෘතීයා පඤ්චමී සප්තමී ඒකවචනස්ථානවලද චතුර්ථී ෂෂ්ඨී දෙකෙහි මෙන් "සබ්බස්සා" යනු ශබ්දනීතියෙහි කියන ලද්දේය.

ඒක-ය-ත-ඒත-ඉම-ශබ්දාදියෙහිද එසේමය—"තස්සා කුමාරිකාය සද්ධිං—කස්සාහං කෙන හායාමි—ඉධාති ඉමිස්සා දිසියා—එකිස්සා ලොකධාතුයා ද්වෙ අරහන්තො සම්මාසම්බුද්ධා" යනාදී ප්‍රයෝගයන් පාළියෙහි විද්‍යමාන හෙයින්—එහෙත් මෙබඳු පද ත-ඒත-ඉම අමු-යන ශබ්දයන්ට පමණක් පයොගසිද්ධි ආදියෙහි කියන ලදී.

සප්තමී ඒකවචනස්ථානයෙහි "සබ්බාය" යන්නක්ද මොග්ගල්ලානාදියෙහි දක්වනලද නමුදු එබඳු පදයන්ගේ සිද්ධිය "ඝෙනාහි ස්මිං මායයා" යන සූත්‍රයෙන් කච්චායනාදියෙහි ප්‍රතිෂෙධ කරණ ලදී.

උභය ශබ්දයත් සබ්බ ශබ්දය මෙන් වරනැගිය යුතුයයි මෙහි දක්වනු ලැබූ නමුත් ප්‍රථමා ද්විතීයා බහුවචනස්ථානයන්හි ලිඞ්ගත්‍රයෙහිම "උභයො" යනු බැවින් එය සබ්බශබ්දයෙහි රූවලට වෙනස් රූපයකි.

ඉතර, අඤ්ඤ, අඤ්ඤතර, අඤ්ඤතම, එක, යනමේ ශබ්දද සබ්බ ශබ්දය හා සමාන නමුදු සබ්බ ශබ්දයෙහි රූපවලට මඳක් වෙනස් රූපයන් ස්ත්‍රීලිඞ්ග තෘතීයා චතුර්ථී ආදියෙහි පෙනෙත්—ඒනම් ("අඤ්ඤතරෙ පුරිසො අඤ්ඤතරිස්සා ඉත්ථියා පටිබද්ධචිත්තො හොති"-යනාදියෙහි දක්නාලද) ඉතරිස්සා, ඉතරිස්සං, ...අඤ්ඤතරිස්සා......එකිස්සා යනාදියයි.

තවද සර්වනාමයෝයයි මෙහි දක්වනු ලැබූ ශබ්දයන්ගේ ලක්‍ෂණ,

ශබ්දනීතියෙහි.

"යානි හොන්ති තිලිඞ්ගානි අනුකූලානි යානි ච,
තිලිඞ්ගානං විසෙසෙන පදානෙ තානි නාමතො.
සබ්බසාධාරණත්තානි නාමානිච්චෙව අත්ථතො,
සබ්බනාමානි වුච්චන්ති සත්තවීසති සංඛ්‍යතො.
තෙසු කානි චි රූපානි සෙහඤ්ඤෙහි ච යුජ්ජරෙ,
කානි චි පන සෙහෙව එතෙසං ලක්ඛණං ඉදං.
එතස්මා ලක්ඛණා මුත්තං න පදං සබ්බනාමිකං
තස්මා තීනාදයො නාමා ගුණනාමාති වුච්චරෙ."

රූපසිද්ධියෙහි.

"සබ්බෙසං ඉත්ථි පුම නපුංසකානං නාමානි සබ්බනාමානි."

න්‍යාසයෙහි.

"සබ්බෙසං නාමානි සබ්බනාමානි."

න්‍යාස ටීකාවෙහි.

"සබ්බෙසං නාමානීති සබ්බෙසං ඝටපටාදීනං නාමානි—යානි ඝටපටාදි සද්දත්ථවාචකානි තෙහි තුල්‍යාධිකරණානි දසවිධානි සබ්බනාමානීති අත්ථො."

කච්චායනභෙද ටීකාවෙහි.

"සබ්බත්ථවාචකත්තා ච සබ්බ ලිඞ්ගයුත්තත්තා ච සබ්බනාමං නාම"-

මුග්ධබෝධටීකාවෙහි.

"සර්වේෂාං බුද්ධිස්ථානාං නාම, සර්වනාම"

සාරස්වත ටීකාවෙහි.

"සර්වේෂාං නාමානීති සර්වනාමානි"—යනුයි.

තවද සර්වනාමයෝයයි ප්‍රසිද්ධවූ ශබ්ද අතුරෙන් "අඤ්ඤ-පුබ්බ-දක්ඛිණ-උත්තර-පර-ඌන මේශබ්ද පස සමහරවිට සර්වනාම සංඛ්‍යාවටද සමහරවිට අසර්වනාම සංඛ්‍යාවටද ඇතුලත්වන බවකියන ලදී.

"අඤ්ඤසද්දෙ පුබ්බසද්දෙ දක්ඛිණෙ වුත්තරෙ පරෙ,
සබ්බනාමෙසු ගය්හන්ති අසබ්බනාමිකෙ සු පි."

මෙයින් අඤ්ඤශබ්දය බාලාර්ථවාචක කල්හිද පුබ්බශබ්දය ප්‍රධානාර්ථ පූජා අර්ථ වාචක කල්හිද—උත්තර පර ශබ්දවය උත්තමාර්ථවාචක කල්හිද, දක්ඛිණ ශබ්දය සුශික්ෂිතාර්ථ, චතුරාර්ථ, දෙයධර්මාර්ථ වාචක කල්හිද-අසර්වනාම සංඛ්‍යාවට ඇතුලත් බවද, මෙයින් පිටත් සෙසු අර්ථ වාචක කල්හි සර්වනාම සංඛ්‍යාවට ඇතුලත් බවද දතයුතුයි.

තවද "සකලත්ථො සබ්බසද්දො" යනු සබ්බ ශබ්දයාගේ මාතෘකාවෙහි දක්වනු ලැබූහෙයින් සබ්බශබ්දය සකලාර්ථයෙහි බව දත යුතුය. සකලාර්ථයද නිෂ්ප්‍රදෙශ සප්‍රදෙශ වශයෙන් විප්‍රකාරයක් වේ—එහි "සබ්බෙ ධම්මා බුද්ධස්ස භගවතො ඤාණමුඛෙ ආපාථං මාගච්ඡන්ති" යනාදියෙහි සබ්බ ශබ්දය නිෂ්ප්‍රදෙශ සකලාර්ථයෙහිය—"සබ්බෙසං වො සාරිපුත්ත සුභාසිතං පරියායෙන..."—"සබ්බං වො භික්ඛවෙ දෙසිස්සාමි තං සුණාථ" යනාදි තන්හි සප්‍රදෙශ සකලාර්ථයෙහිය.

සබ්බශබ්දය මෙන් වරනැගිය යුතුවූ කතර කතම ශබ්දවය විචාරිම අර්ථකොට ඇත්තේය—එහෙයින් කතර ශබ්දය ටිකවූ දේවල් අතුරෙන් එසේම ටිකදෙයක් විචාරීම සඳහාය—කතම ශබ්දය බොහෝවූ දේවල් අතුරෙන් එසේම බොහෝ දෙයක් විචාරීම සඳහාය.

එහෙයින් කීහ.

"කතර කතම සද්දා පුච්ඡනත්ථා, තෙසු කතර සද්දො අප්පෙසු එකං වා වෙ වා තීණි වා හියෙය්‍ය වා අප්පමුපාදාය වත්තන්ති—කතම සද්දො බහූසු එකං වා වෙ වා තීණි වා බහු වා බහුමුපාදාය වත්තන්ති

සමුද්දෙ කතරො අයං? කතරෙන මග්ගෙන ගන්තබ්බං?
කතමො තස්මිං සමයෙ ඵස්සො හොති? කතමෙ ධම්මා කුසලා?"

2. කාලදෙසාදි වචනො පුබ්බසද්දො.

Pubba Declined.

පුමෙ (අ.)—*Mas.* (A.)

ඒකවචන.	බහුවචන
ප... පුබ්බො	පුබ්බෙ, පුබ්බා
ආ... (හෙ) පුබ්බ, පුබ්බා	(භව:) පුබ්බෙ, පුබ්බා
දු... පුබ්බං,	පුබ්බෙ
ත... පුබ්බෙන	පුබ්බෙහි, පුබ්බෙභි
ක... පුබ්බෙන	පුබ්බෙහි, පුබ්බෙභි
ච.. පුබ්බස්ස	පුබ්බෙසං, පුබ්බෙසානං
පං.. පුබ්බා, පුබ්බම්හා, පුබ්බස්මා	පුබ්බෙහි, පුබ්බෙභි
ඡ... පුබ්බස්ස	පුබ්බෙසං, පුබ්බෙසානං
ස... පුබ්බෙ, පුබ්බම්හි, පුබ්බස්මිං	පුබ්බෙසු.

ඉත්ථියං (අ.)—*Fem.* (A.)

ප... පුබ්බා	පුබ්බා, පුබ්බායො
ආ.. (හෙ) පුබ්බෙ	(භොති) පුබ්බා, පුබ්බායො
දු... පුබ්බං	පුබ්බා, පුබ්බායො
ත... පුබ්බාය	පුබ්බාහි, පුබ්බාභි
ක... පුබ්බාය	පුබ්බාහි, පුබ්බාභි
ච... පුබ්බස්සා, පුබ්බාය	පුබ්බාසං, පුබ්බාසානං
පං... පුබ්බාය	පුබ්බාහි, පුබ්බාභි
ඡ... පුබ්බස්සා, පුබ්බාය	පුබ්බාසං, පුබ්බාසානං
ස . පුබ්බස්සං, පුබ්බායං	පුබ්බාසු.

නපුංසකෙ (අ.)—*Neut.* (A.)

ප... පුබ්බං	පුබ්බානි
ආ... (හෙ) පුබ්බ, පුබ්බා	(භව:) පුබ්බානි
දු... පුබ්බං	පුබ්බානි
ත... පුබ්බෙන,	පුබ්බෙහි, පුබ්බෙභි
ක... පුබ්බෙන	පුබ්බෙහි, පුබ්බෙභි
ච... පුබ්බස්ස	පුබ්බෙසං, පුබ්බෙසානං
පං... පුබ්බා, පුබ්බම්හා, පුබ්බස්මා	පුබ්බෙහි, පුබ්බෙභි
ඡ... පුබ්බස්ස	පුබ්බෙසං, පුබ්බෙසානං
ස... පුබ්බෙ, පුබ්බම්හි, පුබ්බස්මිං	පුබ්බෙසු.

එවං පර පර දක්ඛිණ උත්තර අධර සද්දා.

පුල්ලිඞ්ගික පුබ්බ ශබ්දයෙහි ප්‍රථමා ඒකවචනස්ථානයෙහි යො හට
ආකාරාදෙශව සිද්ධවූ "පුබ්බා" යනු මෙන් රූපයන් අපර සබ්බ
කතර ආදිකොට අඤ්ඤතම කෙළවරකොට ඇති ශබ්දවල අප්‍ර
සිද්ධබව හා පුබ්බ දක්ඛිණ උත්තර අධර යන ශබ්ද සතරෙහි පමණක්
ලැබෙන බවද-පඤ්චමී ඒකවචනස්ථානයෙහිවූ "පුබ්බා" යනු මෙන්
රූප පෙළෙහි අප්‍රසිද්ධ බවද—සප්තමී ඒකවචනස්ථානයෙහි වූ
"පුබ්බෙ" යනු මෙන් රූප සබ්බ අඤ්ඤ යන ශබ්දවල අප්‍රසිද්ධ බව හා
කතර කතම යනු ආදිකොට අධර ශබ්දය කෙළවරකොට ඇති
ශබ්ද දෙළසෙහි ලැබෙන බවද ශබ්දනීතියෙහි කියන ලදී.

තවද මෙහි දක්ඛිණ උත්තර ශබ්දද්වයත් පුබ්බ ශබ්දය මෙනැයි
දක්වන ලද්දේ නුමුත් ස්ත්‍රීලිඞ්ගික සප්තමී ඒකවචනස්ථානයෙහි
"දක්ඛිණාය-උත්තරාය" යන රූප, සිද්ධ වන බව රූපසිද්ධියෙහි
කියනලදී.

සමාස වීමෙන් පරපදභාවයෙහි සිටියාවූ සර්වනාම ශබ්ද සාමාන්‍ය
සර්වනාමවලට වඩා වෙනස්ය—ඒනම් ද්වන්ද්ව සමාස වීමෙන් පරපදභා
යෙහි සිටියාවූ සර්වනාම ශබ්දවල ප්‍රථමා බහුවචනයෙහි ඒකාරාදෙ
ශව සිද්ධවූ පද හැර සර්වනාම පදයන්ට නියමවූ අන්‍ය ක්‍රමවලින්
සිද්ධවූ පදයන් අප්‍රසිද්ධය—තෘතීයා තත්පුරුෂ සමාස වීමෙන් පරපද
යෙහි සිටියාවූ සර්වනාම ශබ්දයන්ගේද-බහුව්‍රීහි සමාස වීමෙන්
පරපදභාවයෙහි සිටියාවූ සර්වනාම ශබ්දයන්ගේද එසේමය—එහෙත්
දිසාවාචක සර්වනාමයෝ පමණක් බහුව්‍රීහි සමාස වීමෙන් පරපද
භාවයෙහි සිටියේ නමුදු සර්වනාම ක්‍රමයටම වරනඟනු ලැබෙත්.

යාදීනමාලපනං නත්ථි.

3. අනියමත්ථො ය ශබ්ද.

Ya Declined.

පුමෙ (අ.)—*Mas.* (A.)

එකවචන.	බහුවචන.
ප..යො	යෙ
දු..යං	යෙ
ත...යෙන	යෙහි, යෙභි
ක...යෙන	යෙහි, යෙභි
ච...යස්ස	යෙසං, යෙසානං
පං..යම්හා, යස්මා	යෙහි, යෙභි
ඡ..යස්ස	යෙසං, යෙසානං
ස...යම්හි, යස්මිං	යෙසු.

ඉත්ථියං (ආ.)—*Fem.* (A'.)

ප..යා	යා, යායො
දු..යං	යා, යායො
ත..යාය	යාහි, යාභි
ක...යාය	යාහි, යාභි
ච...යස්සා, යාය	යාසං, යාසානං
පං..යාය	යාහි, යාභි
ඡ...යස්සා, යාය	යාසං, යාසානං
ස...යස්සං, යායං	යාසු.

නපුංසකෙ (අ.)—*Neut.* (A)

ප..යං	යානි
දු...යං	යානි
ත...යෙන	යෙහි, යෙභි
ක...යෙන	යෙහි, යෙභි
ච...යස්ස	යෙසං, යෙසානං
පං..යම්හා, යස්මා	යෙහි, යෙභි
ඡ...යස්ස	යෙසං, යෙසානං
ස...යම්හි, යස්මිං	යෙසු.

ස්ත්‍රීලිඞ්ග ශබ්දයෙහි, තෘතීයා පචමී සප්තමී ඒකවචනස්ථාන යන්හි "යස්සා" යනුද-නපුංසක ලිඞ්ග ශබ්දයෙහි ප්‍රථමාවි ත්‍යා බහු වචනස්ථානයන්හි "යා-යෙ" යන රූපවයන්ද ශබ්දනීතියෙහි දක්වන ලදී.

"යා පුබ්බෙ බොධි සත්තානං පල්ලඞ්කවර මාහුජෙ,
නිමිත්තානි පදිස්සන්ති තානි අජ්ජ පදිස්සරෙ."

යනාදියෙහි එබඳු පද දක්නාලද හෙයිනි—චතුර්ථී ෂෂ්ඨී බහු වචනස්ථානවල "යෙසානං-යාසානං" යන පදයන් රූපසිද්ධි ශබ්දනීති දෙක්හි නොදක්වන ලද්දුහුය—තවද "යං" යන රූපය ප්‍රථමා ද්විතීයා තෘතීයාර්ථයන්හි පවත්නේය—ඒනම් "යංමෙ භන්තෙ තාවතිංසානං දෙවානං සම්මුඛා සුතං සම්මුඛා පටිග්ගහිතං ආරොචෙමි තං භන්තෙ භගවතො" යන මෙහි ප්‍රථමාර්ථයෙහිය.

"යං තං අපුච්ඡිම්හ අකිත්තයී නො අඤ්ඤං තං පුච්ඡාම තදිඞ්ඝ බ්‍රෑහි" යනාදියෙහි ද්විතීයාර්ථයෙහිය.

"අට්ඨාන මෙතං භික්ඛවෙ අනවකාසො යං එකිස්සා ලොකධාතුයා වෙ අරහන්තො සම්මාසම්බුද්ධා උප්පජ්ජෙය්‍යුං" යනාදියෙහි තෘතීයාර්ථයෙහිය.

තවද ය ශබ්දය පර පදයන්හා සමාසවූ කල්හි නිග්ගහීතාගම වීමෙන් හෝ පරපදයෙහි ආද්‍යක්ෂරයට ද්විත්ව වීමෙන් හෝ යුක්තවූ රූප වෙත්—කෙසේද "යංබන්ධාදී-යංගුණා-යග්ගුණා" යනාදියයි-එහි යො බන්ධාදි යං බන්ධාදි, කියාද—යෙ ගුණා යං ගුණා, කියාද—යස්ස ගුණා යග්ගුණා, කියාද සමාස විග්‍රහයි.

"ය සද්දස්ස සමාසම්හි සබ්බං පරපදෙන වෙ,
නිග්ගහීතාගමො වාථ ද්විභාවො වා සියා ද්විධා."

ශබ්දනීතියෙහිය.

4. පරම්මුඛවචනො තසද්දො.

Ta Declined.

පුමෙ (අ.)—*Mas.* (A.)

	එකවචන.	බහුවචන.
ප...	සො	නෙ, තෙ
දු...	නං, තං	නෙ, තෙ
ත...	නෙන, තෙන	නෙභි, තෙභි, නෙහි, තෙහි
ක...	නෙන, තෙන	නෙභි, තෙභි, නෙහි, තෙහි
ච..	නස්ස, තස්ස [අස්ස]	නෙසං, නෙසානං, තෙසං, තෙසානං
පං..	නම්හා, තම්හා, නස්මා, තස්මා, [අස්මා]	නෙභි, තෙභි, නෙහි, තෙහි
ඡ...	නස්ස, තස්ස, [අස්ස]	තෙසං, නෙසානං, තෙසං, තෙසානං
ස...	නම්හි, තම්හි, නස්මිං, තස්මිං, [අස්මිං]	නෙසු, තෙසු.

ඉත්ථියං (ආ.)—*Fem.* (A′.)

ප...	සා	නා, තා, නායො, තායො
දු...	නං, තං	නා, තා, නායො, තායො
ත...	නාය, තාය, [නස්සා, තස්සා, අස්සා]	නාභි, තාභි, නාහි, තාහි
ක...	නාය, තාය, [නස්සා, තස්සා, අස්සා]	නාභි, තාභි නාහි, තාහි
ච...	තිස්සාය, තිස්සා, [තස්සාය] තස්සා, [නස්සාය, නස්සා, අස්සාය, අස්සා, නාය,] තාය	තාසං, තාසානං, [නාසං, නාසානං, ආසං, ආසානං, සානං]
පං..	නාය, තාය, [නස්සා, තස්සා, අස්සා]	නාභි, තාභි, නාහි, තාහි
ඡ...	තිස්සාය, තිස්සා, [තස්සාය] තස්සා, [නස්සාය, නස්සා, අස්සාය, අස්සා, නාය,] තාය	තාසං, තාසානං, [නාසං නාසානං, ආසං, ආසානං, සානං]
ස...	තිස්සං, තස්සං, [නස්සං, අස්සා, නස්සා, තස්සා, තිස්සා, නායං,] තායං*	[නාසු,] තාසු.

---

* මොග්ගල්ලායනයෙහි හා පයොගසිද්ධියෙහිද, සත්තමීඑකවචන "අස්සං, අස්සා, නස්සං, නස්සා, තස්සං, තස්සා, තිස්සං, තිස්සා, නායං, නාය, තායං, තාය," යනුයි.

නපුංසක (අ.)—*Neut.* (A.)

ඒකවචන.	බහුවචන.
ප.. නං, තං,	නානි, තානි
දු... නං, තං,	නානි, තානි
ත... නෙන, තෙන,	නෙභි, තෙභි, නෙහි, තෙහි
ක... නෙන, තෙන	නෙභි, තෙභි, නෙහි, තෙහි
ච... නස්ස, තස්ස, [අස්ස]	නෙසං, නෙසානං, තෙසං, තෙසානං
පං.. නම්හා, තම්හා, නස්මා, තස්මා, [අස්මා,]	නෙභි, තෙභි, නෙහි, තෙහි
ඡ.. නස්ස, තස්ස, [අස්ස]	නෙසං, නෙසානං, තෙසං, තෙසානං
ස .. නම්හි, තම්හි, නස්මිං, තස්මිං, [අස්මිං,]	නෙසු, තෙසු.

මෙහි දක්වනුලැබූ පද අතුරෙන් ලිඞ්ගත්‍රයෙහිම තශබ්දයාගේ ප්‍රථමාවෙහි න කාරාදෙශව සිද්ධවූ "නෙ-නා-නං-නානි" යන පද බාලාවතාරාදියෙහි මුත් ශබ්දනීතියෙහි නොදක්වන ලදී.

එසේම චතුර්ථ්‍යාදියෙහි අකාරාදෙශව සිද්ධවූ "අස්ස, අස්මා, අස්මිං, අස්සා" යනාදි පද බාලාවතාරයෙහි නොදක්වන ලද්දේ නමුදු කච්චායනාදියෙහි දක්වන ලදී.

ස්ත්‍රීලිඞ්ගික ශබ්දයෙහි තෘතීයා පඤ්චමී සප්තමී, එකවචනස්ථානයන්හි "අස්සා, නස්සා, තස්සා" යන පද මොග්ගල්ලායන පයෝගසිද්ධි ශබ්දනීති යන පොත්වල මුත් කච්චායන රූපසිද්ධි ආදියෙහි නොදක්වන ලදී.

චතුර්ථී ෂෂ්ඨී එකවචනස්ථානයන්හි "තිස්සාය, තිස්සා, තස්සාය, නස්සාය, අස්සාය" යන පදයො රූපසිද්ධි, පයෝගසිද්ධි, මොග්ගල්ලායනවෘත්ති, යන පොත්වල මුත් ශබ්දනීතියෙහි නැති නමුදු කච්චායන බාලාවතාර දෙක්හි පමණක් "තිස්සාය, තිස්සා" යනු දක්වන ලදී.

චතුර්ථී ෂෂ්ඨී බහුවචනස්ථානයන්හි "නාසං, නාසානං, *ආසං,

---

* "යථා නදීච සන්ථො ච පානාගාරං සභා පපා,
ඒවං ලොකිත්ථියො නාම නාසං කුජ්ඣන්ති පණ්ඩිතා" යනුද,
"සබ්බාසං සොකා විනස්සන්ති-නෙවාසං කෙසා දිස්සන්ති හත්ථපාදාච ජාලිනො" යන උදාහරණද දක්වමින් "ආසං" යනු ලිඞ්ගත්‍රයෙහිම බව ශබ්දනීතියෙහි කියන ලදී.

අංසානං" යන පද මොග්ගල්ලායනවුත්ති පයෝගසිද්ධි යන පොත් වල මුත් බාලාවතාරාදියෙහි නැති නමුදු ශබ්දනීතියෙහි "නාසං, ආසං" යනු පමණක්ද—රූපසිද්ධියෙහි "නාසං" යනු පමණක්ද දක්වන ලදී.

සප්තමී ඒකවචනස්ථානයෙහි "අස්සං, නස්සං, අස්සා, නස්සා, තිස්සා, තස්සා, නායං" යන පද පයෝගසිද්ධි මොග්ගල්ලායනවුත්ති ශබ්දනීති යන පොත්වල මුත් බාලාවතාරයෙහි නැති නමුදු "අස්සං, නස්සං, නාය" යනු පමණක් කච්චායන රූපසිද්ධි ගෙදක්හි පමණක් දක්වන ලදී.

චතුර්ථී ෂෂ්ඨී බහුවචනයන්හි "සානං*" යන පදය ශබ්දනීතියෙහි පමණක් මුත් රූපසිද්ධි පයෝගසිද්ධි කච්චායනාදියෙහි නො දක්වන ලදී.

තවද—"යදා සස සීලං පඤ්ඤඤ්ච සොචෙය්‍යං චාධිගච්ඡති,
අථ විස්සාසතෙ ත්‍යම්හි ගුය්හං චස්ස න රක්ඛති."
"ඛිඩ්ඩා පණිහිතා ත්‍යාසු රති ත්‍යාසු පතිට්ඨිතා,
බීජානි ත්‍යාසු රූහන්ති.. ...".........

යනාදියෙහි දක්නාලදහෙයින් ලිඞ්ගත්‍රයෙහිම සප්තමී ඒකවචන බහුවචනස්ථානයන්හි "ත්‍යම්හි, ත්‍යාසු" යන පද ශබ්දනීතියෙහි පමණක් දක්වනලද්දේ නමුදු මොග්ගල්ලායනයෙහි හා පදසාධනී පයෝගසිද්ධි යන පොත්වලද ත ශබ්දය මෙන්ම සර්වනාම "ත්‍ය"† ශබ්දයක්ද දක්වා ලිඞ්ගත්‍රයෙහි "ස්‍යො, ස්‍යා, ත්‍යං, ත්‍යානි, ත්‍යම්හි, ත්‍යාසු" යනාදී පද දක්වන ලදී,

"අරියවිනයෙති වා සප්පුරිසවිනයෙති වා එසෙ සෙ එකෙ එකට්ඨෙ" යන පාළියෙහි ත ශබ්දයාගේ ප්‍රථමා ඒකවචනයෙහි එකාරාන්ත රූපයක්ද ඇති බව ශබ්දනීතියෙහි කියනලදී

තශබ්දය අන්‍යශබ්දයන් හා සමාසවූ කල්හි මධ්‍යයෙහි නිග්ගහීත සහිත රූපයන්ද පරපදයාගේ ආද්‍යක්ෂරයට විත්තවූ රූපද ඇතිබව දතයුතුයි-ඒනම් "තං පුතෙන-තං සදිසො-තන්නින්නො-තප්පොණො-තප්පබ්භාරො" යනාදියයි.

එහෙයින් කීහ.

"තසද්දස්ස සමාසම්හි සද්ධිං පරපදෙහි වෙ,
නිග්ගහීතාගමො පුබ්බපදෙ විත්තානත්තු පච්ඡිමෙ."

---

* "සානං" යනු පාළියෙහි ඇතිබවට "අභික්කමො සානං පඤ්ඤායන්ති නො පටික්කමොති" යන උදාහරණයද දක්වන ලදී.

† "ත්‍ය සද්දො ත සද්දෙන සමානත්ථො"—යනු පදසාධනී ටීකායි.

5. සමීප වචනො එතසද්දො.

Eta One

පුමෙ (අ.)—*Mas.* (A.)

එකවචන,	බහුවචන,
ප...එසො	එතෙ
දු...එතං	එතෙ
ත...එතෙන	එතෙහි, එතෙභි
ක...එතෙන	එතෙහි, එතෙභි
ච...එතස්ස	එතෙසං, එතෙසානං
පං...එතම්හා, එතස්මා	එතෙහි, එතෙභි
ඡ...එතස්ස	එතෙසං, එතෙසානං
ස...එතම්හි, එතස්මිං	එතෙසු.

ඉත්ථියං (ආ.)—*Fem.* (A.)

ප..එසා	එතා, එතායො
දු..එතං	එතා, එතායො
ත...එතාය [එතිස්සා]	එතාහි, එතාභි
ක...එතාය [එතිස්සා]	එතාහි, එතාභි
ච...එතිස්සාය, එතිස්සා, එතාය	එතාසං, එතාසානං
පං..එතාය, [එතිස්සා]	එතාහි, එතාභි
ඡ...එතිස්සාය, එතිස්සා, එතාය	එතාසං, එතාසානං
ස...එතිස්සං, [එතිස්සා] එතස්සං, එතාසං, [එතාය]	එතාසු.

නපුංසකෙ (අ.)—*Neut.* (Am.)

ප..එතං	එතානි
දු...එතං	එතානි
ත...එතෙන	එතෙහි, එතෙභි
ක...එතෙන	එතෙහි, එතෙභි
ච...එතස්ස	එතෙසං, එතෙසානං
පං..එතම්හා, එතස්මා	එතෙහි, එතෙභි
ඡ...එතස්ස	එතෙසං එතෙසානං
ස...එතම්හි, එතස්මිං	එතෙසු.

මෙහිද ස්ත්‍රීලිඞ්ගික ශබ්දයෙහි තෘතීයා පඤ්චමි සප්තමී ඒකවචන ස්ථානවල දක්වනු ලැබූ "එතිස්සා" යන පදය පයොගසිද්ධි මොග්ගල්ලායන ශබ්දනීති යන ප්‍රකරණවල මුත් කච්චායන රූපසිද්ධි ආදියෙහි නැත—චතුර්ථී ෂෂ්ඨී බහුවචන වශයෙන් දක්වනු ලැබූ "එතාසානං" යනු බාලාවතාරාදියෙහි මුත් රූපසිද්ධි ශබ්දනීති යන දෙක්හි නැත—සප්තමී ඒකවචනස්ථානයෙහි "එතස්සං" යනු ශබ්දනීතියෙහි පමණක් නොදක්වන ලදී—තවද එතශබ්දයාගේ ප්‍රථමා ඒකවචනයෙහි ඒකාරාන්ත රූපයක්ද "අරියස්ස—පෙ—එසෙ සෙ..." යනාදී පාඨයෙහි පෙනේ—එතශබ්දය අන්‍යශබ්දයන් හා සමාසවූ කල පූර්ව පදාන්තයෙහි නිග්ගහීතාගමවූද නොවූද රූපයන් ඇති වෙත්—ඒනම්,

"එතදත්ථාය ලොකස්මිං නිධිනාම නිධීයති"
"එතපරමා යෙව දෙවතා සන්නිපතිතා අහෙසුං"

යනාදියෙහි වූ "එදත්ථ, එතපරම" යනාදියයි—එහෙයින් කීන,

ශබ්දනීතියෙහි.

"සමාසෙ එත සද්දස්ස ඛිං පරපදෙහි වෙ,
නිග්ගහීතාගමො පුබ්බපදෙ හොති න හොති ච."

6. අවචනත්ථ සම්පවචනො ඉමසද්දො.

Ima. Declined.

පුමෙ (අ.)—*Mas.* (A.)

එකවචන.	බහුවචන.
ප...අයං	ඉමෙ
දු...ඉමං	ඉමෙ
ත...අනෙන, ඉමිනා	එහි, ඉමෙහි, එභි, ඉමෙභි
ක...අනෙන, ඉමිනා	එහි, ඉමෙහි, එභි, ඉමෙභි
ච...අස්ස, ඉමස්ස	එසං, එසානං, ඉමෙසං, ඉමෙසානං
පං...අස්මා, ඉමම්හා	එහි, ඉමෙහි, එභි, ඉමෙභි
ඡ...අස්ස, ඉමස්ස,	එසං, එසානං, ඉමෙසං, ඉමෙසානං
ස...අස්මිං, ඉමම්හි, ඉමස්මිං	එසු, ඉමෙසු.

ඉත්ථියං (ආ.)—*Fem.* (A′)

ප...අයං, ඉමා	ඉමායො
දු...ඉමං, ඉමා	ඉමායො
ත...ඉමාය, [අස්සා, ඉමිස්සා]	ඉමාහි, ඉමාභි
ක...ඉමාය, [අස්සා, ඉමිස්සා]	ඉමාහි, ඉමාභි
ච...අස්සාය, අස්සා, ඉමිස්සාය, ඉමිස්සා, ඉමාය	ඉමාසං, ඉමාසානං
පං...ඉමාය, [අස්සා, ඉමිස්සා]	ඉමාහි, ඉමාභි
ඡ...අස්සාය, අස්සා, ඉමිස්සාය, ඉමිස්සා, ඉමාය	ඉමාසං, ඉමාසානං
ස...අස්සං, ඉමිස්සං, [අස්සා, ඉමිස්සා ඉමාය] ඉමායං,	ඉමාසු.

නපුංසකෙ (අ.)—*Neut.* (Am.)

ප..ඉදං, ඉමං	ඉමානි
දු...ඉදං, ඉමං	ඉමානි
ත...අනෙන, ඉමිනා	එහි, ඉමෙහි, එභි, ඉමෙභි
ක...අනෙන, ඉමිනා	එහි, ඉමෙහි, එභි, ඉමෙභි
ච...අස්ස, ඉමස්ස	එසං, එසානං, ඉමෙසං, ඉමෙසානං
පං...අස්මා, ඉමම්හා, ඉමස්මා	එහි, ඉමෙහි, එභි, ඉමෙභි
ඡ...අස්ස, ඉමස්ස	එසං, එසානං, ඉමෙසං, ඉමෙසානං
ස...අස්මිං, ඉමම්හි, ඉමස්මිං	එසු, ඉමෙසු,

මෙහිද ස්ත්‍රීලිඞ්ගික ශබ්දයෙහි තෘතීයා පඤ්චමී සප්තමී එකවචනස්ථානයන්හි "අස්සා, ඉමිස්සා" යනු ප්‍රයොගසිද්ධි ආදියෙහි මුත් කච්චායන බාලාවතාරාදියෙහි නොදක්වන ලද්දේ නමුදු රූපසිද්ධියෙහි සප්තමී එකවචනස්ථානයෙහි පමණක් "ඉමිස්සා" යනු දක්වනලදී-චතුර්ථී ෂෂ්ඨී බහුවචනස්ථානයන්හි "ඉමාසං" යනු මුත් "ඉමාසානං" යනු ශබ්දනීතියෙහි නායේය-සප්තමී එකවචනස්ථානයෙහි "ඉමාය" යි පදයක් සිද්ධනොවන බව කච්චායනයෙහි දක්වනලද්දේ නමුත් ප්‍රයොගසිද්ධිආදියෙහි එම පදය දක්වන ලදී—එසේම චතුර්ථී ෂෂ්ඨී බහුවචනස්ථානවල "ආසං" යන පදයක්ද මොග්ගල්ලායන ප්‍රයොගසිද්ධි දෙක්හි පමණක් ආයේය—තවද පුල්ලිඞ්ගික නපුංසක ලිඞ්ගික ශබ්දවයෙහි පඤ්චමී සප්තමී එකවචනස්ථානයන්හි "අම්හා, අම්හි" යන පදවයක්ද ප්‍රයොගසිද්ධි මොග්ගල්ලායන වෘත්ති දෙක්හිද ආයේ නමුදු ඉම ශබ්ද ත ශබ්ද දෙක්හි එබඳු පදයන්ගේ සිද්ධිය කච්චායන බාලාවතාර ශබ්දනීති ආදියෙහි ප්‍රතිෂෙධ කරණලදී—එත ශබ්ද ඉම ශබ්ද දෙක්හි විතීයායෙහි "එනං, එනෙ" යන පදවයක්ද සිද්ධවන බව ප්‍රයොගසිද්ධියෙහි පමණක් පෙනේ.

තවද ලිඞ්ගත්‍රයෙහි "අයං ඉමෙ" යනාදි මේ සියළුම පදයන්ගේ ප්‍රකෘති පදය "ඉම" කියා බැවින් මීට "ඉමශබ්දය" යි කච්චායනාදියෙහි ව්‍යවහාරයි-එහෙත් පටිච්චසමුප්පාද පාළි ආදියෙහි "ඉදප්පච්චයා, ඉදප්පච්චයතා" යනාදියෙහි "ඉද" යන ප්‍රකෘතිය දක්නාලදහෙයින් ප්‍රකෘති පදය "ඉම" කියා නොව "ඉද" යනු බවද කියනලද්දේ පමණක් නොව එහෙයින් මීට "ඉදං ශබ්දය" යි කියාද ශබ්දනීතියෙහි ව්‍යවහාරයි.

7. දූර විචනො අමුසද්දෙ.

Amu Declined.

පුමෙ (උ.)—*Mas.* (U.)

එකවචන.	බහුවචන.
ප.. අසු, අමුකො, අවු,	අමූ, අමුයො
දු.. අමුං	අමූ, අමුයො
ත. .අමුනා	අමූහි, අමූභි
ක...අමුනා	අමූහි, අමූභි
ච.. අමුනො,* අමුස්ස	අමූසං, අමූසානං
පං..අමුනා, අමුම්හා, අමුස්මා	අමූහි, අමූහි
ඡ...අමුනො, අමුස්ස	අමූසං අමූසානං
ස ..අමුම්හි, අමුස්මිං,	අමූසු.

ඉත්ථියං (උ.)—*Fem.* (U.)

ප...අසු, අමු,	අමූ, අමුයො
දු...අමුං	අමූ, අමුයො
ත...අමුයා	අමූහි, අමූභි
ක...අමුයා	අමූහි, අමූහි
ච...අමුස්සා, අමුයා	අමූසං, අමූසානං
පං. .අමුයා	අමූහි, අමූහි,
ඡ . අමුස්සා, අමුයා,	අමූසං, අමූසානං
ස...අමුස්සං, අමුයං,	අමූසු.

නපුංසකෙ (උ.)—*Neut.* (U.)

ප ..අදුං	අමූ, අමූනි
දු . අදුං	අමූ, අමූනි
ත...අමුනා	අමූහි, අමූභි
ක...අමුනා	අමූහි, අමූහි
ච...අමුනො, අමුස්ස	අමූසං, අමූසානං
පං..අමුනා, අමුම්හා, අමුස්මා	අමූහි, අමූහි
ඡ... අමුනො, අමුස්ස	අමූසං, අමූසානං
ස ..අමුම්හි, අමුස්මිං	අමූසු.

* චතුත්ථි ෂෂ්ඨි දෙක්හි "අමුනො" යනු සිඬනොවන බව "තනො සස" යනාදින් පදසාධනියෙහි කියන ලදී.

බාලාවතාර ක්‍රමයට අමු ශබ්දයාගේ පදමාලා තොම මෙසේ නමුදු රූප සිද්ධියෙහි සමහර විභක්ති මීට වෙනස්ය—ප්‍රයොගසිද්ධි ශබ්දනීති ආදියෙහි රූපසිද්ධියෙහි ක්‍රමයටද වෙනස්ය—රූපසිද්ධියෙහි පුල්ලිඞ්ග ප්‍රථමා විභක්තිය මෙසේය—☞ "අසු; අමූ"—තියාය විතීයා...අමුං; අමූ-චතුත්ථි...අමුස්ස, අදුස්ස; අමූසං, අමූසානං පඤ්චමී...අමුම්හා, අමුස්මා; අමූහි, අමූභි-ස්ත්‍රීලිඞ්ගික ප්‍රථමා...අසූ; අමූ, අමුයො-නපුංසකලිඞ්ගයෙහිද තෘතීයාවෙහි පටන් පුල්ලිඞ්ගයෙහි මෙනි.

ශබ්දනීතියෙහි මේ රූපසිද්ධික්‍රමයට වඩා වෙනසනම් පුල්ලිඞ්ගික නපුංසක ලිඞ්ගික චතුත්ථී ෂෂ්ඨී එකවචනස්ථානවල "දුස්ස" යන පදයක් ඇතිබවහා ස්ත්‍රීලිඞ්ගික සප්තමී එකවචනස්ථාන යෙහි "අමුයා" යන පදයක් ඇති බවද නපුංසක ලිඞ්ගික ප්‍රථමා විතීයා දෙක "අදුං—අමූ" කියාද බව පමණයි.

ප්‍රයොගසිද්ධියෙහි බාලාවතාර ක්‍රමයට වඩා පුල්ලිඞ්ගික නපුංසක ලිඞ්ගික ශබ්දවලයෙහි වෙනසනම් පුල්ලිඞ්ගික ප්‍රථමා එකවචනස්ථාන යෙහි "අමු" කියා පදයක් නැතිබව හා පුංනපුංසක ලිඞ්ගික චතුත්ථී ෂෂ්ඨී එකවචනස්ථානවල "අමුනො" යන පදය නැති බවද යන මේදෙකයි—ස්ත්‍රීලිඞ්ගික ශබ්දයෙහි වෙනස දැනගැණීම පිණිස පිළිවෙළින්ම වරනැගා මෙහි දක්වනු ලැබේ.

	එක.	බහු.
	ප.. අසු	අමූ, අමුයො
	දු ..අමුං	අමූ, අමුයො
	ත...අමුස්සා, අමුයා	අමූහි, අමූභි
	ක...අමුස්සා, අමුයා	අමූහි, අමූභි
ප්‍රයොගසිද්ධියෙහි.	ච.. අමුස්සා, අමුයා	අමූසං, අමූසානං
	පං..අමුස්සා, අමුයා	අමූහි, අමූභි
	ඡ.. අමුස්සා, අමුයා	අමූසං, අමූසානං
	ස.. අමුස්සා, අමුස්සං අමුයං, අමුයා	අමූසු.

අමුශබ්දයෙන් පරව කකාරාගම කොට සිද්ධකරණු ලබන්නාවූ "අමුකො" යන පදය බාලාවතාරයෙහි සර්වනාමශබ්දයෙහි අන්තර්ගත කොට දැක්වූයේ නමුදු එය සර්වනාම ශබ්දක්‍රමයට වරනැගෙනනාවූ ශබ්දයක් නොවන බැවින් ශබ්දනීති ප්‍රයොගසිද්ධි ආදියෙහි වෙන් වශයෙන්ද—"අමුකො-අමුකා" යනාදි වශයෙන් පුල්ලිඞ්ගයෙහි බුද්ධශබ්දය මෙන්ද—"අමුකා-අමුකා, අමුකායො" යනාදි වශයෙන් ස්ත්‍රීලිඞ්ගයෙහි කඤ්ඤාශබ්දය මෙන්ද—"අමුකං-අමුකානි" යනාදීන් චිත්තශබ්දය මෙන් නපුංසක ලිඞ්ගයෙහිද වරනැගිය යුතුබව කියන ලදී—අමුශබ්දයද සමාසයෙහි අප්‍රසිද්ධයි.

8. පුච්ඡනත්ථො කිං සද්දො.

Kim. Declined.

පුමෙ (ඉං—අ.)—*Mas.* (Im—A.)

එකවචන.	බහුවචන.
ප...කො	කෙ
දු...කං	කෙ
ත...කෙන	කෙහි, කෙභි
ක...කෙන	කෙභි, කෙහි
ච...කස්ස, [කිස්ස]	කෙසං, කෙසානං
පං..කම්හා, කස්මා	කෙහි, කෙභි
ඡ...කස්ස, [කිස්ස]	කෙසං, කෙසානං
ස...කම්හි, [කස්මිං] [කිම්හි, කිස්මිං]	කෙසු

ඉත්ථියං (ඉං—ආ.)—*Fem.* (Im—A.)

ප...කා	කා, කායො
දු...කං	කා, කායො
ත...කාය [කස්සා]	කාහි, කාභි
ක...කාය [කස්සා]	කාභි, කාහි
ච...කාය, [කස්සා]	කාසං, කාසානං
පං..කාය, [කස්සා]	කාහි, කාභි
ඡ...කාය, [කස්සා]	කාසං, කාසානං
ස...කස්සං, කායං [කාය [කස්සා]	කාසු

නපුංසකෙ (කිං—අ.)—*Neut.* (Im—Am.

ප කං, [කිං*]	කානි
දු...කං, [කිං]	කානි
ත...කෙන	කෙහි, කෙභි
ක.. කෙන	කෙභි, කෙහි,
ච ..කස්ස, [කිස්ස]	කෙසං, කෙසානං
පං..කම්හා, කස්මා	කෙහි, කෙභි
ඡ...කස්ස, [කිස්ස]	කෙසං, කෙසානං
ස...කම්හි, කස්මිං, [කිම්හි, කිස්මිං]	කෙසු.

---

* "සබ්බවිධිහොය ලොපවිධිබලවාන්" සියළු විධිවලට වඩා ලොප් විධිය බලවත් හෙයින් කිං ශබ්දයාකෙරෙන් පරවූ සි-අං-යන විභක්ති ලොප්කළ කල්හි දෙවනු ක කාරාදෙශ නොවන හෙයින් "කිං" යනු සිධයි.

චතුත්ථී ෂෂ්ඨී එකවචනස්ථානවල "කිස්ස" යනුද සප්තමී එක වචනස්ථානයෙහි "කිම්හි, කිස්මිං" යනුද බාලාවතාරාදියෙහි නො දක්වන ලද්දැහු නමුදු

"කිස්සස්ස එක ධම්මස්ස වධං රොචෙසි ගොතම"
"කිස්මිං ලොකො සමුප්පන්නො කිස්මිං කුබ්බති සන්ථවං"
"කිම්හි කාලෙ තයා වීර පත්ථිතා බොධි මුත්තමා"

යනාදි තැන්වල දක්නා ලද හෙයින රූපසිද්ධි පයොගසිද්ධි ආදියෙහි දක්වන ලද්දේය.

බහුවචනස්ථානවල "කෙසං" යනු මුත් "කෙසානං" යනු ශබ්ද නීති රූපසිද්ධි දෙක්හිම නායේය—තෘතීයාදියෙහි "කස්සා" යනු ගැණ "සබ්බස්සා" යන්න ගැණ කී විභාගය දතයුතුය—ප්‍රථමා ද්විතීයා එකවචනස්ථානවල "කිං" යනු "කිං පරාභවතො මුඛං" යනාදියෙහි දක්නාලද හෙයින් පයොගසිද්ධි රූපසිද්ධි ආදියෙහි කියනලදී.

තවද "කො තෙ බලං මහාරාජ—කොනු ත්වං සාම ජීවසි?" යනාදි තැන්වල පෙනෙන "කො" යන පදය ප්‍රථමා එකවචනයක් නොව "ඛ-කාරථං" යනාර්ථයන්හි වැටෙන නිපාතයකැයි දත යුතුයි.

එහෙයින් කිහ.

"කො තෙ බලං මහාරාජ ඉති ආදීසු පාළිසු.
ඛ සද්දත්ථෙ වත්තතීති ඤෙය්‍යො කො ඉධයං සුති.
පෙතානකං සාම මද්දක්ඛි කොනු ත්වං සාම ජීවසි?,
ඉති පාඨෙ කාථං සද්දෙ ඛිංධයෙය්‍ය වත්තතී තිච.
එතෙසු විසු අත්ථෙසු දිට්ඨෝ කො ඉධයං රගවා,
නිපාතොති ගහෙතබ්බො සුතිසාමඤ්ඤතො රුතො,"

තවද සර්වනාම කිං ශබ්දය නින්දාර්ථ, අනියමාර්ථ, (සරූප වස්තු ක්‍රියා කාරණ කෘත්‍ය යන මොවුන්ගේ) පෘච්ඡාර්ථ, නිෂ්ඵලාර්ථ, සම්පටිච්ඡනාර්ථයන්හිද— සුබනාම භූත කිං ශබ්දය ජලජාර්ථ සදෘශාර්ථයන්හිද පවත්නේය—එහෙයින් කිහ.

එකක්ඛරකොසයෙහි

"නින්දානියම පුච්ඡාසු නිප්ඵලෙ සම්පටිච්ඡනෙ.
සබ්බනාමිකා පදං කිං ජලජෙ සදිසෙ තු කිං."

එකක්ඛරකොස ටීකාවෙහි—"කිං රාජා යො ලොකං නරක්ඛති—කිං නු ඛො නාම තුම්හෙ මං වත්තබ්බං මඤ්ඤථ?" යනාදි තන්හි

නිඥාර්ථයෙහිය-"යං කිඤ්චි රූපං අතීතානාගත පච්චුප්පන්නං" යනාදි තන්හි අනියමාර්ථයෙහිය—"[1]කිංසූධ විත්තං පුරිසස්ස සෙට්ඨං—[2]කිං සීලං කො සමාධි—[3]කිං බාදසි කිං ජවසි—[4]කිං නු සන්තරමානොව කාසුං ඛණසි සාරථි-කිං නු ජාති නාගරවෙසි-කෙන තෙ තාදිසො වණ්ණො—[5]කිං කාසුයා කරිස්සසි" යනාදි තන්හි පිළිවෙළින් [1]ස්වරූප [2]වස්තු [3]ක්‍රියා [4]කාරණ [5]කාර්ය්‍ය යන මොවුන්ගේ ප්‍රශ්නාර්ථ යන්හිය—"කිං තෙ වක්කලි ඉමිනා පූතිකායෙන දිට්ඨෙන යො ඛො වක්කලි ධම්මං පස්සති සො මං පස්සති" යනාදි තන්හි නිෂ්ඵලාර්ථයෙහිය—"කිං න කාහාමි තෙ වචො" යනාදි තන්හි සම්පටිච්ඡනාර්ථයෙහිය.

සුඛනාමභූත කිං ශබ්දය "කිඤ්ජක්ඛං*" යනාදීයෙහි ජලාර්ථයෙහිය—"කිම්පුරිසො † කින්නරො" යනාදියෙහි සදෘශාර්ථයෙහි යයි කියන ලදී.

තවද කිං ශබ්දයාගේ ලිංගත්‍රය වශයෙන් විභක්ත්‍යන්තවූ කො-කා-කං යනාදි පදයො සමාසයෙහිදී කිං යන රූපයෙන්ද නාමශබ්දය හා සමාසවූ කල "කිං-කො" යන දෙයාකාරයෙන්මද සිටිත්.

එම කීහ.

"කිංසද්දස්ස සමාසම්හි සඛිං නාම රවෙනවෙ,
කිනනාමො ඉති කො නාමො ඉති චෙවං ගති විධා.
කො නාමො තෙ උපජ්ඣායො ඉඩාදෙත්ථ නිදස්සනං,
ජහඤ්ඤෙනූන සමාසම්හි කිං කිං ඉමෙව සූයතෙ."

කිං ශබ්දයතෙම සමහර තැනෙක වෙන් වශයෙන්ද සමහර තැනෙක පදාවයව භාවයෙන්ද, සමහර තැනෙක "නු-සු-නුඛො-කාරණ" යනාදි ශබ්දයන් සමග සහචාරී භාවයෙන්ද දක්නා ලැබේ.

වෙන් වශයෙන්—"එසා තෙ ඉත්ථී කිං හොති-එතෙ මනුස්සා තුම්හාකං කිං හොති" යනාදියෙහිය—"කිඤ්ජක්ඛා කිම්පුරිසො" යනාදියෙහි පදාවයවභාවයෙන්ය—"කින්නු භීතොව තිට්ඨසි-කිංසු ඡෙත්වා සුඛං සෙති—කිං කාරණා පාලිත ත්වං පමජ්ජසි" යනාදියෙහි සහචාරී භාවයෙන්ය.

---

* "කෙ (උදකෙ) ජායතීති කිං, කමලාදි-තස්මිං ජායති ජලතීති වා කිංජක්ඛා යනුද.

† කිනාති සමෙතීති කිං—කිං (සදිසො) පුරිසොති කිම්පුරිසො—කින්නරො—කිනන රිති ආදීසුපි එසෙව නයො" යනුද එකක්ඛරකොෂ ටීකායි.

එම කීහ,

"මීසු පදවයමො චං ශුත්වා නචාදිගි වා පන,
ශුතෙනා සඥෙදගි කිං සඥෙද දීඝො සුගතසාසනෙ.
පාලිනයානු සාරෙන සෙසානං සමහාවෙං පිච,
ඤෙයෙ විඤ්ඤෑගි සඩම්මනාස ඤ්ඤෑගි පභෙදතො."

සර්වනාම කිං ශබ්දයාගේ පුල්ලිංගික නපුංසක ලිංගික පදමාලං වන්හි කොහි-කිස්ස-කස්මා-කම්හා-කම්හි-කිම්හි-යන පදයන්ද,

ස්ත්‍රීලිංගික පදමාලාවෙහි-කායො-කාහි-කාසානං-කායං-කස්සං යන පදයන්ද හැර සෙසු පදයො "චි-චන-චනං"-යන මොවුන් සමග යෙදී මෙසේ රූපවත්ව දක්නා ලැබෙත්—කෙසේද?

☞ කො චි	කෙහි චි	කාචි ඉත්ථි
කෙ චි	කස්ස චි	කාචි ඉත්ථියො
කෙ චන	කෙසඤ්චි	කිඤ්චි...
කඤ්චි	* * *	කාය චි
කිඤ්චි	කෙහි චි...	කාහි චි
කිඤ්චනං	කස්මි චි	කාසස චි
කෙ චි	කිස්මි චි	කා සඤ්චි
කෙ චන	කෙසු චි.	* * *
කෙන චි		කායචි
		කාසු චි.

යථොක්ත පදයෝ ය ශබ්දය සමගයෙදුනු කල මෙසේය

☞ යො කොචි	යේසං කෙසඤ්චි	යා කාචි
යෙ කෙචි	යස්මිං කිස්මි චි	යං කිඤ්චි
යං කිඤ්චි	යස්මිං කස්මි චි	යාය කාය චි
යෙන කෙන චි	යෙසු කෙසු චි.	යාහි කාහි චි
යෙහි කෙහි චි	යං කිඤ්චි	යාසං කාසඤ්චි
යස්ස කස්ස චි	යානි කානි චි.	යාසු කාසු චි.

මෙසේ ලිංගත්‍රය වශයෙන් කියන ලද්දාවූ "යොකොචි-යංකිඤ්චි යාකාචි" යනාදිය අනවශෙෂ පයඝීදන වචනයෝයයිද, මේ සියලු නිපාත පද නොවේ නමුදු නිපාත ප්‍රතිරූපක ශබ්ද ගතිකයෝ යයිද කියන ලදී.

9. තීසු ලිඞ්ගෙසු සමානරූපා

තුම්හාම්හසද්දා.* (අ.)

Tumha and Amha, (A.) equal in the three Genders.

ඒකවචන	බහුවචන
ප...ත්වං, තුවං, අහං, [අහකං]	†තුම්හෙ, මයං, අම්හෙ, [අස්මා]
දු...තං, තවං, තුවං, ත්වං [තුම්හං] මං, මමං [අම්හං]	තුම්හාකං, තුම්හෙ, [තුම්හං] අම්හාකං, අම්හෙ, [අම්හං, අස්මා]
ත...ත්වයා, තයා, මයා	තුම්හෙහි, තුම්හෙභි අම්හෙහි, අම්හෙභි
ක...ත්වයා, තයා, මයා	තුම්හෙහි, තුම්හෙභි අම්හෙහි, අම්හෙභි
ච...තව, තුය්හං, තුම්හං මම, මය්හං, අම්හං, මමං	තුම්හාකං, අම්හාකං, [අස්මාකං]
පං...ත්වයා, තයා [ත්වම්හා] මයා	තුම්හෙහි, තුම්හෙභි අම්හෙහි, අම්හෙභි
ඡ...තව, තුය්හං, තුම්හං, මම, මය්හං, අම්හං, මමං	තුම්හාකං, අම්හාකං, [අස්මාකං]
ස...ත්වයි, තයි, මයි,	තුම්හෙසු, අම්හෙසු, [අස්මාසු]

බාලාවතාරාදී පොත්වල තුම්හ අම්හ යන ශබ්දයන්ගේ පදමාලා දෙක එකට ගලපා දක්වන ලද්දෙන් මෙහිද එලෙස දක්වනු ලැබූ නමුදු ශේලගපිටෙහි වෙන් වෙන් වශයෙන්ද තුම්හ අම්හ ශබ්දයන්ගේ පදමාලාවන් දක්වනු ලැබෙත්.

* "තුම්හ අම්හ සද්දා පර අතත නිද්දෙසවචනා"–යනු පදසාධනී ටීකායි.

† ප්‍රථමා බහුවචනස්ථානයෙහි "තුම්හං, අම්හං" කියා කච්චායනයෙහි දක්නා ලද බව ශබ්දනීතියෙහි කියන ලද්දේ මුත් අපවිසින් නොදක්නා ලදී.

* යෙන කාරෙති තස්ස වාතාඛ්‍යවචනො

තුම්හසද්දො (අ.)—*Tumha* (A.)

එකවචන.	**බහුවචන.**
ප.. ත්වං, තුවං	තුම්හෙ
දු... තං, තවං, තුවං, ත්වං, [තුම්හං]	තුම්හාකං, තුම්හෙ, [තුම්හං]
ත... ත්වයා, තයා	තුම්හෙහි, තුම්හෙභි
ක... ත්වයා, තයා	තුම්හෙහි, තුම්හෙභි
ච... තව, තුය්හං, තුම්හං	තුම්හාකං
පං.. ත්වයා, තයා, [ත්වම්හා]	තුම්හෙහි, තුම්හෙභි
ඡ.. තව, තුය්හං, තුම්හං,	තුම්හාකං,
ස .. ත්වයි, තයි	තුම්හෙසු.

අත්තනි වචනාඛ්‍යවචනො

අම්හසද්දො (අ.)—*Amha.* (A.)

එකවචන.	**බහුවචන.**
ප... අහං, [අහකං]	මයං, අම්හෙ, [අස්මා]
දු... මං, මමං, [අම්හං]	අම්හාකං, අම්හෙ, අම්හං, [අස්මා]
ත... මයා	අම්හෙහි, අම්හෙභි
ක... මයා	අම්හෙහි, අම්හෙභි
ච.. මම, මය්හං, අම්හං	අම්හාකං [අස්මාකං]
පං.. මයා	අම්හෙහි, අම්හෙභි
ඡ... මම, මය්හං, අම්හං	අම්හාකං, [අස්මාකං]
ස... මයි	අම්හෙසු, [අස්මාසු.]

තුම්හ අම්හ ශබ්දද්වය ලිඞ්ගත්‍රයෙහිම සමාන රූප බැවින් අලිඞ්ගික යයි රූප සිද්ධියෙහි කියන ලදී—මෙහි ප්‍රථමා එකවචනස්ථානයෙහි "අහකං" යනු "අහක ච චිත්තවසානුගා භාවිස්සං" යනාදියෙහි දක්නා ලදහෙයින් ශබ්දනීතියෙහි පමණක් දක්වන ලද්දේය—

ප්‍රථමා විතීයා බහුවචනස්ථානයන්හි "අස්මා" යනුහා විතීයා බහුවචනස්ථානයෙහි "තුම්හං, අම්හං" යනුද මොග්ගල්ලායනවෘත්ති පයෝගසිද්ධි පදසාධනි යන තුනෙහි පමණක්ය—එසේත් "තුම්හං, අම්හං" යනු ශබ්දනීතියෙහිද ආදේශ—"තුම්හානං, අම්හානං" සීද ප්‍රථමා විතීයා බහුවචනවයත් කච්චායන ශබ්දනීති දෙක්හි පමණක් දක්වනලද්දේය "මමං" යන චතුර්ථී ෂෂ්ඨී එකවචනයද ශබ්දනීතියෙහි නොදක්වන ලද්දේ පමණක් නොව "අස්මාකං" යන බහුවචනයද බාලාවතාරාදියෙහි නායේ නමුදු පෙළෙහි ඇති හෙයින් රූපසිද්ධ්‍යාදියෙහි දක්වන ලද්දේය-"ත්වම්හා" යනා පචමී එකවචනයද පයෝගසිද්ධි ආදියෙහි මුත් කච්චායන රූපසිද්ධි නිරුත්තිපිටකාදියෙහි නායේය-"අස්මාසු" යන සප්තමී බහුවචනයද මොග්ගල්ලායනවෘත්ති පයෝගසිද්ධි පදසාධනි යන පොත්වල පමණක්ය-එහෙත් ශබ්දනීතියෙහි පමණක් ඒ වෙනුවට "අස්මෙසු" යන පදයක් දක්වන ලදී—චූලනිරුත්ති නිරුත්තිපිටක යන පොත්වල පමණක් "තුම්හං, අම්හං" සී විතීයා එකවචනවයක්ද "තුම්හෙ, අම්හෙ" සී චතුර්ථී ෂෂ්ඨී බහුවචනවයක්ද කියන ලද්දේ පමණක් නොව පරීක්ෂා කොට අටුවා කථා සහිත පිටකත්‍රයෙහි පෙණේනම් ගතයුතුබව්ද ශබ්ද නීතියෙහි කියන ලදී.

පරපදයන් හා සමාසවූ කල තුම්හ ශබ්දය "ත්වං" යන රූපයෙන් හා "ත" යන රූපයෙන්ද—අම්හ ශබ්දය "මං" යන රූපයෙන් හා "ම" යන රූපයෙන්ද යුක්තව දක්නාලැබෙත්—ඒනම්-"එතෙ ගාමනි මංදීපා මංලෙණා මංසරණා" යනාදියෙහි හා "ත්වං මුඛං කමලෙනෙව තුල්‍යං නාඤ්ඤෙන කෙනචි-චන්දෙන ත්වං මුඛං තුල්‍යං-තය්‍යොගො, මය්‍යොගො" යනාදියෙහිය-එහි "අහං දීපො එතෙසන්ති මංදීපා-අහං ලෙණං එතෙසන්ති මංලෙණා-අහං සරණං එතෙසන්ති මං සරණා-තව (තුම්හාකං වා) මුඛං ත්වං මුඛං-තුම්හෙහි (සදෙන) යොගො තය්‍යොගො, අම්හෙහි (සදෙන) යොගො මය්‍යොගො" යනු සමාස විග්‍රහයි.

එම කීහ.

"සමාසෙ තුම්හ අම්හානං හොන්ති පර පදෙහි චෙ,
ත්වං මුඛංති ච මං දීපා තය්‍යොගො මය්‍යොගොති ච."

තවද තුම්හ අම්හ ශබ්දයන්ගේ විභක්ත්‍යන්ත රූප යථොක්ත පදමාලාවෙහි පෙනෙන පමණක් නොව තෙ-මෙ-වො-නො-කියාද වෙත්—එහි තෙ-වො-තුම්හශබ්දයාගේ පිළිවෙළින් එකවචන බහු

වචන රූපයෝය-මෙ-නො-යනු අම්හ ශබ්දයාගේය-විභක්ත්‍යන්ත පදයකින් පරව මුත් පූර්ව නොයෙදෙන හෙයින් යථොක්ත පද යන් පදමාලාවෙහි නොයොදන ලදී.

එම කීහ.

“කාරණෙ සම්පදානෙ ච සාමි අත්ථෙ ච ආගතා,
තෙ මෙසද්දා ති විඤ්ඤෙය්‍යා විඤ්ඤූනා නයදස්සිනා.
පච්චත්ත උපයොගෙ ච කාරණෙ සම්පදානියෙ,
සාමිස්ස වචනෙ චෙව (තථෙව පදපූරණෙ.)
ඉමෙසු ඡසු ඨානෙසු වො සද්දා සම්පවත්තති,
පඨත්ථෙ උපයොගෙ ච කාරණෙ සම්පදානියෙ.
සාමඤ්ඤවධාරණෙ චෙව නුසද්දත්ථෙ නිවාරණෙ,
තථා නිපාතමත්තම්හි නො සද්දා සම්පවත්තති.
තෙ මෙ වො නො ති රූපානි පරානි පදතො යතො,
තතො නාමිකපනතීසු නවූත්තානි මෙ තානි මෙ.”

පදයාකෙරෙන් පරවූ තුම්හාම්හ ශබ්ද රූප.

Pronominal Affixes of *Tumha and Amha.*

විභක්ති නාම.	එකවචන.		බහුවචන.	
	තුම්හශබ්දයාගේ.	අම්හශබ්දයාගේ.	තුම්හශබ්දයාගේ.	අම්හශබ්දයාගේ.
ප්‍රථමා	,,	,,	වො	නො
විතීයා	,,	,,	වො	නො
තෘතීයා	තෙ	මෙ	වො	නො
චතුත්ථී	තෙ	මෙ	වො	නො
ෂෂ්ඨී	තෙ	මෙ	වො	නො

සර්වනාමසංඛ්‍යාශබ්ද.

NUMERALS.

1. සංඛ්‍යාදි වචනො එක සද්දො.

E'ka Declined.

පුමෙ (අ.)—*Mas.* (A.)

එකවචන.	බහුවචන.
ප...එකො	එකෙ
දු...එකං	එකෙ
ත...එකෙන	එකෙහි, එකෙභි
ක...එකෙන	එකෙහි, එකෙභි
ච ..එකස්ස	එකෙසං, එකෙසානං
පං..එකම්හා, එකස්මා	එකෙහි, එකෙභි
ඡ...එකස්ස	එකෙසං, එකෙසානං
ස...එකම්හි, එකස්මිං	එකෙසු.

ඉත්ථියං (ආ.)—*Fem.* (A'.)

ප...එකා	එකා, එකායො
දු...එකං	එකා, එකායො
ත...එකාය	එකාහි, එකාභි
ක...එකාය	එකාහි, එකාභි
ච...එකිස්සං, එකාය	එකාසං, එකාසානං
පං..එකාය	එකාහි, එකාභි
ඡ...එකිස්සා, එකාය	එකාසං, එකාසානං
ස...එකිස්සං, එකායං, [එකාය]	එකාසු.

නපුංසකෙ (අ.)—*Neut.* (A)

ප . එකං	එකානි
දු.. එකං	එකානි
ත...එකෙන	එකෙහි, එකෙභි
ක...එකෙන	එකෙහි, එකෙභි
ච...එකස්ස	එකෙසං, එකෙසානං
පං..එකම්හා, එකස්මා	එකෙහි, එකෙභි
ඡ...එකස්ස	එකෙසං, එකෙසානං
ස . එකම්හි, එකස්මිං	එකෙසු.

මේ එකශබ්දයෙහිද චතුර්ථී ෂෂ්ඨී බහුවචනස්ථානවල "එකෙසානං" යනු ශබ්දනීතියෙහි නායේස-එකශබ්දය ("එකසද්දො සංඛ්‍යා තුල්‍යාඤ්ඤ සහායත්ථො-යදා සංඛ්‍යත්ථො තදෙකවචනො අඤ්ඤත්‍ර සබ්බවචනො ච" යනු බැවින්) සංඛ්‍යාර්ථ අතුල්‍යාර්ථ අන්‍යාර්ථ අසහායාර්ථ වාචී බව හා සංඛ්‍යාර්ථ වාචී කල එක වචනද, අතුල්‍යාර්ථාදිය වාචකකල සියළු වචනද ඇතිබව බාලාවතාර ප්‍රයොග සිද්ධි යනාදියෙහි කියන ලද්දේ නමුදු ශබ්දනීතියෙහි මීට මදක් වෙනස්ලෙස විභාග සහිතව කියන ලදී—ඒනම්-එක ශබ්දයතෙම සංඛ්‍යාය (හෙවත් එකය යන අර්ථයයි) අතුල්‍යය (ශ්‍රෙෂ්ඨය යන අර්ථයයි) අසහායය (හුදකලාව යන අර්ථයයි) අන්‍යය (සමහරෙක් යන අර්ථයයි) මිශ්‍රය යන මෙතෙක් අර්ථවාචී වේ—යම් කලෙක්හි [1]සංඛ්‍යාර්ථ [2]අතුල්‍යාර්ථ [3]අසහායාර්ථ වාචී වේද එකල්හි එකවචන පමණක් ඇත්තේය—ඊට උදාහරණ මෙසේය—"[1]එකො රුක්ඛො-එකා ලතා-එකං ඝරං-[2]සබ්බ ලොකස්ස එකො රාජා-එකොම්හි සම්මාසම්බුද්ධො*-[3]එකො සබ්බඤ්ඤුතං ගතො-එකො අරඤ්ඤං පවිසිත්වා යනාදියයි.

තවද ක්‍රමයක්—යම්කලෙක්හි සංඛ්‍යාර්ථද අසහායාර්ථද බොහෝ කියනු ලැබෙද්ද එකල්හි එක ශබ්දයාකෙරෙන් කකාරාගම කොට "එකකා, එකකෙ" යනාදි වශයෙන් පුරිසශබ්දයෙහි බහුවචන මෙන් පදමාලා කටයුතුය—"චත්තාරො එකකා සියුං"-ඉමෙ ගහපතයො එකකාව ආගතා" යනාදි උදාහරණ බැලිය යුතුයි—මේ පසුව කී ක්‍රමය සර්වනාම පක්ෂය භජනය නොකෙරේ.

එක ශබ්දය යම් කලෙක්හි [1]අන්‍යාර්ථ † [2]මිශ්‍රාර්ථ වාචී වේද එකල්හි බහුවචන පමණක් ඇත්තේය—"[1]අප්පණ්ණකං ඨාන මෙකෙ දුතියං ආහු තක්කිකා-එකෙ ආචරියං එව මාහංසු-එකෙ වදන්ති අත්තානං"—"[2]පච්ඡාලො ච විදෙහො ච උභො ‡ එකා භවන්තුතෙ" යනු උදාහරණයි.

තවද ප්‍රථමා එකවචනයෙහි එකාරාන්ත රූපද එක ශබ්දයෙහි ඇති බව "එකෙ එකඨෙ සමෙ සමභාගෙ"යනාදියෙන් දත යුතුයි.

---

* එකශබ්දය තුල්‍යාර්ථයෙහිද පවත්නාබවද එකල්හි එකවචන බහුවචන දෙවර්ගයම ඇතිබවද ප්‍රයොගසිද්ධියෙහි දක්වනලද උදාහරණවලින් පෙනේ—"එකො පි ලාසො විනතං කුමාරනං-එකෙ වණ්ණා සදිසා විනතං කුමාරනං" යනුයි.

† එකශබ්දය මිශ්‍රාර්ථ වාචීකල සර්වනාමපක්ෂය භජනය නොකෙරේ. පුරිස ශබ්දයාගේ බහුවචන මෙන් පදමාලා කටයුතුයි.

‡ "තණ්හා එකා භවන්තුති එකී භවන්තු මිස්සී භවන්තු ගඞ්ගොදකෙන යමුනොදකං විය සංසන්දන්තු සමෙන්තු" යනු ටීකායි.

2. තීසු ලිඞ්ගෙසු සමානරූපො
සදා බහුවචනන්තො
* විසද්දපරියායො උභසද්දෝ. (අ.)

Ubha (A.) Declined.

බහුවචන.

ප.. උභො, උභෙ
දු...උභො, උභෙ
ත...උභොහි, උභොභි, උභෙහි, උභෙභි
ක...උභොහි, උභොභි, උභෙහි, උභෙභි
ච...උභින්නං
පං..උභොහි, උභොභි, උභෙහි, උභොහි
ඡ උභින්නං
ස...උභොසු, උභෙසු.

උභ ශබ්දය ලිඟත්‍රයෙහි සමාන රූප ඇත්තේය—බහුවචනාන්තය—සර්වනාම ශබ්දයක්ය—ද්විශබ්දාර්ථ වාචීය—අඟාවංසාචාර්‍ය්‍යමතය ලෙසවූ උභ ශබ්දයෙහි "උභෙ, උභෙහි, උභෙභි, උභෙසු." යන පද නොදක්වන ලද නමුදු කච්චායනාදියෙහි "උභෙ තප්පුරිසා" යනාදි තන්හි "උභෙ" යනාදිය දක්නාලද හෙයින් සමහර ආචාර්‍ය්‍යවරයන් විසින් මෙහි දක්වනු ලැබූ පදමාලා ක්‍රමය අනුමත කරණ ලදී.

විභක්ති පරකල්හි ද්විශබ්දයට "උභ" යනාදේශ වීමෙන්ද "උභින්නං" යී පදයක් සිඩවන බවත්ද කච්චායනාදියෙහි කියන ලදී.

උභ ශබ්දය සමාසයෙහි අප්‍රසිඞයි.

---

* "විසද්දපරියායොති රූකෙබා තරූති ආදි විය" යනු රූපසිඞි ටීකායි

ද්වාදයො අට්ඨාරසන්තා බහුවචනන්තා.

3. ත්‍රීසු ලිඞ්ගෙසු සමානරූපො
සංඛ්‍යා වචනො ද්වි සද්දො. (ඉ.)

Dvi (I) M. F. N.

බහුවචන.

ප.. දුවෙ, ද්වෙ
දු . දුවෙ, ද්වෙ
ත...ද්වීහි, ද්වීභි
ක...ද්වීහි, ද්වීභි
ච...දුවින්නං, ද්වින්නං
පං...ද්වීහි, ද්වීභි
ඡ...දුවින්නං, ද්වින්නං
ස...ද්වීසු.

මේ ද්විශබ්දයාගේ පදමාලාවෙහි "දුවෙ, දුවින්නං" යනු බාලාවතාරයෙහි නොදක්වන ලද්දේ නමුදු කච්චායනාදියෙහි දක්වන ලදී— "දුවෙ" යනු ශබ්දනීතියෙහිද නොදක්වන ලදී—චූලනිරුත්තියෙහි පමණක් චතුර්ථී ෂෂ්ඨී දෙක්හි "ද්වින්නන්නං" යන රූපයක්ද දක්වනලදී.

ද්විශබ්දය පරපදයන් හා සමාසවූ කල "ද්වි" යන ප්‍රකෘතියෙන් පමණක් නොව "දු—දෙ" යන රූපවලින්ද සිටින බව "ද්විභාවො-දුවඞ්ගිකො-දෙහලිනී" යනාදියෙන් දත යුතුයි.

ද්වෙ පුරිසා-ද්වෙ ඉත්ථියො-ද්වෙ චිත්තානි-යනාදි වශයෙන් පුල්ලිඞ්ගික ස්ත්‍රීලිඞ්ගික නපුංසකලිඞ්ගික ශබ්දයන් සමග ද්වෙ යනාදී රූපයන් යොදනු ලැබෙත්.

4. ඉකාරන්ත සඞ්ඛ්‍යානාමිකො සංඛ්‍යාවචනො තිසද්දො.		
පුලිං (ඉ.)—*M.* (I.)	ඉත්ථිලිං (ඉ.)—*F.* (I.)	නපුං: (ඉ.)—*N.* (.I)
බහුවචන.	බහුවචන.	බහුවචන.
ප...තයො	ප...තිස්සො	ප ..තීණි
දු තයො	දු...තිස්සො	දු...තීණි
ත...තීහි, තීභි	ත...තීහි, තීභි	ත...තීහි, තීභි
ක...තීහි, තීභි	ක ..තීහි, තීභි	ක...තීහි, තීභි
ච...{ තිණ්ණං, තිණ්ණන්නං	ච...තිස්සන්නං	ච...{ තිණ්ණං තිණ්ණන්නං
පං..තීහි, තීභි	පං..තීහි, තීභි	පං..තීහි, තීභි
ඡ...{ තිණ්ණං තිණ්ණන්නං	ඡ...තිස්සන්නං	ඡ...{ තිණ්ණං තිණ්ණන්නං
ස...තීසු.	ස...තීසු.	ස...තීසු.

ස්ත්‍රී ලිඟික තිශබ්දයාගේ චතුර්ථී ෂෂ්ඨි දෙක්හි "තිස්සං" යන රූපයක් මූලනිරුක්තියෙහිද "තිණ්ණන්නං" යන රූපක් නිරුක්තිපිටකයෙහිද දක්නාලද්දේ නමුදු අටුවා කථා සහිතවූ පිටකත්‍රයෙහි නැවත නැවතත් පරීක්‍ෂා කොට එසේවූ පද පෙණේනම් ගතයුතු බව පමණක් ශබ්ද නීතියෙහි කියන ලදී.

නපුංසක ලිඟිකවූ "තීණි" යන පදයාගේ ණිකාර ලොප වශයෙන් සිද්ධවූ පද පාළියෙහි ඇති බව "මෙ විං ති වා උදකඤ්සිතානි" යනාදියෙන්ද—"තිණ්ණන්නං" යනාදිය පාළියෙහි විද්‍යමාන බව "තිණ්ණන්නං ඛො භික්ඛවෙ ඉන්ද්‍රියානං භාවිතත්තා බහුලීකතත්තා පිණ්ඩොල භාරද්වාජෙන භික්ඛුනා අඤ්ඤා බ්‍යාකතා" යනාදියෙන්ද දත යුතුයි.

ති ශබ්දය සමාසයෙහි "ති" යන ප්‍රකෘතියෙන් සිටින බැව් ආදිය මෙසේ කියන ලදී.

☞ "යානි රූපානි වුත්තානි තිස්සො තීණි තයො ඉති,
සමාසවිසයෙ තානි ති'ති පකති කා සියුං
තස්මා තිස්ස සමාසම්හි සඞ්ඛං පර පදෙන වෙ,
ත්වෙදන නත්ති විත්තත්ති තිලොකන්ති ච සිද්ධිසෙ.
එත් නපුංසකත්තංච පාසංසං පාය වුත්තිතො
පුම ත්තමෙපත් ඉච්ඡන්ති තිභවො බායනෙ ඉති."

5. උකාරන්තො සබ්බනාමිකො සංඛ්‍යාවචනො චතුසද්දො		
පුම (උ.)—*M.* (U.)	ඉත්ථිං (උ.)-*F.* (U.)	නපුං (උ.)—*N.* (U.)
බහුවචන.	බහුවචන.	බහුවචන.
ප... චත්තාරො, චතුරො	ප...චතස්සො	ප...චත්තාරි
දු... චත්තාරො චතුරො	දු...චතස්සො	දු...චත්තාරි
ත...චතුබ්භි, චතූහි	ත...චතුබ්භි, චතූහි	ත...චතුබ්භි, චතූහි
ක...චතුබ්භි, චතූහි	ක...චතුබ්භි, චතූහි	ක...චතුබ්භි, චතූහි
ච...චතුන්නං	ච...චතස්සන්නං	ච...චතුන්නං
පං..චතුබ්භි, චතූහි	පං..චතුබ්භි, චතූහි	පං..චතුබ්භි, චතූහි
ඡ.. චතුන්නං	ඡ.. චතස්සන්නං	ඡ...චතුන්නං
ස ..චතූසු.	ස...චතූසු	ස...චතූසු.

මේ චතු ශබ්දයාගේ පදමාලාවෙහි "චතුබ්භි" යන රූපයක් තෘතීයා පඤ්චම්‍යාදියෙහි ශබ්දනීතියෙහි පමණක් දක්වන ලදී—බාලාවතාරාදියෙහි නොදක්වන ලද්දේ නමුදු එබඳු පද පාළියෙහි බොහෝ තැන පෙනෙන හෙයින් ගත යුතුය.

ස්ත්‍රීලිඞ්ගික ශබ්දයෙහි චතුර්ථී ෂෂ්ඨී දෙක්හි "චතුන්නං" යන පදය චූලනිරුත්ති ශබ්දනීති නිරුත්තිපිටක යන පොත්වල ආයේය—කච්චායන බාලාවතාරාදියෙහි නායේ නමුදු "සමණො ගොතමො චතුන්නං පරිසානං පියො මනාපො" යනු සොණදණ්ඩ සූත්‍රයෙහිද—"ආචරියො පනස්ස චතුන්නං සත්තීනං ලඞ්ඝනසිප්පං ජානාති" යනු සත්තිලඞ්ඝජාතක අටුවාවෙහිද දක්නාලදහෙයින් ස්ත්‍රීලිඞ්ගික ශබ්දයෙහි "චතුන්නං"යන්නක් කැමතිවියයුතු බව පෙනේ ත්‍රිලිඞ්ගයෙහිම චතුර්ථී ෂෂ්ඨී දෙක්හි "චතස්සනානානං" යන රූපයක් චූලනිරුත්තියෙහි පමණක් ආයේය—අග්ගවංසාචාර්‍ය්‍යතෙම ඊට රුචි නොවේ.

චතු ශබ්දය පරපදයන්හා සමාස වූ කල "චතු" යන ප්‍රකෘතියෙන්ම සිටී—එම කීහ.

"චත්තාරොති චතස්සොති චත්තාරි තිච සද්දිතං,
රූපං සමාසභාවම්හි චතුප්පකතිකං භවෙ.
නිදස්සන පදානෙත්ථ කමතො කමතො විදෙ,
චතුබ්බිධං චතුස්සාලං චතුසච්චානි නිද්දිසෙ

අසව්නාමසංඛ්‍යාශබ්ද.

6. තිසු ලිංගෙසු සමානරූපො සංඛ්‍යා වචනො

පඤ්ච සද්දො—(අ.)

Pancha (A.)

බහුවචන.

ප...පඤ්ච
දු...පඤ්ච
ත...පඤ්චහි, පඤ්චභි
ක...පඤ්චහි, පඤ්චභි
ච...පඤ්චන්නං
පං...පඤ්චහි, පඤ්චභි
ඡ...පඤ්චන්නං
ස...පඤ්චසු.

එවං—*ඡ සත්ත අට්ඨ නව දස එකාදස ද්වාදස බාරස තෙළස තෙරස චුද්දස චොද්දස චතුද්දස පණ්ණරස පඤ්චදස සොළස සොරස සත්තරස සත්තදස අට්ඨාරස අට්ඨාදස.

එක ශබ්දයෙහි පටන් අට්ඨාරස ශබ්දය දක්වා ඇති සංඛ්‍යාශබ්ද සංඛ්‍යෙය වාචී බවද, වීසති ශබ්දාදීහු † සංඛ්‍යෙය සංඛ්‍යාන යන උභයාර්ථ වාචී බවද කියන ලදී.

පදසාධනී ටීකාවෙහි—"එකසද්දමභිව්‍යාපෙත්වා යෙ අට්ඨාරස සුත්ති "පරියන්තා සංඛ්‍යා සද්දා තෙ සංඛ්‍යෙය වචනා (සංඛ්‍යෙයස්ස අභිධෙයස්ස "වචනා)-සංඛ්‍යෙය වචනත්තාව එකෙ බ්‍රාහ්මණා ඉති සමානාධිකරණපාත මහවති, න තු ව්‍යධිකරණත්තං බ්‍රාහ්මණානං දසෙති-එකූ "නවීසත්‍යාදයො තු සංඛ්‍යෙය සංඛ්‍යානෙ ච වත්තන්තෙතා-අතො යෙවාහ 'වීසති ආදයො පන සංඛ්‍යානවචනා" චෙති-වීසති රුක්ඛා-රුක්ඛානං වීසතීති එව් උදාහරණානි."

ඡ ශබ්දයාගේ සප්තමී ඒකවචනස්ථානයෙහි "ඡස්සු" යන්නක්ද කැමතිවිය යුතුයි-"ඡස්සු ලොකො සමුප්පන්නො ඡස්සු කුබ්බති සන්ථවං." යනාදියෙහි පෙනේ.

† "සංඛෙය්‍යෙ ගණිතබ්බෙ වත්ථුම්හි—සංඛ්‍යානෙ ගණනාමත්තෙ" යනු රූපසිද්ධි ටීකායි.

වීසත්‍යාදයො ආනවුතියා ඉත්ථිලිඞ්ගෙකවචනන්තා.*

From visati to navuti Fem. Sing.

7. එකූනවීසති සද්ද. (ඉ,)—*Ekuna visati* (I.)

එකවචන.

ප ..එකූනවීසති
ආ ..(හො) එකූනවීසති
දු ..එකූනවීසතිං
ත...එකූනවීසතියා
ක...එකූනවීසතියා
ච . එකූනවීසතියා
පං..එකූනවීසතියා
ඡ . එකූනවීසතියා
ස...එකූනවීසතියං, එකූනවීසතියා.

එවං වීසති එකවීසති වෙවීසති වාවීසති බාවීසති තෙවීසති චතුවීසති පඤ්චවීසති පණ්ණුවීසති ඡබ්බීසති සත්තවීසති අට්ඨවීසති.

8. එකූනවීසා සද්ද. (ආ.)—*Ekuna visa* (A′)

එකවචන.

ප.. එකූනවීසා†
ආ...(හො) එකූනවීසෙ
දු...එකූනවීසං
ත...එකූනවීසාය
ක...එකූනවීසාය
ච...එකූනවීසාය
පං..එකූනවීසාය
ඡ...එකූනවීසාය
ස...එකූනවීසායං, එකූනවීසාය.

එවං වීසා එකවීසා වෙවීසා වාවීසා බාවීසා තෙවීසා චතුවීසා පඤ්චවීසා ඉච්චාදයොපි.

---

* "නවුතිසඞ්ඛ්‍යමභිව්‍යාපෙත්වා වීසත්‍යාදයො භින්නවචනෙනාපි සමානාධිකරණා, එකවචනන්තා, භින්නලිඞ්ගෙනාපි සමානාධිකරණා ඉත්ථිලිඞ්ගාති අත්ථො-තං යථා වීසති පුරිසා, වීසති කුලානි." යත්‍රුටීකායි.

† ප්‍රථමාවෙහි "එකූනවීස, එකූනවීසං" කියාද පදමයක් ශබ්දනීති ආදියෙහි දක්වා ලදී.

මේ එකූනවීසාදි ශබ්ද බාලාවතාරාදියෙහි නොදක්වන ලද්දෑහු නමුදු පෙලෙහි දක්නා ලද හෙයින් ශබ්දනීති ආදියෙහි දක්වන ලද්දෑහුය.

මේ ශබ්දයාගේ නිෂ්පත්තිය කෙසේද යත්?

“දස ච දස ච” යී දස ශබ්ද වය ද්වන්ද්වසමාස කොට “සරූපාන මෙකසෙසව්සකිං”-යන සූත්‍රයෙන් ඒකශේෂ කොට (ඒ නම් දසශබ්දවය එකක් කිරීමයි) දස ශබ්ද දෙකෙහිම අර්ථ ඇති ඒ තනි දස ශබ්දයාකෙරෙන් පරව යො විභක්ති තබා යොවිභක්ති පරකල්හි දස ශබ්දයාහට “ගණනෙ දසස්ස ද්විතිච තුපඤ්චඡසත්තට්ඨනවකානං විතිං චත්තාර පඤ්ඤාස සත්තාසනවා යොසු යොනං වීස මාසං ඨිරිත් තුත්”—යන සූත්‍රයෙන් “වි” යනාදෙශ හා යො විභක්ති හට “ඊසං” යනාදෙශද කොට පමුණුවා “වීසං” කියා සිටි කල්හි ස්ත්‍රීලිඞ්ගික ආ ප්‍රත්‍යය හා නිග්ගහීත ලොප්‌ආදිය කොට පමුණුවා වීසා යන රූප නිපන් කල්හි එකූනා ශබ්දය සමඟ “එකූනා ච සා වීසා ච” යී කර්ම්මධාරය සමාස කොට පූර්ව පදයා හ්‍රස්වත් කිරීමෙන් “එකූනවීසා” ශබ්දය සිද්ධ කටයුතුයි.

එකූනවීසති ශබ්දයාගේ නිෂ්පත්තියද මෙසේ නමුදු “ත්‍යන්තමො වීසතිංසෙහි” යනසූත්‍රයෙන් තිකාරාගම කිරීම පමණක් වෙනසි.

තවද වීසති ශබ්දය පටන් නවුති ශබ්දය දක්වා ස්ත්‍රීලිඞ්ගික එකවචනාන්ත බව සාමාන්‍යයෙන් ආචාර්‍ය්‍යවරයන්විසින් කියනලද නමුදු “ඡන්නවුතීනං පාසණ්ඩානං පවරං යදිදං සුගතවිනයං” යනාදියෙහි බහුවචනාන්ත පද දක්නාලද හෙයින් සමහර ආචාර්‍ය්‍යවරයෝ මෙසේද කියති.

☞ “සඞ්ඛ්‍යා සංඛෙය්‍ය සංඛ්‍යාසු එකත්තෙත වීසතාදයො,
සංඛ්‍යත්තෙ වි බහුත්තම්හි තාතු වා නවුතින්තියො”-යනුයි.

---

9. එකූනතිංසති සද්දෙ (ඉ.) *Ekuna tinsati.* (I.)	10. එකූනතිංසා සද්දෙ (ආ.) *Ekuna tinsa* (A'.)
එකවචන,	එකවචන.
ප ..එකූනතිංසති	ප...එකූනතිංසා*
ආ.. (භො) එකූනතිංසති	ආ...(භො) එකූනතිංසෙ
දු...එකූනතිංසතිං	දු...එකූනතිංසං
ත...එකූනතිංසතියා	ත...එකූනතිංසාය
ක...එකූනතිංසතියා	ක...එකූනතිංසාය
ච...එකූනතිංසතියා	ච...එකූනතිංසාය
පං..එකූනතිංසතියා	පං.එකූනතිංසාය
ඡ...එකූනතිංසතියා	ඡ...එකූනතිංසාය
ස...{ එකූනතිංසතියං එකූනතිංසතියා	ස...{ එකූනතිංසායං එකූනතිංසාය

එවං

තිංසති, තිංසා
එකතිංසති, එකතිංසා
ද්වත්තිංසති, ද්වත්තිංසා
බත්තිංසති, බත්තිංසා
තෙත්තිංසති, තෙත්තිංසා
චතුත්තිංසති, චතුත්තිංසා
පඤ්චතිංසති, පඤ්චතිංසා
ඡත්තිංසති, ඡත්තිංසා
සත්තතිංසති, සත්තතිංසා
අට්ඨතිංසති, අට්ඨතිංසා
එකූනචත්තාලීසති
එකූනචත්තාලීසා
එකූනචත්තාරීසති,
එකූනචත්තාරීසා
තාලීසති, තාලීසා
†චත්තාලීසති, චත්තාලීසා
චත්තාරීසති, චත්තාරීසා
එකචත්තාලීසති,
එකචත්තාලීසා
එකචත්තාරීසති,
එකචත්තාරීසා
ද්විචත්තාලීසති, ද්විචත්තාලීසා
ද්විචත්තාරීසති, ද්විචත්තාරීසා
ද්වෙචත්තාලීසති, ද්වෙචත්තාලීසා
ද්වෙචත්තාරීසති, ද්වෙචත්තාරීසා
ද්වාචත්තාලීසති, ද්වාචත්තාලීසා
ද්වාචත්තාරීසති, ද්වාචත්තාරීසා
තෙචත්තාලීසති, තෙචත්තාලීසා
තෙචත්තාරීසති, තෙචත්තාරීසා
තිචත්තාලීසති, තිචත්තාලීසා
තිචත්තාරීසති, තිචත්තාරීසා
චතුචත්තාලීසති, චතුචත්තාලීසා
චතුචත්තාරීසති, චතුචත්තාරීසා

* ප්‍රථමාවෙහි "එකූනතිංස, එකූනතිංසං" කියාද පදවයක් විය යුතුයි.

† "චුත්තාලීසති-චොත්තාලීසති" කියාද සතලිසට නාමය.

පඤ්චචත්තාලීසති, පඤ්චචත්තාලීසා	සත්තචත්තාලීසා
පඤ්චචත්තාරීසති, පඤ්චචත්තාරීසා	සත්තචත්තාරීසති-
ඡචත්තාලීසති, ඡචත්තාලීසා	සත්තචත්තාරීසා
ඡචත්තාරීසති, ඡචත්තාරීසා	අට්ඨචත්තාලීසති, අට්ඨචත්තාලීසා
සත්තචත්තාලීසති-	අට්ඨචත්තාරීසති, අට්ඨචත්තාරීසා.

11. * එකූනපඤ්ඤාසා සද්දො. (ආං.)

Ekûna pññású Declined. (A′.)

එකවචන.

ප...එකූනපඤ්ඤාසා†
ආ...(භො)එකූනපඤ්ඤාසෙ
දු...එකූනපඤ්ඤාසං
ත...එකූනපඤ්ඤාසාය
ක...එකූනපඤ්ඤාසාය
පං..එකූනපඤ්ඤාසාය
ඡ ..එකූනපඤ්ඤාසාය
ස...එකූනපඤ්ඤාසායං, එකූනපඤ්ඤාසාය.

එවං-පඤ්ඤාසා, පණ්ණාසා	චතුපඤ්ඤාසා, චතුපණ්ණාසා
එකපඤ්ඤාසා, එකපණ්ණාසා	පඤ්චපඤ්ඤාසා, පඤ්චපණ්ණාසා
ද්වෙපඤ්ඤාසා, ද්වෙපණ්ණාසා	ඡපඤ්ඤාසා, ඡපණ්ණාසා
ද්වාපඤ්ඤාසා, ද්වාපණ්ණාසා	සත්තපඤ්ඤාසා-
ද්විපඤ්ඤාසා, ද්විපණ්ණාසා	සත්තපණ්ණාසා
තෙපඤ්ඤාසා, තෙපණ්ණාසා	අට්ඨපඤ්ඤාසා, අට්ඨපණ්ණාසා.
තිපඤ්ඤාසා, තිපණ්ණාසා	

---

* "එකූනතිංසති-එකූනතිංසා" යනාදිය මෙන් ඉකාරාන්ත-ආකාරාන්ත වශයෙන් ශබ්ද දෙක දෙක මෙහි නොවිය හැකිබව හෙවත් "එකූනපඤ්ඤාසා, පඤ්ඤාසා" යනාදි ආකාරාන්ත ශබ්ද මුත් (පඤ්ඤාසති යි) ඉකාරාන්ත ශබ්ද නැති බව රූපසිද්ධ්‍යාදියෙහි කියනලද නයින් සිතිය හැකිය—ඒගැණ

රූපසිද්ධියෙහි—"විභාසාවීසතිංසාන මනෙත හොති තිආගමො,
අඤ්ඤත් න ච හොතෙව චවත්තාළීතවිභාසතො."

ශබ්දනීතියෙහි—"තආගමො වීසතිංසෙහි—වීසති-තිංසති."—යනුයි.

† "එකූනපඤ්ඤාස-එකූනපඤ්ඤාසං" කියාද ප්‍රථමා එකවචන දෙකක් පාලියෙහි දක්නාලදී.

12. ඒකූනසට්ඨි සද්දෙ (ඉ.)

Ekûna-saṭṭhi Declined. (I.)

ඒකවචන.

ප...ඒකූනසට්ඨි
ආ...(භො) ඒකූනසට්ඨි
දු...ඒකූන සට්ඨිං
ත...ඒකූනසට්ඨියා
ක.. ඒකූන සට්ඨියා
ච...ඒකූන සට්ඨියා
පං..ඒකූන සට්ඨියා
ඡ...ඒකූන සට්ඨියා
ස...ඒකූන සට්ඨියං, ඒකූන සට්ඨියා.

එවං-සට්ඨි:—

ඒක සට්ඨි
ද්වෙ සට්ඨි, ද්වා සට්ඨි
ද්වි සට්ඨි—*වට්ඨි
තෙ සට්ඨි
ති සට්ඨි
චතු සට්ඨි
පඤ්ච සට්ඨි
ඡ සට්ඨි
සත්ත සට්ඨි
අට්ඨ සට්ඨි
ඒකූන සත්තති
ඒකූන සත්තරි
සත්තති
සත්තරි
ඒක සත්තති
ඒක සත්තරි
ද්වෙ සත්තති
ද්වෙ සත්තරි
ද්වා සත්තති
ද්වා සත්තරි
ද්විසත්තති
ද්වි සත්තරි
තෙ සත්තති
තෙ සත්තරි
ති සත්තති
ති සත්තරි
චතු සත්තති
චතු සත්තරි
පඤ්ච සත්තති
පඤ්ච සත්තරි
ඡ සත්තති
ඡ සත්තරි
සත්තසත්තති
සත්තසත්තරි
අට්ඨ සත්තති
අට්ඨ සත්තරි
ඒකූන අසීති
අසීති
ඒකාසීති
ද්වෙ අසීති
ද්වාසීති
ද්වියාසීති
තෙ අසීති
තියාසීති
චතුරාසීති
චුල්ලාසීති†
පඤ්චාසීති
ඡාසීති
සත්තාසීති
අට්ඨාසීති
ඒකූන නවුති
නවුති
ඒක නවුති
ද්වා නවුති
ද්වි නවුති
තෙ නවුති
ති නවුති
චතු නවුති
පඤ්ච නවුති
ඡනනවුති
සත්තනවුති
අට්ඨ නවුති.

* † "වට්ඨි—චුල්ලාසීති"—යන වචන ගැණ මෙහි අග අකාරාදිය බලනු,

සතං නපුංසක මෙකවචනන්තං.

13. අකාරන්ත නපුංසකලිංගෙකවචනො
එකූනසත සද්දෙ. (අ.)

Ekûna-sata Declined—*N.* (A.)

එකවචන.

ප...එකූන සතං
ආ.. (හො) එකූන සත
දු...එකූන සතං
ත...එකූන සතෙන
ක...එකූන සතෙන
ච...එකූන සතස්ස
පං...{ එකූන සතා, එකූන සතම්හා
එකූන සතස්මා
ඡ...එකූන සතස්ස
ස...{ එකූන සතෙ, එකූන සතම්හි,
එකූන සතස්මිං

එවං-සතං සහස්සං නහුතං ලක්ඛං අබ්බුදං නිරබ්බුදං අහහං අබබං අටටං සොගන්ධිකං උප්පලං කුමුදං පුණ්ඩරීකං පදුමං කථානං මහාකථානං අසංඛෙය්‍යං.

මේ එකූන සත ශබ්දය පටන් අසංඛෙය්‍ය ශබ්දය දක්වා ඇති ශබ්දයන් අතුරෙන් "කොටි, අක්ඛොහිණී" යන ශබ්දයන් හැර සෙසු ශබ්ද නපුංසක ලිංගික එකවචනාන්තයෝය—රාශිභේදයක් ඇතිකල්හි බහුවචනාන්තයෝය—චිත්ත ශබ්දයාගේ බහුවචන මෙන් වරනැගිය යුතුයි,

මෙහි රාශිභේදයනම් කුමක්ද යත්?—රැස් (ගණන්) කීපයක් කිය යුතු බවයි—"සතාන සතානි" යන තැන සත ශබ්දයෙන් සිය යයි කියනලද රාශි (ගණන්) කීපයක් කියනු ලැබෙත්—(එය සතාන ශබ්දයෙන් නියමකරණහෙයින්) "සතාන සතානි" යනු සත් සියයයි—මෙසේ "සතානසතානි" යන තැන සත ශබ්දයෙන් සියවල් කීපයක් කියනලදහෙයින් රාශිභේදයයි දත යුතුය—එහෙයින් "සතානි" යී බහුවචන වීය.

යම් සතශබ්දයකින් එක සියයක් කියනු ලැබේනම් රාශිභේදයක් නැතිහෙයින් "සතං" යනාදි එකවචනම වේත්.

එසේම "ෙව වීසතියො" යි කී කල වීසති සංඛ්‍යාත රාශිය දෙව රක් වීම් සංඛ්‍යාත භේදය ඇති හෙයින් වීසති ශබ්දයා කොරෙන් බහුවචන වීය—එහෙයින් "වෙ වීසතියො" යනු (විසිදෙකය යන අර්ථය නොව) සතලිසය යනාර්ථයි—විසිදෙකය යන අර්ථය කිය යුතුතන්හි "වෙ වීසති" කියා හෝ "වා වීසති" කියා හෝ වීසති ශබ්දය එකවචනාන්තා වියයුතුයි.

"ද්වෙ සතසහස්සානි චත්තාරි නහුතානිච"—යන මෙහි "ද්වෙ සතසහස්සානි" යනු සතසහශ්‍ර හෙවත් ලක්‍ෂ දෙකක යන අර්ථය—"චත්තාරි නහුතානි" යනු නහුත සතරය යනාර්ථයි—"ද්වෙ සතසහස්සානි" යනු දෙකකුත් ලක්‍ෂය යනාර්ථ වීනම් "සතසහස්ස" ශබ්දය බහුවචනාන්තව නොසිටී—"චත්තාරි නහුතානි" යනුද එසේමැයි—එහෙයින් ඒ සංඛ්‍යාශබ්දවලින් කියනු ලබන්නාවූ ඒ ඒ ගණන් එක එක කියන කල්හි රාශිභේදයක් නැති බැවින් ඒකවචනාන්තා වශයෙන්ද කීපයක් කියන කල්හි රාශිභේදය හෙයින් බහුවචනාන්ත වශයෙන්ද සිටිත්යයි දත යුතුයි.

තවද සත ශබ්දය නියත නපුංසක ලිඞ්ගිකය යනු සැබෑනම් "තා දෙවතා සතාසතා උළාරා" යන මෙහි "සත" ශබ්දය ස්ත්‍රී ලිඞ්ගික භාවයෙන් යොදන ලද්දේ කුමක්නිසාද යත්? "තා දෙවතා සතා සතා" යනාදියෙහි දක්නාලද "සතා" යනු ස්ත්‍රී ලිඞ්ගිකනොව නපුංසක ලිඞ්ගිකමයයි දත යුතුය—කිමෙක්ද "සතාසතා" යනු දෙවතා ශබ්දය හා සමානාධිකරණ නොවේද යත්?-එසේය සමානාධිකරණමය එසේනමුදු නපුංසක ලිඞ්ගිකමය-මෙබඳුවූ සංඛ්‍යාවිෂයෙහි ලිඞ්ග විශෙෂ්‍යය ගැණ සමානාධිකරණ බව ප්‍රමාණ නොවේ—"පච පච්චෙකබුද්ධසතානි ඉමස්මිං ඉසිගිලිස්මිං පබ්බතෙ චිරනිවාසිනො අහෙසුං" යන මේ පාඨයෙහි නපුංසක ලිඞ්ගික ශබ්දය හා පුල්ලිඞ්ගික ශබ්දයාගේ සමානාධිකරණ බව පෙනේ—එසේම මෙහිද "සතා" යන නපුංසක ලිඞ්ගික පදය හා "දෙවතා" යන ස්ත්‍රී ලිඞ්ගික පදයාගේ සමානාධිකරණබව වන්නේයයි දත යුතුයි.

තවද සංඛ්‍යා ශබ්ද පිළිබඳව සමානාධිකරණ බව නොකමැති විය යුතු තැන් මේ මතු ප්‍රකාශවන ගාථාවෙන්ද දත යුතුය.

> "ද්වෙ සතසහස්සානි චත්තාරි නහුතානි ච
> එත්තකං බහලත්තෙන සංඛාතායං වසුන්ධරා."

මෙහි ද්වෙ යනු විශෙෂණය, සතසහස්සානි යනු විශෙෂ්‍යයි—එසේම චත්තාරි යනු විශෙෂණය, නහුතානි යනු විශෙෂ්‍යයි—එහෙයින් දෙලක්‍ෂය-සතර නහුතය යනු අභිප්‍රායි.

මෙසේ විශෙෂණ විශෙෂ්‍යභාවයෙන් ගන්නා ලද්දේ නමුදු "දුවෙ"-"චතතාරි" යනාදි සංඛ්‍යා ශබ්දයන්ගේ "සතසහස්සානි" යනාදි සංඛ්‍යා ශබ්දයන් හා සමානාධිකරණ බව පූර්වාචාර්‍ය්‍යවරයන් විසින් නොකියන ලද්දේය—විශෙෂ්‍යපදයෝ ද්‍රව්‍යවාචකහෙයින් "දුවෙ පුථුජ්ජනා"-"සතසහස්සං භික්ඛූ" යනාදියෙහි යම්සේ සමානාධිකරණබව ලැබේද-"දුවෙ සතසහස්සානි" යනාදියෙහි එසේ සමානාධිකරණබව නොලැබේ-කුමක්නිසාද යත්?—විශෙෂ්‍යපදයෝ ද්‍රව්‍යවාචක නොවන හෙයිනි—එසේහෙයින් මෙබඳු තැන්වල (යුක්තියක් නැතිහෙයින්) සමානාධිකරණ බව කැමති නොවිය යුතුයි-ඉදින් එසේනම් මේ පදයන්ගේ අන්‍යොන්‍ය සම්බන්ධ රහිත බව වීදයත්?-විශෙෂණ විශෙෂ්‍යභාවයෙන් ගත්හෙයින් අන්‍යොන්‍ය සම්බන්ධ බව වන්නේය-ඉදින් එසේනම් සමානාධිකරණබව ලැබිය යුතු නොවේදයත්?—අන්‍යොන්‍ය සම්බන්ධ බව ඇතහොත් සමානාධිකරණභාවය ලැබිය යුතුය යන නියමයක් නැතිහෙයින් නොලැබිය යුතුය—සමානාධිකරණබව වනාහි ගුණ ගුණී සංඛ්‍යාත විශෙෂණ විශෙෂ්‍යයන් පිළිබඳවමය—විශෙෂණ විශෙෂ්‍යත්වය ඇත්තේ නමුදු ගුණ ගුණී භාවය නැතිකල්හි සමානාධිකරණභාවය නැත්තේයයි දත යුතුයි.

මෙහි "එතතකං" යනු ප්‍රමාණය කීමය-"බහලත්තෙන" යනු විශෙෂණයෙහි තෘතීයාය-මේ දෙකින්ම "මේ මහා පෘථිවි තොමෝ බහලත්වයෙන් සොදුන් දෙලක්ෂයක්ද සතාර නහුතයක්ද (යන) මෙපමණයක් කියන ලදී" යන මේ අර්ථය දක්වන්නේය—"එතතකං" යන පදය "දුවෙ සතසහස්සානි, චතතාරි නහුතානි ච" යනමේ පදයන් සමග හෝ "වසුන්ධරා" යන පදය සමග හෝ සමානාධිකරණ බවක් කැමති නොවිය යුතුය-"එතතකං" යනු භාවනපුංසක පදයි (ශබ්දශාස්ත්‍රයෙහි "ක්‍රියාවිශෙෂණය" යනුදු මෙයටම කියන නමකි) මෙපමණින් යනු එහි අර්ථයි.

නැවතද-"දුවේ සතසහස්සානි, චතතාරි නහුතානි" යන මේ පදයන්ගේද "වසුන්ධරා" යන පදයා සමග සමානාධිකරණබව කැමති නොවිය යුතුය—කුමක් නිසාද යත්?—මෙහි "සතසහස්සානි" යනාදිය ("භික්ඛූනං සතං" යන තන්හි මෙන්) සංඛ්‍යාමාත්‍ර අර්ථකොට ඇති හෙයිනි—ඒ නිසාම "එතතකං" යි කියන ලදී—"සංඛාතා" යනුද "අයං" යනුද "වසුන්ධරා" යනු හා සමානාධිකරණයි-මේ සියළු ක්‍රමය වෙනත් මෙබඳු වූ තැන්වලද දත යුතුයි.

14. ඉත්ථිලිඞ්ගෙක වචනානෙකා සංඛ්‍යා වචනො

* කොටි සද්දො. (ඉ.)

Kóti Declined—*E.* (I.)

එකවචන.

ප...කොටි
ආ...(භො) කොටි
දු...කොටිං
ත...කොටියා
ක...කොටියා
ච...කොටියා
පං...කොටියා
ඡ...කොටියා
ස...කොටියං, කොටියා.

එවං-පකොටි කොටිප්පකොටි අක්ඛොභිණීයො.

† දස දසකං සතං නාම, දස සතං සහස්සං, දස සහස්සං නහුතං, දස නහුතං ලක්ඛං, (සතසහස්සන්ති පි වුච්චති) ලක්ඛසතං කොටි, කොටි ලක්ඛසතං පකොටි, පකොටිලක්ඛසතං කොටිප්පකොටි, කොටිප්පකොටි ලක්ඛ සතං නහුතං, නහුතලක්ඛසතං නින්නහුතං, නින්නහුතලක්ඛසතං අක්ඛොභිණී, අක්ඛොභිණී ලක්ඛසතං බින්දු, බින්දු ලක්ඛසතං අබ්බුදං, අබ්බුදලක්ඛසතං නිරබ්බුදං, නිරබ්බුද ලක්ඛසතං අහහං, අහහලක්ඛසතං අබබං, අබබලක්ඛසතං අටටං, අටටලක්ඛසතං සොගන්ධිකං, සොගන්ධිකලක්ඛසතං උප්පලං, උප්පලලක්ඛසතං කුමුදං, කුමුදලක්ඛසතං පුණ්ඩරීකං, පුණ්ඩරීක ලක්ඛසතං පදුමං, පදුමලක්ඛසතං කථානං, කථානලක්ඛසතං මහාකථානං, මහාකථාන ලක්ඛසතං අසංඛෙය්‍යන්ති—

---

* රාශිභෙදයක් ඇතිකල්හි කොටි ශබ්දදියද බහුවචනාන්තයි-"අසීති කොටියො හිත්වා හිරඤ්ඤස්සාභිපබ්බජිං-ඛීණාසවා වීතමලා සමිංසු සතකොටියො"-යනු උදාහරණයි.

† "දස දසකං සතං නාම" යනාදි මේ පාඨය වරනැගිල්ලෙහිද මොග්ගල්ලායන ව්‍යාකරණයට අයිති "පදසාධනී" නම් ප්‍රකරණයෙන් ගෙණ ලියනලද්දකි.

මෙහි අදහස—දසදසකං, දශයන් සම්බන්ධිවූ දශප්‍රමාණයක් (හෙවත් දශවරක් දශය) සතං නාම, සියය නම් වේ—දසසහස්සං නහුතං......යනාදියෙහිද මෙසේම අර්ථ යෙදිය යුතුයි—ලක්ඛසතං ලක්ෂයන්ගේ සියයක්, කොටි, කොටියකි-කොටිලක්ඛසතං, කෝටින්ගේ ලක්ෂ සියයක්, පකොටි, ප්‍රකෝටියයි—පකොටිලක්ඛසතං කොටිප්පකොටි යනාදියෙහිද අර්ථ මෙසේමැයි.

මේ සියළු කියමන්වලින් දක්වන්නේනම් සියයෙහි පටන් ලක්ෂය දක්වා මෙහි දක්වනු ලැබූ ගණන් අතුරෙන් යම්කිසි ගණනක් දශවරක් වැඩිවූ කල ඊලඟ ගණන වන බවද-ලක්ෂයන් සියයක් කෝටියක් බවද—කොටියෙහි පටන් අසංඛෙය්‍ය දක්වා ඇති ගණන් අතුරෙන් යම් කිසි ගණනක් සියක්ලක්ෂ වරක් වැඩි වූ කල්හි ඊ ලඟ ගණන වන බවත්ය.

සමහරකෙනෙක් දශයෙහි පටන් අසංඛෙය්‍ය දක්වාම දශගුණිත කටයුතු බවද, තවත් සමහරෙක් දශයෙහි පටන් දශගුණිත කට යුතු බව හා අබ්බුදයෙහි පටන් වීසති ගුණිත කටයුතු බවද කියත්—අබ්බුදයෙහි පටන් වීසතිගුණිත කටයුතු බව, සංයුත් සඟියෙහි දක්වන ලද මේ පාඨය බලා කියනලදී—ඒනම්, "සෙය්‍යථාපි භික්ඛවෙ වීසති අබ්බුද නිරයා එව මෙකො නිරබ්බුද නිරයො" යනාදියයි.

තවද සියයෙහි පටන් ලක්ෂය දක්වා දශගුණිත කටයුතු බව "සතතො පට්ඨාය යාව සතසහස්සං තාව දසසංඛ්‍යා දසගුණිතං වෙදිතබ්බං" යී පදසාධනී ටීකාවෙහිද-

"එතාසු සංඛ්‍යාසු කමො සතාදි ලක්ඛපරියන්තානං දසගුණං දසහි ගුණිතං භවති" යී තිඝණ්ඩු ටීකාවෙහිද කියන ලද්දේය.

රූපසිද්ධි ටීකාවෙහි-"තාසං සංඛ්‍යානං යාව කොටිපරියන්තානං ගණනමත්ථි තාව තං දසගුණිත මෙව කාතබ්බං"—යන්නෙන් කොටිය දක්වා දශගුණිත කටයුතුබව කියන ලදී *

තවද-"එකං, දස, සතං, සහස්සං, නහුතං, ලක්ඛං" යනාදි පිළිවෙළෙහි "නහුතං" යනු පඤ්චමස්ථානයෙහිද වාදශමස්ථානයෙහි ඇත්තේය-පඤ්චමස්ථානයෙහි වූ නහුතං යනු දශදහසය—සමහර ආචාර්‍ය්‍යකෙනෙක් පඤ්චමස්ථානයෙහි "දසසහස්සං" යනුද වාදශමස්ථානයෙහි පමණක් "නහුතං" යනු දක්වන ලදී—දශසහශ්‍රවාංචි

* "සතසහස්සං දසගුණිතං දසසතසහස්සං, දසසතසහස්සං දසගුණිතං කොටි" යනක්‍රමයෙන් ගතහැකි බැවින් රූපසිද්ධි ටීකාවෙහි කියමනද යථොක්ත කියමන් වලට විරුද්ධ නොවේ.

(පචමස්ථානයවූ) "නහුත" ශබ්දයක් පෙළ අටුවා දෙක්හිම "චතුනහුතාධිකවීයොජනසතසහස්සබහලා අයං මහාපඨවී."

"ද්වෙ සතසහස්සානි චත්තාරි නහුතානිච,
එත්තකං බහලත්තෙන සංඛාතායං වසුන්ධරා."

යනාදියෙහි දක්නා ලද හෙයින් පචමස්ථානයෙහිද "නහුතං" යන්නක් අවශ්‍යයෙන්ම විය යුතුය–එහි "චතු නහුත" යනුද–"චත්තාරි නහුතානි" යනුද සතලිස් දහසයි.

"අක්ඛොභිණී-බින්දු-අබ්බුදං-නිරබ්බුදං-අහහං-අබබං-අටටං-සොගන්ධිකං–උප්පලං–කුමුදං–පුණ්ඩරීකං– පදුමං–කථානං–මහාකථානං–අසංඛෙය්‍යං"-යන ගණන් පිළිවෙළ කච්චායන රූපසිද්ධි අභිධානප්පදීපිකා ආදියෙහි දක්වන ලද්දේය–ශබ්දනීතියෙහි මීට වෙනස් ලෙස–"අක්ඛොභිණී-බින්දු-අබ්බුදං-නිරබ්බුදං-අබබං-අටටං-අහහං-කුමුදං-සොගන්ධිකං–උප්පලං-පුණ්ඩරීකං-පදුමං-කථානං-මහාකථානං අසංඛෙය්‍යං"—යන පිළිවෙළක් දක්වන ලද්දේ පමණක් නොව ඒ පිළිවෙළ පෙළ අටුවා දෙකට සම බවද මෙසේ දක්වන ලදී—

සංයුත් සඟියේ බ්‍රහ්මසංයුත්තකයෙහි—"සෙය්‍යථාපි භික්ඛවෙ වීසති අබ්බුදා එවමෙකො නිරබ්බුදනිරයො" යනාදිය දක්වමින් විසි අබ්බුදයෙන් එක් නිරබ්බුදයක් බවද, විසි නිරබ්බුදයෙන් එක් අබබයක, විසි අබබයෙන් එක් අටටයෙක, අහහ, කුමුද, සොගන්ධික, උප්පල, පුණ්ඩරීක, පදුම, කථාන, මහාකථාන, අසංඛෙය්‍ය, යනුද මෙසේම බවද දක්වා අටුවාවෙහිද පෙළට අවිරුද්ධලෙස අර්ථ යන් ගන්නාලද බවද කියන ලදී—මෙසේ හෙයින් අග්ගවංසාචාර්‍ය්‍ය මතයෙහි වූ ගණන් පිළිවෙළ හා, "අබ්බුදයෙහි පටන් අසංඛෙය්‍ය දක්වා වීසතිගුණිත කටයුතුය" යන කියමන පෙළ අටුවා දෙකට සම බැව් පෙනේ.

තවද රත්නකොශාදියෙහි

"සතං සහස්සං අයුතං නියුතම්පයුතං තථා,
කොටිරබ්බුද මිච්චෙවං කමා දසගුණුත්තරං."

යනාදිය දක්වමින් "නහුත" වෙනුවට "අයුත" කියාද "ලක්ඛ" නොහොත් "සතසහස්ස" වෙනුවට "නියුත" කියාද "දසසතසහස්ස" වෙනුවට "පයුත" කියාද කියන ලද්දේ පමණක් නොව "සතං සහස්සං" යනාදිය ක්‍රමයෙන් මතු මත්තෙහි දශගුණිත කටයුතු බවද කියන ලදී

එහි පිළිවෙළ පදසාධනී ටීකාවෙහි දක්වනලෙස මෙසේය.
"දස සංඛ්‍යා දසගුණං සතං, සතං දසගුණං සහස්සං, සහස්සං
"දසගුණමයුතං, අයුතං දසගුණං නියුතං, නියුතං දසගුණං
"පයුතං, පයුතං දසගුණං කොටි, කොටියා දසගුණුත්තරමබ්බුදං,
"අබ්බුදා පදුමං, පදුමා ඛබ්බං, ඛබ්බා මහාඛබ්බං, තතොපි මහා
"පදුමං තතොපි සංඛු, සංඛුතො සමුද්දො, තතො අනන්තා,
"අනන්තා මජ්ඣං, මජ්ඣා පරඩ්ඪං, පරඩ්ඪා අමිතං, අමිතා දසගු
"ණුත්තරං සංඛ්‍යං, සංඛ්‍යා විසතිමං ඨානං අසංඛෙය්‍යං"—යනුයි.

තවද සියයෙහි පටන් අසංඛෙය්‍යය දක්වා පැවති ගණන් ක්‍රමය ගැණ අභිධානප්පදීපිකා ටීකා කතෘගේ අදහස සහ වාද කථාවන්ද දක්වා තිබෙන ක්‍රමයක් නම්.

"එතාසු සංඛ්‍යාසු කමෙන සතාදී ලක්ඛපරියන්තං දසහි දසහි
"ගුණිතං භවති, කොට්‍යාදිකං අසංඛෙය්‍යපරියන්තං සතලක්ඛෙහි
"සතලක්ඛෙහි ගුණිතං භවති, තස්මා එකා ලෙඛා ද්විසුඤ්ඤසහිතා
"සතං භවති, තථා තිසුඤ්ඤසහිතා සහස්සං, චතුසුඤ්ඤසහිතා
"නහුතං, පඤ්චසුඤ්ඤසහිතා එකා ලෙඛා ලක්ඛං භවති, එකා පන
"ලෙඛා සත්තසුඤ්ඤසහිතා කොටි, තථා චුද්දස සුඤ්ඤසහිතා ප
"කොටි, ඉමිනා නයෙන යාවාසංඛෙය්‍යං නෙතබ්බං—අයමෙකච්චාන
"මාචරියානං මති—අථවා සතාදයො අසංඛෙය්‍යපරියන්තා සබ්බෙපි
"දස ගුණිතා කාතබ්බා—අයං කච්චායනස්ස මති—තෙන හි "යාව ත
"දුත්තරි දස ගුණිතඤ්ච" ඉති සුත්තං මාහ—අථවා සතාදයො ලක්ඛ
"න්තා දස දස ගුණිතා, තෙන එකා ලෙඛා ද්විබින්දුසහිතා සතං
"භවති, තථා චතුපඤ්ච බින්දු සහිතා සහස්සාදිකං භවති, එකා ලෙඛා
"පන චුද්දසබින්දුසහිතා කොටි, තථා එකූනවීසති බින්දුසහිතා
"පකොටීති, යාවාසංඛෙය්‍යා එකෙකස්මිං සත්ත බින්දූනි කත්වා
"ගණනා කාතබ්බා, තස්මා අසංඛෙය්‍ය ගණනාවිසෙසෙ පඤ්චත්තා
"ලීසාධිකානි සතබින්දූ භවන්ති—අය මමහාකං මති—අමරකොසෙ
"පන *පච්චාසහස්සාදි කමා දසගුණොත්තර මිත්‍යුත්තං—තස්ස
"ත්ථො, දසසංඛ්‍යා පට්ඨාය තතො ආරබ්භ දසගුණොත්තරං
"සතසහස්සාදිකං කමා විඤ්ඤෙය්‍යං—තං යථා—දසසංඛ්‍යාය දසගු
"ණොත්තරං සතං, සතා දසගුණොත්තරං සහස්සං, සහස්සා දස
"ගුණොත්තරං අයුතං, අයුතා දසගුණොත්තරං ලක්ඛං, ලක්ඛං දස
"ගුණොත්තරං පයුතං, පයුතා දසගුණොත්තරං කොටි, කොටියා

* සමහර පොත්වල "සතසහස්සාදිකමාරබ්භ දසගුණොත්තරමිත්‍යුත්තං"—කියාය.

"අබ්බුදං, අබ්බුදා පදුමං, පදුමා බබ්බා, බබ්බා මහාබබ්බා,
"තතොපි මහාපදුමං, තතොපි සංඛං, සංඛතොපි සමුද්දං, තතො
"අනන්තං, අනන්තා මජ්ඣං, මජ්ඣා පරඩ්ඪං, පරඩ්ඪා අමතං,
"අමතා දසගුණෙනනන්තං සංඛ්‍යං, සංඛ්‍යච වීසතිමං ඨානං, අසං
"ඛෙය්‍ය මිතො පරමිති සබ්බපාරියදන්තා හි බ්‍යාකරණස්ස සබ්බ
"මපස්සත්‍ර වාද දස්සිතා"—යනුයි.

තවත් වාදයක් සූත්‍රනිද්දේශයෙහි මෙසේ දක්වන ලදී.

"අඤ්ඤ ආචරියා පන සෙය්‍යථාපි භික්ඛවෙ වීසත්ඛාරිකො
"කොසලානං තිලවාහො තතො පුරිසො වස්සසතස්ස වස්සසහ
"ස්සස්ස අච්චයෙන එකෙකං තිලං උද්ධරෙය්‍ය ඛිප්පතරං සො භික්ඛ
"වෙ වීසතිඛාරිකො කොසලානං තිලවාහොති ඉමිනා උපකාන
"මෙන පරික්ඛයං පරියොදානං ගච්ඡෙය්‍ය නත්වෙව එකො අබ්බුදො
"නිරයො සෙය්‍යථාපි භික්ඛු වීසති අබ්බුදනිරයා එවමෙකො නිර
"බ්බුදනිරයොති එවමාදි එකාදසඞ්ගුත්තරෙ අංගත්තසූත්තං ආහරි
"ත්වා දසාදීනං යාව අසංඛෙය්‍යපරියන්තානං තාසං සංඛ්‍යානං දසගු
"ණිතං පඨිතෙහි කාතබ්බං, නච කොටිලං සතාදීනං දසසත සහස්ස
"පරියන්තානං තාසං සංඛ්‍යානං දසගුණිතං කාතබ්බං, තතො
"කොටිපභූතීනං බින්දුපරියන්තානං තාසං සංඛ්‍යානං සතලක්ඛ
"ගුණිතාච පඨිතෙහි කාතබ්බං, තතො අබ්බුද පභූතීනං අසංඛෙ
"ය්‍යපරියන්තානං තාසං සංඛ්‍යානං වීසත්තිලවාහෙහි පඨිතෙහි
"කාතබ්බන්ති වදන්ති." යනුයි.

Figures from 10 & *Asankheyya.*

දශයෙහි පටන් අසංඛෙය්‍ය දක්වා ඉලක්කම් ක්‍රමයනම්.

10 දහයයි
100 සියයයි
100,0 දහයි
1000,0 දශදහයි (නො හොත්) නහුතයයි.
10000,0 ලක්‍ෂයයි.
100,00000 කොටියයි.
10000000,0000000 ප්‍රකොටියයි.
10000000,0000000,0000000 කොටිප්‍රකොටියයි.
10000000,0000000,0000000,0000000 නහුතයයි.
10000000,0000000,0000000,0000000,0000000 නිනනහුතයයි.

10000000,0000000,0000000,0000000,0000000,0000000	අක්ෂෞහිණීයයි*
10000000,0000000,0000000,0000000,0000000,0000000, 0000000	බින්දුවයි.
10000000,0000000,0000000,0000000,0000000,0000000, 0000000,0000000	අබ්බුදයයි.
10000000,0000000,0000000,0000000,0000000,0000000, 0000000,0000000,0000000	නිරබ්බුදයයි.
10000000,0000000,0000000,0000000,0000000‘0000000, 0000000,0000000,0000000,0000000	අහහයයි.
10000000,0000000,0000000,0000000,0000000,0000000, 0000000,0000000,0000000,0000000,0000000	අබබයයි.
10000000,0000000,0000000,0000000,0000000,0000000, 0000000,0000000,0000000,0000000,0000000,0000000	අටටයයි.
10000000,0000000,0000000,0000000.0000000,0000000, 0000000,0000000,0000000,0000000,0000000, 0000000,0000000	සොගන්ධිකයයි.
10000000,0000000,0000000,0000000,0000000,0000000, 0000000,0000000,0000000,0000000,0000000, ,0000000,0000000,0000000	උප්පලයයි.
10000000,0000000,0000000,0000000,0000000,0000000, 0000000,0000000,0000000,0000000,0000000, 0000000,0000000,0000000,0000000	කුමුදයයි.
10000000,0000000,0000000,0000000,0000000,0000000, 0000000,0000000,0000000,0000000,0000000,0000000, 0000000,0000000,0000000,0000000	පුණ්ඩරීකයයි.
10000000,0000000,0000000,0000000,0000000,0000000, 0000000,0000000,0000000,0000000,0000000,0000000, 0000000,0000000,0000000,0000000,0000000	පදුමයයි.
10000000,0000000,0000000,0000000,0000000,0000000, 0000000,0000000,0000000,0000000,0000000,0000000, 0000000,0000000,0000000,0000000,0000000,0000000,	කථානයයි.
10000000,0000000,0000000,0000000,0000000,0000000, 0000000.0000000,0000000,0000000,0000000,0000000, 0000000,0000000,0000000,0000000,0000000, 0000000,0000000	මහාකථානයයි.
10000000,0000000,0000000,0000000,0000000,0000000, 0000000,0000000,0000000,0000000,0000000,0000000, 0000000,0000000,0000000,0000000,0000000, 0000000,0000000,0000000	අසංඛ්‍යෙයයයි.

* "අක්ඛෞහිණී" යන නාමය බුරුම රටේ සෑම පොත්වලම "අක්ඛොභිනී" කියාය—නියණ්ඨුටීකාවෙහිද "බොහෙතු මසඞ්ඛුණෙය්‍යතාය අක්ඛොභිනී" යි විග්‍රහකරණ ලදී.

මෙහි පිළිවෙළනම්.

දහයට රේඛාවක් සහිත	බින්දු	1		
සියයට	,,	බින්දු	2	
දහසට	,,	බින්දු	3	
දශදහසට	,,	බින්දු	4	
ලක්ෂයට	,,	බින්දු	5	
කෝටියට	,,	බින්දු	7	
ප්‍රකෝටියට	,,	බින්දු	14	
කෝටිප්‍රකෝටියට	,,	බින්දු	21	
නහුතයට	,,	බින්දු	28	
නින්නහුතයට	,,	බින්දු	35	
අක්ෂෝහිණියට	,,	බින්දු	42	
බින්දුවට	,,	බින්දු	49	
අබ්බුදයට	,,	බින්දු	56	
නිරබ්බුදයට	,,	බින්දු	63	
අහහයට	,,	බින්දු	70	
අබබයට	,,	බින්දු	77	
අටටයට	,,	බින්දු	84	
සොගන්ධිකයට	,,	බින්දු	91	
උප්පලයට	,,	බින්දු	98	
කුමුදයට	,,	බින්දු	105	
පුණ්ඩරීකයට	,,	බින්දු	112	
පදුමයට	,,	බින්දු	119	
කථානයට	,,	බින්දු	126	
මහාකථානයට	,,	බින්දු	133	
අසංඛෙය්‍යයට	,,	බින්දු	140	

"දසාදි යාව කොට්‍යන්තා සුඤ්ඤෙකකංව වඩ්ඪයෙ,
අවසෙසෙසු සඞ්ඛ්‍යාසු සත්ත සත්තෙව වඩ්ඪයෙ.
සත්ත සුඤ්ඤා භවෙ කොටි උත්තරං සත්ත බොං ගුණෙ,
චත්තාලීස සතං සුඤ්ඤා අසංඛෙය්‍යන්ති වුච්චති."

මේ දක්වනු ලැබූ ක්‍රමයට අක්ෂෝහිණියක්නම් නිනහුත සියක් ලක්ෂයක්ය සමහර ආචාර්‍ය්‍යවරයෝ මෙසේද කියත්—ඒ නම්,

හස්තීන් දහසක්ද ඒ එක එක හස්තියාට රථ සියය සියයද ඒ එක එක රථයට අශ්වයන් සියය සියයද ඒ එක එක අශ්වයාට මනුෂ්‍යයන් සියය සියයද ඒ එක එක මනුෂ්‍යයාට කානාකවන් සියය සියයද ඒ එක එක කානාකවට ස්ත්‍රීන් සියය සියයද වූ කල මේ ගණන අක්ෂෝහිණියයිද කියත්—

එහෙයින් කීහ.

"නව නාගසහස්සානි නාගෙ නාගෙ සතං රථා,
රථෙ රථෙ සතං අස්සා අස්සෙ අස්සෙ සතං නරා,
නරෙ නරෙ සතං කඤ්ඤා, එකෙකිස්සා සතිත්ථියො,
එසා අක්ඛොහිණී නාම *පුබ්බාචරියෙහි භාසිතා."

---

* සද්දසාරත්ථජාලිනියෙහි "මුනින්දෙන පකාසිතා" කීයාය.

අක්ෂෞහිණීය ගැණ සමහර ආචාර්‍ය්‍යවරයෝ මෙසේද කියත්—ඒ නම්—හුණදඬු සැට සැට ඇත්තාවූ මිටි සැටක් මාර්ගයෙහි දැමූ කල යම් පමණ සේනාවකින් ඒ හුණදඬු මිටි සැට ධූලි කළ හැකිද ඒ සේනා ප්‍රමාණය අක්ෂෞහිණීයක්යයි කියනු ලැබේ.

එහෙයින් කීහ.

“සට්ඨිවේළු කලාපෙසු පච්චේකං සට්ඨි වේළුසු,
ධූලීකාතෙසු සේනාය යාති අක්ඛොහිණී වහායා.”

තවද මෙහි දක්වනු ලැබූ ක්‍රමයට “අසංඛෙය්‍යයක්” නම් මහා කඨාන සියත්ලක්ෂය නමුදු සතිස් ලක්ෂ දශ දහස්පනස්හත් යොදුන් වට සහ, දෙලොස්ලක්ෂ තිස්දහස් හාරසිය පනස්යොදුන් සර සඳ, අසූදෙදහසක් යොදුන් උසද ඇත්තාවූ චක්‍රවාටය සම්පූර්ණයෙන් පිරෙණ ලෙස තුන්අවුරුදක් මුළුල්ලෙහි නොකඩව වසින්නාවූ වර්ෂාවෙහි වැසිබිඳුගණන අසංඛෙය්‍යයයි කියනු ලැබේ—ගණන් පථය අතික්‍රාන්තහෙයින් එසේ කියන ලදී—එහෙයින් කීහ.

“*සකලා තිණ්ණි වස්සානි චක්කවාළාභිපූරයං,
පිතව බින්දු වස්සව අසංඛෙය්‍යානීති වුච්චති.”
“අථවාපි චත්තාලීසං සතං සුඤ්ඤමපි වුච්චති,
අථවාපි ගණනපථං අතීතත්තා තථා මතං.”

වීසතිශබ්දය පටන් අසංඛ්‍යෙය ශබ්දය දක්වා පැවති සංඛ්‍යා ශබ්දයන්ගේ නිෂ්පත්තික්‍රමය.

“දසච දසච වීසං, වීසතිවා”-යනු විග්‍රහබැවින් දශයක්ද දශයක්ද විස්සක් නම් වේ-මෙසේ දස ශබ්ද දෙක දසච දසච යි ද්වන්ද්වසමාස කොට චකාරප්‍රයෝගාදිය කළ කල්හි “දසදස” යි දස ශබ්දවය සිටී, එකල්හි “සරූපාන මෙකසෙසවසකිං” යන සූත්‍රයෙන් එකශෙෂ කොට හෙවත් දස ශබ්ද වයම තබා එක දස ශබ්දයක් කොට සමාසාන්තයා අලිඟුහෙයින් නම්වත් කොට ඔදුකෙරෙන් පරව යො විභක්ති තබා සොවිභක්ති පරකල්හි “ගණනෙ දසස්ස ද්වික තික “චතුක්ක පඤ්චක ඡක්ක සත්තක අට්ඨක නවකානං වී තිං චත්තාර “පඤ්ඤාස ඡ සත්තාසනවා යොසු යොනඤ්චසමාසං ඕ රීතුති”—යන

---

* කච්චායනභෙදටීකාවෙහි “සකලානි තීවස්සානි...බින්දුවබින්දුවිස්සව”-යනුයි.

සූත්‍රයෙන් දසශබ්දයාහට වි යනාදෙශද යොවිභක්තිහට ඊසං යනාදෙශද කළකල්හි වීසං කියා වේ. ඔහුකෙරෙන් පරව "තිච" යන සූත්‍රයෙන් තිකාරාගම හා "ව්‍යඤ්ජනෙ ච" යන සූත්‍රයෙන් නිග්ගහීත ලොප් කළ කල්හි "වීසති" කියා වේ.

පෙරසේම දස ශබ්ද තුනක් වනව සමාස කොට එකශෙෂ කොට දස ශබ්ද තුනෙහිම අජ්ඣවාවී ඒ තනි දසශබ්දයාකෙරෙන් පරව යොවිභක්ති තබා යොවිභක්ති පරකල්හි දස ශබ්දයා හට "ගණනෙ දසස්ස..." යනාදි සූත්‍රයෙන් ති යනාදෙශද යො හට ඊසං යනාදෙශද, ඒ ඒ සූත්‍රවලින් නිග්ගහීතාගමද පරස්වර ලොප්ද කළ කල්හි "තිංසං" කියා වේ—"තිච" යන සූත්‍රයෙන් අන්තයෙහි තිකාරාගමද, නිග්ගහීත ලොප්ද කළ කල්හි "තිංසති" කියාවේ-තිකාරාගම නොකොට ස්ත්‍රී ලිංගික ආප්‍රත්‍යය කළ කල්හි "තිංසා" කියා වේ-දසච දසච දසච තිංසං-තිංසති, තිංසා වා-යනු විග්‍රහයි.

දසච දසච දසච දසච යී දස ශබ්ද සතරක් වනව සමාස හා එකශෙෂකොට දසශබ්ද සතරෙහිම අජ්ඣවාවී ඒ කෙවල දසශබ්දයා කෙරෙන් යොවිභක්ති තබා යො විභක්ති පරකල්හි දසශබ්දයා හට චත්තාර යනාදෙශද යො ට ඊසං යනාදෙශද පරනයනාදියද කළ කල්හි චත්තාරීසං කියාද—*තිකාරාගම හා නිග්ගහීත ලොප්ද කළ කල්හි චත්තාරීසති කියාද, ති කාරාගම නොකොට ස්ත්‍රීලිංගික ආප්‍රත්‍යය කළ කල්හි "චත්තාරීසා" කියාද රකාර සි්න්ට † ලකාරාදෙශ කළ කල්හි "චත්තාලීසං, චත්තාලීසති, චත්තාලීසා" කියා වේ.

දස ශබ්ද පසක් වනව සමාස කොට එකශෙෂ කිරීමෙන් පසු සිටි දසශබ්දයා කෙරෙන් යො විභක්ති කොට දස ශබ්දයාට "ගණනෙ" යනාදි සූත්‍රයෙන් පඤ්ඤ යනාදෙශද යො හට ආසං යනාදෙශද කොට පරනයනය කළ කල්හි "පඤ්ඤාසං" කියා වේ—ස්ත්‍රීලිංගික ආප්‍රත්‍යය හා නිග්ගහීත ලොපාදිය කළ කල්හි "පඤ්ඤාසා" කියා වේ—මෙහි අන්තයෙහි තියාරාගමව සිඩවූ ශබ්දයක් පාලියෙහි නොදක්නාලද හෙයින් නොකියනලදී-"දසච දසච දසච දසච දසච පඤ්ඤාසං,-පඤ්ඤාසා වා"-යනු විග්‍රහයි.

---

* මෙහි තිකාරාගමයක් පොත්වල නොකියනලද නුමුත් "චත්තාලීසති" යනාදි උදාහරණ පෙනේ.

† රකාරාහට බැවින් ල කාර ආදෙශය යුතුව පේන නමුදු බොහෝ පුරාණ පොත්වල හා බුමපොත්වලද "චත්තාලීසං" යනුයි.

දස ශබ්ද සයක් වනාව සමාස කිරීමෙන් එකශෙෂාදිය කොට යොවිභක්ති පරකල්හි දසශබ්දයාට *ස යනාදෙශ හා යො හට ඕ යනාදෙශද විතතද කළ කල්හි "සඨි" කියා වේ-එකශෙෂ කිරීම හා දසශබ්දයටද යොවිභක්තියටද කාරණු ලබන ආදේශද මූලකි සූත්‍රදෙකින්ම බව දතයුතුයි. ඊගුන වාක්‍යද මූලකි නයින් ක්‍රමයෙන් එක එක දස ශබ්දය වැඩි කිරීමෙන් යොදා ගත යුතුයි.

දස ශබ්ද සතක් වනාව සමාස කොට එකශෙෂ කොට යො විභක්ති තබා දස ශබ්දයා හට සත්ත යනාදෙශද යො හට රි යනාදෙශද එසේම "ත්" යනාදෙශද කළ කල්හි "සත්තරි, සත්තති" කියා වේ.

දස ශබ්ද අටක් වනාව සමාස හා එකශෙෂාදිය කොට දස ශබ්දයා හට අස යනාදෙශද යො විභක්ති හට ඊති යනාදෙසද පර නයනාදියද කළ කල්හි "අසීති" යනු වේ.

දස ශබ්ද නවයක් වනාව සමාසහා එකශෙෂාදිය කොට දස ශබ්ද නවයෙහිම අර්ථ වාචී එකශෙෂ කාරණුවැඹූ දසශබ්දයා හට නව යනාදෙශද යො හට උති යනාදෙශද පරනයනාදියද කළ කල්හි "නවුති" කියා වේ.

දසච දසච යනාදි වශයෙන් දස ශබ්ද දහයක් පෙරසේම වනාව සමාස කොට එකශෙෂ කිරීමෙන් පසු දස ශබ්දයා කෙරෙන් පරව යො විභක්ති කොට යො විභක්ති සහිතවූ දස ශබ්දයා හට "දස දසකං සතං දසකානං සතං සහස්සඤ්ච යොම්හි" යන සූත්‍රයෙන් සත යනාදෙශ කොට සත යන ප්‍රකෘති පදයා කෙරෙන් ප්‍රථමා එක වචන සි විභක්ති කොට ඔහට අං යනාදෙශ පර නයනාදිය කළ කල්හි "සතං" කියා වේ.

සහස්සං යනාදි තැන්හි දසච දසච යනාදි වශයෙන් දස ශබ්ද සියයක් තබා වනාව සමාස කොට එකශෙශ කළ කල්හි යො විභක්ති කොට යො විභක්ති සහිතවූ දස ශබ්දයා හට "දසදසකං" යනාදි සූත්‍රයෙන් සහස්ස යනාදෙශ වේ. නැවත සහස්ස යන ප්‍රකෘති පදයා කෙරෙන් පරව සි විභක්ති කොට සි විභක්ති හට අං යනාදෙශ හා පර නයනාදිය කළ කල්හි "සහස්සං" කියා වේ.

"කොටි" යන තන්හි "සතසහස්ස" ශබ්ද සියයක් "සතසහස්සඤ්ච සතසහස්සඤ්ච" යනාදිවශයෙන් වනාව සමාස කොට විභක්ති

---

* සමහර තැනෙක ඡ යනාදෙශද වේ-එකල "ඡළී" කියා වේ.

ලොපාදිය හා එකශෙෂද කළායින් පසු "සඞ්ඛ්‍යාමෙහි" යන සූත්‍රයෙන් "කොටි" යනාදෙශ කොට ඔහු කෙරෙන් පරව සිව්භක්ති තබා ලොප්කළ කල්හි "කොටි" කියා වේ.

මෙසේම කොටි සතසහස්ස ශබ්ද සියක් වනාව සමාස කොට විභක්ති ලොපාදිය හා එකශෙෂ කිරීමෙන් පසු "සඞ්ඛ්‍යාමෙහි" යන සූත්‍රයෙන් පකොටි යනාදෙශ කළ කල්හි නම්වත් සි ලොපාදිය කළ කල්හි "පකොටි" යනු සිඩයි—කොටිප්පකොටි, නහුතං, නින්නහුතං, යනාදියද මෙසේම සුදුසු පරිද්දෙන් "සඞ්ඛ්‍යාමෙහි" යන සූත්‍රයෙන් සිඩ කටයුතුයි—මෙසේහෙයින් මේනාමයෝ සමාසාන්තයෝයයි සිතිය හැකියි.

මේ වීසති යනාදි ශබ්දයන්ගේ නිෂ්පත්ති ක්‍රමය කච්චායන ශබ්දනීති යන ව්‍යාකරණවල දක්වන ලද්දේ නමුදු ඒ ලොකප්‍රසිඩවූ සංඥා ශබ්දයෝයයි මොග්ගල්ලාන යන පදසාධනී යනාදියෙහි නොකියන ලදී—එහෙයින් පදසාධනී ටීකාවෙහිද ඒනැණ මෙසේ කියන ලදී.

☞ "කච්චායනෙ දස ච දස චාති විග්ගය්හ චත්ථ සමාසෙ දස
"දසාති වත්වා තද්ධිතෙ සරූපානං එකසෙසං කත්වා දස ඉති ඨිතෙ
තතො යොම්හි දසස්ස ද්වි ආදෙසං යොස්ස ංසං ආදෙසඤ්ච කත්වා
"වීස ඉති ඨිතෙ තතො තිකාරාගමං කත්වා වීසති ආදයොපි
"අනෙකායාසෙන නිප්ඵාදිතා තෙ පන ලොකප්පසිද්ධා සඤ්ඤා
"සද්දා යෙවෙති න නිප්ඵාදේතබ්බා යථා කොටි ආදයො සඞ්ඛ්‍යා
"මෙඝ සඤ්ඤා සද්දා."

"සංඛ්‍යාශබ්දයන්ගේ ප්‍රභේද.

NUMERALS.

සංඛ්‍යා ශබ්දයෝ වනාහි තුන් ප්‍රකාරයක් වේ--ඒනම් සංඛ්‍යාප්‍රධානය සංඛ්‍යාප්‍රධානය, උභය ප්‍රධානය කියාය--එහි එක ශබ්දය පටන් අෂ්ඨාරස ශබ්දය දක්වා ඇති ශබ්දයෝ සංඛෙය්‍යප්‍රධානයෝය (ඒනම් ගණන් අර්ථය නොව ගණන්න් විශිෂ්ඨවූ අර්ථය ප්‍රධාන කොට ඇති බවයි) එහි එක ශබ්දය එකවචනාන්තය විශබ්දදීහු බහුවචනාන්තයෝය-වීසති ශබ්දය පටන් නවුති ශබ්දය දක්වා ඇති ශබ්දයෝ කිසි තැනෙක සංඛ්‍යාප්‍රධානයෝය කිසි තැනෙක සංඛෙය්‍යප්‍රධානයෝය—(සංඛ්‍යාප්‍රධානය යනු ගණන් අර්ථය ප්‍රධාන කොට ඇති බවයි) ස්ත්‍රීලිඞ්ගික එකවචනාන්තයෝය.

එහෙයින් කීහ—අභිධානප්පදීපිකාවෙහි.

“අට්ඨාරසන්තා සංඛෙය්‍යෙ සංඛ්‍යා එකාදයො තිසු *
සංඛ්‍යානෙ තු ච සංඛෙය්‍යෙ එකත්තෙ වීසතාදයො.”

සත ශබ්දය පටන් අසංඛෙය්‍ය ශබ්දය දක්වා ඇති ශබ්දයෝ උභය ප්‍රධානයෝය—“සතං, සතානි” යනාදි එකවචන බහුවචනාන්තයන් දක්නාලද හෙයිනැයි සූත්‍රනිර්දේශයෙහි කියන ලදී—කොටිත්‍රය හා අක්ඛොභිණී යන ශබ්දයන් හැර සෙසු ශබ්දයෝ නපුංසකලිඞ්ගිකයෝය—කොටිත්‍රය හා අක්ඛොභිණී ශබ්ද ස්ත්‍රීලිඞ්ගිකයි—එහෙයින් කීහ—කච්චායන නිස්සයප්‍රකරණයෙහි.

“එක ත්‍රි චතුසංඛ්‍යායො තිලිඞ්ගස්මිං තිධා සියුං,
වාදයො සත්ත සෙසා ච ති සුලිඞ්ගෙසු එකධා.
වීසත්‍යාදි නවුත්‍යන්තා ඉත්ථිලිඞ්ගෙක වාචකා,
සතං යාව අසංඛෙය්‍යා නපුංසක මිතුච්චතෙ.
කොටිත්තය අක්ඛොභිණී ඉත්ථිලිඞ්ගවිවාචකා,
සංඛ්‍යාවිසෙසො වුත්තොයං යතිනා වරබුද්ධිනා.”

ශබ්දනීතියෙහි හා මොග්ගල්ලායන පඤ්චිකාප්‍රදීපයෙහි මීට මඳක් වෙනස්ලෙස මෙසේ කියන ලදී.

“එකප්පභුතිතො යාව දසකායා පවත්තන්ති,
සා සංඛ්‍යාතාව සංඛෙය්‍යප්පධානාති ගරූ වදුං.
වීසතිතො යාව සතා යාසංඛ්‍යා තාව සා පන,
සංඛ්‍යාප්පධානා සංඛෙය්‍යප්පධානාති ච වණ්ණයුං.
අපිච—වීසතො යාව කොටියා සංඛ්‍යා තාව සා බහූ,
සංඛ්‍යාප්පධානා සංඛෙය්‍යප්පධානා ති ච නිද්දිසෙ”

“එකො බ්‍රාහ්මණො—අට්ඨාරස බ්‍රාහ්මණා” යනාදියෙහි එක ශබ්දාදීහු සංඛෙය්‍යප්‍රධානයෝය—“වීසති භික්ඛවො” යනාදියෙහි වීසති ශබ්දාදීහු සංඛෙය්‍යප්‍රධානයෝය—“භික්ඛූනං වීසති” යනාදියෙහි සංඛ්‍යාප්‍රධානයි.

---

* තිසු ත්‍යනෙන න කෙවලං එකසද්දොව තිලිඞ්ගො අථඛො අට්ඨාරස පරියන්තාපි, තෙන කත්ථචි තෙසං අලිඞ්ගතා වචනං ලිඞ්ගවිසෙසාභාවං සන්ධාය වුත්තං න පන සා මිස්සලිඞ්ගාභාවන්ති දට්ඨබ්බං” යනු අභිධානප්පදීපිකා ටීකායි.

යම්තැනෙකත්හි සංඛ්‍යාප්‍රධාන වීනම් හෙවත් ගණන් අර්ථය ප්‍රධාන වූයේ වීනම්) සංඛ්‍යා ශබ්දය තුල්‍යාධිකරණව යොදන ලදී—"දුවෙ පුථුජ්ජනා-අට්ඨාරස බ්‍රාහ්මණා-දසහි චක්කවාළසහස්සෙහි දසසහස්ස භික්ඛූ" යනාදි වශයෙනි-සංඛ්‍යෙයප්‍රධාන වීනම් භින්නාධිකරණව තත්පුරුෂ සමාසවශයෙන් යොදනලදී—"භික්ඛූනං සතං-භික්ඛු සතං"-යනාදි වශයෙනි.

තවද—"යෙසං ඛො විසාඛෙ දස පියානි දස තෙසං දුක්ඛානි, යෙසං නව පියානි නව තෙසං දුක්ඛානි, යෙසං අට්ඨ පියානි අට්ඨ තෙසං දුක්ඛානි......යෙසං පඤ්ච පියානි පඤ්ච තෙසං දුක්ඛානි" යනාදියෙහි දසශබ්දාදීහු සංඛ්‍යෙයප්‍රධානයෝය—"යෙසං ඛො විසාඛෙ සතං පියානි සතං තෙසං දුක්ඛානි......යෙසං අසීති පියානි අසීති තෙසං දුක්ඛානි" යනාදියෙහි සතශබ්දාදීහුද එසේමැයි.

"චත්තාරි සත සහස්සානි ඡළභිඤ්ඤා මහිද්ධිකා,
දීපංකරං ලොකවිදුං පරිවාරෙන්ති සබ්බදා."

(4.) එසේම දිනෙනා සුංකො යස්ස යන වාක්‍යයෙහි "දිනන-සුංක" යන ශබ්ද වය සම්ප්‍රදානාර්ථයෙහිද, (5.) නිග්ගතා ජනා යස්මා යන වාක්‍යයෙහි "නිග්ගත-ජන" ශබ්ද වය අපාදනාර්ථයෙහිද--(6.) දස බලානි යස්ස යන වාක්‍යයෙහි "දස-බල" ශබ්ද වය සාම්‍යර්ථයෙහිද, (7.) සම්පන්නානි සස්සානි යස්මිං යන වාක්‍යයෙහි "සම්පනන-සස්ස" යන ශබ්ද වය ආධාරාර්ථයෙහිද—(දිනනසුංකො-නිග්ගතජනො-දසබලො-සම්පනනසස්සො යී) සමාස නොව ස්වකීය ස්වකීය වාක්‍යම

සිටිහෙයින් සමාසයාවිසින් සම්ප්‍රදාන, අපාදාන, සාමි, ආධාර, යනාර්ථයො උක්ත නොවන ලද්දාහුය—එහෙයින් ඒ අනුක්ත සම්ප්‍රදානාදියෙහි ප්‍රථමා විභක්ති නොව පිළිවෙළින්, චතුර්ථි, පඤ්චමී, ෂෂ්ඨී සප්තමී යන විභක්තීහු වූවාහු යයි දතයුතුයි.

තද්ධිතයාවිසින් උක්තවූ කර්මාදියට උදාහරණ.

තද්ධිතයාවිසින් උක්ත කර්මය ...1. ඛාත්තිකො-ආහාරෙ—සත්තිකො-දාසො.
තද්ධිතයාවිසින් උක්ත කර්තෘ......2. අභිධම්මිකො–භික්ඛු.
තද්ධිතයාවිසින් කරණය ....උක්තවීමක් නැත්තේය.
තද්ධිතයාවිසින් උක්ත සම්ප්‍රදානය.4. දක්ඛිණෙය්‍යො–භික්ඛු.
තද්ධිතයාවිසින් අපාදානයද ......උක්ත වීමක් නැත්තේය.
තද්ධිතයාවිසින් උක්ත සම්බන්ධය 6. වෙණිකො – ගන්ධබ්බො.
තද්ධිතයාවිසින් උක්ත ආධාරය...7. රුක්ඛවා—දෙසො.

(1.) ඛාත්තිකො-සත්තිකො-යන මෙහි "ඛාතෙන සංසට්ඨො-සත්තෙන කීතො" යනු විග්‍රහය—එහි කර්මාර්ථයෙහි ත ප්‍රත්‍යයාන්තවූ සංසට්ඨ, කීත, යන ශබ්දයන්ගේ අර්ථයෙහි තද්ධිත (ණික) ප්‍රත්‍යය වූ හෙයින් ඒ තද්ධිත ප්‍රත්‍යයාන්ත ඛාත්තික, සත්තික, යන ශබ්දයන් විසින් "ආහාරෙ-දාසො" යන කර්මදෙක උක්තහෙයින් ඒ තද්ධිතයාවිසින් උක්තවූ කර්මයෝයයි කියනු ලැබෙත්.

(2.) අභිධම්මං අධීයතෙ යී වාක්‍ය ගෙණ විග්‍රහ කරණු ලබන්නාවූ තද්ධිත (ණික) ප්‍රත්‍යයාන්ත පදයෙන් (උක්ත වූයේ) කියනු ලබන්නේ "භික්ඛු" යන කර්තෘහෙයින් ඒ භික්ඛු යනු තද්ධිතයා විසින් උක්ත කර්තෘයයි දත යුතුයි.

(4.) දක්ඛිණා දීයතෙ යස්ස යන වාක්‍යයෙහි යස්ස යන සම්ප්‍රදානාර්ථයෙහි දක්ඛිණා ශබ්දයාකෙරෙන් ණෙය්‍ය ප්‍රත්‍යය වූහෙයින් ඒ තද්ධිත (ණෙය්‍ය) ප්‍රත්‍යයාන්ත පදයාවිසින් සම්ප්‍රදානය උක්තනුයි, "භික්ඛු" යනු තද්ධිතයා විසින් උක්ත සම්ප්‍රදාන නම් වේ.

(6.) වීණා අස්ස සිප්පං යන වාක්‍යයෙහි වීණා ශබ්දයෙන් පරව සාමාර්ථයෙහි තද්ධිත (ණික) ප්‍රත්‍යය වූහෙයින් ඒ තද්ධිත (ණික) ප්‍රත්‍යයාන්ත වෙණිකො යන පදයාවිසින් සාමි උක්තනුයි "ගන්ධබ්බො" යනු තද්ධිතයා විසින් උක්ත සාමිනම් වේ.

(7.) රුක්ඛා අස්මිං විජ්ජන්ති යන වාක්‍යයෙහි රුක්ඛ ශබ්දයෙන් පරව ආධාරාර්ථයෙහි තද්ධිත (වන්තු) ප්‍රත්‍යය වූ හෙයින් ඒ තද්ධිත පදයා විසින් ආධාරය උක්තනුයි "දෙසො" යනු තද්ධිතයා විසින් උක්තාධාරනම් වේ.

තද්ධිතයා විසින් අනුක්ත කර්මාදිය.

තද්ධිතයාවිසින් අනුක්ත කර්මය ...1. { ඝතෙන සංසට්ඨො ආහාරො- / සතෙන කීතො දුස්සො.

තද්ධිතයාවිසින් අනුක්ත කර්තෘ......2. අභිධම්මං අවෙච්ච අධීතෙ භික්ඛු.

,, ,, ,, ,,

තද්ධිතයාවිසින් අනුක්ත සම්ප්‍රදානය.4. දක්ඛිණාදීයතෙ යස්ස භික්ඛුනො.

,, ,, ,, ,,

තද්ධිතයාවිසින් අනුක්ත සාමි ......6. වීණාවාදනං සිප්පං අස්ස ගන්ධබ්බස්ස.

තද්ධිතයාවිසින් අනුක්ත ආධාරය...7. රුක්ඛා යස්මිං දෙසෙ විජ්ජන්ති.

(1.) ඝතෙන සංසට්ඨො ආහාරො යනාදියෙහි-සංසෘෂ්ටාර්ථයෙහි විධීයමාන වූ තද්ධිත "ණික" ප්‍රත්‍යය නොකළහෙයින් ඔහුවිසින් ඔදනාඛ්‍ය කර්මය අනුක්තනුයි අනුක්තකර්ම නම් වේ—එහි තද්ධිතයා විසින් කර්මය අනුක්ත නමුදු කර්මයෙහි කරණ ලද කිතාඛ්‍යාත ප්‍රත්‍යයා විසින් උක්තහෙයින් "ආහාරො-දුස්සො" යනු කිතාඛ්‍යාතයා විසින් උක්ත කර්මයෝයි.

(2.) අභිධම්මං අවෙච්ච අධීතෙ යන වාක්‍යයෙහි අභිධම්ම ශබ්දයා කෙරෙන් පරව කර්තෘ අර්ථයෙහි තද්ධිත "ණික" ප්‍රත්‍යය නුවූහෙයින් තද්ධිතයා විසින් කර්තෘ අනුක්තයි.

(4.) දක්ඛිණා දීයතෙ යස්ස යන වාක්‍යයෙහි දක්ඛිණා ශබ්දයා කෙරෙන් පරව සම්ප්‍රදානාර්ථයෙහි තද්ධිත "ණෙය්‍ය" ප්‍රත්‍යය නුවූහෙයින් තද්ධිතයා විසින් සම්ප්‍රදානය අනුක්තයි.

(6.) වීණා වාදනං සිප්පං අස්ස ගන්ධබ්බස්ස යන වාක්‍යයෙහි වීණා ශබ්දයා කෙරෙන් පරව සාම්‍යර්ථයෙහි තද්ධිත "ණික" ප්‍රත්‍යය නුවූහෙයින් තද්ධිතයා විසින් සාමි අනුක්ත නම් වේ.

(7.) රුක්ඛා යස්මිං දෙසෙ විජ්ජන්ති යන වාක්‍යයෙහි රුක්ඛ ශබ්දයා කෙරෙන් පරව ආධාරාර්ථයෙහි තද්ධිත "වන්තු" ප්‍රත්‍යය නුවූහෙයින් ස්වකීය වාක්‍යයම සිටි බවද තද්ධිත ප්‍රත්‍යයා විසින් ආධාරය අනුක්තහෙයින් ප්‍රථමා විභක්ති නොව "දෙසෙ" යි සප්තමී විභක්තිම වූ බවද දත යුතුයි.

ආඛ්‍යාතයාවිසින් උක්තානුක්ත කර්මාදියට උදාහරණ.

ආඛ්‍යාතයාවිසින් උක්ත කර්ම ...1 { සූදෙන ඔදනො පච්චතෙ. / බුද්ධෙන ධම්මො දෙසීයතෙ.

ආඛ්‍යාතයාවිසින් උක්ත කර්තෘ...2 { සූදො ඔදනං පචති. / බුද්ධො ධම්මං දෙසෙති.

(ආඛ්‍යාතයා විසින් කරණාදිය උක්තවීමක් නැත්තේය.)

(1.) "පච්චතෙ" යන්නෙහි ආඛ්‍යාත තෙ විභක්තියද ය ප්‍රත්‍යයද කර්මයෙහි ඊරිතහෙයින් පච්චතෙ යන ඒ ආඛ්‍යාත පදයා විසින් ප්‍රකාශකරණු ලබන්නේ හෙවත් උක්තවනු ලබන්නේ කර්මයන්ය ඒ නම්, "ඔදනො" යනුයි-එහෙයින් "සූදෙන ඔදනො පච්චතෙ" යන මෙහි "ඔදනො" යනු ආඛ්‍යාතයාවිසින් උක්ත කර්මයි.

(2.) "බුද්ධෙන ධම්මො දෙසීයතෙ" යන්නෙහිද මෙසේමය—තවද උක්තකර්මය වූ පදයෙහි යෙදිය යුතු විභක්තිය නම් ප්‍රථමාවමබව "අභිහිතෙ කර්මණි ප්‍රථමෛව" යන පාණිනි සූත්‍රයෙන්ද— "ප්‍රථමෛව විභක්ති සංඛ්‍යාත් උක්තෙ කර්මණි කර්තරි" යන ප්‍රබෝධ චන්ද්‍රිකා පාඨයෙන්ද "පඨමෙන යුත්තො වුත්තො" යන කච්චායන භෙද පාඨයෙන්ද දත යුතුයි.

"කම්මත්ථෙ දුතියා" යන ආචාර්ය වචනය ලෙස කර්මාර්ථය ප්‍රකාශකරණ පදයෙහි යෙදිය යුතු ද්විතීයා විභක්තිමය—එසේ යුතුව තිබියදී ප්‍රථමා විභක්ති යොදන ලද්දේ කුමක් නිසාද? යත්- ඒ මෙනිසායයි දතයුතුය-ඒනම්, යම්සේ "ඔදනං පචති" යන මෙහි ඔදන සංඛ්‍යාතවූ කර්මය ද්විතීයා විභක්තිය විසින් කියනලද හෙයින් (ඒ කර්මාර්ථය ප්‍රකාශකරණු පිණිස) තමාවිසින් කිය යුතුවූ අර්ථ විශෙෂයක් නැතිහෙයින් ඒ ද්විතීයා විභක්ත්‍යන්ත කර්මපදයෙහි නැවත ද්විතීයා විභක්තිය නොයොදනු ලැබේද, එසේම "සූදෙන ඔදනො පච්චතෙ" යන මෙහිද-"පච්චතෙ" යන කර්මකාරක ආඛ්‍යාත ක්‍රියාපදයාවිසින් කර්මයතෙම කියනලද හෙයින් නැවත ඒ (කර්මාර්ථය ප්‍රකාශ කරණු පිණිස) කර්මපද යෙහි ද්විතීයා විභක්තිය යෙදීමෙන් අමුතු ප්‍රයෝජනයක් නැති හෙයින් ද්විතීයා විභක්ති නොව ප්‍රථමා විභක්තියම යොදනු ලැබේ යයි දත යුතුයි.

එහෙයින් කීහ—බාලාවතාරයෙහි.

"යථා ඔදනං පචතීත්‍යත්‍ර ඔදනසංඛ්‍යාතං කම්මං දුතියාය
"වුත්තන්ති පුන තත්‍ථ වත්තබ්බස්සාත්ථවිසෙසස්සාභාවා න දුතියා
"තථා ත්‍රාපි සමාසාදීහි එව විභාගාදීනං කම්මානං කථිතත්තා න
"පුන තප්පකාසිකා දුතියා සියා, විභත්තිං විනා චාත්ථං නිද්දිසිතුම
"සක්කුණෙය්‍යත්තා අවසිය් ලිඞ්ගත්ථ මත්තාපෙක්ඛාය මපන ....
"පඨමා හොතෙව."

(2.) "සූදො ඔදනං පචති" යන මෙහි "පචති" යනු ආඛ්‍යාත කර්තෘකාරක ක්‍රියාපදයක් බැවින් ඒ පදය විසින් කියනු ලබන්නේ

(උක්තවන ලද්දේ) කර්තෘ කෙනෙකුන්ය—ඒනම් "සූදෝ" යනුයි—
එහෙයින් "සූදො" යනු ආඛ්‍යාතය විසින් උක්ත කර්තෘයි—"බුද්ධො
ධම්මං දෙසෙති" යන්නෙහිද මෙසේමය.

උක්තකර්තෘ පදයෙහි යෙදිය යුතු ප්‍රථමා විභක්තියම බව ප්‍රබොධ
චන්ද්‍රිකාදියෙහි කියනලද—"ප්‍රථමෙව විභත්ති සඞ්ඛ්‍යාත් උක්තෙ
කම්මණි කත්තරි" යනාදියෙන් දත යුතුයි.

තවද "ඔදනො පච්චතෙ" යන්නෙහි * තෙ විභක්තිය විසින්
කර්මය කියනලදහෙයින් (කර්මාර්ථය ප්‍රකාශ කරණු පිණිස
නැවත ද්විතීයා විභක්තිය ඒ කර්මපදයෙහි නොයොදා) ප්‍රථමා විභක්
තියම යෙදුවාක් මෙන් "ඔදනං පචති" යන්නෙහිද ද්විතීයා විභක්
තිය විසින්ද කර්මය කියන ලද කල්හි ප්‍රථමා විභක්තිය ඒ කර්ම
පදයෙහි නොයොදනු ලබන්නේ කුමක් නිසාද? යත්.

කර්මාර්ථය ඒ ද්විතීයාවිභක්තිය විසින් ප්‍රකට ලෙස කියනලද
කල්හි ඇත්තාවූද ලිඞ්ගාර්ථය මුවා වූහෙයින් යයි දතයුතුයි.

එම කීම.

"කථං ඔදනං පචතීත්‍යත්‍රෙ දුතියායපි කම්මෙ වුත්තෙ පුන ලිඞ්ග
'ත්ථමත්ත මපෙක්ඛිත්වා පඨමා න හොතීති චෙ? කම්මමත්තෙ තාය
'පාකටං වුත්තෙ සති සන්තොපි ලිඞ්ගත්ථස්ස තිරො භූතත්තා."
මේ ගැණ ගඬලාදෙනි සන්නයෙහිද මෙසේ කියන ලදී.

☞ "යම්සේ ස්ත්‍රී පුරුෂ නපුංසක කුමාර තරුණ වෘද්ධාදි විශෙ
'ෂයෙහි පැතිර සිටියාවූ මනුෂ්‍යත්ව ලක්ෂණවූ සාමාන්‍යය ඇතද ස්ත්‍රී
'යයි කීකල ස්ත්‍රී ස්වරූපවූ මනුෂ්‍යවිශෙෂය ප්‍රකට කොට කීහෙයින්
'සාමාන්‍යවූ මනුෂ්‍යත්වයට වඩා ස්ත්‍රී ලක්ෂණවූ මනුෂ්‍ය විශෙෂයම
'හැඟේද, මෙහිදු කර්ම කර්තෘ කරණාදියෙහිම පැතිර සිටියාවූ
'ලිඞ්ගාර්ථ මාත්‍රය ඇතද ඔදනං යනාදියෙහි කර්මාඛ්‍ය විශෙෂාර්ථය
'ද්විතීයාව විසින් ස්ඵුට කොට කියනලද හෙයින් ලිඞ්ගාර්ථමාත්‍රයට
'වඩා කර්මාර්ථයම මුඛ්‍යව හැඟෙනහෙයින් ඇතද ලිඞ්ගාර්ථ මාත්‍රය
'මුවා වූහෙයින් තදපෙක්ෂායෙන් ප්‍රථමා නොවෙයි සේයි"—යනුයි.

තවද එකම කර්ම ධාරක ක්‍රියාපදය සමග කර්ම දෙකක් යෙදිය
යුතු කල්හි එයින් කවර කර්මයක් උක්ත විය යුතුද? කවර කර්ම
යක් අනුක්තවිය යුතුද? නොහොත් කර්ම දෙකම උක්ත හෝ

---

* "යප්‍රත්‍යය සහිතවූ තෙ විභක්තිය විසින්ය" යනු හැඟෙනලෙස සමහර පොත්
වල කියන ලද්දේ නමුත් "තෙ විභත්ති වාචකො නාම—යපපඩයො රූපසිද්ධි
මතෙනාව" යි වාචකොපදෙශයෙහි කියන ලදී.

අනුකත හෝ වියයුතුද? යත්—එසේ ඇතිකල්හි සමහර තැනෙක්හි (ඒ කර්ම දෙකින්) ප්‍රධාන කර්මයද සමහර තැනෙක්හි අප්‍රධාන කර්මයද උක්තවන්නේය.

ඒනම්-දුහ (පපූරණෙ) යාච (යාචනෙ) රුධි (ආවරණෙ) සාසු (අනුසිඨියං) වච (බ්‍යතතවචනෙ) යනාදි ද්විකර්මික ධාතුවලින් සිඩවූ ක්‍රියාපදය සිටිකල්හි අප්‍රධාන කර්මය උක්තවන්නේය—නී (පාපුණනෙ) වහ (පාපනෙ) හර (හරණෙ) යනාදි ද්විකර්මක ධාතුවලින් සිඩවූ ක්‍රියාපදය සිටිකල්හි ප්‍රධාන කර්මය උකතවන්නේයයි දත යුතුයි.

ඊට උදාහරණ මෙසේය—“ගොපාලෙන ගො ඛීරං දුය්හතෙ” මෙහි “දුය්හතෙ” යනු දුහ (පපූරණෙ) යන ද්විකර්මක ධාතුවෙන් සිඩවූ කර්මකාරක ක්‍රියාපදයක්ය “ගො” යනුද “ඛීරං” යනුද ඒ හා සම්බන්ධ වන්නාවූ කර්ම දෙකය එහෙයින් “ඛීරං” යනු ප්‍රයෝජනත්වයෙන් අභිමතහෙයින් ප්‍රධාන කර්මය “ගො” යනු එයට නිමිත්තත්වයෙන් අභිමතහෙයින් අප්‍රධාන කර්මයයි—ඒ අප්‍රධාන කර්මය “දුය්හතෙ” යන ක්‍රියාපදයෙන් උක්තහෙයින් ප්‍රථමා විභක්තියෙන් යුක්තය-“ඛීරං” යනු අනුකතහෙයින් ද්විතීයා විභක්තියෙන් යුක්තයි.

“දාසෙන භාරො ගාමං නීයතෙ” යන මෙහි “නීයතෙ” යනු නී (පාපුණනෙ) යන ද්විකර්මක ධාතුවෙන් සිඩවූ කර්මකාරක ක්‍රියාපදය “දාසො” යනුද “භාරො” යනුද ඒ හා සම්බන්ධ වන්නාවූ කර්මදෙකය—එයින් “භාරො” යනු ප්‍රධාන කර්මය “ගාමං” යනු අප්‍රධාන කර්මය, ප්‍රධාන කර්මය “නීයතෙ” යන ක්‍රියාපදයෙන් උකතහෙයින් ප්‍රථමා විභක්ති යොදනලද්දේ පමණක් නොව “ගාමං” යනු අප්‍රධානහෙයින් ද්විතීයා විභක්ති යොදන ලදී.

එහෙයින් කීහු.

ප්‍රබොධචන්ද්‍රිකාවෙහි හා බාලාවතාරයෙහි.

“ප්‍රධානෙ කර්මණි භාවෙ වාචකො හි ද්විකර්මිණං,
අප්‍රධානෙ දුහාදීනං හෙතෞ කතෘශ්ච කර්මණි.”
“අප්පධානං දුහාදීනං නයාදීනනානු පධානකං,
කම්මං කම්මෙසවචනෙකෙසු වුත්තකම්මන්ති වුච්චති.”

තවද අප්‍රධානවූ කතෘකාරක ක්‍රියාවන් හා ප්‍රධානවූ කර්මකාරක ක්‍රියාවන්ද යන ක්‍රියාපද දෙකක් සමග යෙදීමෙන් එකම කර්මයාගේ උකත බවද අනුකතබවද ඇතිකල්හි ඒ කර්මපදය කවර

විභක්තියකින් යුක්තවිය යුතුද? යත්—"ප්‍රධාන අප්‍රධානයන් අතුරෙන් ප්‍රධානයා කෙරෙහිම කාර්‍ය්‍ය ප්‍රසිද්ධිය" යන යුක්තියෙන් ප්‍රධානවූ කර්‍ම්මකාරක ක්‍රියාපදය සලකා ප්‍රථමා විභක්තියම යෙදිය යුතුයි—එම තිහ.

"යස්සප්පධානප්පධාන ක්‍රියා සම්බන්ධතො සියුං,
වුත්තානුත්තතාතතා තස්ස පඨමං හොති නාපර."

ඊට උදාහරණ මෙසේය—"භික්ඛුනා පච්චවෙක්ඛිත්වා පිණ්ඩපාතො පටිසෙවීයතෙ" මෙහි "භික්ඛුනා" යනු කර්තෘය, "පිණ්ඩපාතො" යනු කර්‍ම්මය, "පච්චවෙක්ඛිත්වා" යනු (කර්තෘකාරකයෙහි ත්වා ප්‍රත්‍යයව සිද්ධවූ) අප්‍රධාන ක්‍රියාවය, "පටිසෙවීයතෙ" යනු (කර්‍ම්මකාරකයෙහි ය ප්‍රත්‍යයව සිද්ධවූ) ප්‍රධාන ක්‍රියාවය, "පිණ්ඩපාතො" යන කර්‍ම්මය මේ ප්‍රධාන අප්‍රධාන ක්‍රියාවයම සමග සම්බන්ධ වනහෙයින් වුත්ත බව හා අනුක්ත බවද ඇත්තේ නමුදු ප්‍රධාන ක්‍රියාව බලවත් හෙයින් ඊට යෝග්‍යලෙස ප්‍රථමා විභක්තිම යොදන ලදැයිද දතයුතුයි.

මෙසේම "බ්‍රාහ්මණෙන ඔදනො පචිත්වා භුජ්ජතෙ භුත්තො වා" මෙහිද "ඔදනො" යන එකම කර්‍ම්මය "පචිත්වා" ය "භුජ්ජතෙ භුත්තො" ය යන අප්‍රධානවූද ප්‍රධානවූද ක්‍රියාවන් හා සම්බන්ධවන හෙයින් වුක්ත බව හා අනුක්ත බවද ඇත්තේ නමුදු ප්‍රධාන ක්‍රියා බලයෙන් ප්‍රථමා විභක්තියෙන්ම යොදනු ලැබේ—"භුජ්ජතෙ භුත්තො" යන ක්‍රියාවලට විශෙෂණහෙයින් අප්‍රධානවූ "පචිත්වා" යන ක්‍රියාවහා සම්බන්ධය නිසා අනුක්තවූයේ නමුදු විතීයාවිභක්තියෙන් නොයොදනු ලැබේ—මෙහි "පචිත්වා" යනු විශෙෂණය, කුමක් හෙයකින්ද? යත්—වෙන් කරන්නේ විශෙෂණ නම් වේ—වෙන් කරණු ලබන්නේ විශෙෂ්‍ය නම් වේ—මෙහි වෙන් කිරීම නම් "භුජ්ජතෙ, භුත්තො" යන භෝජනක්‍රියා තොමෝ භික්ෂාදි ක්‍රියාවන්ට සාධාරණය-(සිඟාද මිලදී ගෙණද භෝජන ක්‍රියාව කරණ්ට හැකි හෙයිනි) එසේ සාධාරණවූ භෝජනක්‍රියා තොමො "පචිත්වා" යන පාකක්‍රියාව විසින් භික්ෂාදි ක්‍රියාවන් කෙරෙන් වෙන් කරණ ලදහෙයින් "පචිත්වා" යන පාකක්‍රියා තොමො "භුජ්ජතෙ, භුත්තො" යන භෝජන ක්‍රියාවට විශෙෂණ යයි දතයුතුයි.

තවද පිසීම කොට, දීමය ගැණීමය යනාදි වෙන යමක් කරන්ටත් හැකිහෙයින් ඒ දීම් ආදි ක්‍රියාවන්ට සාධාරණවූ "පචිත්වා" යන පාකක්‍රියා තොමෝ "භුජ්ජතෙ" නොහොත් "භුත්තො" යන භෝජන ක්‍රියාව විසින් ඒ දානාදි ක්‍රියාවලින් වෙන්කරණු ලබන

හෙයින් "පචිත්වා යන පාකක්‍රියා තොමෙ විශෙෂ්‍යවන්නීත් නො විද යත්?-විය හැකිය-එසේ නමුදු "පචිත්වා" යන පාකක්‍රියා තොමෙ (ත්වාප්‍රත්‍යයාන්ත බැවින්) අප්‍රධානයි-ත්වා ප්‍රත්‍යයාන්ත ක්‍රියාපදයෝ කිසි අපර ක්‍රියාවක් අපේක්ෂාකරණහෙයින් අප්‍රධානයයි දත යුතුයි.

තවද උක්තකර්මයක ක්‍රමයක්.

යාමය දැනීමය අනුභවකිරීමය ශබ්දය යන අර්ථ ඇති ධාතු වලින්ද, හර (හරණ) කර (කරණ) යන ධාතු දෙකින්ද, අකර්මක ධාතුවලින්ද (කාරිතප්‍රත්‍යයක් නොවී) සෑදුනාවූ ක්‍රියාපද වලට කර්තෘව සිටියාවූ යමෙක් ඇත්තේද ඔහු එම ධාතුවලින් කාරිතප්‍රත්‍යය වීමෙන් සෑදුනාවූ ක්‍රියා පදයන්ගේ උක්තකර්මය වන්නේ යයි දත යුතුයි.

එම කීහ.

"ගති බොධාහාර සද්දත්ථ හර කර කම්මකානං,
කත්තා අකාරිතෙ යො තං වුත්තකම්මං හි කාරිතෙ."

ඊට උදාහරණ මෙසේය—(1.) "දාසො ගාමං ගච්ඡති."
(2.) "සාමිනා දාසො ගාමං ගච්ඡාපීයතෙ."

මෙහි "දාසො" යනු ගමනාර්ථවාචී ධාතුවෙන් කාරිතප්‍රත්‍යයක් නොවී සෑදුනාවූ "ගච්ඡති" යන ක්‍රියාපදයට කර්තෘයි—එම කර්තෘ තෙම යථොක්ත ධාතුවෙන් කාරිතප්‍රත්‍යය වී සෑදුනාවූ "ගච්ඡාපියතෙ" යන ක්‍රියා පදයාගේ උක්ත කර්මය වූ බව දෙවෙනි උදාහරණයෙන් දතයුතුයි.

තවද උක්ත කර්තෘ ක්‍රමයක්.

එකම ක්‍රියාවට නොයෙක් කර්තෘහු වූකල්හි එයින් *ප්‍රධාන කර්තෘ උක්ත වන්නේය-ඒ මෙසේය-"ආචරියො අන්තෙවාසිකෙන ධම්මං දෙසයති" යන මෙහි දෙශනා ක්‍රියාව කරන්නාවූ අතවැස්සා ආචාර්‍ය්‍යයා විසින් ඒ ක්‍රියාවෙහි යොදන ලදහෙයින් "ආචරියො" යනු ප්‍රධානය එහෙයින් ඒ කර්තෘ ප්‍රථමා විභක්තියෙන් යොදන ලදී—"අන්තෙවාසිකෙන" යනු ආචාර්‍ය්‍යයා විසින් යොදන ලදුව ක්‍රියාව කරණහෙයින් එසේ ප්‍රධාන නොවේ—එහෙයින් අනුක්ත කර්තෘ බැවින් තෘතීයා විභක්තිය යොදන ලදී.

---

* ප්‍රධාන කර්තෘනම් ක්‍රියාව කරන්නහු එහි යොදවන තැනැත්තාය, ඔහු ක්‍රියාව කරණ කර්තෘව වඩා උත්සාහවත් හෙයිනි.

එම කීහ.

"වුත්තකත්තාති සො ඤෙය්‍යො යො මුඛ්‍යො නෙකකත්තුසු,
උස්සාහවන්තා මුඛ්‍යො සො යො කත්තාරං පයොජයෙ."

ක්‍රියාව කරන්නහු ඒ ක්‍රියාවෙහි යොදන්නා හේතුකර්තෘතෙම තවත් යමෙක් විසින් යොදන ලද්දේ වේද එකල්හි ඔහු යථොක්ත හේතුකර්තෘටත් වඩා උත්සාහවත් හෙයින් උක්ත කර්තෘ නම් වන්නේය.

එහෙයින් කීහ.

"පයොජකම්පි යො අඤ්ඤො යදා පන පයොජයෙ,
වුත්තකත්තා තදා එසො තස්මා ප්‍යුස්සාහවන්තතො."

ඊට උදාහරණ මෙසේය—"අමච්චො සූදජෙට්ඨෙන ඔදනං පාචෙති" මෙහි සූදයා ලවා ක්‍රියාව කරවන්නාවූ සූදශ්‍රේෂ්ඨයා අමාත්‍යයා විසින් යොදනලද හෙයින් අමාත්‍යතෙම සූදශ්‍රේෂ්ඨයාටත් වඩා උත්සාහවත්ය—එහෙයින් "අමච්චො" යනු උක්තකර්තෘය, එහෙයින් ප්‍රථමා විභක්තියෙන් යොදන ලදී—"සූදජෙට්ඨෙන, සූදෙන" යනු අනුක්ත හෙයින් තෘතීයා විභක්තියෙන් යොදන ලද්දාහුයයි දත යුතුයි.

ආඛ්‍යාතයා විසින් අනුක්ත කර්මාදිය.

ආඛ්‍යාතයාවිසින් අනුක්ත කර්ම...1 { සූදො ඔදනං පචති-
බුද්ධො ධම්මං දෙසෙති.

ආඛ්‍යාතයාවිසින් අනුක්ත කර්තෘ...2 { සූදෙන ඔදනො පච්චතෙ-
බුද්ධෙන ධම්මො දෙසීයතෙ.

(1.) "සූදො ඔදනං පචති" යන උදාහරණයෙහි "පචති" යන කර්තෘකාරක ආඛ්‍යාත ක්‍රියා පදයා විසින් කර්තෘ මිස කර්මය නොකියන ලදහෙයින් (අනුක්තහෙයින්) "ඔදනං" යනු ආඛ්‍යාතයා විසින් අනුක්තකර්මයයි—"බුද්ධො ධම්මං දෙසෙති" යන්නෙහිද එසේමය—ඒ අනුක්ත කර්මයෙහි යෙදිය යුතු විභක්තිය ද්විතීයාව බව "අනුක්තෙ කර්මණි ද්විතීයා ස්‍යාත්" යනාදි පාණිනි සූත්‍රාදියෙන් දත යුතුයි.

(2.) "සූදෙන ඔදනො පච්චතෙ"—යන උදාහරණයෙහි "පච්චතෙ" යන ආඛ්‍යාත කර්මකාරක ක්‍රියා පදයාගේ "තෙ" විභක්ත්‍යාදිය කර්තෘයෙහි නොකරණ ලද බැවින් ඒ ආඛ්‍යාත පදයා විසින් කර්තෘ අනුක්තහෙයින් "සූදෙන" යනු ආඛ්‍යාතයාවිසින්

අනුක්ත කර්මනම් වේ—"බුද්ධෙන ධම්මො දෙසීයතෙ" යන්නෙහිද එසේමය—ඒ අනුක්ත කර්තෘ පදයෙහි යෙදිය යුතු විභක්තිය තෘතීයාව බව "අනභිහිතෙ කත්තරි කරණෙ ච තෘතීයා" යනාදි ආචාර්ය්‍ය වචනවලින් දතයුතුයි.

තවද ප්‍රධානවූ හා අප්‍රධානවූද ක්‍රියා පද දෙකක් සමග සම්බන්ධ වීමෙන් එකම කර්තෘගේ අනුක්තබව හා උක්ත බවද ඇතිකල්හි ඒකර්තෘ පදයෙහි ප්‍රථමා විභක්තිය නොව තෘතීයා විභක්තියම යෙදිය යුතුයි.

එම කීහ.

"යස්ස පප්පධානප්පධාන ක්‍රියා සම්බන්ධතො සියුං,
අනුත්තවුත්තතා තත්ථ තතියා හොති නාපරා."

ඊට උදාහරණ—"බ්‍රාහ්මණෙන හුත්වා සුප්‍යතෙ"—යන මෙහි "බ්‍රාහ්මණෙන" යන කර්තෘ තෙම "හුත්වා" යන අප්‍රධාන ක්‍රියාව සමනද "සුප්‍යතෙ" යන ප්‍රධාන ක්‍රියාව සමගද සම්බන්ධවන හෙයින් "සුප්‍යතෙ" යන කර්මකාරක ආඛ්‍යාත ප්‍රධාන ක්‍රියාපදයා විසින් ඒ කර්තෘ අනුක්තය, "හුත්වා" යන කර්තෘකාරක අප්‍රධාන ක්‍රියාපදයා විසින් කර්තෘ උක්තය, එසේ නමුදු ප්‍රධානවූ "සුප්‍යතෙ" යන ක්‍රියාපදය හා සම්බන්ධය සලකා තෘතීයා විභක්තිය යොදන ලදැයි දත යුතුයි.

කිතකයා විසින් උක්ත කර්මාදිය.

කිතකයා විසින් උක්ත කර්ම.......1 { බුද්ධෙන ධම්මො දෙසිතො- ස්වාක්ඛාතො භගවතා ධම්මො.
කිතකයා විසින් උක්ත කර්තෘ... ..2. පුඤ්ඤකාරො පුමා-විනයධරො භික්ඛු
කිතකයා විසින් උක්ත කරණය ..5. පහරණං ආවුධං.
කිතකයා විසින් උක්ත සම්ප්‍රදානය.4. සම්පදානං, බුද්ධො-පූජනීයො බුද්ධො.
කිතකයාවිසින් උක්ත අපාදානය.. 5. භීමො රක්ඛසො.
කිතකයා විසින් සාමි...............උක්තවීමක් නැත්තේය.
කිතකයා විසින් උක්ත ආධාරය ..7. ආසනං, පීඨං.

(1.) "බුද්ධෙන ධම්මො දෙසිතො" යන මෙහි "දෙසිතො" යන කිතක ක්‍රියා පදයෙහි වූ "ත" ප්‍රත්‍යය කර්මාර්ථයෙහි කරණලද්දක් බැවින් ඒ තප්‍රත්‍යයාන්ත කිතක ක්‍රියා පදයා විසින් කියනු ලබන්නේ කර්මයක්ය—ඒ නම් "ධම්මො" යනුයි-එහෙයින් ධම්මො

යනු දෙසිතො යන කිතකයා විසින් උක්තවූ කර්ම්මයයි දත යුතුයි. "ස්වාක්ඛාතො භගවතා ධම්මො" යන්නෙහිද මෙසේමය.

(2.) "පුඤ්ඤකාරො" යනු පුඤ්ඤං කරොතීති වාක්‍ය ගෙණ කර්තෘ අර්ථයෙහි විග්‍රහ කටයුතු බැවින් ඒ පුඤ්ඤකාරො යන පදය කර්තෘකාරක කිතක ප්‍රත්‍යයාන්ත පදයක්ය—එහෙයින් ඒ පදයා විසින් උක්තකරණු ලබන්නේ කර්තෘකොණෙතුන්ද ඒනම් "පුමා" යනුයි එබැවින් "පුමං" යනු පුඤ්ඤකාරො යන කිතකයා විසින් උක්තවූ කර්තෘයි.

(3.) පහරන්ති යෙන යන වාක්‍යයෙහි කරණාර්ථයෙහි (ප පූර්වවූ හර හරණෙ යනධාතුවෙන් පරව) කෘදන්ත යුප්‍රත්‍යය වූ හෙයින් ඒ යුප්‍රත්‍යයාන්ත "පහරණං" යන කෘදන්ත පදයාවිසින් කරණය උක්තනුයි "අයුධං" යනු කිතකයාවිසින් උක්ත කරණයයි.

(4.) "සම්පදානං" යනු (සං ප පූර්වවූ දා දානෙ යන්නාගු කොරෙන්) යස්ස සම්මා පදීයතෙ යන වාක්‍යයෙහි සම්ප්‍රදානාර්ථයෙහි කෘදන්ත යුප්‍රත්‍යය වන ලද පදයක් හෙයින් ඒ කෘදන්තපදයා විසින් සම්ප්‍රදානය උක්තනුයි "බුද්ධො" යනු "සම්පදානං" යන කෘදන්තයා විසින් උක්තවූ සම්ප්‍රදානයයි.

(5.) "භීමො" භායන්ති එතස්මා යන වාක්‍යයෙහි අපාදානාර්ථයෙහි (භී යන ධාතුවෙන් පරව) කෘදන්ත මප්‍රත්‍යයව සිද්ධවූ බැවින් "රක්ඛසො" යනු ඒ කෘදන්ත පදයාවියින් උක්තවූ අපාදානයයි දතයුතුයි.

(7.) "ආසනං" යනු යස්මිං ආසන්ති යන වාක්‍යයෙහි ආධාරාර්ථයෙහි (ආස උපවෙසනෙ යන ධාතුවෙන් පරව) කෘදන්ත යුප්‍රත්‍යයව සිද්ධවූ කෘදන්ත පදයක් බැවින් "පීඨං" යනු ඒ කෘදන්තයා විසින් උක්තවූ ආධාරයයි දතයුතුයි.

කිතකයාවිසින් අනුක්තකර්ම්මාදිය.

කිතකයා විසින් අනුක්ත කර්ම්මය.........1 { බුද්ධො ධම්මං දෙසිතවා- සඞ්ඝො පුඤ්ඤං කතවා,

කිතකයා විසින් අනුක්තකර්තෘ............2. { පුඤ්ඤං කාරෙන්ති පුරිසො- විනයං ධරන්ති භික්ඛූ.

කිතකයා විසින් අනුක්ත කරණය.........3. පහරන්ති යෙන ආවුධෙන.

කිතකයාවිසින් අනුක්ත සම්ප්‍රදානය......4. සම්මාපදීයතෙ යස්ස බුද්ධස්ස.

කිතකයාවිසින් අනුක්තාපාදානය.........5. භායන්ති එතස්මා රක්ඛසා.

" " " "

කිතකයාවිසින් අනුක්තාධාරය............7. ආසනෙ අස්මිං නිසීදන්ති භික්ඛූ.

(1.) "බුද්ධො ධම්මං දෙසිතවා" යන්නෙහි "දෙසිතවා" යන කෘදන්ත ක්‍රියාපදයෙහි "තවන්තු" ප්‍රත්‍යය කර්මාර්ථයෙහි අවිහිත බැවින් ඒ තවන්තු ප්‍රත්‍යයාන්ත කිතකයා විසින් කර්මය අනුක්ත නුයි "ධම්මං" යනු කිතකයා විසින් අනුක්ත කර්මනම් වේ. "සඞ්ඝො පුඤ්ඤං කතවා" යන්නෙහිද මෙසේමයි.

2.) "පුඤ්ඤං කරෙති" යන වාක්‍යයෙහි (කර කරණෙ යන ධාතුවෙන් පරව) කර්තෘ අර්ථයෙහි කිතක ණප්‍රත්‍යය නුවූ හෙයින් "පුරිසො" යනු කිතකයා විසින් අනුක්තකර්තෘනම් වේ—"විනයං ධරති භික්ඛු" යන්නෙහිද මෙසේමයි.

(3.) "පහරති යෙන" යන වාක්‍යයෙහි කරණාර්ථයෙහි (පපූර්වවූ හර හරණෙ යන ධාතුවෙන් පරව) කෘදන්ත යුප්‍රත්‍යය නුවූහෙයින් කෘදන්තයාවිසින් කරණය අනුක්තනුයි "ආවුධෙන" යනු අනුක්ත කරණනම් වේ.

(4.) "යස්ස සම්මාපදීයතෙ" යන වාක්‍යයෙහි සම්ප්‍රදානාර්ථයෙහි (සං ප පූර්වවූ ද දානෙ යන ධාතුවෙන් පරව) කෘදන්ත යුප්‍රත්‍යය නුවූ හෙයින් "බුද්ධස්ස" යනු කෘදන්තයා විසින් අනුක්ත සම්ප්‍රදාන නම් වේ.

(5.) "භායන්ති එතස්මා" යන වාක්‍යයෙහි අපාදානාර්ථයෙහි (භී භයෙ යන ධාතුවෙන් පරව) කෘදන්ත මප්‍රත්‍යය නුවූ හෙයින් "රක්ඛසා" යනු කිතකයා විසින් අනුක්තාපාදාන නම් වේ.

(7.) "යස්මිං නිසීදන්ති" යන වාක්‍යයෙහි ආධාරාර්ථයෙහි (නිපූර්වවූ සද යන ධාතුවෙන් පරව) කිතක යුප්‍රත්‍යය නුවූ හෙයින් "ආසනෙ" යනු කිතකයා විසින් අනුක්තාධාරනම් වන්නේයයි දතයුතුයි.

සමාස තද්ධිත කිතකාදීන් විසින් උක්තානුක්ත කර්ම කර්තෘ ආදිය මේ කීවාවූ උදාහරණාදියෙන් දත යුතුයි.

තවද ක්‍රමයක්.

(1.) කිතකාදීන් විසින් උක්තවන ලද්දම ආඛ්‍යාතයා විසිනුදු උක්ත වන බවද, (2.) කිතකාදීන් විසින් උක්තවනලද්ද ආඛ්‍යාතයා විසින් අනුක්ත වන බවද, (3.) කිතකයා විසින්අනුක්ත වන ලද්ද ආඛ්‍යාතයාවිසින් උක්තවන බවද, (4.) ආඛ්‍යාතයාවිසින් උක්ත වනලද්ද ආඛ්‍යාතයා විසින්ම උක්තවන බවද, (5.) එසේම ආඛ්‍යාතයා විසින් අනුක්තවනලද්ද ආඛ්‍යාතයා විසින්ම අනුක්තවන බවද දත යුතුයි.

එම තීහ—ජංඝදාසයෙහි.

"වුත්තමෙ වුත්තත්තං යාති කච්චිදුත්ත මනුත්තතං,
සියා නුත්ත මනුත්ත ච කචි පදන්තරෙහි තු."

උදාහරණ.

(1.) වාචකො ජනො ගච්ඡති-කතපපණාමො ජනො ගච්ඡති-වෙය්‍යාකරණිකො ජනො ගච්ඡති.
(2.) ධම්මදෙසකං බුද්ධං අභිවන්දති ජනො-කතප්පණාමං ජනං ධම්මං පුච්ඡති-අභිධම්මිකං පඤ්ඤහං පුච්ඡති.
(3) ධම්මො දෙසෙත්වා ඤාපීයතෙ-ඔදනො පචිත්වා භක්ඛීයතෙ.
(4.) නච්චති ගායති නටො-පච්චවෙක්ඛති දෙසති භික්ඛු.
(5.) පච්චතෙ භිසාඛීයතෙ ඔදනො-සාවීයතෙ දීයතෙ කම්බලො.

එසේම ප්‍රබෝධචන්ද්‍රිකාවෙහිද උදාහරණ සහිතව.

"උක්තමෙවොක්තතාං යාති ක්වචිදුක්ත මනුක්තතාං,
අනුක්තමපි චොක්තං ස්‍යාත් ක්වචිදෙව පදාන්තරෛඃ.
ඔදනඃ පච්‍යතෙ දෘෂ්ටඃ මයා සත්පුරුෂො ප්‍යයං,
ආරූඪ වානරො වෘක්ෂඃ ඡිද්‍යතෙ දෘෂ්‍යතෙ පිච.
පඨොයං ශිතිකො භාති රාමෙණ පරි බීයතෙ,
කෘදාදිභි යදීදෙවොක්තං තාද්‍යෛරපි තදෙව හි.
නෘත්‍යන්තං ච නටං රාමඃ විලොකයති කෞතුකී,
ඡාත්‍රං ච වෛයාකරණං ශබ්දාන් පෘච්ඡති ලක්ෂ්මණඃ.
ආරූඪ වානරං වෘක්ෂං රාමඃ පශ්‍යති සාදරං,
කෘදාද්‍යෛනොක්ත මෙවෛතත් අනුක්තං තාද්දිනා භවෙත්.
නෘත්‍යතෙ ගීයතෙ රංගෙ නටෙන සඛීයතෙ ක්වචිත්,
භොක්තුං පචති රාමොය මොදනං ක්ෂුද්වශං ගතඃ.
රාමභක්ත සසමාජීය්‍ය රාමං පූජයති ස්වයං,
ඉත්‍යාද්‍යනුක්තමෙව ස්‍යාත් අනුක්තමිති බුධ්‍යතාං," යි
දක්වන ලදී.

"මේ කාරණයම මීට මඳක් වෙනස් ලෙස විස්තාර සහිතව කච්චායනසාර ටීකාවෙහි දක්වන ලදී—ඒනම්-ආඛ්‍යාතයා විසින් උක්තවූ කර්ත්‍රාදිය එම ආඛ්‍යාතයා විසින්ම උක්තවන බවද—කිතකයා විසින් උක්තවූ කර්ත්‍රාදිය කිතකයා විසින්ම උක්තවන බවද—සමාසයා විසින් උක්තවූ කර්ත්‍රාදිය සමාසයා විසින්ම උක්තවන

බවද—තද්ධිතයාවිසින් උක්තවූ කර්ත්‍රාදිය තද්ධිතයං විසින්ම උක්ත වන බවද—කිතකාදීන්විසින් උක්තවූවාහු ආඛ්‍යාතයාවිසින් උක්ත වන බවද—කිතකාදීන් විසින් උක්තවූවාහු ආඛ්‍යාතයා විසින් අනුක්තවන බවද—යනාදියයි.

"නච්චති ගායති නටො, පච්චවෙක්ඛීයතෙ දෙසීයතෙ ධම්මො—පාචකො භුඤ්ජකො දෙවදත්තො, පූජිතො මානිතො බුද්ධො—ආගතසමණො සංඝවිභූසිතො විහාරෙ—වෙය්‍යාකරණිකො භික්ඛු අභිධම්මිකො, වාසිඨො ජනො නාවිකො"—යනාදි උදාහරණයි.

සමාසාදීන්විසින් කොතෙක් කොතෙක් කාරකයන්
උක්තවන ලද්දාහුද යත්.?

බාලාවතාරයෙහි හා නිරුත්තිසංග්‍රහයෙහි-එම කීහු.

"සමාසො හොති සබ්බත්ථ කිතකො සාමිවජ්ජිතෙ,
තද්ධිතො ලබ්භතෙ භිය්‍යො කරණාදිවජ්ජිතෙ.

ආඛ්‍යාතං කත්තුකම්මෙසු කරණාදීනනාබ්භාසිතෙ,
සං සං වාක්‍ය මුදාහාරෙ ඉති තානාක්‍ය නුදාහටා.

කත්තුකම්මනි ආඛ්‍යාතං තද්ධිතං වධිවජ්ජිතෙ,
සාමිවජ්ජෙ කිතාසමාසො ඛිලෙ ජාති විසෙසකෙ."

යනු බැවින් සමාසයා විසින් සාමිවජ්ජිය සහිතවූ සියළු ෂට්කාරකයන් උක්තවන ලද්දාහුය—කිතකයාවිසින් සාමිවජ්ජිය වර්ජිත සියළු කාරකයන් උක්තවන ලද්දාහුය—තද්ධිතයා විසින් කරණ අවධි වර්ජිතවූ කර්මකාරකාදිය උක්තවන ලද්දේය—ආඛ්‍යාතයා විසින් කර්තෘකර්ම යන කාරකද්වය උක්තවන ලද්දේයයි දතයුතුයි.

විශෙෂණ විශෙෂ්‍ය විභාග.

ATTRIBUTES AND NOUNS QUALIFIED BY THEM.

විශෙෂණ විශෙෂ්‍ය නම් කිමයත්?—ව්‍යවච්ඡෙදය (භේදය) කරන්නේ විශෙෂණ නම් වේ—ව්‍යවච්ඡෙදය (භේද්‍ය) කරණු ලබන්නේ විශෙෂ්‍ය නම් වේ—ඒ විශෙෂණ විශෙෂ්‍ය දෙක සමානාර්ථනම් විශෙෂණයා විශෙෂ්‍යයාගේ ලිඞ්ග විභක්ත්‍යාදිය බෙහෙවින් ග්‍රහණය කෙරේ.

එම කීහු—ප්‍රබොධචන්ද්‍රිකායෙහි හා කච්චායන සාරයෙහි.

"ව්‍යවච්ඡෙද්‍යං විශෙෂ්‍යං ස්‍යා ද්ව්‍යවච්ඡෙදක මත්‍ර තු,
තද්විශෙෂණ මාඛ්‍යාතං රාමො දශරථිර් යථා."

* "භෙදෙ විසෙසනං භෙද්‍යං විසෙස්‍යං තං වයං යදි,
තුල්‍යත්ථං භෙදකං භියො භෙද්‍යලිඞ්ගාදි ගාහකං."

සම්බන්ධචින්තායෙහි "විසෙසෙති බ්‍යවච්ඡින්දති කුතොචි කිඤ්චි අනෙනාති විසෙසනං-වුත්තලක්ඛණෙන විසෙසනෙන විසෙසීයති අඤ්ඤතො බ්‍යවච්ඡිජ්ජතීති විසෙස්‍යං"යි කියනලදහෙයින් (ධවලො ගො යනාදියෙහි ධවලො යන) මේ විශෙෂණයා කරණකොට ගෙණ රක්තාදීවූ කිසිවක් කොරෙන් ගවාදීවූ කිසිවක් වෙන්කෙරේ

---

* භෙදයතෙම විශෙෂණය—භෙද්‍යය විශෙෂ්‍යයයි-ඉදින් ඒ විශෙෂණ විශෙෂ්‍ය දෙක තුල්‍යාධිකරණ වීනම් (බෙහෙවින්) විශෙෂ්‍යයාගේ ලිඞ්ග සංඛ්‍යා විභක්තීන් විශෙෂණයා ග්‍රහණය කරන්නේය යනු ගාථාවෙහි අර්ථයි.

එම කීහ ජංඝදාසයෙහිද—"විසෙස්‍යෙන සහෙකත්ථං භවෙ යත්‍ර විසෙසනං,
තත්‍ර ලිඞ්ගාදිකො පායො විසෙස්‍යාධා විසෙසනෙ,"

"තත්ථ භෙදෙති අනිච්ඡිතත්ථතො ඉච්ඡිතත්ථස්ස භෙදකො බ්‍යවච්ඡෙදකො විසෙසනං නාම—වුත්තඤ්ච–'ගුණො විසෙසනං භෙදෙ විසෙසො අනුවාදකො,
අප්පධාන මුපායො ච සකත්ථොති චිමෙ සමා.'

විසෙස්‍යං යථා වුත්තනයෙන විසෙසනෙන බ්‍යවච්ඡෙජ්ජං. විසෙසිතබ්බවත්ථු භෙද්‍යං භොදිතබ්බං නාම—වුත්තඤ්ච.

"ගුණී විසෙසිතබ්බඤ්ච භෙද්‍යං සාමඤ්ඤ විධිනො,
පධානඤ්ච උපායො ච දබ්බං ඤෙය්‍යා සමානකො."

තං වයං යදි තුල්‍යත්ථං එකත්ථං භවති එවං සති භෙදකං භියො යෙභුය්‍යෙන භෙද්‍යලිඞ්ගාදි ගාහකං විසෙස්‍යස්ස පුම්භත්තාදි පඨමාදීනො ගාහකන්ති සම්බන්ධො."
යනු ටීකායි.

ණුයි ව්‍යවච්ඡෙදය කෙරේණුයි විශෙෂණ නම් වේ—සංයෝක්ත ලක්ෂණ ඇති විශෙෂණයාවිසින් අන්‍යයන්කෙරෙන් වෙන් කරණු ලැබේනුයි පිරිසිඳිනු ලැබේනුයි විශෙෂ්‍ය නම් වේ.

මොග්ගල්ලායන පඤ්චිකාවෙහි—“ යං සාමඤ්ඤාකාරෙන පවත්තං “ මනෙකප්පකාරවන්තං වත්ථුං පකාරන්තරෙහි අවච්ඡිජ්ජ ව්‍යාව “ත්තෙත්වා එකස්මිං පකාරෙ අවත්ථාපයති තං වුච්චති විසෙසනං-යද “ නෙකප්පකාරවන්තං වත්ථුං පකාරන්තරෙහි අවච්ඡිජ්ජ එකස්මිං “ පකාරෙ අවත්ථාපීයති තං තබ්බිධියන්තො විසෙස්සං”—යනුබැවින් (නීලුප්පලං * යනාදියෙහි) යම් නීලාදියෙක්තෙම සාමාන්‍යාකාරයෙන් පැවැත්තාවූ අනේකප්‍රකාරවත් වූ (උත්පලාදි) වස්තුව අන්‍යප්‍රකාරවලින් වෙන් කොට පිරිසිඳ වෙසෙසා (නීලාදීන් අතුරෙන්) එක්තරා ප්‍රකාරයෙක්හි පිහිටුවාද ඒ විශෙෂණයයි කියනු ලැබේ—(නීලාදි) අනේප්‍රකාරවත්වූ යම් (උත්පලාදි) වස්තුවෙක් (ශ්වේතාදි) ප්‍රකාරාන්තරයෙන් සම්බන්ධ දූරීකරණය කොට එක් (නීලාදි) ප්‍රකාරයෙක්හි පිහිටුවනු ලැබේද ඒ අවච්ඡෙද්‍යය විශෙෂ්‍ය යයි කියනු ලැබේ.

සම්බන්ධචින්තාටීකාවෙහි “ යතො යතො විසෙසාධිගමො හොති තං තදෙව විසෙසනං” යනු කීබැවින් යමක් යමක් හේතුකොට ගෙණ විශෙෂ්‍ය අවබෝධ වේද ඒ ඒ විශෙෂණ නම් වේ—“ නීලුප්පලං” යන්නෙහි නීලගුණය හේතුකොට ගෙණ නීලෝත්පලයාගේ රක්තෝත්පලාදියට වඩා ඇති විශෙෂය අවබෝධවන හෙයින් නීලගුණය විශෙෂණ නම් වේ—තවද බලාවතාරයෙහිද විශෙෂණ ලක්ෂණ දක්වනු පිණිස

“ යස්මා හි යබ්භෙද බුද්ධි හොති තං තබ්බිසෙසනං,
තං ච ජාති ගුණ ක්‍රියා දබ්බං නාමනානෙකධා.”

යනු කීබැවින් යමක් හේතුකොටගෙණ යමකුගේ වෙනසෙහි බුද්ධිය වේද ඒ හේතුවූ දෙය ඒ වෙනස ඇති දෙයට විශෙෂණ වේ, ඒ විශෙෂණයද ජාතිය ගුණය ක්‍රියාය ද්‍රව්‍යය නාමයයි කියා නො නොයෙක් ප්‍රකාර වේත්—ඒ මෙසේය “ ධවලො ගො” කී කල්හි “ ධවලො” යන ගුණය හේතුකොට ගෙණ “ ගො” පදාර්ථයාගේ

---

* “ අත්‍ර හි නීලසද්දො රත්තාදීහි අවච්ඡිජ්ජ උප්පලසද්දං නීල අවත්ථාපෙති, උප්පලසද්දොපි නීලසද්දං භමරාදීහි අවච්ඡිජ්ජ උප්පලෙ අවත්ථාපෙති තස්මා වොහාරයස්ස විසෙසන විසෙස්සභාව සම්භවො”—යනුද කච්චායනසාර ටීකායි.

නීල රක්තාදී ගො පදාර්ථයන් කෙරෙන් වෙනසෙහි බුද්ධිය උපදනා හෙයින් ඒ බුද්ධිය ඉපදීමට හේතුවූ "ධවලො" යන ගුණය ඒ වෙනස ඇති වස්තුව වූ ගො ශබ්දයට විශෙෂණ වූයේයයි දත යුතුයි.

* "කාමතො ගම්‍යතෙ තත්‍ථ විසෙසන විසෙස්සතා" යනු බැවින් අන්‍යොන්‍ය සාපෙක්ෂා සංඛ්‍යාත සම්බන්ධයට පැමිණියාවූ ඒ පදයන් අතුරෙන් මෙයම විශෙෂණය මෙයම විශෙෂ්‍ය යයි කියා නියමයක් නැත්හෙයින් ඒ විශෙෂණ විශෙෂ්‍ය භාවය කැමති පරිද්දෙන් (වක්තෘ විවක්ෂාවශයෙන්) හැගෙන්නේය (දන්නා ලද්දේය.)

විශෙෂණ විශෙෂ්‍යභාවය කාමාචාරයෙන් හැගෙන බවට කරුණු දක්වන්නාවූ ගඬලාදෙනි සන්නකාර ආචාර්‍ය්‍යයන් විසින්ද මෙසේ කියන ලදී.

☞ "නීලුප්පලං" යන්නෙහි නීලය උප්පලය යන පදයො දෙදෙන
"උත්පලාඛ්‍ය එක ජලජ වස්තුයෙක්හි පවත්නාහයි ඔවුනොවුන්
"හා සම්බන්ධයන, මෙහි ශ්වෙත රක්තාදි ගුණයන්ට සාමාන්‍යවූ
"උත්පල ද්‍රව්‍යය ශ්වෙතාදීන් කෙරෙන් වෙන් කොට සිටිනා නීල
"ගුණය උත්පල ද්‍රව්‍යයට විශෙෂණ වෙයි, වැලිදු භෘංගාදි ද්‍රව්‍යයන්ට
"සාධාරණවූ නීල ගුණය ඒ භෘංගාදීන් කොරෙන් වෙන් කොට සිටී
"නුයි උත්පලයද නීල ගුණයට විශෙෂණ වේ, මෙසේ විශෙෂණ
"විශෙෂ්‍යභාවය විවක්ෂාහෙන් වෙයි දතයුතුයි"–යනුයි.

"පදත්‍ථො නිස්සයො යො සො ක්‍රියාදීහි යථාරහං,
විසෙස්සතෙ එවා තෙහි තෙනතනො නිස්සයෙහි පි."

යනු හෙයින් (ක්‍රියාගුණාදීන්ට) ආධාරවූ (ගවාශ්වාදි) යම් පදාර්ථයෙක් ඇත්තේද ඒ නිශ්‍රය පදාර්ථය තෙම ක්‍රියාදීන්විසින් සුදුසු පරිද්දෙන් වෙසෙසනු ලැබේ (හෙවත් ද්‍රව්‍යාදි නිශ්‍රය පදාර්ථයට ක්‍රියාදි පවත්‍යය විශෙෂණ වන්නේය) (න්‍යැවතද) නොහොත් තමන්ට නිශ්‍රය වූ (ගවාශ්වාදි) ඒ පදාර්ථයන්විසිනුදු ඒ ක්‍රියා ගුණාදීහු වෙසෙසනු ලැබෙත් (හෙවත් නිශ්‍රය පදාර්ථයන්ට ක්‍රියාදීහු විශෙෂණ වූවාක් මෙන්ම ඒ නිශ්‍රය පදාර්ථයෝද ක්‍රියා ගුණාදියට විශෙෂණ වන්නාහුය යනු භාවයි.)

---

* "යානි යානි පදානි චෙ වා තතො ධිකානි වා අඤ්ඤමඤ්ඤාපෙක්ඛතා සංඛාතං සම්බන්ධං සචෙ සමුපෙන්ති තෙසු සම්බන්ධමුපගතෙසු පදෙසු විසෙසන විසෙස්සතා කාමතො ඉදමෙව විසෙසනං විසෙස්සන්ති වා නියමා භාවා වත්තිච්ඡාවසතොව ගම්‍යතෙ ඤායතෙ–තමෙව කාමාචාරප්පවත්තිමාහ "පදත්‍ථොච්චාදිනා"—යනුද, "නිස්සයොති ච න කෙවලං දබ්බමෙව ගුණාදයොපි දබ්බා" යනුද සම්බන්ධ චින්තා ටීකායි.

ඒ මෙසේය—යම් කලෙක්හි "ගො ගච්ඡති" යි ගමන ක්‍රියා වෙන් විශිෂ්ටවූ, නිශ්‍රයභූත ගො පදාර්ථයෙක් කියනු ලැබේද එකල්හි ක්‍රියාව විශෙෂණය, ගො පදාර්ථය විශෙෂ්‍යයි-එසේම යම් කලෙක්හි "ජාතියා ගො" යි ජාතියෙන් විශිෂ්ටවූ ගො පදාර්ථය කියනු ලැබේද එකල්හි ජාතිය විශෙෂණයි—"ධවලො ගො" යි ගුණයෙන් විශිෂ්ටවූ ගො පදාර්ථය කියනු ලැබේද එකල ගුණය විශෙෂණයි—"විසාණී ගො" යි ද්‍රව්‍යයෙන් විශිෂ්ටවූ ගො පදාර්ථය කී කල ද්‍රව්‍යය විශෙෂණයි—"දෙවදත්තා ගො" යි නාමයෙන් විශිෂ්ටවූ ගො පදාර්ථය කී කල නාමය විශෙෂණයි—මේ සියළු ථාන්හිම විශෙෂ්‍යවූ ගො පිණ්ඩය ද්‍රව්‍යභාවයෙන් ගත යුතුයි.

ඒ විශෙෂණවූ ක්‍රියාදි පසම විශෙෂ්‍යද වන්නේ කෙසේද යත්?

"ගාවස්ස ගමනං" යි යම් කලෙක්හි ජාතියෙන් විශිෂ්ටවූ ක්‍රියාව කියනු ලැබේද එකල්හි ජාතිය විශෙෂණය ක්‍රියාව විශෙෂ්‍යයි—"ගාවස්ස ධවලො" යි යම් කලෙක්හි ජාතියෙන් විශිෂ්ටවූ ගුණය කියනු ලැබේද එකල්හි ජාතිය විශෙෂණය ගුණය විශෙෂ්‍යයි—මෙසේම "ගාවස්ස ජාති-ගාවස්ස සිඟං-ගාවිස්ස නාමං"—යි ජාතියෙන් විශිෂ්ට ජාතියද, ද්‍රව්‍යයද, නාමයද, කියනු ලැබෙද්ද එකල්හි ක්‍රමයෙන් ජාති ද්‍රව්‍ය නාම යන මොවුහු විශෙෂ්‍යද ජාතිය විශෙෂණද වන්නේයයි දතයුතුයි.

විශෙෂ්‍යයාගේ අර්ථය වෙනස් කරණහෙයින් පර්‍යාය සංඛ්‍යාත අභින්නාර්ථ ශබ්දයද විශෙෂණ නම් වන්නේය—ඒ මෙසේය ගො ශබ්දය තෙම පසු භූමි වාචාදි අනේකාර්ථ වාචී බැවින් "ගො" යයි කීකල කවරාර්ථයක්දැයි නොහැගෙන්නේය පර්‍යාය ශබ්දයක් වූ වාචා ශබ්දය යොදා "ගොවාචං" යි කීකල වාචා සංඛ්‍යාත අර්ථය හැගෙන්නේය—මෙහි ගො ශබ්දයට පර්‍යාය වූ වාචා ශබ්දයතෙම පසු ආදි අර්ථයන්ට සාධාරණවූ ගො ශබ්දයා ඒ අර්ථයන්ගෙන් වෙන් කොට වාචාර්ථයෙහි පිහිටුවන හෙයින් (හෙවත් විශිෂ්ටාර්ථ ව්‍යවස්ථාපකහෙයින්) විශෙෂණ නම් වන්නේයයි දතයුතුයි.

මෙම කීහ—සම්බන්ධචින්තායෙහි.

"නෙකත්ථ වුත්තියා ගොති වුත්තෙන වාචා න ඤායතෙ,
නොවාචාති තු වුත්තෙතස්මා පරියායො ච භෙදකො."

ටීකාවෙහි—"අත්ථස්ස විසෙසනත්තං වත්වා සද්දස්සාපි විසෙසනත්තං දස්සෙති නෙකත්ථෙච්චාදිනා, ගො සද්දස්ස ගවාදත්‍යනෙක "සබ්බත්ථෙසු වුත්තියා වත්තනතො, තථං හි ගොසද්දෙ පසු භූමි ආදි

“අඤ්ඤත්ථො හොති වුත්තො වාචාත්‍යය මත්ථො න ඤායතෙ හො
“වාචාති තු වුත්තෙන හෙං ඉති වාචන්තරං වාචාත්‍යන්තවිසෙසො
“ඤායතෙ යස්මා අස්මා අතො හෙතුතො පරියායො ච න කෙවලං
“ජාත්‍යාදයොව විසිට්ඨවිෂ්වඨොපකාතා හෙදකො විසෙසං”
යනුයි.

තුල්‍යාධිකරණ භින්නාධිකරණ විශෙෂණ ප්‍රභේද.

විශෙෂණය තෙම තුල්‍යාධිකරණ * භින්නාධිකරණ වශයෙන් ද්විප්‍රකාරයක් වන්නේය—එහි] තුල්‍යාධිකරණනම්, පදසාධනී ටීකා වෙහි “තුල්‍ය මෙක මධිකරණ මත්ථො යස්ස තං තුල්‍යාධිකරණං” යී තුල්‍යාධිකරණ ශබ්දයාගේ විග්‍රහ බැවින් සමානවූ අර්ථය යමක්හුගේද ඒ තුල්‍යාධිකරණ නම් වන්නේය.

තවද බාලාවතාරයෙහි “භින්නප්පවත්ති නිමිත්තා සද්දා එකස්මිං වත්ථුනි පවත්තා තුල්‍යාධිකරණා” යී දක්වන ලද හෙයින්, වෙන් වෙන්වූ ප්‍රවෘත්ති නිමිත්ත කොට ඇති ශබ්දයෝ එකවස්තුයෙහි පවත්නා ලද්දැහු නම් ඒ තුල්‍යාධිකරණයයි දත යුතුයි—සාමාන්‍ය වශයෙන් තුල්‍යාධිකරණ ලක්ෂණ මෙසේ නමුදු තුල්‍යාධිකරණ විශෙෂණයාගේ ලක්ෂණ දක්වන්නාවූ කච්චායනභෙදප්‍රදීප කාර කාචාර්‍යයීතෙම

“යස්ස කත්ථ විභත්තිත්තං එකසංඛ්‍යා ක්‍රියා පි ච,
සමාන ලිඞ්ගතා චෙව තුල්‍යාධිකරණං මතං.”—කියාද

නිරුත්තිසංග්‍රහයෙහි.

“තෙසු විභත්ති සංඛ්‍යාය ක්‍රියා ලිඞ්ගෙන තුල්‍යතා,
තුල්‍යෙ නීලො පවිඩාදි තබ්භිනාන මිතරං භවෙ.” යීද,

කීහෙයින් යම් විශෙෂණයක්තෙම විශෙෂ්‍යයා හා සමාන අර්ථ සමාන විභක්ති සමාන සංඛ්‍යා සමාන ක්‍රියා ඇත්තේ වේද ඒ තුල්‍යාධිකරණ විශෙෂණ නම් වේ—මෙහි විශෙෂ්‍යයා හා “සමානාර්ථ” නම් විශෙෂණ විශෙෂ්‍ය යන දෙකින්ම නීලොත්පලාදි එකම වස්තුවක් ප්‍රකාශ කරණ බවයි—සමාන විභක්තිනම් විශෙෂ්‍යයෙහි දක්නාලද විභක්තියම විශෙෂණයෙහිද විය යුතු බවයි—සමාන සංඛ්‍යානම් විශෙෂ්‍යයෙහි දක්නාලද ඒකවචනය හෝ බහු වචනය

---

* “අධිකරණ සද්දෙන අත්ථො අභිධෙය්‍යො වුච්චති” යනු පදසාධනී ටීකායි.

විශෙෂණයෙහිද විය යුතු බවයි—සමාන ක්‍රියානම් ඒ විශෙෂණ විශෙෂ්‍ය දෙකම එකම ක්‍රියාවක් හා සම්බන්ධ වනු මිස විශෙෂණය එක ක්‍රියාවක් සමගද විශෙෂ්‍යය අන්‍ය ක්‍රියාවක් සමගද සම්බන්ධ නොවන බවයි—මේ නියමය නිත්‍යවශයෙන් නොව බොහෝ සෙයින් බව බාලාවතාර කච්චායනභෙද පදීප ටීකාදියෙහි කියන ලද නමුත් ප්‍රබොධ චන්ද්‍රිකාදියෙහි නිත්‍යවශයෙන්ම කියන ලදී.

ප්‍රබොධචන්ද්‍රිකායෙහි.

“ විශෙෂ්‍යස්‍ය ච යල්ලිඟං විභක්ති වචනෙ ච යෙ,
තානි කාර්‍ය්‍යාණි යොජ්‍යානි විශෙෂණ පදෙෂ්වපි.”

තුල්‍යාධිකරණ විශෙෂණයට උදාහරණ.

“ තිලොකමහිතො නාථො ”—මෙහි “ තිලොකමහිතො ” යනු විශෙෂණය “ නාථො ” යනු විශෙෂ්‍යයි-මේ විශෙෂණ විශෙෂ්‍ය දෙකින්ම තුන්ලෝවාසීන් විසින් පුදනලද එකම ලොකස්වාමි වූ බුදුරජානන්වහන්සේ කියන ලද හෙයින් සමානාර්ථ නම් වේ—“ නාථො ” යන විශෙෂ්‍ය පදයෙහි දක්නා ලද පුල්ලිඟික ප්‍රථමා එක වචනය විශෙෂණවූ “ තිලොකමහිතො ” යන පදයෙහිද දක්නා ලදහෙයින් සමානලිඟ සමානවිභක්ති සමානසංඛ්‍යා ඇත්තේනම් වන්නේයයි දතයුතුයි--ඒ තුල්‍යාධිකරණ විශෙෂණයතෙම ආසයාසයී භාවාදි වශයෙන් ෂට්ප්‍රකාරයක් වේ—ඒනම්.

1. ආසයාසයීභාව තුල්‍යාධිකරණ විශෙෂණය.
2. තබ්භාව තුල්‍යාධිකරණ විශෙෂණය.
3. තබ්බිසෙසතා තුල්‍යාධිකරණ විශෙෂණය.
4. ධම්මකතා තුල්‍යාධිකරණ විශෙෂණය.
5. ආධාරෙකතා තුල්‍යාධිකරණ විශෙෂණය.
6. ඵලෙකතා තුල්‍යාධිකරණ විශෙෂණයයි—කියාය.

ධම්මකතා-ආධාරෙකතා-ඵලෙකතා තුල්‍යාධිකරණ විශෙෂණ තුනට පිළිවෙළින්, ගුණකතා-අධිකරණකතා-විපාකඵලකතා තුල්‍යාධිකරණ විශෙෂණයෝයයිද කියත්—එහි

1. “රත්තො පටො—සෙතො සුවො” යනු ආසයාසයීභාව තුල්‍යාධිකරණ විශෙෂණයට උදාහරණයි.
2 “බුද්ධො ජිනො-කරී හත්ථී” යනු තබ්භාව තුල්‍යාධිකරණ විශෙෂණයටය.

3. “නීලො වණ්ණෙන-අම්බො පාකෙන” යනු තබ්බිසෙසතා තුල්‍යාධිකරණ විශෙෂණයටය.

4. “අනිලො අසෙසො-සීහො නාරෙ” යනු ධම්මෙකතා තුල්‍යාධිකරණ විශෙෂණයටය.

5. “අනිලො ගරුකො-ලහුකො කටුකො” යනු ආධාරෙකතා තුල්‍යාධිකරණ විශෙෂණයටය.

6. “ගදහටං සුසංයුත්තං ඔසධං”-“දුයුත්තං විසං” යනු ඵලෙකතා තුල්‍යාධිකරණ විශෙෂණයටයි.

මේ විශෙෂණ ෂඩ්විධයෙහි ලක්ෂණාදිය දක්වන්නාවූ කාව්‍යාංගන භේද ප්‍රදීපකාලංකාරකාචාර්‍යයතෙම.

“ආසයාසයී භාවො ච තබ්භාවො තබ්බිසෙසතා,
ධම්මාධාරඵලානඤ්ච එකතා ති ඡබ්බිධං මතං”—යනුද

ටීකාවෙහි—“විසෙසනං ආසයති එත්ථාති ආසයො, දබ්බං—ආසයස්ස භාවො ආසයී, ගුණො—ආසයො යස්ස අත්ථීති වා ආසයී, තෙසං භාවො තබ්භාවො, පදත්ථො වාති තදත්ථො තෙසං දබ්බං විනා පදත්ථොති තබ්භාවො—තෙසං තබ්භාවාදීනං විසෙසස්ස භාවො තබ්බිසෙසතා—දබ්බං ධාරෙති පකාසෙතීති ධම්මො, ගුණො—ආධාරො ගුණං ධාරෙතීති ආධාරො, අධිකරණං—ඵලං පවත්තීති ඵලං, විපාකො—ධම්මො ගුණො ච ආධාරො අධිකරණං ච ඵලං විපාකො චාති ධම්මාධාරඵලා—තෙසං එකස්ස (සමානස්ස) භාවො එකතා—භණිතබ්බං ජානිතබ්බං මතං—එවං විසෙසනස්ස ඡ භෙදං දස්සෙත්වා තදුදාහරණං දස්සෙන්තො යමාචරියො.

‘රත්තො පටො සුවො සෙතො කරී හත්ථී බුධො ජිනො,
නීලො වණ්ණෙන අම්බො පාකෙන සීහො අනිලො’සෙසො නාරෙ.
අනිලො ගරුකො හොති ලහුකො කටුකො රසො,
ගදහටං සුසංයුත්තං ඔසධං දුයුත්තං විසං’—ති ආහ.

රත්තොති රත්තගුණයොගො, පටොති වත්ථං, සුවො සෙතොති ගාථාබන්ධවසෙන වුත්තො සෙතො සුවොති වුත්තං හොති, තත්ථ සෙතොති සුක්කගුණයුත්තො, සුවොති සුකො, ආසයාසයී භාවො නාම-බුධො ජිනොති පරියායෙන, කරී හත්ථීති පි පරියායෙන පරියායෙන විසෙසනං තබ්භාවො නාම-නීලොති විසෙසනං වණ්ණස්ස නීලපීත ලොහිත ඔදාතවසෙන චතුබ්බිධත්තා, නීලොති විසෙසෙති-අම්බොති සංචකාලිකො, පාකොති යාමකාලිකපානස්ස මධු මුද්දිකා

සාළක චොච මොච ජම්බු අම්බපාරුසක වසෙන අනෙකවිධතතා අභිධෙති විසෙසෙති තස්මා තබ්බිසෙසකා, නාම—අනිලොති වාතො, අසො ති හයො, ජවෙන සදිසතතා විසෙසනං භවති, නරොති මනුස්සො, සීහොති මිගාධිපො සූරෙන සදිසතතා විසෙසෙති, තස්මා ධම්ම කතා නාම—අඛිලො අඛිල රසො, ගරුකො අලහු රසො, කටුකොපි එසෙව නයො, ආධාරකතා නාම—ගදූහටනාති ගදං වුච්චති රොගං තං ආහූසො හනාති හිංසතීති ගදූහටං, පකති ඔසධං එක මූලෙන රොගහරණදබ්බං, සුන්දරෙන යොගෙන එකතො යුත්තං සුන්දරෙන වා භිසක්කෙන යුත්තනාති සුසංයුත්තං, ඔසධනාති පධාන පදං, දුට්ඨෙන යොගෙන යුත්තං දුට්ඨෙන අබ්‍යත්තෙන වා දෙමන ස්සෙන වා භිසක්කෙන යුත්තනාති තථා, විසනාති පකති එලාඵලං, තඤ්හි ජීවිතං විසරපෙති නිවත්තෙතීති විසනාති වුච්චති, අනාමයා නිබ්බධිතො එලකතා නාමාති." යනුද කීහු.

භිනනාධිකරණ විශේෂණ ප්‍රභේද.

භිනනාධිකරණ විශෙෂණයනොම—"තබ්භිනනමිතරං භවෙ" යි නිරුත්තිසංග්‍රහයෙහි කීහෙයින් යථෝක්ත තුල්‍යාධිකරණ විශෙෂණයට විරුඬවූ ලක්ෂණ ඇත්තේ භිනනාධිකරණ විශෙෂණ නම් වේ—ඒ භිනනාධිකරණ විශෙෂණයද තෘතීයා භිනනාධිකරණ ෂෂ්ඨී භිනනාධිකරණ සප්තමී භිනනාධිකරණ විශෙෂණ වශයෙන් තුන් ප්‍රකාරයක් වේ.

1. "ගොතෙතන ගොතමො නාථො" යනු තෘතීයා භිනනාධිකරණ විශෙෂණයට උදාහරණය.
2. "රඤ්ඤො පුරිසො" යනු ෂෂ්ඨී භිනනාධිකරණ විශෙෂණයටය.
3. "ගෙහෙව නිසිනෙනා හොති" යනු සප්තමී භිනනාධිකරණ විශෙෂණයටයි.

මෙහි "ගොතෙතන ගොතමො නාථො" යන්නෙහි "ගොතෙතන" යනු විශෙෂණය "ගොතමො නාථො" යනු විශෙෂ්‍යයි—එසේම "රඤ්ඤො පුරිසො" යන්නෙහිද "රඤ්ඤො" යනු විශෙෂණය "පුරිසො" යනු විශෙෂ්‍යයි—"ගෙහෙව නිසිනෙනා හොති" යන්නෙහි "ගෙහෙ" යනු විශෙෂණය "නිසිනෙනා" යනු විශෙෂ්‍යයි.

මෙම කීන—නිරුත්තිසංග්‍රහයෙහි.

"ත නාතිධා තතියා ඡට්ඨී සත්තමී තපසු තතමො,
රඤ්ඤොව පුරිසො හොති ගෙහෙ යෙව නිසිනනකො."

උපමානොපමෙය්‍ය වශයෙන් වූ විශෙෂණ විශෙෂ්‍ය විධි.

උපමානයතෙම විශෙෂණද, උපමෙය්‍යය විශෙෂ්‍යද වේ—එසේවූ විශෙෂණයා ඒකාන්තවශයෙන්, විශෙෂ්‍යයාගේ විභක්තිමාත්‍රය මුත්, ලිඞ්ගසංඛ්‍යාවන් ග්‍රහණය නොකරණහෙයින් උපමානොපමෙය්‍යවශයෙන් වූ විශෙෂණ විශෙෂ්‍යයෝ ලිඞ්ගභේද, සංඛ්‍යාභේද, ලිඞ්ගසංඛ්‍යාභේද, යන භේදත්‍රයකින් යුක්ත වූවෝ වෙත්.

1. ලිඞ්ගභේදයෙහි—"චන්දො විය තවානනං රුචිරං හොති—මාතාමාතඞ්ගො විය හත්ථිනී ධාවති."
2. සංඛ්‍යාභේදයෙහි—"සීහො විය ඉමෙ පුරිසා සූරතරා."
3. ලිඞ්ග සංඛ්‍යා භේදයෙහි—"තුරඟා විය හත්ථිනී ධාවති." යනු උදාහරණයි.

"චන්දො විය ආනනං" යන්නෙහි චන්දො යනු උපමානවූ විශෙෂණය, ආනනං යනු උපමෙය්‍යවූ විශෙෂ්‍යයි "විය" යනු * උපමා ද්‍යොතක නිපාතයකි—මෙහි "චන්දො" යන උපමාන විශෙෂණය තෙම "ආනනං" යන උපමෙය්‍යවිශෙෂ්‍යගතවූ නපුංසක ලිඞ්ගත්වය ග්‍රහණය නොකොට පුලිඞ්ගිකත්වයෙන් සිටියේය—"තුරඟා විය හත්ථිනී ධාවති" යන්නෙහිද මෙසේමය.

"සීහො විය" යනාදි උදාහරණයෙහිද "සීහො" යන විශෙෂණය තෙම "පුරිසා" යන විශෙෂ්‍ය ගතවූ බහුත්ව සංඛ්‍යාව ග්‍රහණය නොකොට එකත්ව සංඛ්‍යාවෙන් යුක්තව සිටියේය—"තුරඟා විය" යනාදි උදාහරණයෙහි "තුරඟා" යන විශෙෂණයා "හත්ථිනී" යන විශෙෂ්‍ය ගතවූ ස්ත්‍රීලිඞ්ගිකත්වය හා එකත්වයද ග්‍රහණය නොකොට පුලිඞ්ගික ඒකත්වයෙන් සිටියේය—මෙසේ නමුදු, මේ සියළු උදාහරණවල පමණක් නොව සෙසු උදාහරණවලද උපමාන උපමෙය්‍යයෝ සමාන විභක්ති ඇතැයි දතයුතුයි.

---

* මෙහි උපමා ද්‍යොතකත්වය නම්—ආනන ගතරුචිරත්වය චන්ද්‍රයා කෙරෙහි විද්‍යමාන බැවින් චන්ද්‍රයාගේ ආනනය හා සම්බන්ධය මුඛ්‍යවශයෙන්ද, චන්ද්‍රගතවූ රුචිරත්වය ආනනයෙහි විද්‍යමාන බැවින් ආනනයාගේ චන්ද්‍රයා හා සම්බන්ධය අමුඛ්‍ය වශයෙන්ද ද්‍යොතනය කරණ බවයි—තවද ආනනයාගේ චන්ද්‍රයා සමා හා සදෘශ බව චන්ද්‍රයා නැතිව සදෘශත්වයක් නැති බැවින් ඉවාදිශබ්දසාමර්ථ්‍යයෙන් ආනන ගතරුචිරත්ව සංඛ්‍යාතවූ සදෘශත්වය හැඟෙන්නේය, සෙස්සෙසද මෙම ක්‍රමය දතයුතුයි—එම සිඟ පඨිකාවෙහි—"ආනනාදීහි සදිසං චන්දාදිම්හි පතිට්ඨිතං,
ජොතෙති ඉති වාදීනි එකාධිකරණං තතො."

එහෙයින් තීනු.

ජංඝදාසයෙහි හා ප්‍රබංධචන්ද්‍රිකාවෙහි.

“ලිඞ්ගසංඛ්‍යාදි භෙදෙපි උපමානොපමෙය්‍යතා,
විභත්ති පන එකාව ඤෙය්‍යා තබ්භෙදවෙදිනා.”

“උපමානොපමෙයත්වං සත්‍යද්‍භෙදෙ ලිඞ්ග සංඛ්‍යයොඃ,
අභින්නෛව විභක්ති ස්‍යාත් උපමානොපමෙයයොඃ.

ලිඞ්ගභෙදෙ යථා රාමපත්නී මන්දගතිඃ පරං,
මත්තමාතඞ්ග වත්සීතා මල්ලිවංශවර පුෂ්ප වත්.

යථා වචනභෙදෙ ච කන්දර්පී ඉව සුන්දරාඃ,
ත්‍රියං ත්‍රිවානොං රාමස්‍ය භක්තා අභම්මොනනමාඃ.

ත්වාං රාම ම්‍රිව පශ්‍යාමි රාමෙණෛව ත්වයං ජිතාඃ,
දුර්ජයාශශත්‍රුවස්සෛව රාමාංයෙව නාමෙං සතු තෙ.

ත්වත්තො රාමා දිවාශෙෂා රණෙ භිභ්‍යති ශත්‍රුවඃ,
රාමස්‍යෙව තව ඝොෂා කීර්ත්ති ත්‍රෛලොක්‍යගාම්නී.

ත්වය්‍ය රාම ඉව ප්‍රීතිං භජන්තෙ සකලා ජනාඃ,
එවං ලිඞ්ගත්‍රයෙ පි ස්‍යා වචනත්‍රිතයෙ පි ච.”

“බුද්ධං විය භවන්තං පස්සාමි—බුද්ධෙන විය භවතා ධම්මො දෙසිතො—බුද්ධස්ස විය භවතො දානං දදන්ති—පබ්බතා විය පාසාදා අවරොහන්ති—පිතුස්ස විය පුත්තස්ස මුඛං හොන්ති—අනාථානං ගෙහෙ විය රඤ්ඤො නිවෙසනෙ නිසීදන්ති”—යනාදි උපමානොපමෙය්‍යයන්ගේ සමානවිභක්තික උදාහරණද දත යුතුයි.

මෙහි උපමාන උපමෙය්‍යයෝ* නම් කවරත්හුද යත්?

“උපමීයතෙ යෙන තං උපමානකං—උපමීයතෙති උපමෙය්‍යං” යනු බැවින් යම් (චන්ද්‍රාදි) වස්තුවක් කාරණකොට ගෙණ උපමා කරණු ලැබේද ඒ (චන්ද්‍රාදි) වස්තුව උපමාන නම් වේ—උපමා කරණු ලබන්නාවූ ආනනාදි වස්තුව උපමෙය්‍ය නම් වේ.

---

* “පසිද්ධ සාධම්මියා සාධ්‍ය සාධන මුපමානං”—යනු පදසාධනී ටීකායි.
“පසිද්ධි වසෙන සිද්ධ සාධම්මතො සාධ්‍ය සාධන මුපමානම”—යනුද,
“ප්‍රසිද්ධවූ ශශාඞ්කාදීන්ගේ ශාන්තාදි සාධර්ම්‍යයෙන් දෙවදත්තාදි අප්‍රසිද්ධසාධ්‍යයාගේ සාධනය උපමාන නමැයි දතයුතුයි”—යනුද පංචිකාප්‍රදීපයි.
“අසිද්ධං වත්ථු උපමානකං—සිද්ධං වත්ථු උපමෙය්‍යකං” යනු විභත්‍යත්ථ ටීකායි.

“උපනෙත්වා මඤ්ඤුති ජානාති එතෙනාති උපමානං, පාකටත්ථ වචනං”—යනු බැවින්, මේ උපමානය කාරණකොට ගෙණ පමුණුවා (මඤ්ඤුති යයි සේයි) දැනගන්නේනුයි උපමාන නම් වේ—ඒ නම්, ප්‍රකටාර්ථ වචනයයි.

තවද—රුචිරත්වාදි ගුණයෙන් ප්‍රසිද්ධ නුවූ ආනනාදි වස්තූහුගේ උපමානොපමෙය්‍ය සාධාරණධර්ම්ම සංඛ්‍යාතවූ යථෝක්ත ගුණයෙන් ප්‍රසිද්ධත්වය කරන්නාවූ චන්ද්‍රාදි වස්තුව උපමාන නම් වන්නේය—ප්‍රසිද්ධ නුවූ ආනනාදි වස්තුව උපමෙය්‍ය නම් වන්නේය. ඒ උපමාන උපමෙය්‍ය වාචක ශබ්දද්වය ප්‍රථමාදි වශයෙන් සමාන විභක්ති ඇත්තේයි.

එම කීහ—කච්චායන සාරයෙහි.

“සාධම්මසාධනං සිද්ධ මසිද්ධසෙසා පමානකං,
උපමෙය්‍ය මසිද්ධත්තං වය මෙකවිභත්තිකං.”

මෙහි “උපමා” නම් කුමක්ද යත්?

“උපමා සද්දොහි සදිසතානං වදති, උපමීයතෙ පාකටං කරීයතෙ එතාය අපාකටං වත්ථූනාති උපමා”—යනු බැවින් උපමා ශබ්දය තෙම වනාහි සදෘශ බව කියන්නේය, මේ කාරණකොට ගෙණ අප්‍රකටවූ වස්තුව ප්‍රකට කරණු ලැබේනුයි උපමා නම් වේ.

තවද, උපමාන උපමෙය්‍ය දෙදෙනාගේ සදෘශත්වය (සමානකම) උපමා නම් වන්නේය, උපමෙය්‍යය (විශෙෂ්‍ය හෙයින්) ප්‍රධානය; උපමානය (විශෙෂණහෙයින්) අප්‍රධානයි.

එම කීහ.

“උපමානොප මෙය්‍යානං සදිසතො පමා මතා,
උපමෙය්‍ය පධානොව ඉතරො ත්වප්පධානකො.”

තවද—“නො පමාන මාඛ්‍යාතෙන” යනාදීන් ජාංඝදාසාදියෙහි කියනලද හෙයින් උපමානයතෙම “ලිම්පනම්ව”—“වස්සනා මිව” යනාදිවශයෙන් නාමපදයකින් මුත් “ලිම්පතීව”—“වස්සතීව” යනාදිවශයෙන් ආඛ්‍යාතක්‍රියාපදයෙන් නොවන්නේයයි දතයුතුයි.

ක්‍රියාවිශෙෂණ ලක්‍ෂණ.

KRIYÁVIṢÉSHAṆA LAKSHAṆA.

තවද "කාරකවිශෙෂණය" "ක්‍රියාවිශෙෂණය*" කියාද විශෙෂණයාගේ ද්විප්‍රකාරයකි-එහි කාරක පදයකට විශෙෂණ වූයේ කාරකවිශෙෂණය—ඒ මුලකියන ලද ක්‍රමවලින් දත යුතුය.

ක්‍රියාපදයකට විශෙෂණවූයේ ක්‍රියාවිශෙෂණයි—ඒ මතු කියනු ලබන උදාහරණවලින් දතයුතුයි.

එම කීහ—"කාරක ක්‍රියානොපි ච විසෙසනං දුධීරිතං,
කාරකො තපසුතතාමො මුදුං පචති කිරියා."

ක්‍රියාවිශෙෂණයාගේ ප්‍රභේද.

ඒ ක්‍රියාවිශෙෂණයද බහිඩ අබහිඩ වශයෙන් ද්විප්‍රකාරයක්වේ—එහි සියළුම ආලපනයතෙම ක්‍රියාවෙන් බාහ්‍ය බැවින්ද ක්‍රියාවහා අසම්බන්‍ධහෙයින්ද † බහිඩ ක්‍රියාවිශෙෂණ නම් වන්නේය—"මුදුං පචති" යනාදියෙහි "මුදුං" යනාදී ක්‍රියාවිශෙෂණයෝ ක්‍රියාවෙන් බාහ්‍ය නොවන බැවින්ද ක්‍රියාව හා සම්බන්‍ධ බැවිනුද අබහිඩ ක්‍රියාවිශෙෂණ නම් වේ-එයිතුදු අබහිඩ ක්‍රියාවිශෙෂණයතෙම ප්‍රථමාවිභක්ත්‍යනත අබහිඩ ක්‍රියාවිශෙෂණය, ද්විතීයාවිභක්ත්‍යනත අබහිඩ ක්‍රියාවිශෙෂණයයි කියා ‡ ද්විප්‍රකාරයක්ය—එහි ක්‍රියාව අකර්මක ධාතුවකින් සිඩවන ලද්දක්නම් ක්‍රියාවිශෙෂණය ප්‍රථමා විභක්ත්‍යනත වන්නේය—ක්‍රියාව සකර්මක ධාතුවකින් සිඩවන ලද්දක්නම් ක්‍රියාවිශෙෂණය ද්විතීයා විභක්ත්‍යනත වේ—"සුඛං සයති" යන්නෙහි "සයති" යන ක්‍රියා පදය (සී සයෙ යන) අකර්මක ධාතුවෙන් සිඩහෙයින් "සුඛං" යන ක්‍රියාවිශෙෂණය ප්‍රථමා විභක්ත්‍යනතයි-

---

* "ක්‍රියාය භෙදනං විසෙසනං ක්‍රියාවිසෙසනං"—යනු සඳෑවුතති ටීකායි.

† "බහිඩ ක්‍රියාවිසෙසනං නාම ක්‍රියා අසමපතතං වජ්ජාකි දෙවදතතාතාඤදි සබ්බං ආලපනං" යනුද සඳෑවුතති ටීකායි.

‡ "බාලාවතාර සම්බන්‍ධ විනතාදිසු නපුංසකං,
දුතියෙකවචනනතං යනතං නයහති තීරිතං.
සමුදෑසීන මෙකතෙන පෙකඛිතෙ පඨමා සියා,
ෂෙදතෙන දුතියාත්‍යඤ්ඤඛ්‍යඛ්‍යානෙ සමුදීරිතං." යනු
සඳෑභෙද චිනතායි.

“මුදුං පචති” යන්නෙහි “පචති” යන ක්‍රියා පදය (පච පාකෙ යන) සකර්මකධාතුවෙන් සිඬවනලද්දක් හෙයින් “මුදුං” යන ක්‍රියාවිශෙෂණ පදය ද්විතීයා විභක්ත්‍යන්ත වූයේ යයි දත යුතුයි.

මෙම කිහ—සද්දසාරත්ථජාලිනියෙහි.

“අබ්භිඩං දුඛං හොති පඨමං දුතියන්තතො,
සකම්මකාය දුතියා අකම්මා පඨමං මතා.”

පාණිනි ආචාර්ය මතය ලෙස සද්දසාරත්ථජාලිනියෙහි ද්විප්‍රකාරය බව කියන ලද්දේ නමුදු නිරුක්තිසංග්‍රහකාරකාදි සමහර ආචාර්‍ය්‍යවරයෝ ඒ අබ්භිඩ ක්‍රියාවිශෙෂණය තෘතීයා ෂෂ්ඨී විභක්ත්‍යන්තවශයෙන්ද ද්විප්‍රකාරයක් ගෙණ සතරප්‍රකාරයක් යයිද කියත්-ඒ සතර ප්‍රකාරය නිරුක්තිසංග්‍රහයෙහි දක්වන්නේ මෙසේය.

☞ “චතුධා අබ්භිඩා ච විභත්‍යන්ත වසෙන තු,
පඨමං දුතියන්තා ච තතියන්තා ච ඡට්ඨ්‍යන්තං.
සුඛං සයති පඨමා මුදුං පචති දුතියා,
යදුච්චතෙ ක්‍රියා කත්තං තබ්භෙදං පඨමන්තකං,
යදුච්චතෙ ක්‍රියා කම්මං තබ්භෙදං දුතියන්තකං,
ක්‍රියා චෙ කම්මකං හොති පඨමන්තං විසෙසනං.
ක්‍රියා චෙ සකම්මකං හොති දුතියන්තං විසෙසනං,
එකාංහෙනෙව පාකාසි තතියන්තන්ති සො පි ච.
ක්‍රියාය අපවග්ගො ති ක්‍රියාපවග්ගො ති ච,
පාදස්ස උක්ඛිපනන්ති ඡට්ඨිභෙදක සඤ්ඤිතං.
එත්ථ ධාත්වත්ථ සම්බන්ධෙ ක්‍රියාවිසෙසනං භවෙ,
පච්චයත්ථෙන සම්බන්ධෙ ඡට්ඨි සාමිනි තං පි ච.”

ෂෂ්ඨී විභක්තිතොමෙ කාතීනාව අසම්භාරහෙයින් ක්‍රියා යොග යන්නැතැයි සමහර ආචාර්‍ය්‍යකෙනෙක් එය අත්හැර අබ්භිඩ ක්‍රියා විශෙෂණය ප්‍රථමා ද්විතීයා තෘතීයා විභක්ත්‍යන්තයන් පමණක් ගෙණ තුන්ප්‍රකාරයයිද කියන්නේය—ඒ මෙසේය.

“අසම්භාර සභාවත්තා කත්තුනො න ච කාරකං,
භවෙ තෙනෙව විඤ්ඤූහි තතියන්තම්පි ඉච්ඡිතං.
පඨමං දුතියං තතියා තංච ක්‍රියා විසෙසකා,
කෙචි දිච්ඡන්ති තං සාරං පණ්ඩිතෙහි විචාරිතං.”

සද්දසාරත්ථජාලිනී ටීකාවෙහි—"තංසං කිර අයමධිප්පායො ඡට්ඨී විභත්තියා ක්‍රියා යොගාභාවතො ක්‍රියාවිසෙසනං අයුත්තං තස්මා විභත්තිනාය මෙව යුජ්ජන්ති ඉමස්සාචරියස්ස අධිප්පායො—යදි පන ක්‍රියායොගො න භවෙය්‍ය කථං පාදස්සුක්ඛිපනං සීසස්සුක්ඛිපනං හමුකස්ස චාලනං අක්ඛිස්ස නික්ඛණනං චක්ඛුස්ස උම්මීලනං තාදිසු ක්‍රියායොගො භවතීති? අධිප්පායො-තෙන වුත්තං "විචාරෙතබ්බං" ති—නනු ච ඡට්ඨී විභත්තියා ක්‍රියායොගාභාවතො න කාරකන්ති වුත්තන්ති?—සච්චං තං පන කත්තුකම්මක්‍රියං සන්ධාය වුත්තං ඉදං පන භාව සාධනක්‍රියං උභතො විනිමුත්තං භාවසම්බන්ධස්ස කත්තුකම්මානමවාචකත්තා, යදි වාචකො භවෙය්‍ය 'දෙවදත්තෙන පචතෙ' ති පයොගෙ දෙවදත්තො ති භවෙය්‍ය පාදස්සුක්ඛිපනන්ති පයොගෙපි පාදන්ති භවෙය්‍යාති"—යනුයි.

ක්‍රියාවිශෙෂණය යම්පමණ ඇත්තේද ඒ සියල්ලම නපුංසක ලිඞ්ග එකවචනාන්තවශයෙන්ම බවද, ක්‍රියාවිශෙෂණයට ශබ්ද ශාස්ත්‍රයෙහිදී "ධාතුවිශෙෂණය" යන නාමයක්ද කියනබවද ශාසනයෙහි "භාවනපුංසක" යයි ව්‍යවහාර බවද කියන ලදී,

එම කීහ—නිරුත්තිසංග්‍රහයෙහි.

"ක්‍රියාවිසෙසනං යාව තං සබ්බං හි නපුංසකෙ,
සියා ච එකවචනං යථා භියබ්බු සුඛං ඨිතො.

ක්‍රියා විසෙසනං සත්ථෙ වුත්තං ධාතු විසෙසනං,
භාව නපුංසකං තෙව සාසනෙ සමුදීරිතං."

සියළුම ක්‍රියාවිශෙෂණ නපුංසකලිඞ්ග එකවචනාන්ත වීමට හේතුව කවරේදයත්?—"භූ කාර සබ්බ ධාතුවත්තෙසෙවච සන්ති"-යන ආචාර්‍ය්‍ය වචනය ලෙස භූ කාර යන ධාතු වයගේ අර්ථවූ වීමය කිරීමය යන අභිප්‍රාය සියළු ධාතුන්වලම ඇත්තේය—එහෙයින් "මුදුං පචති-සුඛං සයති" යනාදියෙහිවූ, පචති-සයති-යනු පචනං කරොති-සයනං කරොති—යන අර්ථයෝය—යථෝක්ත ආචාර්‍ය්‍ය වචනානුරූපව මේ "පචති" යන්න පචනං කරොති කියාද "සයති" යන්න සයනං කරොති කියාද යෙදීමට විශෙෂ්‍යධාරණ යයි කියත්-"මුදුං පචති" යන්නෙහි "මුදුං" යනු "පචති" යන ක්‍රියාවෙහි විශෙෂණය-"සුඛං සයති" යන්නෙහිද "සුඛං" යනු "සයති" යන ක්‍රියාවෙහි විශෙෂණයයි—මේ පචති සයති යන ක්‍රියා දෙක විශෙෂ්‍යධාරණයෙහිදී පචනං කරොති සයනං කරොති කියා බැවින් ඒ "මුදුං-සුඛං" යන පදයො "සයනං, පචනං" යන පද

වල විශෙෂණයෝය—ඒ "සයතං, පචතං" යන විශෙෂ්‍ය පදයෝ භාවකාරක යු ප්‍රත්‍යයාන්ත නපුංසක ලිඞ්ගික ඒකවචනාන්ත හෙයින් ඒ විශෙෂ්‍ය ගතවූ නපුංසක ලිඞ්ගික ඒකවචනත්වය තුල්‍යාධිකරණ විශෙෂණවූ "මුදුං, සුඛං" යන පදයෝද ලැබිය යුතුහෙයින් නපුංසකලිඞ්ගික ඒකවචනාන්ත වූවාහුය—ක්‍රියාවිශෙෂණය සෙසු තන්හිද මෙසේම හෙයින් සියළුම ක්‍රියාවිශෙෂණයෝ නපුංසකලිඞ්ගඑකවචනාන්ත වන්නාහුයයි දතයුතුයි—හෙද විශෙෂ්‍යාධාරණයෙහිදී භාවකාරක පදයට විශෙෂණ වන්නාවූ නපුංසක ලිඞ්ගික පදයක්හෙයින් එයට ශාසනයෙහි "භාවනපුංසකය" යන ව්‍යවහාරයද අර්ථානුගත ව්‍යවහාරයක් බව දතයුතුයි.

ක්‍රියාවිශෙෂණයට අයිති සියළු ප්‍රභේද සංග්‍රහ කිරීම් වශයෙන් මේ මතු ප්‍රකාශ වන්නාවූ ගාථාව නිරුත්තිසංග්‍රහවෙහි කියනලදී.

"හින්නාතුල්‍ය තත්‍යාදි ඡඩ්ඩා ආසයාදයො,
තථං කාරක කිරියා බහිඩා පඨමාදයො."

මෙතෙකින් මේ ක්‍රියා විශෙෂණ ලක්ෂණ කාණ්ඩයද
සමාප්තකරණලදී.

එත්තාවතා ච විවිධානි පි සද්ද සත්ථ
ගන්ථෙසු ආගතනයානි සමුද්ධරිත්වා,
සංගය්හ [1]යං විරචිතා යදි නාමමාලා
නිඨාපිත[2]ත්ථ විඤ්ඤුනො බලිතා[3]පනෙන්තු.

ගන්ථස්ස[4]මස්ස පටිපාදිතකං සු[5]වාදිං
භූධාතු[6]මන්තර කිපච්චය [7]මනාත්මා[8]ඛ්‍යං,
පොසිත්ව යෙ ම[9]ම්බ පාවචනෙ විනෙසුං
තෙ මෙ [10]භයන්ථ ගුරවො සුඛිතා භවන්තු.